
THE ADVENTURE OF THE
MYSTERIOUS WAIST BELT
මිණි මේඛලා
හෙවත් මායා බන්ධනය
ලසිත රවීන් උමගිලිය
RS PRATHIBHA PUBLISHERS PRATHIBHA PUBLISHRES PRATHIBHA PUBLISH

kathapothak.blogspot.com

# බිහිසුණු වන මැද - 2

## පිවිසුම

ඔබට ලිවීමට මා යළි පෑන අතට ගත්තේ වැළපෙන සිතිනි. මාගේ ළබැඳි මිතුරා, ක්ලෙවර් දිගින් දිගට ම මාගෙන් විමසා සිටියේ අපගේ චාරිකාවේ තොරතුරු සටහන් කර නොතබන්නේ මන්දැයි කියා ය. අන් සියල්ල අමතක කර දමුව ද මා ඔහුගේ ඉල්ලීම ඉටු නොකර සිටින්නේ කෙසේ ද? එහෙයින් මඳක් පමා වී හෝ මම පෑන අතට ගත්තෙමි.

අපගේ ප්‍රථම චාරිකාව අලලා මා සකස් කළ ලිපි, චාරිකා සටහන් ආදිය පුවත්පත්වල පළ වීමත් සමග ම බොහෝ අය ඒවායේ ඇතුළත් වූ ඇතැම් කරුණු පිළිබඳ මාගෙන් ප්‍රශ්න කරන්නට වූහ. එය මා හට විශාල හිරිහැරයක් වූවා පමණක් නො ව ඇතැමුන් නැගූ අභූත චෝදනා හමුවේ මම දැඩි සිත් වේදනාවට ද පත් වූවෙමි. එහෙත් එම ලිපි තුළ මා අතිශයෝක්තියෙන් එක් කළ කිසිවක් අන්තර්ගත නොවන බව දිවුරා පවසමි. මා ඔබට පැවසුවේ අප අත් දුටු පරම සත්‍යය පමණි. එහෙත් ඇතැම් විචාරකයින් පවා මාගේ ලිපිවලින් ඉදිරිපත් කළ ජීව විද්‍යාත්මක සංකල්ප අභියෝගයට ලක් කරමින් ඇතැම් පුවත්පත්වල ලිපි පළ කර ඇති බව මම දුටුවෙමි. ඇමේසන් වනාන්තරය තුළ බෙංගාල ව්‍යාඝ්‍රයින්ගේ පෙනුමට බොහෝ සෙයින් සමාන ව්‍යාඝ්‍රයින් සිටින්නේ කෙසේද? අඩි හතරක පමණ දිගින් යුත් පිරානා මසුන් ගවේෂණ කණ්ඩායමට හමු වූයේ කෙසේ ද? ඔවුන්ගේ සේවකයකු පිරානා මසුන්ගේ ප්‍රහාරයකින් මිය ගියේ කෙසේ ද? ඔවුන් පවසන්නා වූ ඉන්කා රාජධානිය මනඃකල්පිතයක් ද? වැනි විවාදාත්මක ප්‍රශ්න ගණනාවක් ඔවුන් ඉදිරිපත් කර තිබිණි. එවන් විවේචන ඉදිරිපත් කළවුන් අතර ප්‍රකට සත්ත්ව විද්‍යාඥයින් කිහිප දෙනෙකු ද සිටීම විමතියට කරුණකි. ඇමේසන් වනාන්තරය තවම මූළමනින් ම ගවේෂණයට

ලක් වී නොමැති අපූර්ව පරිසර පද්ධතියක් යැයි ඔවුනට නොහැඟෙන්නේ මන් ද? ඒ පිළිබඳ ව මම කනගාටුවට පත් වෙමි. එහෙත් ඉවසාගත නොහැක්කේ අපගේ චාරිකාවට සම්බන්ධ වූ ලාසරස් පවා නිර්ධය ලෙස අපව විවේචනය කිරීමය. එපමණක් නම් කම් නැත! මෙම නිර්ලජ්ජිත උගතා විසින් දකුණු ඇමරිකාවෙන් රැගෙන ආ ව්‍යාඝ්‍ර පැටවා පිළිබඳ මා ප්‍රශ්න කළ මොහොතේ ඔහු පුවත්පත් සාකච්ඡාවක් පවත්වමින් කියා සිටියේ කුමක් ද? ඒ ව්‍යාඝ්‍ර පැටවා ඔහු විසින් ඉන්දියාවෙන් ආනයනය කරන ලද බවය. මෙවන් දුෂ්ට මිනිසුන් සමඟ වාදයට පැටලීමෙන් ඵලක් නැත. අපගේ මෙම දෙවැනි චාරිකාව පිළිබඳ තොරතුරු ඔබ හට ඉදිරිපත් නො කළ යුතු යැයි මා තීරණය කළේ එබැවිනි. එහෙත් ක්ලෙවර් පැවසුවේ එවන් දෘඪ තීරණයක් ගැනීමෙන් අප පිළිබඳ විශ්වාසය තැබූ පාඨකයන් හට අප විශාල අසාධාරණයක් කරන බවයි. එහෙයින් මඳක් ප්‍රමාද වී හෝ මම මාගේ අදහස වෙනස් කර ගත්තෙමි. මේ ලිපිය ලියන මොහොතේ අප සිටින්නේ ඇමේසන් නදිය ඔස්සේ රට අභ්‍යන්තරයට ගමන් ගන්නා 'ජිබෝල්ටන්' නම් කුඩා දුම් නැවෙහි ය.

මා අවසාන වශයෙන් ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ මෙම ලිපි පෙළින් අනාවරණය වන තොරතුරුවලින් ඔබගේ විද්‍යා ඥානය අභියෝගයට ලක් කෙරේ නම් තවදුරටත් මෙම ලිපි පෙළ නොකියවා අත්හැර දමන්නැයි කියාය. මෙම ලිපි පෙළ තුළින් ඔබගේ ජීව විද්‍යා ඥානය හෝ ලොව මෙතෙක් හඳුනාගෙන ඇති පෘෂ්ඨවංශී හෝ අපෘෂ්ඨවංශී හෝ ජීවී විශේෂයක අනන්‍යතාව අභියෝගයට ලක් කිරීම හෝ මාගේ පරමාර්ථය නොවේ. මාගේ පරම චේතනාව අපගේ චාරිකාවේ අව්‍යාජ විස්තර ඔබ වෙත ඉදිරිපත් කිරීම පමණි. එහෙයින් අන්තගාමී විචාරකයන්ගේ චෝදනා මම උපේක්ෂාවෙන් බැහැර කරමි. එහෙත් පෙර ගල් මුල් විසි කළ දෑත්වලින් ම මතු යම් දිනක මා හට මල් මාලයක් පැළඳුවහොත් ඒ පිළිබඳව ද මම මවිතයට පත් නොවෙමි.

මීට ඇලෙක්



# ඇමේසන් නදිය ඔස්සේ

මීට ඉහත වාරයේ අප ඉන්කා රාජධානියෙන් පිට වූ දින සිට අද දිනය දක්වා ගත වී ඇති කාලය මාස හයකට ආසන්න ය. එන්කි කුමරියගෙන් දුරස්ව ගත කළ මෙම මාස කිහිපය කල්ප ගණනාවකට වඩා දිගු වී යැයි මට සිතේ. මෙම ලිපිය කියවන්නා වූ ඔබ ඇතැම් විට අපගේ ප්‍රථම චාරිකාවේ සටහන් කියවා නොතිබෙන්නට ද ඉඩ ඇත. එහෙයින් එවැනි පාඨකයන්ගේ හිත සුව පිණිස අපගේ ප්‍රථම චාරිකාවේ තොරතුරුවලින් බිඳක් හැකිතාක් සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීම යුක්ති සහගත ය.

එහෙත් ඔබ මේ වන විටත් අපගේ ප්‍රථම චාරිකාවේ සටහන් කියවා ඇත්නම් මෙම ලිපිය කියැවීම තරමක් නීරස කටයුත්තක් විය හැක. ඒ පිළිබඳ මම ප්‍රථමයෙන් ඔබගෙන් සමාව අයදිමි.

අපගේ ප්‍රථම චාරිකාවේ අරමුණ වූයේ සුප්‍රකට සත්ත්ව විද්‍යාඥයකු වූ වෝල්ටර් කැවෙන්ඩිෂ් මහතාට ඇමේසන් වනාන්තරය තුළ දී අත් වූ ඉරණම කුමක් දැයි දැනගැනීමය. එම ගවේෂණ චාරිකාව සංවිධානය කළේ දකුණු ඇමරිකාවේ සංචාරයක නියැලෙමින් සිටි ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් මාස ගණනාවක් මුළුල්ලේ නො ලද බැවිනි. එහිදී පෙරමුණ ගත්තේ ඔහුගේ ළබැඳි මිතුරෙකු වූ උද්භිද විද්‍යාඥ ලයිසැන්ඩර් මහතා ය. මහාචාර්ය ලයිසැන්ඩර් මහතාගේ දුරස්ථ ඥාති පුත්‍රයකු වූ මාගේ අතිජාත මිත්‍රයා, ක්ලෙවර් ද ඊට එකතු වන බව මට දැන ගැනීමට ලැබිණි. ඔහු තනිව එවැනි අන්තරාදායක ගමනකට සහභාගි වනු දැකීමට මම අකමැති වූවෙමි. මෙම අවදානම් සහගත ගමනට මා එක් වූයේ එලෙසයි. ඉන්පසු අපගේ මිත්‍රයෙකු වූ ස්ටෝන් ද චාරිකාවට එක් වූයේ ය. මා ප්‍රථමයෙන් සිතුවේ ගවේෂක කණ්ඩායම අප සිවු දෙනාගෙන් සමන්විත වනු ඇතැයි කියා ය. එනම් උද්භිද විද්‍යාඥ මහාචාර්ය ලයිසැන්ඩර්, ක්ලෙවර්, ස්ටෝන් සහ මාගෙනි. එනමුත් මහාචාර්ය ලාසරස් මහතා අපගේ චාරිකාවට එකතු කර ගැනීමට ලයිසැන්ඩර් මහතා තීරණය කළේ මෙම චාරිකාව සඳහා අවශ්‍ය

වන පිරිවැයෙන් හරි අඩක් ඔහු විසින් දැරීමට එකඟ වූ බැවිනි. එහෙයින් අප සිවුදෙනාට අමතර ව මහාචාර්ය ලාසරස් සහ ඔහුගේ සේවකයෝ කිහිප දෙනෙක් චාරිකාවට එක් වූහ.

නීග්‍රෝ ජාතික සන්තියා අපගේ චාරිකාවට එක්වූයේ ලාසරස්ගේ සේවකයකු ලෙසයි. එහෙත් ඔහු මහාචාර්ය ලාසරස්ට පවා අවනත නොවන බිහිසුණු මිනිසෙක් වූයේ ය. මින් ඔහු පිළිබඳ දීර්ඝ විස්තරයක් කිරීමට අදහස් නො කරන්නේ මෙය ඊට උචිත අවස්ථාවක් නො වේ යැයි මට හැඟී යන බැවිනි. එහෙත් අසරණ රතු ඉන්දියානුවන් බියවද්දා, ඔවුන්ට මරණ තර්ජන කර, තමාට අවශ්‍ය සියලු කටයුතු ඔවුන් වෙතින් ඉටු කර ගැනීමට සන්තියා සමත් වී ඇත. ඒ අතරින් ප්‍රධාන තැනක් ගන්නේ මොහු විසින් සිදු කරනු ලබන දූව ජාවාරමය. ඉන් සිදු වන විනාශය කොතරම් සෝචනීය ද? එහෙත් ඔහු නීතියේ රැහැනට හසුකරගත නොහැක්කේ මන් ද? ඒ යම් දේශපාලන බලපෑමක් නිසා ද? නො එසේ නම් නීතිය ක්‍රියාත්මක කරන්නවුන්ගේ අදක්ෂ බව නිසා ද? අපගේ මෙම චාරිකාව නිමා වීමට මත්තෙන් ඊට නිසි පිළිතුරක් සොයා සන්තියාගේ දූව ජාවාරමට නැවතීමේ තිත තැබිය යුතුව ඇත.

මීට පෙර වාරයේ ඝන වනාන්තරය මධ්‍යයේ අප තනිකර දමා වෙන්ව ගිය ලාසරස් සහ සන්තියා ඇතුළු පිරිස අපට පෙරාතුව පෙරළා මවු රට වෙත පැමිණ ඇත. ඝන වනාන්තරයේ මංමුළා වී විලේච්ඡ රතු ඉන්දියානුවන්ගේ ප්‍රහාරයන්ට ලක්වී අසරණ වූ අප දිවි ගලවා ගත්තේ කොතරම් විශ්මයජනක ලෙස ද? එහෙත් අවසානයේ අප ඉන්කාවරුන්ගේ ග්‍රහණයට නතුවීමත් සමඟ ම සියල්ල වෙනස් විය. අපගේ චාරිකාවේ අරමුණ පමණක් නො ව අපගේ සිතුම් පැතුම් පවා වෙනස් කිරීමට සුරපුරක් බඳු ඉන්කා පුරවරය සමත් වූයේ ය. පෙරුවියානු සම්භවයක් තිබූ මා මිත්‍ර ස්ටොන් එහි මහලු රජුගේ වැඩිමහල් දියණිය වූ ලගාෂා කුමරිය සමඟ අතිනත ගෙන එහි නව රජු ලෙස අභිෂේක ලබනු ඇතැයි මම සිහිනෙනුදු නොසිතුවෙමි. එමෙන්ම ලගාෂා කුමරියගේ නැගණිය වන එන්කි කුමරිය මාගේ හදවතට මෙතරම් සමීප වනු





ඇතැයි මම නොසිතුවෙමි. සැබැවින් ම මෙය දෛවෝපගත සිදුවීමකි. සැතපුම් දහස් ගණන ක් දුරින්, එකිනෙකට පරායත්ත නොවූ ශිෂ්ටාචාර දෙකකට අයත් දෙදෙනෙකු වූ අප අනපේක්ෂිත ලෙස මෙලෙස හමු වූයේ ආත්මීය බැඳීමක අනුහසින් ද? එහෙත් මීට මාස හයකට පෙර එක් අවාසනාවන්ත දිනයක ඇගෙන් වෙන් වී ලයිසැන්ඩර් මහතා සමඟ නැවත අපගේ මවු රට වෙත පැමිණීමට මට සිදු විණි. එනමුත් ඒ නැවත හැකි ඉක්මනින් ඇය වෙත පැමිණෙන පොරොන්දුව මත ය. ඇයගෙන් සමුගත් මොහොතේ සූර්ය දේවාලේ පූජාසනය අබියස දී ඇය මා අත තැබූ සෙවවන්දි මාණික්‍ය නොවන්නට මෙම දෙවැනි චාරිකාව සම්බන්ධයෙන් දැඩි ආර්ථික අපහසුතාවලට මුහුණ පෑමට අපට සිදු වනු ඇත. එය එසේ වුව ද ඈ මට දුන් පලා පැහැ එමරල්ඩ් මාණික්‍ය තවම මා අත සුරැකිව ඇත. යම් මතු දිනක නැවත ඇය හමුවන තුරු එය මා අත සුරැකිව තිබෙනු ඇත.

ඉතින් මා ප්‍රිය පාඨකය, මීට සති කිහිපයකට පෙර එක් ප්‍රතාපවත් දිනක ප්ලිමවුත් නැව් තොටින් අප නැව් නැග්ගේ එළැඹෙන්නා වූ සියලු ම අන්තරායන්ට නො බියව මුහුණ දීමේ අපේක්ෂාවෙන් යුතුවයි. දැන් අපි ජිබෝල්ටන් නම් කුඩා දුම් නැවෙන් මැනාඕස් නගරයට සැතපුම් දෙසීයක් පමණ දුරින්, ඇමේසන් නදියේ යාත්‍රා කරමින් සිටින්නෙමු.

තවත් දින කිහිපයකින් මැනාඕස් නගරය වෙත ළඟාවීමට අපට හැකිවනු ඇත. එහෙයින් අතීතාවර්ජනය මෙතැනින් නවතමි.

# මැතිව් හයිග්‍රේව්

මීට මාස ගණනාවකට ඉහත දී අප ඉන්කා රාජධානියෙන් පිටවන මොහොතේ මා සිතුවේ නැවත ඉන්කා රාජධානිය වෙත ළඟාවීම සඳහා ක්ලෙවර්ගේ හැර වෙනත් කිසිවෙකුගේ සහය මට නොලැබෙනු ඇතැයි කියා ය. විශේෂයෙන් ලයිසැන්ඩර් මහතා මා සමග නැවත ඉන්කා රාජධානිය වෙත ගමන් කිරීමට තීරණය කරනු ඇතැයි මම කිසිසේත් නොසිතුවෙමි. එහෙත් ලාසරස්ගේ නිර්දය විවේචනයන් හමුවේ ලයිසැන්ඩර් මහතා අසරණ වූයේ ය. ප්‍රථම චාරිකාවෙන් පසු අප විසින් අනාවරණය කරන ලද නව තොරතුරු ලාසරස් ප්‍රසිද්ධියේ විවේචනය කළේ ය. එහෙයින් කිසිවෙක් අප නොපිළිගත්තේ ය. අපගේ චාරිකාවෙන් හෙළි වූ ජීව විද්‍යාත්මක තොරතුරු අවඥා සහගතව බැහැර කිරීමට තරම් ඔවුහු කුහක වූහ. එහි ප්‍රතිඵලය වූයේ, ලයිසැන්ඩර් මහතා එඩින්බ්‍රෝ විශ්ව විද්‍යාලය සහ සිය මවු රට පිළිබඳ තව තවත් කලකිරීමට පත්වීමයි. අවසානයේ ඔහු අප සමඟ පෙරළා ඉන්කා රාජධානිය වෙත ගමන් කිරීමට තීරණය කළේ ය. ඉන් අපි දෙදෙනා මවිතයට මෙන් ම බෙහෙවින් සතුටට පත්වීමු.

ජ්ලීමවුන් නැව් තොටෙන් නැව් නැගීමට දෙසතියකට පමණ පෙර එක් සන්ධ්‍යාවක මම ක්ලෙවර් සමඟ මහාචාර්ය ලයිසැන්ඩර් මහතා හමුවීමට ඔහුගේ නිවස වෙත ගමන් කළෙමි.

"ඇලෙක්, ක්ලෙවර්, මම අද මේ ළමයින්ව මුණගැහෙන්නමයි හිටියෙ." ඔහු පැවසුවේ අප දෙදෙනා නිවසට ඇතුළු වන විටයි.

"ඒ මොකද මහාචාර්යතුමා...?" මම විමසුවෙමි.

"අද උදේ මාව මුණගැහෙන්න මැතිව් හයිග්‍රේව් කියලා මනුස්සයෙක් ආවා. මිනිහගෙ රස්සාව සත්ත්ව උද්‍යානවලට සතුන් සැපයීම. ඉතින් ඒ මනුස්සයා මගෙන් ඉල්ලා හිටියා තමන්වත් මේ චාරිකාවට සම්බන්ධ කරගන්න කියලා. ඒත් මිනිහා අන්තිමට කිව්වා ගමනට යන මුළු වියදම ම වුණත් දරන්න තමන් කැමතියි කියලා."





"මොනවා...?" මට කියැවිණි.

"ඔව්. ඉතින් මම ඇහුවා මුදල් ගැන ගැටලුවක් නැත්නම් දකුණු ඇමරිකාවට යන්න මගෙන් අවසර ගන්න හදන්නෙ මොකටද කියලා. ඒත් මැතිව් කිව්වෙ තමන්ට දකුණු ඇමරිකාවේ දී අර ගිය සැරේ ක්ලෙවර්ලට දකින්න ලැබුණු විදියෙ ඩයිනසෝරයින් දකින්න ලැබිලා නෑ කියලයි. ඒ නිසා මැතිව් බලාපොරොත්තු වෙන්නෙ අපේ උදව් ඇතිව ඒ ඩයිනසෝරයින් ගැවසෙන පැත්තක් හොයා ගන්න." ලයිසැන්ඩර් මහතා පැවසීය. නොසිතූ ලෙස අප හමුවට පැමිණි මැතිව් හයිග්‍රේව් නම් දඩයක්කරුවා පිළිබඳ මාගේ සිතේ විශාල කුතුහලයක් ඇති විය.

"ඒ කියන්නෙ මැතිව් බලාපොරොත්තු වෙන්නෙ අපේ මග පෙන්වීම යටතේ ගිහින් කැලේ සත්තු දඩයම් කර ගන්න එහෙමත් නැත්නම් සත්තු අල්ල ගන්න...?" මම විමසුවෙමි.

මහාචාර්ය ලයිසැන්ඩර් ඊට පිළිතුරු ලෙස හිස ඉහළ පහළ සැලීය.

"ලයිසැන්ඩර් මහත්තයා, ගිය සැරේ සත්තියා නිසා අපිට වුණු හිරිහැර මතකයි නෙ? ඉතින් මට නම් හිතෙන්නෙ රෑ වැටුණු වළේ දවල් වැටෙන්න අවශ්‍ය නෑ කියලයි. අපි කොහොමද දඩයක්කාරයෙක් ගැන විශ්වාසය තියන්නෙ?" ක්ලෙවර් පැවසුවේ ය.

"ඔව්, මමත් ඉන්නෙ ඒ ස්ථාවරයෙම තමයි ක්ලෙවර්. ඒ නැතත් මේ සැරේ හැම දෙයක් ම තීරණය කරන එක ඇලෙක්ට භාරයි. මම කළේ දැනුවත් කිරීමක් විතරයි." ලයිසැන්ඩර් මහතා පැවසුවේ ය.

"මට හිතෙන්නෙත් දඩයක්කාරයෙක් ගැන විශ්වාසය තියන්න බෑ කියලයි." මම පැවසුවෙමි. එදින ලයිසැන්ඩර් මහතාගෙන් සමුගෙන පැමිණි පසු ද මම ඒ පිළිබඳ ව තව තවත් කල්පනා කළෙමි.

ඊට දෙදිනකට පසු මම එඩින්බ්‍රෝවේ සිට මාගේ නවාතැන වෙත පිය නගමින් සිටිය දී කිසිවකු මා පසුපස දිව එන හඬ ඇසී

නතර වූවෙමි. මුහුණ පුරා වැඩුණු රැවුලකින් යුත් හැඩි දැඩි මිනිසෙක් මා පසුපස වූයේ ය. ඔහු පැළඳ සිටි පුළුල් වාටියක් සහිත සංචාරක හිස් වැසුමෙන් සහ ගොපලු ඇඳුම හේතුවෙන් මාගේ සිතේ ඔහු පිළිබඳ යම් සැකයක් පහළ විය.

"මේ ඇලෙක් මහත්තය ද?" ඔහු විමසුවේ හිනි දමමිනි.

"ඔව්... එතකොට මේ..."

"මම මැකිව් හයිග්‍රේව්... සමහර විට මහත්තයා මං ගැන අහලත් ඇති. මම තමයි අර සත්ත්ව උද්‍යානවලට සත්තු සපයන හයිග්‍රේව්." ඔහු පැවසීය.

"ආ... ඔව් මම අහලා තියෙනවා. මහාචාර්යතුමත් මට මැකිව් ගැන කිව්වා."

"අන්න හරි මහත්තයා... මම මේ කකහණියක් ම මහත්තයා මුණගැහෙන්න ආවේ ඒ ගැන කතා කරන්න තමයි." ඔහු පැවසුවේ මාගේ උරහිසක් මත සිය සුරත තබමිනි.

අපගේ චාරිකාවට ඔහුව සම්බන්ධ කර නොගත යුතු යැයි තීරණය කර තිබුණ ද ඔහුගේ සුහදශීලී ස්වභාවය හේතුවෙන් මම මඳක් අසරණ වීමි.

"මගෙන් කිසිම බාධාවක් වෙයි කියලා හිතන්න එපා මහත්තයා. මට අවශ්‍ය කරන්නෙ කැලෑවෙන් සත්තු අල්ල ගන්න විතරයි. ඒ හැර මගෙන් කාටවත් හිරිහැරයක් නෑ. අඩුම තරමින් කැලෑවෙ ගහක් කොළක්වත් මගේ අතින් විනාශ වෙන් නෑ. ඒක මගේ ප්‍රතිපත්තියක්." ඔහු පැවසීය. ඔහුගේ සෘජු නාසය දෙපස පිහිටි තියුණු දෙනෙතේ අව්‍යාජ ප්‍රතිපත්තිගරුක බවක් රැඳී ඇතැයි මට සිතිණි.

"හොඳයි, මට ඒ ගැන තනියම තීරණය කරන්න බෑ. ඒ නැතත් හයිග්‍රේව්ට පුළුවන්නෙ තනියම මේ ගමන යන්න. ඇයි අපිත් එක්ක එකතු වෙන්න හදන්නෙ?" මම විමසුවෙමි. එවිට ඔහුගේ මුවගට මඳ සිනා රැල්ලක් නැගිණි.

"ඒක නම් සම්පූර්ණ ඇත්ත මහත්තයා. ඒත් අර පත්තරවල





පළවුණ ලිපිවල සඳහන් වෙලා තිබුණු ව්‍යාඝ්‍රයින් එක්කයි මගේ ගනුදෙනුව තියෙන්නෙ."

"ඇයි ඔහේ කියන්නෙත් ඒ ව්‍යාඝ්‍රයින් ගැන කිව්ව කතාව මම ගොතපු පට්ටපල් බොරුවක් කියල ද?"

"නෑ... නෑ... මම මේ ලොකුකමකට කියනවා කියලා හිතන්න එපා ඇලෙක් මහත්තයා. මගේ වයස දැන් අවුරුදු තිස් හතක් වෙනවා. මගේ වයසින් වැඩි කාලයක් ගත වුණේ දරුණු වන සිවුපාවුන් එක්ක. ඒ නිසා මේ ලෝකෙ ඉන්න බොහොමයක් සත්තු ගැන මට හොඳ අවබෝධයක් තියෙනවා. උන් හරියට මගේ නෑයො වගේ. ඉතින් මහත්තයා ඔය විස්තර කරපු ව්‍යාඝ්‍රයා බෙංගාල ව්‍යාඝ්‍රයින්ගෙන් වෙනස් කියන එක මට ඉර හඳ වගේ විශ්වාසයි. ලාසරස් මහත්තයා ළඟ හිටපු කොටි පැටියව මිලට ගත්තෙ මම."

"මොනවා! මට මතක විදියට ඒ සතා වෙන්දේසි වුණේ ඇමරිකානු ඩොලර්... දහස් ගණනකට." එවන් සතෙකු මිල දී ගැනීමට තරම් ධනස්කන්දයක් මෙම දඩයක්කරුවාට හිමි වූයේ කෙසේ දැයි යන්න මට සිතා ගත නොහැකි විය.

"ඒ ගැන පුදුම වෙන්න එපා මහත්තයා. මම ඒ සතාව ආයෙත් විකුණුවා ඒ තරම්ම ලාභයකුත් තියාගෙන. ලාසරස් ගාව හිටපු ව්‍යාඝ්‍ර පැටියා ඉන්දියාවෙන් ගෙන්වපු එකෙක් කියලා කවුරු ප්‍රතික්ෂේප කළත් දන්න මිනිහා දන්නවා ඒක එහෙම නෙවෙයි කියන එක. ඉතින් මම ඇලෙක් මහත්තයාගෙන් කරන්නෙ එක ම එක ඉල්ලීමයි. ඒ වෙනුවෙන් මම මේ ගමනට වෙන සම්පූර්ණ වියදම වුණත් දරන්න සූදානම්. මට අවශ්‍ය කරන්නෙ ඒ ව්‍යාඝ්‍රයින්ව දැකගන්න ලැබුණෙ කොයි හරියේ දී ද කියලා දැනගන්න එක විතරයි. මොකද ඇමෙසන් වනාන්තරේ ගැන මටත් හොඳ අවබෝධයක් තියෙනවා. ඒක පොතපත කියවලා ලබා ගත්ත එකක් නම් නෙවෙයි, අවුරුදු ගණනාවක් තිස්සේ මහ පුදුම සහගත අන්තරායන්ට මුහුණ දෙමින් දුක් විඳලා ලබා ගනිපු එකක්. මම බාහියා බිලන්කාවල ම අවුරුදු පහක් ජීවත් වුණා. අප්‍රිකාවෙ අවුරුදු තුනයි. දකුණු ඇමරිකාව ගැන කතා කළොත් වෙනිසියුලාවෙ

ට්‍රිනිඩෑඩ්, ගයනාවෙ ජෝර්ජ් ටවුන්, උරුගුවේවල මොන්ටි විඩියෝ, චිලියෙ වල්පරයිසෝ, පේරුවල ලීමාවේ ඒ වගේ ම ඉක්වදෝරයෙ, පැනමාවෙ, පෝක්ලන්ඩ් දූපත්වල මේ වගේ මම නොගිය තැනක් නෑ. ඒත් මම අවංකව ම පිළිගන්නවා මම තවම ඇලෙක්ලා එදා දැකපු ව්‍යාඝ්‍රයින්ව දකුණු ඇමරිකාවේ දී දැකලා නැති බව. ඒත් මම පියුමාවුන් කළු ව්‍යාඝ්‍රයින් නම් ඕන තරම් කොටු කරගෙන තියෙනවා. ඉතින් මම ඇලෙක්ගෙන් නැවතත් ඉල්ලන්නෙ එක ම එක දෙයයි. ඒ තමයි, මේ සත්තු දැකගන්න ලැබුණේ නෙග්‍රෝ ගංගාවෙ කොයි හරියේ දී ද කියන එක මට පෙන්වලා දෙන්න.'' ඔහු පැවසීය.

''හයිග්‍රේව් මහත්තයා, මම මේ ගැන අනිත් අය එක්කත් ටිකක් කතා කරන්න ඕනෙ. හෙට හවස හයට ලයිසැන්ඩර් මහත්තයගෙ නිවසෙදී මාව මුණගැහෙන්න. මට මේ ගැන තව ටිකක් කල්පනා කරන්න ඕනෙ.'' මම පැවසුවෙමි. මාගේ පිළිතුරෙන් ඔහු සෑහීමකට පත් වූ බවක් පෙනිණි.

''හොඳයි, මම හෙට හවස එන්නම්.'' ඔහු පැවසුවේ හිස පහත් කොට මට ආචාර කරමිනි.



# තීරණාත්මක දිනයක්

පසු දින සවස හතරට පමණ මම ක්ලෙවර් සමග ලයිසැන්ඩර් මහතා හමුවීමට ගියෙමි. ඔහු සිය පයිප්පය උරමින් බරාඳයේ තිබූ හාන්සි පුටුවේ අසුන්ගෙන සිටියේ ය.

''කාට කාටත් දකුණු ඇමරිකාව ගැන උනන්දුවක් ඇති වෙලා තියෙන්නෙ දැන් තමයි.'' ඔහු පැවසුවේ අප නිවසට ඇතුළුවනවාත් සමගයි.

''ඇයි ලයිසැන්ඩර් මහත්තයා? ඒ සැරේ මොකක් ද?'' මම විමසුවෙමි.

''නෑ. දැන් ටිකකට කලින් ලාසරස් ආවා මාව මුණගැහෙන්න.'' ලයිසැන්ඩර් පැවසුවේ දුම් දමමින් පැවැති සිය පයිප්පය සුරතට ගනිමිනි.

''පුදුමයි, ලාසරස් ලැජ්ජා නැතිව ආපහු මෙහෙ පස් පෑගුවා කියපුවම. ඉතින් මේ සැරේ මොකාට ද එන්න හදන්නෙ?''

''ලාසරස් මගෙන් සමාව ගත්තා පහුගිය දේවල්වලට. ඒ විතරක් නෙවෙයි මිනිහා මට කිව්වා, මේ වතාවෙ ගමනට එයාගෙ ගෝලයෙක් එවන්න කැමතියි කියලා. ඒ වෙලාවෙ මට උන් හිටි තැනුත් අමතක වුණා. මගේ කටින් මොන වගේ දේවල් කියැවුණා ද කියලවත් මට මතක නෑ. මම මිනිහව බැනලා එලව ගත්තා.'' ලයිසැන්ඩර් එසේ පවසන විට ඔහුගේ නළල කෝපයෙන් රැලි ගැන්වෙනු මම දුටුවෙමි.

''හොර තක්කඩියා, ලැජ්ජා නැතිව ආපහු ආවනෙ...'' ක්ලෙවර් දත්මිටි කෑවේ ය.

''ඒත් ලාසරස් කලබල වුණේ නෑ. මිනිහා ගෙදරින් පිට වුණේ සිනහමුසු මුහුණින්. අන්තිමට කිව්වා 'නිවිහැනහිල්ලෙ මම කියපු දේ ගැන ටිකක් කල්පනා කරලා බලන්න, ගමනට යන වියදම තමන් සම්පූර්ණයෙන් ම දරන්න කැමතියි' කියලා.''

"නෑ... නෑ.. අවශ්‍ය නෑ මහාචාර්යතුමා. ඒ වගකීම මම භාර ගන්නවනෙ. ලාසරස් කියන්නෙ සර්පයෙක්. මිනිහා හිතුණු හිතුණු වෙලාවට පරණ හැව ඇරලා අලුත් වෙන්න හදනවා... තිරිසනා..." මට කියැවිණි. ක්ලෙවර් මෙන් ම මහාචාර්යතුමා ද එය අනුමත කළේ ය.

"එතකොට ඇලෙක්, අර මැතිව් හයිග්‍රේව්ගෙ ඉල්ලීම ගැන කල්පනා කළා ද?" ලයිසැන්ඩර් විමසුවේ ය.

"ඔව්.. මට හිතෙනවා හයිග්‍රේව් අවංක කෙනෙක් කියලා. ඒ නිසා ක්ලෙවර්ගෙයි මහාචාර්යතුමාගෙයි විරුද්ධත්වයක් නැත්තම් මගෙත් විරුද්ධත්වයක් නෑ ඒ සම්බන්ධව."

"ඔව්... අපි දෙන්නව පෞද්ගලිකව මුණගැහුණු එකෙන් ම හයිග්‍රේව්ගෙ හිතේ මේ ගැන තියෙන උනන්දුව පැහැදිලි වෙනවා. අනික මිනිහා අවංකව ම තමන්ගෙ අරමුණ මොකක්ද කියලා කියනවනෙ. ඒ නිසා මගේ විරුද්ධත්වයක් නෑ." ලයිසැන්ඩර් පැවසීය.

"ක්ලෙවර් මොකද කියන්නෙ?" මම විමසුවෙමි. එහෙත් ඊට පිළිතුරු දීමට ඔහුට ඉඩ නොලැබිණි. මැතිව් හයිග්‍රේව් අප හමුවට පැමිණියේ ය.

"මහත්වරුනි, මම හිතනවා ඔබගේ වැදගත් සාකච්ඡාවට මං නිසා බාධාවක් වුණේ නෑ කියලා." ඔහු පැවසුවේ හිස පහත් කර අපට ආචාර කරමිනි. නිවස තුළට පැමිණ අසුන් ගන්නා ලෙස ලයිසැන්ඩර් අතින් සංඥා කළේ ය. හිස්වැසුම ගලවා මේසය මතින් තැබූ ඔහු ලයිසැන්ඩර් මහතා අසලින් අසුන් ගත්තේ ය.

මොහු පැමිණීමට පෙර ක්ලෙවර්ගේ අදහස දැනගැනීමට නොලැබීම පිළිබඳ මගේ සිතේ කනගාටුවක් ඇති විය. ක්ලෙවර් එය තේරුම් ගත්තා විය යුතුය. සිය සාක්කු දින පොතේ යමක් සටහන් කළ ඔහු එය හයිග්‍රේව්ගේ අවධානයට ලක් නොවන අයුරින් මට පෙන්වූවේ ය.





'මැතිව් හයිග්‍රේව් අපගේ චාරිකාවට සම්බන්ධ කර ගැනීම පිළිබඳ මාගේ විරුද්ධත්වයක් නැත.' එහි සටහන්ව තිබිණි.

අප සමග ආ ගිය තොරතුරු සාකච්ඡා කරමින් සිටි හයිග්‍රේව් අදාළ මාතෘකාවට බැස්සෙ මිනිත්තු විස්සකට පමණ පසුවයි.

"ඉතින් මහත්වරුනි, තවම මගේ ඉල්ලීම ගැන තීරණයකට එළැඹෙන්න බැරි වුණා ද?"

"නෑ, අපි ඒ ගැන තීරණයක් ගත්තා... හයිග්‍රේව් පොරොන්දු වෙනවා නම් අපේ ප්‍රධාන කොන්දේසි කිහිපයකට යටත්ව මේ ගමනට එකතු වෙන්න, පෞද්ගලිකව මගෙත් ක්ලෙවර්ගෙත් මහාචාර්යතුමාගෙත් අකමැත්තක් නෑ හයිග්‍රේව්ගේ ඉල්ලීමට." මම පැවසුවෙමි.

"බොහොම ස්තුතියි ඇලෙක් මහත්තයා. ඒ වගේ ම මහාචාර්යතුමා ගැනත් මගේ හිතේ ලොකු පැහැදීමක් තියෙනවා. ඒත් මම දැනගන්න කැමතියි මොනවද ඒ කොන්දේසි කියලා."

"වැදගත්ම දේ තමයි මේ චාරිකාවේ දී අපි තීරණ ගන්නෙ කණ්ඩායමක් විදියට. තනියෙන් තමන්ට ඕනෙ විදියටම කටයුතු කරන්න අවශ්‍ය නම් අපිත් එක්ක එකතු වෙන්න එපා හයිග්‍රේව් මහත්තයා." එසේ පැවසුවේ ලයිසැන්ඩර් මහතායි.

"නෑ... ඒ වගේ තත්ත්වයක් උදාවෙන් නෑ. මම ඒකට එකඟයි." ඔහු පැවසීය.

"ඒ වගේ ම තමයි හයිග්‍රේව්, කැලෑවෙ සතුන්ට තිරපරාදෙ හිංසා කරනවට මම කැමති නෑ." ලයිසැන්ඩර් පැවසීය.

"මගේ ප්‍රතිපත්තියත් ඒක ම තමයි ලයිසැන්ඩර් මහත්මයා."

"බොහොම සන්තෝසයි හයිග්‍රේව් මහත්තයා. ඒ කොහොම වුණත් මේ හැම දෙයක් ම තහවුරු වෙන්නෙ වචනවලින් දෙන පොරොන්දු නිසා නෙවෙයි, ක්‍රියාවෙන්!!" ලයිසැන්ඩර් පැවසීය.

# ගමනට සියල්ල සූදානම්

යථෝක්ත සාකච්ඡාවෙන් පසුව අපි මැතිව් හයිග්‍රේව් නම අධ්‍යක්ෂකරුවා අපගේ චාරිකාවට සම්බන්ධ කර ගැනීමට තීරණය කළෙමු. එමෙන්ම ගමන් වියදමෙන් හරි අඩක් දැරීමට ඔහු තීරණය කළේ ය. එහෙත් එය අවශ්‍ය නොවන බව මම ඔහුට පැවසුවෙමි. මක්නිසාද යත් පසුවට මුදල් සම්බන්ධව යම් ආරවුලක් ඇති විය හැකි හෙයිනි. චාරිකාව සම්බන්ධව වන පිරිවැය සම්පූර්ණයෙන් ම දරනුයේ අප විසින් නම් චාරිකාව සම්බන්ධ සියලු තීරණ ගැනීමේ හිමිකම ඇත්තේ අපට ය. එහෙයින් මම හයිග්‍රේව්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළෙමි.

ඉන් පසු එළැඹි දින කිහිපය අපි ගමනට අවශ්‍ය අවි ආයුධ සහ වෙනත් කළමනා සූදානම් කිරීම සඳහා වෙන් කළෙමු. මැතිව් හයිග්‍රේව් නැවත මට හමු වූයේ අප ප්ලිමවුත් නැව් තොටෙන් පිටවීමට දින දෙකකට පෙරය. මා හමුවීම සඳහා ඔහු මාගේ නවාතැන්පොළ වෙත පැමිණියේ තවත් තැනැත්තකු සමගය.

''ඇලෙක් මහත්තයා, මේ මගේ මිත්‍රයා, ඒ වගේම ගමන් සහයකයා ටෝර්නි ග්ලේන්.'' ඔහු මට අමුත්තා හඳුන්වා දුන්නේ ය.

මධ්‍යම ප්‍රමාණයේ උසින් යුත් ටෝර්නි, ආරෝහ පරිණාහ දේහධාරියෙක් වූයේ ය. ඔහු මට අතට අත දී ආචාර කළේ ය.

''මම ඇලෙක්ව මුණගැහෙන්න ආවෙ ටෝර්නිව හඳුන්වලා දෙන්නමයි. මොකද අපි දෙන්නා හැම චාරිකාවක් ම යන්නෙ එකට. ඉතින් මේ ගමනේදීත් මගේ සහයට මම ටෝර්නිව එක්ක යන්නයි බලාපොරොත්තු වෙන්නෙ.''

''ඒකට ප්‍රශ්නයක් නෑ. ඒත් ටෝර්නිව හැර වෙන කාවවත් මෙකට එකතු කර ගන්න එපා.'' මම පැවසුවෙමි.

''ඒ ගැන බයවෙන්න එපා ඇලෙක්. මම ටෝර්නිව හැර





වෙනත් කෙනෙක්ව මේකට එකතු කර ගන්නෑ. මේ ගමනෙ තියෙන අවදානම් සහගත බව වගේ ම හාරදූර බවත් මට තේරෙනවා. ඒ නිසා කොහොමටත් මේ වගේ වැඩකට එහෙම ආවට ගියාට මිනිස්සුන්ව යොදා ගන්න මම කැමති නෑ. ඒත් ටෝර්නි ගැන මට සියයට සියයක් ම විශ්වාස තියන්න පුළුවන්.'' ඔහු පැවසුවේ ය.

එහෙයින් අවසානයේ අපගේ දෙවැනි දකුණු ඇමරිකා සංචාරයට සහභාගි වන්නා වූ කණ්ඩායම පස් දෙනෙකුගෙන් සමන්විත වූයේ ය. ඊට ඇතුළත් වූයේ මා, ක්ලෙවර්, ලයිසැන්ඩර් මහතා, මැතිව් හයිග්‍රේව් සහ ඔහුගේ සහයක ටෝර්නි ග්ලේන් ය. මම කේප් ටවුන් ප්‍රින්ස් නෞකාවේ කුටි දෙකක් කල් වේලා ඇතිව වෙන් කර තිබුණෙමි. ඊට දෙදිනකට පසු අපි ප්ලිමවුත් වරායෙන් නැව් නැඟ මවු බිමට සමු දුන්නෙමු. එය මාගේ සිතට මෙන් ම ක්ලෙවර්ගේ සිතට ද දුඩි වේදනාකාරී මොහොතක් විය. ලයිසැන්ඩර් මහතාට ද එසේම වන්නට ඇත.

එමෙන්ම මෙතෙක් මාගෙන් මගහැරුණු, නමුත් වෙසෙසින් සඳහන් කළ යුත්තක් ඇත. ඒ ක්ලෙවර් සහ ඔහුගේ පෙම්වතිය වූ කැන්ඩෙලා පිළිබඳවයි. පෙර වාරයේ ක්ලෙවර්, ලයිසැන්ඩර් මහතා සමඟ දකුණු ඇමරිකාව බලා පිටත්ව යනවාට ඇය තදින් ම විරුද්ධ වූ බව ඔබට මතක ඇතිවාට සැක නැත. එහෙත් ඔහු කෙසේ හෝ අවසාන මොහොතේ ඇයට කරුණු පහදා දී ඇගේ කැමැත්ත ලබා ගැනීමට සමත් වූයේ ය. එහෙත් ක්ලෙවර්ගේ බලවත් ඉල්ලීම මත ඇය තම හිත රවටමින් ඇතිකර ගත්තා වූ එම ස්ථාවරයේ වසරක් වැනි දීර්ඝ කාලයක් රැඳී සිටීමට ඇය සමත් නොවන්නට ඇත. එහෙයින් ඇයගේ සිතේ ඔහු කෙරෙහි තිබූ විශ්වාසය සහ ආදරය අවිශ්වාසය මුසු වෛරයකට පෙරළෙන්නට ඇත. එන්කි කුමරිය වෙනුවෙන් මාගේ සිතේ ඇති වූ ආදරය වෙනුවෙන් දිවි පරදුවට තබමින් දිරි දුන් ක්ලෙවර් හට අත් වූ අවාසනාවන්ත ඉරණම පිළිබඳ මම මුළු හදින් ම කම්පා වීමි. අප පෙරළා එඩිංබ්‍රෝ වෙත පැමිණෙන විට ඇය සිය අධ්‍යාපනය ද අතරමඟ හැර දමා නේවාසිකාගාරයෙන් ද පිටත්ව ගොස් සිටියා ය. මම ක්ලෙවර් සමඟ ඇය සොයා ඇගේ නිවස වෙත ද ගමන්

කළෙමි. එහෙත් ඇය එහි ගොස් තිබුණේ නැත! එසේ නම් මෙම බොළඳ තරුණියට අත් වූ ඉරණම කුමක් ද? ඇය සිය දිවි හානිකර ගත්තා ද? නොඑසේ නම්...? අපට ඉතිරිව තිබුණේ ඒ පිළිබඳ ව සිතා පසුතැවීම පමණකි. කෙසේ වෙතත් ඒ පිළිබඳ ව පැවසිය යුතු තවත් බොහෝ දෑ මාගේ මනසේ පෙළගැසී ඇතත් දැඩි ආයාසයකින් මම පෑන ඉවතට ගන්නෙමි.



## මැනාඕස් හිඳී

එංගලන්තයේ ප්ලිමවුත් නැව් තොටේ සිට එක්වරම දකුණු ඇමරිකාවේ බිහිසුණු වන සතුන්ගෙන් ගහණ ඇමේසන් වනාන්තරය වෙත මා ප්‍රිය පාඨකයා ඇද දැමීම පිළිබඳ ප්‍රථමයෙන් මම සමාව අයැදිමි. දැන් අප සිටින්නේ මැනාඕස් වෙත ළඟා වෙමින් තිබෙන ජිබෝල්ටන් නම් කුඩා නෞකාවෙහි ය. අපගේ ගමන් මලු සහ ආයුධ පෙට්ටි ඔසවාගෙන යෑම සඳහා පරාවලින් බ්‍රසීලියානු සේවකයන් සයදෙනෙකු සේවයට ගැනීමට සිදු විණි. එමෙන්ම මැතිව හයිග්‍රේව් විසින් රැගෙන විත් තිබූ විශාල පෙට්ටිය ඔසවාගෙන යෑම සඳහා තවත් බ්‍රසීලියානුවන් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. එම සේවකයන් දෙදෙනා පිළිබඳ වගකීම හයිග්‍රේව් සහ ටෝර්නි බාරගත්හ. එහෙයින් මේ වන විට අපගේ කණ්ඩායමේ සාමාජිකයන් ගණන දහතුන දක්වා ඉහළ ගොස් තිබිණි.

අපගේ කුඩා දුම් නැව, 'ජිබෝල්ටන්' මැනාඕස් වෙත ළඟා වන විට අපි ඇමේසන් නදියේ දින විස්සකට අධික කාලයක් ගත කර තිබුණෙමු. හයිග්‍රේව් මෙන් ම ඔහුගේ සහයක ටෝර්නි ද විශ්වාසවන්ත පුද්ගලයන් බව මේ වන විට අපි අවබෝධ කර ගෙන සිටියෙමු. එමෙන්ම පරාවලින් බඳවා ගත් බ්‍රසීලියානුවන් අටදෙනා ද අපට බෙහෙවින් පක්ෂපාතී අනලස් තැනැත්තන් වූ බව පෙනිණි. ප්ලිමවුත්වලින් නැව් නැඟ සතියක පමණ කාලයක් ගත වන තුරුත් ක්ලෙවර් මා සමඟ හැර වෙනත් කිසිවකු සමඟ වැඩි කතාබහට නොගියේ ය. ඒ කැන්ඩෙලා සම්බන්ධ යථෝක්ත සිදුවීමෙන් ඔහු බලවත් ලෙස කලකිරීමට පත් ව සිටි බැවිනි. එහෙත් කාලයට ඉඩ දී බලා සිටීම හැර වෙනත් විකල්පයක් ඉතිරිව නොතිබිණි. අප අත්ලාන්තික් සයුර තරණය කළා වූ 'කේප් ටවුන් ප්‍රින්ස්' නෞකාවට සමු දී පරා නැව් තොටින් ගොඩ බට පසු ඔහු මා සමඟ පැවසුවේ, තම ජීවිතය හා බැඳුණු සියලු ප්‍රශ්නවලින් තමා නිදහස් වූවාක් බඳු හැඟීමක් දැනෙන බව ය. සැබැවින් ම කලක් අතුරුදන්ව ගොස් තිබූ ඔහුගේ සුපුරුදු ප්‍රීතිමත් ස්වභාවය ට නැවත ඔහු පත්ව සිටීම පිළිබඳ මම අවංකවම සතුටු වීමි.

''ක්ලෙවර්, මගේ එක ම බලාපොරොත්තුව මැරෙන්න කලින් කොහොමහරි අර ඉන්කා රාජධානිය ගැන අනාගත පරම්පරාවට ප්‍රයෝජනවත් වෙන විදියෙ යමක් ලියලා තියන එක. අලුත් දෙයක් ලෝකෙට හඳුන්වලා දීපු මිනිහෙක්ට කවදාවත් ලෝකෙන් මල් මාලා පළන්දන් නෑ. අතීතයේ ඉඳන් මේ දක්වා ම සිද්ධ වුණෙත්, අනාගතයේ දී සිද්ධ වෙන්නෙත් ඒ දෙමයි. ඒ ගැන කම්පාවෙලා වැඩක් නෑ. මේ ඉන්කාවරුන්ගේ ආගමික, සංස්කෘතික, සමාජීය හැම සංසිද්ධියක් ගැන ම හොඳින් හොයලා බලලා ඒ ගැන සටහන් කරලා තියන්නයි මම හිතාගෙන ඉන්නෙ.''

ලයිසැන්ඩර් මහතා පැවසුවේ ජිබෝල්ටන් නෞකාව ඔබිඩෝස් හි නැංගුරම් ලෑ දින රාත්‍රියේ දී ය. එම රාත්‍රිය අපි නැව් තොට අසල පිහිටි සංචාරක නිවාසයක ගත කළෙමු.

පසු දින උදෑසන හයට ජිබෝල්ටන් ඔබිඩෝස්වලින් පිටත් වීමට නියමිතව තිබිණි. රාත්‍රී ආහාර ගැනීමෙන් අනතුරුව අපි තිදෙනා දූව මුවා මේසයක් වටා අසුන්ගෙන සතුටු සාමීචියේ යෙදෙමින් සිටියෙමු.

''ලයිසැන්ඩර් මහත්තයා, මට නිකමට හිතෙනවා කවුරුහරි අපි ගැන සෝදිසියෙන් ඉන්නවා කියලා.'' ක්ලෙවර් පැවසුවේ අපගේ කතාබහට ඇහුම්කන් දිය හැකි සීමාවේ කිසිවෙකුත් නොසිටින බවට සැක හැර දැනගැනීමෙන් අනතුරුවයි.

''ඇයි එහෙම කියන්නෙ?''

''නෑ ඇලෙක්ට මතක ද මන්දා පරාවලින් අපේ සේවකයෝ අටදෙනා බඳවා ගත්තු දවස.''

''ඔව්.'' මම පැවසුවෙමි.

''එදා මුහුණ පුරා රැවුලක් වැවුණු කෙට්ටු මිනිහෙක් අපේ පස්සෙන් ම හිටියා. ඒත් මම ඒ ගැන වැඩිය කල්පනා කළේ නෑ. අපි පරාවල තානාපති කාර්යාලයට ඇතුළු වෙද්දී මිනිහා තානාපති කාර්යාලය ඉදිරිපිට තිබුණු තානායමට ඇතුළු වෙනවා මම දැක්කා. ඒ විතරක් නෙවෙයි අපි පරාවලින් නැව් නගිද්දිත් මිනිහා නැව්





තොටේ ගැවසෙමින් හිටියා. නැවට නැග්ගට පස්සෙ රාජකාරිය භාර ගත්තෙ අර අපිට නිතර දකින්න ලැබුණු තරබාරු තට්ට මිනිහා.''

''ඔව්, මට ඒ මිනිහව මතකයි.'' මම පැවසුවෙමි. අපගේ කණ්ඩායමේ සාමාජිකයන් දහතුන් දෙනාට අමතරව ජිබෝල්ටන් නෞකාවේ තවත් විසිදෙනෙකුට ආසන්න පිරිසක් ගමන් ගත්හ. ඒ අතර සිටි තරබාරු තට්ට මිනිසා නිරතුරු අපගේ අවධානයට ලක් වූයේ ය. ඒ ඔහු දවසේ වැඩි කාලයක් නැව් තට්ටුව මත ගත කළ බැවිනි. කෙසේ වෙතත් මෙම කරුණේ වැදගත්කම මාගේ සිතට තදින් දැනුණේ ක්ලෙවර් එය අවධාරණය කළ පසු ය.

''හොඳයි දැන් කොහේද ඒ මිනිහා?'' ලයිසැන්ඩර් විමසීය.

''අන්න ඒක තමයි ප්‍රශ්නෙ. ඔබිඩෝස්වල නැංගුරම් දානකල් මිනිහා හිටියා. ඒත් ඉන් පස්සෙ මිනිහා අන්තරස්දාන වුණා. හෙට උදේ අපිට ඒ ගැන තීරණයක් ගන්න පුළුවන්. සමහර විට මිනිහා වෙනත් සංචාරක නිවාසයක රාත්‍රිය ගත කරනවා වෙන්න පුළුවන්.'' ක්ලෙවර් පැවසීය.

''ක්ලෙවර් හිතන්නෙ මේ ලුහුබැඳීමේ අරමුණක් ඇති කියල ද?''

''ඔව්, අනිවාර්යයෙන්ම අරමුණක් තියෙනවා. සමහරවිට ඒක බොහොම අන්තරාදායක ගනුදෙනුවක් වෙන්න පුළුවන්. ඒත් තවම ඒ ගැන තීරණයක් ගන්න ඉක්මන් වැඩියි. අපි තව ටිකක් කාලයට ඉඩ දෙමු. මැනාඔස්වලින් පස්සෙත් මේ දේ සිද්ධ වෙනවා නම් ඒක ලේසියෙන් අමතක කරලා දාන්න පුළුවන් වෙන් නෑ.'' ක්ලෙවර් පැවසුවේ ය. ඔහුගේ මුහුණේ රැඳී තිබුණේ සුපරීක්ෂාකාරී අවිනිශ්චිත බැල්මකි. ඔහුගේ සුපරීක්ෂාකාරී බව පිළිබඳ අප සතුටු විය යුතු ය. එහෙත් ක්ලෙවර් පැවසූ කරුණු පිළිබඳ මාගේ සිතේ හට ගත් කුතුහලය හේතුවෙන් ඔබිඩෝස්හි සංචාරක නිවසේ ගත කළ එම රාත්‍රිය එතරම් සතුටුදායක එකක් නො වී ය.

## සුපරීක්ෂාකාරී දින කිහිපයක්

පසු දින උදෑසන ඔබ්ඩෝස්වලින් පිට වූ ජිබෝල්ටන් සුපුරුදු ලෙස ඇමේසන් නදිය තරණය කරන්නට වූයේ ය. ක්ලෙවර්ගේ අනාවැකිය සනාථ කරමින් ඉතා අවාසනාවන්ත ලෙස තරබාරු තට්ට මිනිසා අතුරුදන්ව සිටියේ ය. අපි ජිබෝල්ටන් නෞකාවේ නියමුවාගෙන් ඔහු පිළිබඳ විමසා බැලුවෙමු.

''ඔව්, මට මතක හැටියට ඔය කියන මනුස්සයගෙ නම, ග්‍රැහැම් බේකර්. මේ තියෙන්නෙ පරාවල ඉඳන් ඔබ්ඩෝස් දක්වා එන්න මුදල් ගෙවපු බවට සහතික කරපු කුවිතාන්සිය.'' ඔහු පැවසුවේ මගී නාම ලේඛනය සහ ඊට අදාළ තවත් ලිපි ලේඛන කිහිපයක් පෙරළමිනි.

''ක්ලෙවර්, ඒ කියන්නෙ මිනිහගෙ රාජකාරිය එතැනින් ඉවරයි කියන එක ද?'' මම විමසුවෙමි.

''ඔව්. මට හිතෙන්නෙ එහෙමයි. ඒ විතරක් නෙවෙයි, ග්‍රැහැම්ට අමතර ව නැවේ තවත් ඔත්තුකාරයෙක් ඇති. ග්‍රැහැම් බේකර් තනියෙන් මේ ගමන ආව වෙන්න බෑ.'' ඔහු පැවසීය.

''ඒත් දැන් අපේ කණ්ඩායමට අමතර ව නැවේ ඉතිරි වෙලා ඉන්නෙ, පස්දෙනයි. අපි ඒ අය ගැන විමසිල්ලෙන් ඉමු.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ ය.

''ඔව්... මෙ ගැන මැතිව්ටත් කියලා තියන එක හොඳයි.'' ක්ලෙවර් පැවසීය.

එහෙයින් ඉන් අනතුරුව අපි මැතිව් සහ ටෝර්නි කැඳවා උද්ගතව ඇති ගැටලුව පිළිබඳ ඔවුන් දැනුවත් කළෙමු.

''මමත් ඒ ගැන කල්පනාවෙන් හිටියෙ ලයිසැන්ඩර් මහත්තයා. ඔය කියන මිනිහා පරාවලින් නැවට නැග්ග වෙලාවෙ ඉඳලා අපි ගැන සෝදිසියෙන් හිටියෙ. සමහර විට මිනිහා වෙන කාගෙහරි





කොන්ත්‍රාත්තුවක් භාර ගත්තා වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් වෙනත් අරමුණකින් කළ දෙයක් වෙන්නත් පුළුවන්. ඔය දෙකෙන් කොයික වුණත් මට එකයි. මිනිහා මේ මැතිව් හයිග්‍රේව් ගැන නොදනයි ඔය දඟලන්නෙ.'' මැතිව් හයිග්‍රේව් පැවසුවේ තීරණාත්මක ලෙස සිය හිස ඉහළ පහළ සලමිනි.

''මට හිතෙන්නෙ කවුරුහරි අපි ගැන හොඳ සෝදිසියෙන් ඉන්නෙ. අපි ප්ලිමවුත්වලින් නැව් නැග්ග මොහොතෙ ඉඳන් මේ දේ සිද්ධ වුණා. ඒක මට ඉර හඳ වගේ විශ්වාසයි. තාමත් ඒ දේ සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසීය.

''මම ඒ ගැන හොයලා බලන්නම්. ඒ කොහොම වුණත් මැනාඕස්වලින් පස්සෙ අපිට ඒ ගැන තීරණයකට එළැඹෙන්න පුළුවන්.' මැතිව් පැවසීය.

''ඒත් අපි ගැන සෝදිසියෙන් ඉන්න කාටවත් තියෙන වුවමනාව මොකක්ද? අන්න ඒකයි මට හිතාගන්න බැරි.'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

''එහෙම හිතන්න එපා මහාචාර්යතුමා. අපි කොහොමද කියන්නෙ කාටවත් එහෙම අවශ්‍යතාවයක් නෑ කියලා. විශේෂයෙන් මේකට මගේ වෘත්තීය ප්‍රතිවාදියෙක් සම්බන්ධවෙලා ඉන්නවා වෙන්න පුළුවන්. අමතක කරන්න එපා අර බෙංගාල ව්‍යාඝ්‍රයාට සමාන හැඩහුරුකම් තියෙන ව්‍යාඝ්‍රයින් ගැන කාටහරි උනන්දුවක් ඇති වුණා වෙන්න පුළුවන්. මේ ගැන වගකීම මම සම්පූර්ණයෙන් භාරගන්නවා මහාචාර්යතුමා. මම කොහොමහරි මේකෙ තේරුම දැන ගන්නම්...'' මැතිව් අවසානයේ පැවසීය.

මැතිව් එහි වගකීම භාරගත්ත ද මම පෞද්ගලිකව ම ඒ පිළිබඳ යමක් අනාවරණය කර ගැනීමට වෙහෙසුණෙමි. අපගේ ගවේෂණ කණ්ඩායමේ සාමාජිකයන්ට අමතරව ජිබෝල්ටන්හි ගමන් ගත්තේ තවත් මගීන් පස්දෙනෙකු පමණක් බව මම පෙර ඔබට පැවසුවෙමි. ඉන් එක් අයෙක් මැනාඕස් හි පිහිටුවා තිබූ රෝහලේ සීමාවාසික වෛද්‍යවරයකු වූයේ ය. ඔහු ජිබෝල්ටන් නෞකාවට අමුත්තකු නොවන බව කපිතාන් පැවසුවේ ය. එමෙන්ම

මැනාඕස් වෙත ගමන් කරමින් සිටි වෛද්‍ය ශිෂ්‍යයන් දෙදෙනා ද අපගේ විෂය පථයෙන් බැහැර කළ හැකි විය. ඔවුහු පැටගෝනියාවේ සිට පැමිණියවුන් වූහ. එහෙයින් මාගේ පූර්ණ අවධානය අනෙක් තැනැත්තන් දෙදෙනා වෙත යොමු කළෙමි. ඉන් කෙසඟ සිරුරක් හිමි සැට වැනි වියෙහි පමණ පසුවූ තැනැත්තා බෙනට් ෆර්නැන්ඩස් නම් වූයේ ය. ඔහු පැමිණ සිටියේ දකුණු චිලියෙනි. එමෙන් ම ඔහු සිය දිවියේ සැදෑ සමය විවිධ ප්‍රදේශයන්හි සංචාරය කරමින් ගත කරන්නකු බව මට දැනගන්නට ලැබිණි. අනෙක් තැනැත්තා ජිබෝල්ටන් නෞකාවේ ගමන් ගනිමින් සිටියේ ඇමෙසන් නදියේ සුන්දරත්වය දැක ගැනීම පිණිසය. ඉංග්‍රීසි ජාතිකයකු වූ ඔහුගේ පෙනුම මෙන් ම හැසිරීම ද තරමක් අස්වාභාවික වූයෙන් මාගේ සැකය එල්ල වූයේ ඔහු වෙතයි. වික්ටර් ලැඩමියර් නම් වූ ඔහු දවසේ වැඩි කාලයක් ගත කළේ නැව් තට්ටුව මතයි. එමෙන්ම දෙනෙති දුරේක්ෂයක් ද නිරතුරු ඔහු අත රැඳිණි.

ක්ලෙවර්ගේ අදහස දැනගැනීම පිණිස දිනක් මම මේ පිළිබඳ ව ඔහුගෙන් විමසීමි.

''මමත් ලැඩමියර් ගැන හොඳ කල්පනාවෙන් ඉන්නෙ. අපි බලමුකො මැනාඕස්වලින් පස්සෙ මොකක්ද සිද්ධ වෙන්නෙ කියලා.'' ඔහු පැවසීය.

• • • • • •

ඉන් පසු එළැඹි දිනයේ උදෑසන අප නැව් තට්ටුව මතට වී කතා බහක නියැලෙමින් සිටින අතරතුර දෙනෙතියෙන් ගං ඉවුර නිරීක්ෂණය කරමින් සිටි ක්ලෙවර් එක්වරම විශ්මයාන්විත හඬකින් සිවුරුහන් කළේ ය.

''ඇලෙක්, අන්න අතන රතු ඉන්දියානුවන්ගෙ ගම්මානයක්. මට පේන විදියට ඒ ගං ඉවුර ළඟ දැව කඳන් වගයකුත් ගොඩගහලා තියෙනවා.''

ඔහු දෙනෙතිය මා අත තැබුවෙන් මම ඉන් ඔහු පෙන්වූ පෙදෙස පරීක්ෂා කළෙමි.





''ඔව්, දැව ජාවාරම නම් තවමත් සාර්ථකව කෙරෙනවා වගේ. මේකත් අර කාලකණ්ණි සත්තියගෙ වැඩක් වෙන්න ඇති.'' මම පැවසුවෙමි.

''ඇලෙක්, ගං ඉවුරෙ මොනවද සිද්ධ වෙන්නෙ?'' අපගේ කතාබහ ඇසෙන සීමාවේ සිටි මැතිව් විමසුවේ මා අසලට පැමිණෙමිනි. ඉන් පසු ඔහු සිය උරයේ රඳවගෙන සිටි දෙනෙතිය ගෙන ඉන් ගං ඉවුර පරීක්ෂා කළේ ය. ඔහුගේ මුහුණ අඳුරු වන අයුරු මම දුටුවෙමි.

''හ්ම... මොකෙක් හරි කැලෑවෙ ගස් ටික කපලා විකුණනවා වගේ. මේ ජාවාරම මහා පරිමාණයෙන් කෙරෙනවා වගේ මට නම් පේන්නෙ.''

''ඔය ආරම්භය විතරයි මැතිව්. ගඟ ඉහළට යාත්‍රා කරද්දී අපිට තව හොඳ හොඳ දේවල් දැක බලාගන්න පුළුවන් වෙයි. අපේ මුල් ගමනට සත්තියා කියලා නීග්‍රෝ ජාතිකයෙක් එකතුවෙලා හිටියා. ඌත් මේ වැඩේට සම්බන්ධයි. ඒත් ගිය සැරේ අපිට මේ සම්බන්ධව කිසි දෙයක් කරන්න බැරි වුණා. බලමුකො, අපි මැනාඕස්වල දී මෙ සම්බන්ධයෙන් මොනවාහරි කරන්න උත්සාහ කරමු.'' ක්ලෙවර් පැවසීය.

''මම අපේ තානාපති කාර්යාලය හරහා මේ ගැන වගකිව යුත්තන්ට දැනුම් දුන්නා. ඒත් තවම මේ සම්බන්ධව මොනවත්ම කෙරිලා නෑ වගේ. සමහරවිට මේ දැව ජාවාරම ආණ්ඩුවෙ වගකිව යුත්තන්ගෙ අනු දැනුම පිට කෙරෙනවා වෙන්නත් පුළුවන්.'' ලයිසැන්ඩර් පැවසීය.

''ඔව්. ලෝකෙ සිද්ධ වෙන හුඟක් අපරාධවලට ඒ ඒ රටවල ආණ්ඩු සෘජුව ම නැතත් වක්‍රව හරි සම්බන්ධයි. ඒ නිසා අපි ඒ වගේ ආණ්ඩු ගැන ම විශ්වාසය තියලා බලන් ඉන් නැතුව මේකට මොනවහරි කරන්න බලමු. මම කොහොමත් ගස් කපන එකට තදින් ම විරුද්ධයි.'' මැතිව් පැවසීය.

''ඒක තමයි මමත් කියන්නෙ. මේකට අපි මොනවහරි කරන්න

ඕනෙ. සමහරවිට ඒක බොහොම භයානක ගනුදෙනුවක් වෙන්න ඉඩ තියෙනවා. ඒත් මම නම් මේක ලේසියෙන් අමතක කරලා දාන්න සූදානම් නෑ.'' ක්ලෙවර් පැවසුවේ මැතිව්ගේ අදහස අනුමත කරමිනි. දැව ජාවාරම්කරුවන්ට එරෙහිව අපි මෙලෙස සන්ධාන ගතවීමු. එමෙන්ම දැව ජාවාරම්කරුවන් වෙත අපගේ අවධානය යොමු වුව ද වික්ටර් ලැඩමියර් අපගේ විෂය පථයෙන් බැහැර නොකළෙමු.



# මැනාඕස් හිදී

අපි මෙලෙස තවත් ඒකාකාරීව ගත වූ දින කිහිපයකට පසු මැනාඕස් වෙත ළඟාවීමු. එතැනින් ඊබෝල්ටන් වෙත සමුදිය යුතුව තිබිණි. එදින ක්ලෙවර් සිය පූර්ණ අවධානය ලැඩමියර් වෙත යොමු කළේය. මැනාඕස්වලින් පසු ලැඩමියර් කුමක් කරනු ඇද්දැයි මට සිතා ගත නොහැකි විය. එහෙයින් අපි වඩාත් විමසිලිමත්ව කටයුතු කළෙමු.

''අපිට මෙතන ඉඳලා ගඟ ඉහළට යාත්‍රා කරන්න වෙන්නෙ බෝට්ටුවලින් එහෙමත් නැත්නම් උණ බට පහුරුවලින්.'' මැතිව් පැවසීය.

''කොහොමත් බෝට්ටුවලින් යන්න පුළුවන් වෙන්නෙ එක්තරා දුරකට විතරයි. ඒ නිසා අපිට අනිවාර්යයෙන් උණ පහුරු මිලදී ගන්න වෙනවා.'' ලයිසැන්ඩර් පැවසීය.

''ඔව්, ඒක ඇත්ත. ඒත් පහුරු මිලදී ගන්න අපි දැන්ම හදිස්සි වෙන්න ඕනෙ නෑ. ගඟ ඉහළ තියෙන රතු ඉන්දියානු ගම්මානයකින් අපිට පහුරු මිලදී ගන්න පුළුවන්.'' මැතිව් යෝජනා කළේය.

''එහෙනම් අපි ගිය සැරේ පහුරු මිල දී ගත්තු ඇටන් රතු ඉන්දියානුවන්ගෙන්ම මේ සැරෙත් පහුරු ගමු.'' මම පැවසුවෙමි. එය වඩාත් සුදුසු යැයි මට සිතිණි.

සේවකයන් විසින් නෞකාවේ තිබූ අපගේ බඩු බාහිරාදිය ඉවත් කර ගත් පසු අපි සංචාරක නිවසක් වෙත ගමන් කළෙමු. රාත්‍රිය උදාවෙමින් පැවතියෙන් මෙම තානායමේ රාත්‍රිය ගත කර, පසු දින උදෑසනින් ගමන් ආරම්භ කිරීමට අපි තීරණය කළෙමු.

''ඇලෙක්, අර ලැඩමියරුත් මීට හැතැප්ම කාලක් විතර එහායින් තියෙන තානායමක නවාතැන් ගත්තා. මට හිතෙන්නෙ මිනිහා මෙතනින් නතර වෙන එකක් නෑ. බලමුකෝ. ඌ අපේ පස්සෙ එන්න සූදානම් වුණොත් ඒක හොඳින් හෝ නරකින්

බේරුමක් කර ගන්න සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසුවේ අප රාත්‍රී ආහාර ගන්නා අතරයි.

''ඔව්, මමත් මිනිහා ගැන හොයලා බැලුවා. මට හිතෙන්නෙ ඌ සූදානම් වෙන්නෙ අපේ පස්සෙන් එන්න. මොකද මම දැක්කා ලැඩමියර් බෝට්ටු කුලියට දෙන මිනිහෙක් එක්ක හුඟ වෙලාවක් කතාබහ කර කර ඉන්නවා.'' මැතිව් පැවසුවේ අප සැමගේ සිත් තුළ චකිතයක් ඇතිකරවමිනි.

''හොඳයි, එහෙනම් අපි දැන්ම මේ ගැන තීරණයක් ගමු.'' ක්ලෙවර් පැවසුවේ හුන් තැනින් නැඟී සිටිමිනි.

මැතිව් සිය හිස දෙපසට සැලුවේ තමා එය අනුමත නොකරන බව පවසන්නාක් මෙනි.

''ක්ලෙවර්, අපි මේක හෙට උදේ වෙනකල් කල් දාමු. අපි කලබල කරලා මිනිහව බය කළොත්, ඌ වෙනත් විකල්පයක් තෝරාගනී. ඒ නිසා දැන්ම කලබල කරන එක සුදුසු නෑ.'' මැතිව් පැවසීය. ක්ලෙවර් මඳ වේලාවක් ඇසිපිය නොහෙළා මැතිව් දෙස බලා සිටියේය. ඉන් පසු ඔහු යළි අසුනට බර වූයේ සිය අදහස වෙනස් කර ගත් බව පවසන්නාක් මෙනි.

''හොඳයි, අපි හෙට උදේ වෙනතුරු ඉවසමු.'' අවසානයේ ඔහු පැවසීය.

පසු දින උදෑසන හතට අප මැනාඞ්ස්වලින් පිටත් වීමට නියමිතව තිබිණි. ඒ සඳහා මම බෝට්ටු යුගලක් වෙන්කර ගතිමි. අපටත් අපගේ බ්‍රසීලියානු සේවකයන්ටත් එම බෝට්ටු යුගලේ ඉඩකඩ ප්‍රමාණවත් විය.

රාත්‍රී ආහාරයෙන් පසු අපි නින්දට ගියෙමු. පසු දින උදෑසන ඇරඹීමට නියමිතව තිබූ අභියෝගාත්මක චාරිකාව පිළිබඳ විවිධාකාර වූ සිතිවිලි මගේ මනසේ සැරිසරන්නට වූයෙන් නින්ද මා අසලකවත් නොවිය. ලැඩමියර් අප පසුපස පැමිණීමට සූදානම් වුවහොත් එය කෙසේ හෝ වළක්වාලීමට සිදුවනු ඇත. ඇතැම් විට මෙය ගැටුමකින් කෙළවර වීමට ඉඩ තිබේ. එසේ වුවහොත්





නියත වශයෙන්ම අපගේ ගමන තවත් ප්‍රමාද වනු ඇත. එහෙයින් සියල්ල සාමකාමීව විසඳේවා යැයි මම සිතින් ප්‍රාර්ථනා කළෙමි. මෙලෙස විවිධ දෑ පිළිබඳ කල්පනා කරමින් සිටි මා කරා නිදි දෙව්දුව ළඟාවන්නට ඇත. පසු දින මා අවදි වූයේ ක්ලෙවර්, ලයිසැන්ඩර් මහතා අමතන හඬ ඇසීමෙනි.

''ආ, ඇලෙක් අවදි වුණ එක හොඳයි. දැන් හයටත් ළඟයි. හතට මෙහෙන් පිටත් වෙන්න නම් දැන් සූදානම් වෙන්න වෙයි. මම අපේ සේවකයින්ට දැනුම දුන්නා බඩු පෙට්ටි බෝට්ටුවලට පටවන්න කියලා.'' ක්ලෙවර් පැවසීය.

''ඒක හොඳයි, මැතිව්ලා කෝ...?''

''ටෝර්නි නම් එළියෙ ඉන්නවා. මැතිව් ගියා ලැඩමියර් ගැන හොයලා බලන්න.'' ඔහු පැවසීය.

අප තිදෙනා හැඳ පැළඳගෙන අවසන් වන විට සේවකයින් අපගේ භාණ්ඩ සියල්ල බෝට්ටුවලට පටවා තිබිණි.

''ලයිසැන්ඩර් මහත්තයා, දැන්නම් මැතිව්ට එන්න වෙලාව හරි. මොකද දන්නෑ මෙච්චර පරක්කු?'' ටෝර්නි පැවසීය.

''ඔව්, දැන් එන්න වෙලාව හරි...'' ක්ලෙවර් පැවසුවේ සිය ඔරලෝසුව දෙස බලමිනි. ඒ වන විට මැතිව් පිටත්ව ගොස් මිනිත්තු පහළොවකට ආසන්න කාලයක් ගතවී තිබිණි.

# ලැඩමියර් අතුරුදන් වෙයි

මැතිව් යළි පැමිණෙන තුරු අපි නොඉවසිල්ලෙන් බලා සිටියෙමු. එහෙත් ඔහු පැමිණියේ තවත් අඩහෝරාවකට පමණ පසුවයි.

''මිනිහා අපි හිතුවට වඩා දක්ෂයි.'' ඔහු අප වෙත පැමිණියේ එලෙස පවසමිනි.

''ඇයි?'' මම විමසුවෙමි.

''මිනිහා උදේ පාන්දරින් ම තානායමෙන් පිටත්වෙලා ගිහින්! මම පුළුවන් හැම තැනකම හොයලා බැලුවා. ඒත් වැඩක් වුණේ නෑ. ඒ නිසා මම අන්තිමට ගියා ඊයෙ මිනිහා මුණගැහුණු අර බෝට්ටු කුලියට දෙන නියෝජිතයා මුණගැහෙන්න. මම හිතුවා හරි. ඌ පාන්දරින් ම බෝට්ටුවකුත් කුලියට අරන් ගඟ ඉහළට යාත්‍රා කරලා තියෙනවා.'' මැතිව් පැවසුවේ ය.

එය අසා ක්ලෙවර් දත්මිටි කනු මම දුටුවෙමි. ලයිසැන්ඩර් මහතා මා දෙස බැලුවේ බලාපොරොත්තු කඩ වූ ලෙසිනි.

''හොඳයි, මේ සැරෙත් උන් අපිට ඉස්සර වුණා. කමක් නෑ බලමුකො. කොහොම වුණත් ඒකෙන් ඔප්පු වෙනවා; අපිත් ඌ ගැන සෝදිසියෙන් ඉන්න බව මිනිහා දැන ගත්තා කියන කාරණේ.'' ක්ලෙවර් පැවසුවේ ය.

''දැන් ඉතින් ඒ ගැන කල්පනා කර කර ඉඳලා වැඩක් වෙන්නෑ ක්ලෙවර්. අපි අපේ ගමන යමු. ඒත් එන ඕන ම බාධාවකට මුහුණ දෙන්න සූදානම්ව ඉදිරියට යන්න අපිට සිද්ධ වෙනවා.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ අපගේ චිත්ත ශක්තිය පිරිහී යමින් තිබෙන මොහොතකයි. එය අනුමත කරන්නාක් මෙන් මැතිව් ද හිස ඉහළ පහළ සලනු මම දුටුවෙමි. එහෙත් ක්ලෙවර් සිටියේ ගැඹුරු කල්පනාවක නිමග්නවයි. මම ඔහුට බාධා කිරීමට නොසිතුවෙමි. එහෙත් අවසානයේ ඔහු ද ලයිසැන්ඩර් මහතාගේ අදහසට එකඟ වන බව පවසන්නාක් මෙන් බෝට්ටුවට නැඟ ගත්තේ ය. මිළඟට





පැමිණියේ මාගේ වාරයයි. ලැඩමියර්ගේ අතුරුදන්වීම හමුවේ මා කුමන තීරණයක් ගනු ඇත්දැයි දැන ගැනීමට ලයිසැන්ඩර් මහතා මෙන් ම මැතිව් ද මාගේ මුහුණ දෙස බැලුවේ ය.

''දැන් ඉතින් වෙන කරන්න දෙයක් නෑ අපි යමු.'' මම පැවසුවෙමි.

එහෙයින් ඉන් අනතුරුව අපි බෝට්ටු දෙක ආධාරයෙන් නදිය තරණය කිරීමට වීමු. වාෂ්ප බලයෙන් ක්‍රියා කළ බෝට්ටු දෙකේ කාර්යය මණ්ඩලය ලෙස බෝට්ටු කුලියට දුන් ආයතනය විසින් එක් බෝට්ටුවකට සේවකයකු බැගින් යොදවා තිබිණි.

එහෙයින් අවට නිරීක්ෂණය කිරීමට කාලය ඉතිරි විය. මැනාඕස්වලින් පිටත් වීමෙන් පසු එළැඹි දෙවැනි දින රාත්‍රියෙහි අපි තවත් එක් රතු ඉන්දියානු ගම්මානයක නවාතැන් ගැනීමට සිතුවෙමු. එහි විසූ රතු ඉන්දියානුවන් සුහදශීලී ජන කොට්ඨාසයක් වූ බව පෙනිණි. ඒ බැව් අපගේ බ්‍රසීලියානු සේවකයන් මෙන් ම පළපුරුදු ගවේෂකයකු වූ මැතිව් හයිග්‍රේව් ද පෙර සිට දැන සිටියේ ය. අප අපගේ බෝට්ටු මෙම රතු ඉන්දියානු ගම්මානය වෙත යාත්‍රා කරවූයේ එබැවිනි.

ස්වදේශික රතු ඉන්දියානුවන්ට ම උරුම වූ ජේරාල් භාෂාවෙන් අප ඇමතූ ඔවුහු අප පිළිගත්හ. මැතිව් හට ජේරාල් භාෂාව හැසිරවීමේ යම් හැකියාවක් තිබිණි. එහෙත් මට මෙන් ම ක්ලෙවර්ටත් ලයිසැන්ඩර් මහතාටත් ටෝර්නිටත් ජේරාල් භාෂාව පිළිබඳ අවබෝධයක් නොවූයෙන් අපි නිහඬව සිටියෙමු. අපගේ බ්‍රසීලියානු සේවකයන් ජේරාල් භාෂාව හොඳින් දැන සිටියෙන් ඔවුන් හරහා අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව පැවතිණි.

අපි ප්‍රථමයෙන් ගෝත්‍රික ප්‍රධානියා හමුවීමු. ඔහු මහලු වයසේ පසු වූ තැනැත්තෙකු වූයේ ය. මැතිව් ඔහුගෙන් යමක් විමසූ පසු ඊට පක්ෂපාතී වූ අයුරින් ඔහු හිස ඉහළ පහළ සලමින් යමක් පවසනු මම දුටුවෙමි.

''අද රෑ අපි මෙහේ නවාතැන් ගන්න එකට මිනිහගෙ

විරුද්ධත්වයක් නෑ.'' මැතිව් පැවසුවේ යළි අප අතරට පැමිණි පසුවය. කොළ අතු සෙවිලි කළ කූඩාරම් දෙකක් අපට වෙන්කර දුන්නෙන් අපි ඒ තුළ වැතිරී මදක් ගිමන් හළෙමු. තවත් හෝරාවකට පමණ පසුව රතු ඉන්දියානු තරුණියෝ පිරිසක් පැමිණ අපට රාත්‍රී ආහාර පිළිගැන්වූහ. ඊට අන්තර්ගත වූයේ මඤ්ඤොක්කා පිටිවලින් තනන ලද රොටි සහ පුළුස්සන ලද එක්තරා මාංස වර්ගයකි. එම ආහාර වේල භුක්ති විඳීම එක්තරා ආකාරයක අපූර්ව අත්දැකීමක් විය.

''මේ ගම්මානයට නම් දුව ජාවාරම්කාරයන්ගෙන් බලපෑමක් වෙලා නෑ වගේ.'' ලයිසැන්ඩර් පැවසුවේ ය. එය මැතිව්ගේ සවන් හි ද වැකිණි.

''මමත් ඒ ගැන තමයි මේ කල්පනා කළේ. ඒත් දූන් රෑ බෝවෙලා නිසා අපිට නොපෙනුණාට මෙහෙත් එහෙම දෙයක් සිද්ධ වෙනවා වෙන්න පුළුවන්. කොහොමත් ඒ ගැන හෙට උදේ අපි අහලා බලමු.''මැතිව් පැවසීය.

''සමහරවිට දුව ජාවාරම්කාරයො මේ ස්වදේශික රතු ඉන්දියානුවන්ව තමන්ගෙ පාලනය යටතට අරන් ඉන්නවා වෙන්නත් පුළුවන්. කටයුතු සිද්ධ වෙන්නෙ ඒ විදියට නම් අපිට උන්ගෙන් තොරතුරු දැනගන්න ලැබෙන එකක් නෑ. දුව ජාවාරම්කාරයින්ට තියෙන බයට මුන් අපිට කිසි දෙයක් කියන එකක් නෑ.'' ක්ලෙවර් පැවසුවේ මාගේ දෙනෙත නිදිබරින් පියවී යමින් තිබෙන මොහොතක ය.



# රතු ඉන්දියානුවන් සමඟ ගැටුමක්

පසු දින උදෑසන මා අවදිවන විට වර්ෂාවක් ඇද හැලෙමින් පැවතිණි. කොළ අතු සෙවිලි කළ වහලයේ සිදුරු අතරින් පහළට ගලා ආ හිරිකඩ හේතුවෙන් ගතට අධික ශීතලක් දැනෙන්නට විය. එහෙත් ඒ වන විටත් ක්ලෙවර් අවදි වී හැඳ පැළඳගෙන සූදානම්ව සිටියේ ය.

''ඇලෙක්, මේ විදියට වැස්සොත් නම් අපිට ලොකු ප්‍රශ්නෙකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසුවේ මා අවදිවනු දුටු පසුවය. එහෙත් වර්ෂාව තව තවත් දැඩි කළා මිස මඳකුදු තුරල් වූයේ නැත.

''මේ විදියට වැස්සොත් අපිට ගමන කල්දාන්න වෙනවා. බලන්න දැනටම වතුර පාරේ සැර. මම හිතන්නෙ දවල් වෙද්දි වතුර පාර මීටත් වඩා සැර වෙයි.'' මැතිව් පැවසුවේ ක්ලෙවර්ගේ කීම අනුමත කරමිනි. එහෙයින් මම අපගේ කූඩාරමේ කවුළුව අසලට ගොස් ඉන් අවට නිරීක්ෂණය කළෙමි. එතැන් සිට බැලූ විට නේග්‍රෝ නදිය පැහැදිලිවම දැක ගත හැකි විය. එහි ජල මට්ටම අඩි කීපයකින් ඉහළ ගොස් තිබූ අතර දිය පාරේ වේගය ද මඳක් වැඩි වී තිබිණි.

එහෙත් මාගේ සිත වඩාත් නොසන්සුන් වූයේ එය දැකීමෙන් නොවේ. ඉවුර අසල සිදුවෙමින් පැවැති වෙනත් ක්‍රියාවක් දැකීමෙනි. අප සිටි කූඩාරම්වලට බොහෝ ඈතින් ඉවුර අසල ගොඩ ගසා තිබූ දුව කොටන් තොගයක් රතු ඉන්දියානු තරුණයෝ පිරිසක් යුහුසුළුව දිය පාර වෙත තල්ලු කරමින් සිටියහ.

''දැක්කද අර වැඩේ?'' මම මාගේ මිතුරන් කවුළුව අසලට කැඳවා ගතිමි. එහෙත් මින් පෙර ඔවුන් එය දැක නොතිබිණි.

''හොඳයි එහෙනම් මෙතනත් ඒ දේ සිද්ධ වෙනවා!'' ක්ලෙවර් පැවසීය.

''අපි ගිහින් බලමු.'' මැතිව් යෝජනා කළේ ය.

එහෙත් ලයිසැන්ඩර් මහතා ඒ පිළිබඳ ව එතරම් සතුටු වූයේ නැත. එහෙයින් අපි සිවුදෙනා එනම් ක්ලෙවර්, මැතිව්, ටෝර්නි සහ මම මහ වැසි නොතකා එහි දිව ගියෙමු.

අප එහි ළඟා වන විට රතු ඉන්දියානුවෝ විසිදෙනෙක් පමණ එහි රැස් වී සිටියහ. ඉදිරියෙන් ම දිව ගිය මැතිව් ජෙරාල් භාෂාවෙන් යමක් පවසමින් කෑගැසුවේ ය. ක්ලෙවර් සිය රයිෆලය ද රැගෙන විත් තිබුණෙන් ඔහු මැතිව් ද පසුකරමින් රතු ඉන්දියානුවන් අතරට ම ගමන් කළේ ය. ඉන්පසු රතු ඉන්දියානුවෙක් මැතිව් අසලට පැමිණියේ ය. ඔහු මෙම කණ්ඩායමේ ප්‍රධානියා හෝ අණ දෙන්නා වන බව මම වටහා ගත්තෙමි. ඔහු සහ මැතිව් අතර සංවාදය ඇති වූයේ ජෙරාල් භාෂාවෙනි. එහෙයින් එහි සිදුවූයේ කුමක් දැයි මම පසුව මැතිව්ගෙන් අසා දැන ගත්තෙමි.

ප්‍රථමයෙන් මැතිව් විමසා ඇත්තේ මේ දැව කඳන් කාගේ අවශ්‍යතාවක් මත මෙලෙස දියට දමන්නේ දැයි කියා ය. එවිට එම රතු ඉන්දියානුවා පැවසුවේ එය තමාට ඉහළින් එනම් සිය රජුගෙන් ලද අණක් පරිදි සිදු කළ බවය. එහෙයින් මෙම ගැටලුව විසදා ගත හැක්කේ මෙම සේවකයන් සමඟ නොවන බව අපි වටහා ගත්තෙමු. ඔවුන්ගේ කාර්යය මඳකට නවත්වන්න යැයි පවසා අපි රජු හෙවත් ගෝත්‍රික ප්‍රධානියා සොයා ගියෙමු. ගෝත්‍රික ප්‍රධානියාගේ වාසභවන ලෙස භාවිත වූ පැල්පතට වර්ෂාවෙන් තෙත බරිත වූ ඇඳුම් පැළඳුම්වලින් යුතුව අපි ඇතුළුවීමු. අප දුටු මහලු රතු ඉන්දියානුවා වික්ෂිප්ත වී යනු මම දුටුවෙමි. ඔහු අසල වැතිරී සිටි තරුණ බිරින්දෑවරු ද බියෙන් පසෙකට වූහ. ඉන්පසු මැතිව් ඔහු ඇමතීය.

''නායකතුමනි, අර දැව කොටන් කාගේ වුවමනාවකට ද ගඟට දාන්නෙ?'' මැතිව් පැවසුවේ ය.

''ඒක උඹලට වැඩක් නැතෙ! උඹලා ආපු කාරිය කර ගෙන මෙහෙන් පිටවෙලා පලයව්...'' ඔහු පැවසුවේ කෝපයෙනි.

''නෑ, ඒක අපිට බොහොම වැදගත්. මොකද මේ කැලෑව



මේ විදියට විනාශ කරන්න ඉඩ දෙන්න බෑ. ඒකෙ සීමාවක් තියෙන්න ඕනෙ. මෙකෙ බලපෑම අපිට වඩා දැනෙන්නෙ ඔහෙලට.'' මැතිව් පැවසීය. එහෙත් මුරණ්ඩු පෙනුමක් තිබූ මහලු වනචාරියා ඉන් තව තවත් කිපුණේ ය.

''අපේ වැඩවලින් උඹට වැඩක් නෑ සුදු මිනිහො.... මගේ යක්ෂයා කුපිත කරන්නැතිව මේ දැන් ම උඹලා මෙහෙන් පිටවෙන්න ඕනෙ... ඔව්! මෙ දැන්ම!!'' ඔහු ගිගිරුවේ ය.

''මුන්ව එළියට ඇදලා දාපියව්...'' ඔහු සිය සෙබළුන් කැඳවා අණ කළේ ය. එහෙත් ක්ලෙවර් ඊට ඉඩ නොතැබුවේ ය. සිය රයිෆලයෙන් අහසට වෙඩි මුරයක් තැබූ ඔහු ඉන් පසු එය ඉලක්ක කළේ ගෝත්‍රික ප්‍රධානියා වෙතයි. ඒ දැක ගෝත්‍රික ප්‍රධානියාගේ දෙබැම රැළි වැටිණි. නළලට සිහින් දා බිඳු නැඟුණු අතර ඔහු මරණ බියෙන් වෙව්ලා යනු මම දුටුවෙමි. මෙම සාමකාමී රතු ඉන්දියානුවන් සමඟ සටන් වැදීමට අපි කිසිසේත් අපේක්ෂා නොකළෙමු. ක්ලෙවර්ගේ රයිෆලය සිය රජු වෙත යොමුවනු දුටු ප්‍රචණ්ඩ තරුණ සෙබළු සිය දුනු, හී, මුගුරු පහළ දමා හුන්තැනම නතර වූහ. එහෙත් ක්ලෙවර්ගේ වෙඩි හඬින් කැළඹීමට පත් වූ ගම්වාසී සෙසු රතු ඉන්දියානුවන් මෙන් ම ලයිසැන්ඩර් මහතා ඇතුළු අපගේ සෙසු සේවකයෝ ද එහි දිව ආහ. ලයිසැන්ඩර් මහතා අත ද ගිනි අවියක් විය.

''උඹලා මේ කාලකණ්ණි වැඩේ නවත්තන් නැත්නම් අපිට සිද්ධ වෙනවා බලහත්කාරයෙන් හරි උඹලව නවත්වන්න.'' මැතිව් කෑගැසුවේ ය.

බොහෝ වේලාවක් නිහඬව අප දෙස බලා සිටි ගෝත්‍රික ප්‍රධානියා ඉන් පසු සිය හඬ අවදි කළේ බොහෝ යටහත් පහත් ලෙසයි.

''මෙක අපි කැමැත්තෙන් නෙමෙයි කරන්නෙ.'' ඔහු පැවසීය.

''එහෙනම් කාගෙ වුවමනාවකට ද මේක කරන්නෙ?''

''සුදු මිනිස්සුයි, කළු මිනිස්සුයි ගිනි බට පෙන්නලා අපිව

හය කරලා තමයි මේ දේ කරන්න කියලා අණ කළේ. අපි උන්ට ලී කොටන් කපලා නොදුන්නොත් උන් ගම්මානෙට ගිනි තියයි. අපේ ගෑනු උස්සන් යයි. මුලින් මම උන්ට යටත් වුණේ නෑ. මෙ ගහ කොළ කපන්න මගේ හිතේ කැමැත්තක් නෑ. උන් අන්තිමට අපේ ගම්මානෙට පැනලා මුළු ගම ම ගිනි තියලා විනාශ කළා. අපේ හුඟ දෙනෙක්ව ගිනි බට පත්තු කරලා මරලා දැම්මා.'' ඔහු පැවසුවේ තැතිගත් වෙව්ලනසුලු හඬකිනි. දූව ජාවාරම්කරුවන් හමුවේ මෙම ස්වදේශික වනචාරීන් බොහෝ අසරණ බව අපි වටහා ගත්තෙමු. එහෙයින් මොවුන් සමඟ සටන් කර එලක් නොවේ.

# දැව ජාවාරම්කරුවන් පසුපස

''හොඳයි එහෙනම් අපිට කියන්න, උඹලට මේ විදියට තර්ජනය කරන උන්ගෙ විස්තර. ඉතුරු හරිය අපි බලාගන්නම්...'' මැතිව් ගෝත්‍රික ප්‍රධානියා හට පැවසීය. එහෙත් ඔහුගේ මුහුණේ රැඳී තිබුණේ අවිනිශ්චිතභාවය මුසු බැල්මකි. එම බිහිසුණු දූව ජාවාරම්කරුවන් සමඟ සටන් වැදීමට අපට නොහැකි යැයි ඔහු සිතන්නට ඇතිවාට සැක නැත.

''සුදු මිනිහා, හැන්ස් ස්වින්සන්. කළු මිනිහා, සන්තියා. උන්ගෙ කල්ලිය තමයි මේ විනාසෙ කරන්නෙ.'' ඔහු පැවසීය. ''සන්තියා!'' මටත් ක්ලෙවර්ටත් කියැවුණේ එක්වරම ය. එසේනම් සන්තියා තවම සිය අණසක පතුරවමින් ඇමෙසන් ගංගාධාරයේ රජ කරයි. ඉන්පසු ගෝත්‍රික ප්‍රධානියාගේ පැල්පතෙන් පිටවී අපි අපගේ කූඩාරම වෙත පැමිණියෙමු.

''ඇලෙක්, මොකද කියන්නෙ? අපි මේක ඉවරයක් කරලා ඉන්නවද? නැත්නම් මේක තවත් පස්සට කල් දානවද?'' ක්ලෙවර් විමසුවේ මාගෙන් සෘජු පිළිතුරක් අපේක්ෂාවෙනි. මම දෙලොවක් අතර මංමුළා වීමි. එන්කි කුමරිය මා එනතුරු ඉන්කා රාජධානිය තුළ නොඉවසිල්ලෙන් බලා සිටින බව මම දනිමි. මම පමා වන්නා වූ සෑම මොහොතක් පාසාම ඇය තව තවත් මා නැති සොවින් පෙළෙනු ඇත. නමුත් මෙම අධම දූව ජාවාරම්කරුවන් මෙම ස්වභාවික සම්පත් විනාශ කර දමන අයුරු තවදුරටත් බලා සිටින්නේ කෙසේද?

''ක්ලෙවර්, අපි මේක කෙළවරක් කරලා ඉමු.'' මම ඔහුගේ උරහිස මත සුරත තබමින් පැවසුවෙමි. ඔහු සිය හිස ඉහළ පහළ සැලුවේ තීරණාත්මක ලෙසයි.

''ලයිසැන්ඩර් මහත්තයා කිව්වා නේද තානාපති කාර්යාලය හරහා මේ ගැන වගකිව යුත්තන්ට දැනුම් දුන්නා කියලා. මට නම් හිතෙන්නෙ ඒකෙන් වැඩක් වෙලා නෑ වගේ...'' ක්ලෙවර් පැවසීය.

''ඔව්... මේ වැඩේ පිටිපස්සෙ ආණ්ඩුවෙ លොක්කෙක්ගෙ

බලල් අතක් ඇති. නැත්නම් මෙච්චර සංවිධානාත්මකව භයක් සැකක් නැතුව මුන් එළිපිට වැඩ කරන්නෑ.'' මැතිව් පැවසීය.

''එහෙනම් අපිට ලැඩමියර්වත් තාවකාලිකව අමතක කරලා දාන්න පුළුවන්.'' ටෝර්නි පැවසීය.

''ලැඩමියර් ගඟ ඉහළට යාත්‍රා කළේ සමහරවිට අපි ගැන සෝදිසියෙන් ඉන්න වෙන්න ඇති. බලමුකො.'' ක්ලෙවර් පැවසීය.

''ක්ලෙවර් හිතන්නෙ අපි මෙක පටන් ගත යුත්තේ කොතනින් කියල ද?'' මැතිව් විමසීය.

''අපි මතක තියා ගන්න ඕනෙ මෙක එක ගම්මානයකට හරි දෙකකට හරි සීමා වුණු දෙයක් නොවෙන බව. විශේෂයෙන් මැනාඕස්වලින් ඉහළ තියෙන රතු ඉන්දියානු ගම්මාන තමයි මුන්ගෙ ග්‍රහණයට නතුවෙලා තියෙන්නෙ. ඒ නිසා අපි මෙක මෙතනින්ම පටන්ගමු... මැතිව් අර ගෝත්‍රික ප්‍රධානියාගෙන් අහල බලන්න උන් ආපහු එන්නෙ කවදට ද කියලා?'' ක්ලෙවර් පැවසීය.

එහෙයින් අපි නැවත ගෝත්‍රික ප්‍රධානියා විසූ පැල්පත වෙත ගමන් කළෙමු. ඔහු යහනේ වැතිර සිටියේ ය.

''උන් ආපහු එන දවසක් ඔහේට හරියට ම කියන්න පුළුවන් ද?'' මැතිව් විමසීය.

''ඔව්. උන් තව දවස් දෙක තුනක් ඇතුළත ආපහු එන්න ඉඩ තියෙනවා. හුඟ වෙලාවට කළු මිනිහා, සන්තියා තමා ගෝලයොත් එක්ක එන්නෙ. සුදු මිනිහා එන්නෙ කලාතුරකින්.'' ඔහු පැවසීය.

''උන්ට දෙන ලී කොටන්වලට හිලව් වෙන්න මෙහෙට මොනවද ලැබෙන්නෙ?'' මැතිව් විමසීය.

''හුඟ වෙලාවට මොනවත් ලැබෙන්නෙ නෑ. මෙක අපේ අවාසනාව. ඒ මදිවට උන් අපේ කොල්ලො කෙල්ලොත් වහල්කමට අල්ලගෙන යනවා...'' ගෝත්‍රික ප්‍රධානියා මැසිවිලි නැඟීය.

ඔහුගෙන් සමුගත් අපි නැවත කුඩාරමට විත් සන්තියා සහ





ස්ටීන්සන් යන බිහිසුණු මිනිසුන් දෙදෙනා සිදු කරන්නා වූ විනාශය නිමා කරන්නේ කෙසේ දැයි සැලසුම් කරන්නට වීමු. මේ සඳහා අපට නීතියෙන් යම් පිළිසරණක් හෝ සහයක් හෝ නොලැබෙන බව පැහැදිලිය. එහෙයින් එළැඹෙන්නා වූ සියලුම අන්තරායන් වෙත තනිව මුහුණ දීමට අපට සිදුවනු ඇත. නීතියේ රැකවරණය හමුවේ සුරතලුන් බවට පත් වී ඇති මෙම බිහිසුණු මිනිසුන් තමන්ට එරෙහිව නැගෙන සියලුම බාධක හොඳින් හෝ නරකින් ජය ගැනීමට උත්සාහ ගනු නියතය.

''ගෝත්‍රික ප්‍රධානියා කියපු හැටියට නම් තව දවස් දෙක තුනක් ඇතුළත සන්තියා මෙහෙ එන්න ඕනෙ. ඒ නිසා අපි දවසක් දෙකක් ඉවසමු. ඌ ආවොත් අපි ඌත් එක්ක කෙළින්ම කතාවට බහිමු. දෙයියම්පා! ඌ මට ඇහුම්කන් නොදී තුවක්කුවත් එක්ක ඔට්ටු වෙන්න හැදුවොත් මම ඌව ඉවරයක් කරලා දානවා. ඒක තමයි කැලෑවෙ නීතිය. අපි දැන් ඉන්නෙ කැලෑවෙ. ඒ නිසා කැලෑවෙ නීතිය ක්‍රියාත්මක කරන්න බය වෙන්න ඕනෙ නෑ.'' මැතිව් පැවසුවේ සිය රයිෆලය සුරතින් පිරිමදිමිනි.

''එහෙනම් අපි දවස් දෙක තුනක් මෙහෙ ඉමු.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ ය.

එදින මධ්‍යහ්නය එළැඹෙන තුරු අපි ගං ඉවුරේ ඒ මේ අත ඇවිදිමින් මෙම රතු ඉන්දියානුවන් විසින් සිදු කර ඇති වන විනාශය නිරීක්ෂණය කළෙමු. රෙඩ්වුඩ්, සෙඩර්, සිල්ක් කොටන් ආදී දැවැන්ත වෘක්ෂ බිම හෙළා තිබූ ආකාරය දැකීම පවා හද කම්පා කරවනසුලු ය. ගං ඉවුර අසල ගොඩගසා තිබූ දැව කඳන් තොග කිහිපයක්ම අපට දැකගත හැකි විය.

සැබැවින් ම ලොවෙහි දැව අවශ්‍යතාවය සපුරාලිය යුත්තේ වගකීමෙන් යුක්ත ව නිවැරැදි ක්‍රමවේදයක් අනුවය. එමෙන්ම නීත්‍යානුකූල ආකාරයටය. මෙලෙස අසරණ ගෝත්‍රික ජනයා පීඩාවට පත් කරමින් ඔවුන් ලවා මෙම ස්වභාවික සම්පත්වලට කරන විනාශය කිසිසේත් අනුමත කළ නොහැක. එමෙන්ම එය සාධාරණීකරණය කළ හැකි නොවේ.

# සැලැස්ම ව්‍යර්ථ වන ලකුණු

අපි මෙලෙස තවත් දින හතරක් රතු ඉන්දියානු ගම්මානයේ රැඳී සිටියෙමු. එමෙන්ම ගම්මානයට පැමිණෙන්නා වූ තැනැත්තන් පිළිබඳ නිරතුරු සෝදිසියෙන් සිටීමට අපගේ සේවකයන්ට නියම කළෙමු. එහෙත් සන්තියා හෝ ඔහුගේ සහචරයන් හෝ පැමිණියේ නැත. එහෙයින් අවසානයේ අපි මඳක් අධෛර්යවත් වීමු.

''මට හිතෙන්නෙ උන් කොහොමහරි දැනගන්න ඇති උන්ට විරුද්ධව අපි යුද්ධ ප්‍රකාශ කරපු බව. මොන ක්‍රමයකින් හරි උන්ගෙ කනට ආරංචිය ගිහින් තියෙනවා. එහෙම නැත්නම් උන් මෙහෙ නැවිත් ඉන්න විදියක් නෑ. සමහරවිට උන්ට පක්ෂපාති රතු ඉන්දියානුවො මේ ගම්මානයේ ඉන්නවා වෙන්න පුළුවන්. එහෙමත් නැත්නම් උන්ට දුර ඉඳලම අපේ බෝට්ටු දකින්න ලැබුණා වෙන්න පුළුවන්. අපරාදෙ අපේ කාලෙ නිකරුණේ අපතෙ ගියා.'' මැතිව් පැවසුවේ මැසිවිලි නගමිනි.

''තව එක දවසක් බලලා අපි අපේ ගමන යන්න පිටත් වෙමු.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ එදින රාත්‍රියේ ආහාර ගන්නා අතරතුරයි.

''ක්ලෙවර්ට මතකද අපේ පළවෙනි චාරිකාවෙදි අපි ගොඩ බැහැපු ඇටන් කියන රතු ඉන්දියානු ගම්මානයේදීත් අපිට මේ ගැන අහන්න ලැබුණා. සමහර විට අපිට එහෙදි මේ ගැන තවත් හොයලා බලන්න පුළුවන් වෙයි.'' මම පැවසුවෙමි.

''ඔව්, කොහොමත් උණ පතුරු මිල දී ගන්න අපිට ඇටන් රතු ඉන්දියානුවන්ව මුණගැහෙන්න සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසීය.

''ඒත් මතක තියාගන්න ක්ලෙවර්, ඇටන් රතු ඉන්දිය ගම්මානය තමයි සභ්‍ය ලෝකයේ අවසානය. එතැනින් එහා තියෙන්නෙ මිනී මස් කන වනචාරී ගෝත්‍රිකයන්ගෙ අඩවිය. ඒ





නිසා කරන දෙයක් බොහෝම කල්පනාවෙන්.'' ලයිසැන්ඩර් පැවසුවේ එහි ඇති අවදානම අපට යළි සිහිකරවමිනි.

පසු දින උදෑසන මැතිව් සිටියේ නොඉවසිල්ලෙන් දත්මිටි කමිනි. ඔහු අසහනයෙන් මෙන් අපගේ කූඩාරමේ වැතිර සිටියේ එකිනෙක පටලවා ගත් දෙපා නොනවත්වා චලනය කරමිනි.

''මේ සැරෙත් වැඩකටයුතු සිද්ධ වෙන්නෙ උන්ට වාසි වෙන විදියට නේද ඇලෙක්?''

''නෑ, මම හිතන්නෙ අපිට ඇටන් රතු ඉන්දීය ගම්මානයේ දී උන්ව මුණගැහෙයි.'' මම ඔහු අස්වැසුවෙමි.

එදින රාත්‍රියේ අපි ආහාර ගන්නා අතරතුර අපගේ ඉදිරි ගමන පිළිබඳ සාකච්ඡා කළෙමු.

''...එහෙම නැත්තම අපි තව සතියක් හරි මෙහෙ ඉඳලා උන්ව මුණගැහෙමු.'' මම පැවසුවෙමි. සැබැවින්ම මෙම තින්දින මිනිසුන් කරන්නා වූ විනාශය කෙසේ හෝ වළක්වාලිය යුතු යැයි මට සිතිණි.

''නෑ.. උන්ට අපි ගැන ආරංචිවෙලා නම් අපි මෙතන රැඳිලා ඉන්න එකේ තේරුමක් නෑ ඇලෙක්...'' ක්ලෙවර් පැවසීය.

''ඔව්. ඒ නිසා අපි හෙට උදෙන්ම මෙහෙන් පිටත් වෙමු.'' මැතිව් ද යෝජනා කළේ ය. අපි සැම එම තීරණයට එකඟ වීමු. එහෙයින් ඉන්පසු අපගේ සේවකයන් කැඳවා ඔවුන්ට ද ඒ බව දැනුම් දුන්නෙමු. එදින මා නින්දට ගියේ ව්‍යාකූල වූ සිතකින් යුතුවයි.

මම කූඩාරමේ වැතිරී අඩහෝරාවකට ආසන්න කාලයක් ගතවන්නට ඇත. කූඩාරමට පිටතින් ඇසුණේ කවුරුන් හෝ යටිගිරියෙන් කෑගසන හඬකි. මම වහා අවදි වීමි. මට මෙන් ම එම කෑගැසීම් හඬ මාගේ මිතුරන්ට ද ඇසී තිබිණි. අපි වහා නැඟිට කූඩාරමෙන් පිටතට පැමිණියෙමු. අපගේ කූඩාරමේ දොරටුව අසල කිණිස්සක් අතැතිව සිටගෙන සිටියේ පරා හිඳි අපගේ කණ්ඩායමට

බදවාගත් පීටර් නම් වූ අපගේ බ්‍රසීලියානු සේවකයා ය. ඒ අසලම මුණින් අතට බිම වැටී සිටියේ අපගේ තවත් සේවකයෙකි. ඔහු එඩ්මන් නම් වූයේ ය. එමෙන්ම ඔහුගේ සිරුර රුධිරයෙන් නැහැවී තිබිණි.

"පීටර්, මොනවද මෙතන සිද්ධ වුණේ?" මම විමසුවෙමි.

ඔහුගේ දෑසේ රැඳී තිබුණේ භීතියට හා තැතිගැන්මට පත් වූ ලකුණු ය.

"කියනවා... මෙතන මොකක්ද සිද්ධ වුණේ?" මැතිව් ඔහුගේ දෙළරෙන් අල්ලා පසෙකට කැඳවාගෙන ගියේ ය. මේ අතර මම මරණාසන්නව බිම වැතිර සිටි එඩ්මන් නම් වූ සේවකයා වෙත අවධානය යොමු කළෙමි. ඔහු පීටර් දෙස බලා යමක් පැවසීමට වැර දැරුව ද සජීවී හඬක් ලෙස එය මුවින් නොනික්මිණි. ඉන් පසු ඔහුගේ හිස එක් පසකට කඩා වැටුණේ ඉතා අවාසනාවන්ත ලෙසය. එඩ්මන් ඒ මොහොතේ මිය ගිය බව මම වටහා ගත්තෙමි. එනම් පීටර් විසින් එඩ්මන්ව ඝාතනය කර ඇත. මම එඩ්මන්ගේ මළ සිරුර අසලින් ඉවත්ව පීටර් වෙත හැරුණෙමි. ඒ වන විට ද මැතිව් ඔහු අත රැඳි කිණිස්ස බිම හෙළා තිබුණේ ය.

"පීටර්... උඹ මොකටද එඩ්මන්ව මැරුවෙ?" මම ඔහුගේ ගෙල එක් අතකින් තදින් ග්‍රහණය කරමින් පැවසුවෙමි.

"මං කියන දේ අහන්න මහත්තයා. මේක මම හිතලා කරපු දෙයක් නෙවෙයි..." ඔහු ගොත ගසන්නට වූයේ ය.

"හිතලා කරපු දෙයක් නෙවෙයි? එහෙනම්?" ක්ලෙවර් විමසීය.



# ඔත්තුකරුවෙක්

"ඔව්, මහත්තයා, මම මේක හිතලා කළේ නෑ. රෑ මම නින්දට යන්න කලින් නිකමට වගේ මහත්තයලගෙ කූඩාරම පැත්තට ඇවිදන් ආවා. එතකොට මම දැක්කා කවුදෝ මිනිහෙක් කූඩාරමේ තියෙන අර වා කවුළුවෙන් ඇතුළට එබිකම් කරනවා. මම නිශ්ශබ්දව එතනට ළං වෙලා මිනිහගෙ පිටට තට්ටු කළා. එතකොට ඌ මං දිහාවට හැරුණේ මෙන්න මේ කිණිස්සත් අමෝරගෙන. ඒක් වාසනාවකට වගේ මට පුළුවන් වුණා ඌගේ මාරාන්තික කිණිසි පහරින් මිදිලා කිණිස්ස තිබුණ අත තදින් ග්‍රහණය කරගන්න. ඉන් පස්සෙ අපි දෙන්නා අතර ඇති වුණේ මාරාන්තික ද්වන්ධ සටනක්. අන්තිමට කිණිස්ස උගේ අතින් ගිලිහිලා මගේ ග්‍රහණයට හතුවුණා. ඉතින් ඉන් පස්සෙ මට වෙන කරන්න දෙයක් ඉතිරි වුණේ නෑ." පීටර් පැවසුවේ ය.

"තමුසෙ කියන්නෙ එඩ්මන් කූඩාරමේ කවුළුවෙන් එබිකම් කළේ මොකක්හරි වැරදි චේතනාවකින් කියල ද?"

"ඔව් මට ඒ බව විශ්වාසයි. මට මුල ඉඳලම එඩ්මන් ගැන සැක හිතුණා. මට විශ්වාසයි මූ කාගෙ හරි ඔත්තුකාරයෙක් කියලා." පීටර් පැවසීය.

"ඇලෙක්, මේක අපි හිතනවට වඩා බොහොම භයානකයි. අපේ කණ්ඩායම ඇතුළෙම ඔත්තුකාරයෙක් හිටියා කියන එක මට නම් විශ්වාස කරන්නත් අමාරුයි. අපි අපේ සේවකයින් ගැන මීට වඩා සෝදිසියෙන් ඉන්න වෙනවා." ක්ලෙවර් පැවසුවේ මා පසෙකට කැඳවමිනි. අඳුරු රාත්‍රියේ සිදු වූ මෙම ඛේදජනක සිදුවීම හේතුවෙන් මාගේ මනස මුළුමනින්ම අවුල් ජාලාවක් බවට පත් විය. සිය මිතුරාට අත් වූ ඛේදජනක ඉරණම අසා සෙසු බ්‍රසීලියානුවෝ ද බෙහෙවින් කම්පාවට පත් වූහ. මියගිය බ්‍රසීලියානුවාගේ ඥාතීන් හට මෙම මරණය පිළිබඳ දන්වා සිටීමට වෙනත් ක්‍රමයක් නොවූයෙන් ගඟ පහළට යාත්‍රා කරන බෝට්ටුකරුවන් පිරිසක් අතේ ලිපියක් ලියා යැවීමට මම තීරණය කළෙමි.

• • • • • •

පසු දින උදෑසන අපි සේවක එඩ්මන්ගේ සිරුර අවමංගල්‍ය

චාරිත්‍ර ඉටුකිරීමෙන් අනතුරුව එම රතු ඉන්දියානු ගම්මානයේ භූමදානය කළෙමු. මෙම අනපේක්ෂිත සිදුවීමෙන් අපගේ ගමන ද තවත් එක් දිනකින් පමා විය.

''ඇලෙක් මහත්තයා...'' අපගේ බ්‍රසීලියානු සේවකයෙක් මා ඇමතුවේ එදින සවස මා ක්ලෙවර් සමඟ ගං ඉවුරේ පිහිටි දැවැන්ත වෘක්ෂයක් පාමුල තිබූ දැවමුවා බංකුවේ අසුන්ගෙන හිඳි මොහොතකය. ඔහු චාලි නම් වූ අතර මිය ගිය එඩ්මන්ගේ සමීපතමයා ඔහු විය.

''ඇයි?'' මම විමසුවෙමි.

''නෑ... මහත්තයා... මම ආවෙ එඩ්මන් ගැන මහත්තයා එක්ක ටිකක් කතා කරන්න...'' ඔහු තෙපළුවේ ය.

''එඩ්මන් ගැන? මොනවද?''

''එඩ්මන්ගෙ මරණෙ ගැන මට බොහොම කනගාටුයි මහත්තයා. ඒ වගේම මම කොහෙත්ම විශ්වාස කරන් නෑ පීටර් කියපු විදියට මහ රෑ එඩ්මන් කූඩාරමට එබිකම් කළා කියලා. මොකද මට හොඳටම විශ්වාසයි එඩ්මන් අවංක, පක්ෂපාති සේවකයෙක් කියන කාරණය. මේ වනතුරුත් එඩ්මන් කිසිම දවසක තමන්ට පැවරිලා තිබුණු රාජකාරි ඉටු නොකර හිටියෙ නෑ. ඒ හැම දෙයක්ම බොහොම කැපවීමෙන් ඉටු කළා. ඒ විතරක් නෙවෙයි, ඊයෙ රෑ මේ අවාසනාවන්ත සිද්ධිය වුණු වෙලාවෙ එඩ්මන්ටයි පීටර්ටයි නියමවෙලා තිබුණෙ මහත්තයලගෙ කූඩාරම අවට භූමිය පිළිබඳ සෝදිසියෙන් ඉන්න එක. ඒ නිසා මට විශ්වාසයි පීටර් කියපු විදියෙ දෙයක් මෙතන සිද්ධ වුණේ නෑ කියන එක. විශේෂයෙන් අර දැව ජාවාරම්කාරයො ගම්මානයට එයි ද කියන එක ගැන හොඳ සෝදිසියෙන් ඉන්න අපිට සිද්ධ වුණා. ඒ නිසා මම හිතන්නෙ මෙතන අපි නොහිතන විදියෙ දෙයක් සිද්ධ වෙලා තියෙනවා කියලයි. මම මෙහෙම කිව්වා කියලා වෙන කාටවත් දැනගන්න ඉඩ තියන්න එපා මහත්තයා. මේක මගේ හිතේ ඇතිවුණ සැකයක් විතරයි.'' එසේ පැවසූ චාලි එතැනින් නික්ම ගියේ ය.

ඔහු පිටත්ව ගිය පසු මම ක්ලෙවර් වෙතට හැරුණෙමි. ඔහුගේ නළල රැලි ගැන්වී මුහුණට බැරෑරුම් ස්වරූපයක් ආරූඪ වී තිබිණි.

# කුමන්ත්‍රණයක් ද?

''චාලි කියපු කතාවෙත් ඇත්තක් තියෙනවා ඇලෙක්.'' ක්ලෙවර් පැවසීය.

''ඔව්. මමත් ඒ ගැන තමයි කල්පනා කළේ. එඩ්මන් මීට කලින් කවදාවත්ම විශ්වාසය කඩවෙන විදියට වැඩ කරලා නෑ. ඒ විතරක් නෙවෙයි, පීටර් කියපු විදියට ඊයෙ රෑ මේ දෙන්නා අතර කිණිස්ස ලබා ගන්න පොරබැදීමක් සිද්ධවෙලා තියෙනවා. ඒත් මට හොඳටම විශ්වාසයි එහෙම දෙයක් සිද්ධ වුණේ නැති බව. මොකද මට ඒ වෙලාවෙ නින්ද ගිහින් තිබුණෙ නෑ. පීටර් කියපු විදියෙ පොර බැදීමක් සිද්ධ වුණා නම් මට ඒ හඬ නෑහෙන්න විදිහක් නෑ. මට ඇහුණෙ එඩ්මන් මරණ වේදනාවෙන් යටිගිරියෙන් කෑගහපු හඬ විතරයි. ඒ නිසා අපි මේ හැම දෙයක් ගැනම බොහොම අවදියෙන් ඉන්න වෙනවා. පීටර් තමන්ගෙ පරණ කෝන්තරයක් මේ මුවාවෙන් පිරිමහ ගත්තා වෙන්නත් පුළුවන්.''

''මටත් එහෙම හිතෙනවා... කොහොමටත් අපි හෙට උදේත්ම මෙහෙන් පිටත් වෙමු... මේ සේවකයන්ගෙ ප්‍රශ්න නිසා සත්තියා ගැන තියෙන අවධානය අඩු වෙන එක ඒ තරම් නුවණට හුරු දෙයක් නෙවෙයි. ඒකෙන් වෙන්නෙ අපි වෙන මහන්සිය අපතෙ යන එක විතරයි.'' ක්ලෙවර් පැවසුවේ ය.

සැබැවින්ම අපි අපගේ මුඛ්‍ය පරමාර්ථයෙන් දුරස් වී නොසිටින්නෙමු ද? එත්කී කුමරිය මෙන්ම මුළු මහත් ඉන්කා පුරවරයම අප පිළිගැනීමට සූදානමින් මඟ බලා සිටින්නාක් මෙන් මට දැනේ. එහෙයින් මෙවන් වූ අනපේක්ෂිත ඛේදජනක සිදුවීම් මින් මතු සිදු නොවේවා යැයි මම ප්‍රාර්ථනා කළෙමි.

පසු දිනට පහන් විය. අපි අපගේ සියලුම බඩුබාහිරාදිය ද රැගෙන, එම රතු ඉන්දියානුවන්ට සමු දී ගම්මානයෙන් පිටවීමු. බෝට්ටු යුගල භාරව සිටි සේවකයන් දෙදෙනා ද ඇතුළුව මේ වන විට අපගේ කණ්ඩායම දාහතර දෙනෙකුගෙන් සමන්විත විය. මෙලෙස අපි තවත් දින ගණනාවක් මුළුල්ලේ නොනවත්වා ඉදිරියට

යාත්‍රා කළෙමු. ඒ අතරතුර තවත් රතු ඉන්දියානු ගම්මාන කිහිපයක් හමුවුව ද අපි ගඟ මධ්‍යයෙන් යාත්‍රා කළ බැවින් එම ගම්මාන පිළිබඳ වැදගත් තොරතුරු කිසිවක් දැනගැනීමට ඉඩ නොලැබිණි. එහෙත් අපි නිරතුරුවම අපගේ දෙනෙතිවලින් ගං ඉවුරු පරීක්ෂා කළෙමු. ඉවුරු දෙපස ගොඩගසන ලද දැව කඳන් තොග දැක ගැනීමට ලැබේ යැයි අප විශ්වාස කළ ද වාසනාවකට මෙන් මෙතෙක් එවැන්නක් අප නෙත නොගැටිණි.

''සමහරවිට මේ ගම්මාන උන්ට යටත් කරගන්න බැරි වෙන්න ඇති. එහෙමත් නැත්නම් ඉතා සූක්ෂමව දැව ජාවාරම සිද්ධ වෙනවා වෙන්න පුළුවන්.'' ලයිසැන්ඩර් මහතා පැවසීය. පසුගිය දින කිහිපයේ දරුණු සෙම්ප්‍රතිශ්‍යා උණකට ගොදුරු වී සිටියෙන් ලයිසැන්ඩර් මහතා සිටියේ එතරම් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් නොවේ.

''මේ ප්‍රශ්න නිසා අපිට ලැඩමියර් ගැන අමතක වුණා නේද ඇලෙක්?'' මැතිව් පැවසුවේ යථෝක්ත රතු ඉන්දිය ගම්මානයෙන් ගමන් අරඹා එළැඹි සත්වැනි දින රාත්‍රියේ දී ය. සැබැවින්ම ඔහු මාගේ මතකයෙන් ඈත්ව යමින් සිටියේ ය.

''ඒත් අපිට ඒ ගැන සුළුවෙන් තකන්න බෑ... සමහරවිට ලැඩමියර් බලාපොරොත්තු වෙන්න ඇති ගඟ ඉහළට යාත්‍රා කරලා අපි ගැන සෝදිසියෙන් ඉන්න.'' මම පැවසුවෙමි.

''ඔව්... එහෙම වෙන්නත් පුළුවන්. එහෙනම් අපේ ප්‍රමාදය ගැන මිනිහා දැන් කලබල වෙලා ඇති...'' ක්ලෙවර් පැවසීය.

එදින දිවා කාලයේ අධික උෂ්ණ කාලගුණයක් පැවතියෙන් රාත්‍රියේ වර්ෂාවක් ඇදහැලීමට ඉඩ ඇතැයි ලයිසැන්ඩර් මහතා විසින් අනතුරු ඇඟවිය. එය සැබෑවක් බවට පත් කරමින් අඳුරු අහස් කුස දෙබෑ කරමින් විදුලි කෙටීම ඇරැඹුණු අතර තවත් මිනිත්තු කිහිපයක් ගත වන විට මහා වර්ෂාවක් ඇද හැලිණි. අපි අපගේ යාත්‍රා ගං ඉවුර අසලට පදවා, නැංගුරම් ලා, ගං ඉවුරේ අපේ කූඩාරම් අටවා ගත්තෙමු.





අප කූඩාරම් අටවාගත් එම පෙදෙස මිනිස් වාසයෙන් තොර වූ බවක් පෙනිණි. එහෙයින් ඝන වනාන්තරයේ වෙසෙන බිහිසුණු වන මෘගයකුගෙන් මිස ම්ලේච්ඡ වනචාරී මිනිසුන්ගෙන් අපට ප්‍රහාරයක් එල්ලවීමේ අවධානමක් නොතිබිණි. අපගේ කූඩාරම් තුළ පවා රැඳී සිටීමට නොහැකි තරමට වර්ෂාව ප්‍රචණ්ඩ වූයේ ය. කූඩාරම් භූමිය මධ්‍යයෙන් ද ජල ධාරාවන් ගලා යන්නට වූයෙන් ඒ තුළ රැඳී සිටීම එතරම් ප්‍රියජනක කාර්යයක් නොවූවේ ය.

වර්ෂාව මඳක් හෝ තුරල් කළේ පසු දින අලුයම පහට පමණ ය. නිදිවර්ජිතව පහන් කළ එම ශීතල වැසිබර රාත්‍රිය මට කිසිදා අමතක නොවනු ඇත. උදෑසන හයට පමණ අපි නැවත ගමන් ඇරඹීමු. මෙලෙස අපි තවත් දින ගණනාවක් ඉහළට යාත්‍රා කළෙමු. එහෙත් මේ වන තුරු අපට පෙර වාරයේ ගොඩබට ඇටන් රතු ඉන්දියානුවන්ගේ ගම්මානයට ළඟාවීමට නොහැකි විය.

''බලන්න ඇලෙක්, තවම ගං ඉවුරු තියෙන්නෙ එකිනෙකට සැතපුමක් විතර දුරින්. හැබැයි දැන්නම් ඇටන් රතු ඉන්දියානුවන්ගෙ ගම්මානයට ළඟ ඇති. ඒ නිසා අපි දකුණු ඉවුරට ළඟින් ගමන් කළොත් හොඳයි...'' ලයිසැන්ඩර් මහතා යෝජනා කළේ ය. එහි ඇති වැදගත්කම අපට ද අවබෝධ විය. ඉන්පසු අප යාත්‍රා කළේ දකුණු ඉවුරට ආසන්නවය.

kathapothak.blogspot.com

# ඇටන් රතු ඉන්දියානු ගම්මානයේ දී

පෙර වාරයේ ගොඩබසින ලද ඇටන් රතු ඉන්දිය ගම්මානය වෙත අප ළඟා වූයේ තවත් දින දෙකකට පසුවය. විශාල දුම කඳන් තොගයක් එහි ඉවුර අසල ගොඩ ගසා ඇති අයුරු බොහෝ දුර සිටම දැකගත හැකි විය.

''මෙහෙ නම් බොහොම දරුණුවට වන විනාශය සිද්ධ වෙනවා වගේ...'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ අප එහි ළඟාවත්මය.

අපගේ යාත්‍රා යුගල එහි තොටුපොළ වෙත ළඟාවත්ම විසිදෙනකුගෙන් පමණ සමන්විත වූ රතු ඉන්දියානුවෝ පිරිසක් එහි රැස්වූහ. ඔවුහු සත්ත්ව සමෙන් සැදි යටි කය ආවරණ හැඳ සිටි අතර රතු, කහ සහ සුදු වර්ණයන්ගෙන් සිය සිරුරු සහ මුහුණු වර්ණ ගන්වාගෙන සිටියහ. ඇතැම් විට පෙර වාරයේ අප දැක තිබූ හැකැන්කන් ද ඒ අතර සිටින්නට ඇත. මෙවර ද රතු ඉන්දියානුවන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ භාරදූර කාර්යය අපි මැතිව් හයිග්‍රේව් හට භාර කළෙමු. ප්‍රථමයෙන් ඔහු අප කවුරුන්දැයි යන්න ස්වදේශික රතු ඉන්දියානුවන්ට පැහැදිලි කර දුන්නේ ය. ඉන්පසු ස්වදේශිකයන් අතර යම් කසුකුසුවක් ඇති වූ අතර ඔවුන් අප පිළිගැනීමට සූදානම් බව පෙනිණි. අප සැම බෝට්ටුවලින් බැස ගත්තේ ඉන් පසුවය.

''සමහරවිට මුන්ට අපේ මුහුණු මතක ඇති. අපි පුළුවන් තරම් ඉක්මනින් ගෝත්‍රික ප්‍රධානියාව මුණගැහෙන්න ඕනෙ.'' ලයිසැන්ඩර් මහතා යෝජනා කළේ ය.

''ඒක හොඳයි... මොකද මේ දුම ජාවාරම ගැන මට ප්‍රශ්න කරන්නත් පුළුවන්.'' මැතිව් ද එය අනුමත කළේ ය.

මැතිව් නොපමාව අපගේ අදහස රතු ඉන්දියානුවන් වෙත ඉදිරිපත් කළේ ය. එයට යහපත් ප්‍රතිචාර ලැබිණි. ඔවුහු අප කැඳවාගෙන තරමක් විශාලව ඉදිකරන ලද පැල්පතක් අබියසට ගමන් කළහ. ඉන් ඉවතට පිවිසියේ පෙර වාරයේ අප දැක තිබූ අපට හුරු පුරුදු මහලු ගෝත්‍රික ප්‍රධානියා නොවේ. මොහු තරුණයෙක් වූයේ ය.

''මෙහෙ රජු ඔබ ද?'' මැතිව් ජෙරාල් භාෂාවෙන් විමසීය.



''ඔව්... උඹලට මගෙන් මොනවද දැන ගන්න අවශ්‍ය?'' රජු තෙපළීය.

''කලින් හිටපු මහලු රජු දැන් කොහේද ඉන්නෙ?'' ලයිසැන්ඩර් මහතාගේ ඉල්ලීම මත මැතිව් විමසීය.

''එයා මැරුණා, සතියකට කලින්. මම තමයි එයාගෙ වැඩිමහල් පුතා. දැන් මමයි මෙහෙ නායකයා.'' රතු ඉන්දියානුවා පැවසීය.

''අර දුම ජාවාරමට ඇයි ඉඩ දෙන්නෙ?'' මැතිව් සෘජුවම කාරණාවට අවතීර්ණ වූයේ ය. ස්වදේශික ප්‍රධානියාගේ දෑස කෝපයෙන් රත් පැහැ ගැන්වෙනු මම දුටුවෙමි.

''මම ඉඩ දීලා නෑ... කවුද උඹලට එහෙම කිව්වෙ? ඒවට මගෙන් ඉඩක් නෑ. ඔය පාහර කළු මිනිහා එනකල් තමයි මම බලන් ඉන්නෙ? එක්කො මරණය! නැත්නම් ජයග්‍රහණය!'' ඔහු පැවසුවේ කර්කශ හඬකිනි.

''ඒක හොඳයි. අපිටත් ඕනෙ කරලා තියෙන්නෙ ඒ කළු මිනිහා සත්තියාව තමයි.'' මැතිව් පැවසීය.

• • • • • •

''මට විශ්වාසයි අද හෙට ම උන් මේ පැත්තට එනවා. මොකද තමන්ගෙ වචනෙට පිටින් මැස්සෙක්වත් යනවට සත්තියා කැමති නෑ. අන්න ඒ නිසා අපිට උන්ගෙ පැමිණීම බලාපොරොත්තු වෙන්න පුළුවන්.'' ලයිසැන්ඩර් පැවසීය.

එහෙත් එය අප අපේක්ෂා කරන අයුරින් සිදුවේ දැයි යන්න පිළිබඳ මාගේ සිතේ පැවතියේ අවිශ්වාසය මුසු හැඟීමකි.

''මම අපේ සේවකයින්ට දැනුම් දුන්නා අපේ බෝට්ටු කාටවත් නොපෙනෙන හැටියට ඉවුරෙ ආරක්ෂිත තැනකට ගෙනියන්න කියලා.'' ක්ලෙවර් පැවසීය.

''ඔව්. මීට ටිකක් එහායින් ගහකොළෙන් වැහුණු හොඳ ආරක්ෂිත තැන් තියෙනවා. කොහොමටත් අපේ බෝට්ටු ඉවුරේ තියෙනවා දැක්කොත් උන් පසුබහින්න ඉඩ තියෙනවා. එහෙම වුණොත් අපිට කිසිදවසක උන්ව අපේ දැලට කොටු කරන්න ලැබෙන් නෑ.'' මම පැවසීමි.

''ඒක නම් මම හරියට කියන්න දන්නෙ නෑ. ඒත් කොයි රටෙත් ඉන්නවනෙ ජාතිද්‍රෝහීන්. ඉතින් මේ නොදියුණු ස්වදේශිකයින් අතරත් ඒ වගේ අය නෑ කියලා අපි කොහොමද කියන්නෙ?'' ක්ලෙවර් පැවසීය.

''එහෙමත් නැත්නම් උන් අපට නොදැනෙන්න අපි ගැන සොඳිසියෙන් ඉන්නවා වෙන්නත් පුළුවන්. ඒ නිසා මට නම් හිතෙන්නෙ අපි මෙහෙ ඉන්නතුරු කවුරුවත් මේ ගම්මානයට එන්නෙ නෑ කියලයි.'' මම පැවසීමි.

එහෙත් අපගේ උපකල්පනයන් සියල්ල බිඳ හෙළමින් එදින සන්ධ්‍යාවේ ගඟ පහළ සිට ගම්මානය දෙසට පැමිණෙන බෝට්ටුවක රුව මා නෙත ගැටිණි. මම ඒ පිළිබඳව සියල්ලන්ම දැනුවත් කළෙමි.

''ඇලෙක්, මට පේන්නෙ ඒකෙ මිනිස්සු හතර පස්දෙනෙක් විතර ඉන්නවා වගේ.'' ක්ලෙවර් පැවසීය.

''මුලින්ම අපි මේ පැල්පත්වල හැංගිලා මෙතන මොනවද සිද්ධ වෙන්නෙ කියලා බලමු. ඉන්පස්සෙ අපිට පුළුවන් උන්ව යටත් කර ගන්න.'' ක්ලෙවර් යෝජනා කළේය. ශූර දඩයක්කරුවකු වූ මැතිව් ද එය වඩාත් ප්‍රඥාගෝචර ක්‍රියාවක් බැව් පැවසීය. ඉන්පසු අපි තොටුපළ පෙනෙන සීමාවේ වූ ස්වදේශික පැල්පත් තුළ සැඟවී ගතිමු.

තවත් මිනිත්තුවක් හෝ දෙකක් ගත විය. මම සැඟවී සිටි පැල්පතේ කුඩා වා කවුළුවකින් තොටුපළ දෙස බලා සිටියෙමි. මා සිටි පැල්පතේ ලයිසැන්ඩර් මහතා ද රැඳී සිටියේ ය. කර්කශ හඬක් නඟමින් තොටුපළට ළඟා වූ යාත්‍රාව එහි ගැටිය අසල නැවතිණි. එහි පැමිණියවුන්ගේ මුහුණු මා ප්‍රථම වරට දුටුවේ ඒ මොහොතේදීය.

සන්තියා එහි ඉදිරිපසින්ම වූ අතර තවත් නීග්‍රෝ ජාතිකයෝ දෙදෙනෙක් සහ මිශ්‍ර ජාතිකයෝ තිදෙනෙක් ඔහු සමඟ වූහ. යාත්‍රාව ඉවුරට ළංවූ සැණින් ඉන් ඉවතට පැනගත් මෙම දාමරික පිරිස සෘජුව ගමන් ගත්තේ ගෝත්‍රික ප්‍රධානියාගේ පැල්පත වෙතයි.



# මේක තමයි කැලෑවෙ නීතිය...

සන්තියා ගෝත්‍රික ප්‍රධානියාගේ පැල්පත දෙසට ගමන් ගන්නට වූයෙන් මාගේ සිත මදක් සලිත විය. ඒ එම පැල්පත තුළ අපගේ කිසිවෙකු සැඟවී නොසිටින බැවිනි. එමෙන්ම සන්තියාගේ සුරතෙහි රිවෝල්වරයක් රැඳී තිබෙනු මම දුටුවෙමි.

''ලයිසැන්ඩර් මහත්තයා, උං ගෝත්‍රික නායකයගෙ පැල්පත පැත්තටයි ගියේ.'' මම පැවසුවෙමි.

''උංගේ ගෝලයො කොහේද ඉන්නෙ?''

''අර ඉන්නෙ උන් බෝට්ටුව ළඟ. ඒත් දෙන්නෙක් සන්තියත් එක්ක අර පැල්පත පැත්තට ගියා.''

අපට අපගේ අනෙක් මිතුරන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාවක් ද නොතිබිණි. එහෙත් ක්ලෙවර් සහ මැතිව් කළ යුතු වැදගත්ම දෙය නොපමාව කරනු ඇතැයි යන විශ්වාසය මා තුළ විය. සන්තියාගේ රිවෝල්වරය හමුවේ ස්වදේශික ගෝත්‍රික ප්‍රධානියා අසරණ වනු දැකීමට මම අකමැති වීමි.

''ලයිසැන්ඩර් මහත්තයා, අර බෝට්ටුව ළඟ ඉන්න උන් ගැන බලා ගන්න. උන් කලබල කළොත් කිසිම සමාවක් දෙන්න එපා. මම අර පැත්තට යන්නම්.'' එසේ පැවසූ මම රැඳී සිටි පැල්පතෙන් ඉවතට පිවිසී සන්තියා ගමන් ගත් දිශාව වෙත ගමන් කළෙමි. මා ඉන් පිටවන විට ලයිසැන්ඩර් මහතා ද රිවෝල්වරයක් රැගෙන තොටුපළ දෙසට දිවයනු මම දුටුවෙමි. මම අතරින් පතර පිහිටා තිබූ පැල්පත්වලට මුවාවෙමින් සන්තියා වෙත බෙහෙවින් සමීප වීමි. දැන් ඔවුන් සහ මා අතර ඇත්තේ යාර විස්සක පමණ පරතරයක් පමණි. මෙම කාලවර්ණ මිනිසාගේ ආගමනයෙන් බිය වූ රතු ඉන්දියානු කතුන් සහ ළමයින් නැඟී ගෙන කලබලයෙන් ඒ මේ අත දිවයනු මම දුටුවෙමි. එමෙන්ම හෙල්ල, පළිහ වැනි නොදියුණු ආයුධවලින් සන්නද්ධව සිටි රතු ඉන්දියානු තරුණයෝ

හුන් තැන්වලම ගල්ගැසී බලා සිටියේ කුමක් කරන්නේ දැයි සිතාගත නොහැකිව විය යුතුය.

අවසානයේ ඔවුහු ගෝත්‍රික ප්‍රධානියාගේ පැල්පත අසලට ළඟා වූහ. මම ඊට යාර විස්සක් පමණ ඈතින් පිහිටි පැල්පතක් පසුපස සැඟවී ගතිමි. සන්තියා එහි දොරටුවෙන් ඇතුළුවීමට තැත් කරත්ම ඉන් ඉවතට පිවිසියේ හෙල්ලයක් අතැතිව සිටි තරුණ ගෝත්‍රික ප්‍රධානියාය. ඉන්පසු සන්තියා ගෝත්‍රික ප්‍රධානියා හට උස් හඬින් යමක් පැවසීය. නමුත් ඒ රතු ඉන්දියානුවන්ගේ මවු භාෂාවෙනි.

''මම නොපිව ඉවරයක් කරනවා.'' ඔහු ඒ මොහොතේ පැවසුවේ එයයි. මම එය පසුව මැතිව්ගෙන් විමසා දැනගත්තෙමි. ඉන්පසු එළැඹියේ තීරණාත්මක මොහොතකි. සන්තියාගේ රිවෝල්වරය රැදි සුරත ඉහළට එසැවිණි. ඒත් සමගම තරුණ රතු ඉන්දියානුවාගේ තියුණු හෙල්ල ඉහළ පහළ ගියේ විදුලි වේගයෙනි. මම මාගේ ගිනි අවිය සන්තියා වෙත ඉලක්ක කළෙමි. සිදුවන්නේ කුමක්දැයි වටහා ගැනීමටත් ප්‍රථම ඇසුණේ කන් බිහිරි කරවනසුලු වෙඩි හඬකි.

එහෙත් ඒ උණ්ඩය නිකුත් වූයේ මාගේ ගිනි අවියෙන් නොවේ. දුටු දසුනෙන් නෙත ඉවතට ගැනීමට පෙර සන්තියා කපාහෙළූ ගසක් මෙන් බිම ඇද වැටුණේය. ඉන් හිතියට පත්වූ ඔහුගේ සහචරයින් දෙදෙනා ආපසු හැරුණේ තොටුපොළ වෙත දිව යෑමට විය යුතුය. එහෙත් ඊට ඉඩ නොලැබිණි. ඔවුන්ට නුදුරින් පිහිටා තිබූ පැල්පතක් තුළින් ඉවතට පිවිසියේ රයිෆලයක් අතැතිව සිටි ක්ලෙවර්ය. ඉන් අනතුරුව අපි සැඟවී හුන් තැන්වලින් ඉවතට පිවිසියෙමු.

''මම තව එක තත්පරයක් ප්‍රමාද වුණා නම් සන්තියා රිවෝල්වරයෙ කොකා ගස්සනවා.'' මැතිව් පැවසුවේ අපට නුදුරින් පිහිටි තවත් පැල්පතක් තුළින් ඉවතට පැමිණෙමිනි. ඔහුගේ උණ්ඩයෙන් සන්තියාගේ වම් කලවයට බරපතළ ලෙස හානි වී තිබිණි. එමෙන්ම ලයිසැන්ඩර් මහතා ඒ වන විට ද යාත්‍රාව අසල සිටියවුන් සිය අත්අඩංගුවට ගෙන තිබුණේ ය. අපි ඔවුන් සැම





දෑත් දෙපා බැඳ පැල්පතක් තුළ සිර කළෙමු. සිරුරෙන් අධික ලෙස රුධිරය වහනය වීම හේතුවෙන් සන්තියා සිටියේ සිහිමූර්ජා වීමට ආසන්නවය. ක්ලෙවර් ඔහු අසලට ගියේ එවන් මොහොතකය.

''සන්තියා, උඹට අපිව මතක ඇති නේද? අදින් පස්සෙ උඹෙ සෙල්ලම් ඉවරයි.'' ක්ලෙවර් පැවසීය. ඊට අවඥාසහගත ලෙස පිළිකුල් දනවනසුලු දසන් විදහා සිනාසුණු සන්තියා යමක් කීමට තැත් කළේය. එහෙත් දුර්වලව සිටි ඔහුගේ මුවින් එය සජීවී හඬක් ලෙස නොනික්මිණි.

# ලැඩමියර් නැවත පැමිණෙයි

එම බිහිසුණු මිනිසුන් පැල්පතක් තුළ සිරකර දැමූ පසු අපි රැස්වී මින් ඉදිරියට කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳ ව සාකච්ඡා කළෙමු.

"මට හිතෙනවා මුන්ව මෙතනම ඉවරයක් කරලා දාන්න. අපි කොහොමද නීතිය ගැන විශ්වාසයක් තියන්නෙ?" මැතිව් පැවසුවේ ය.

"ඔව්, මටත් එහෙම හිතෙනවා. ඒත් අපි ඉක්මන් වෙන්න නරකයි. උත්සාහ කළොත් අපිට මුන්ගෙන් තවත් වැදගත් තොරතුරු දැනගන්න බැරිවෙන එකක් නෑ." ක්ලෙවර් අදහස් දැක්විය.

"ඒත් කරන දෙයක් පරිස්සමෙන් ක්ලෙවර්. මොකද, අමතක කරන්න එපා අපි තවමත් ශිෂ්ටසම්පන්න ලෝකයෙන් බැහැරවෙලා නැති බව. ඒ නිසා දුරදිග නොබලා තීරණ අරන් අපි අනවශ්‍ය කරදරයක පැටලෙන්නත් ඉඩ තියෙනවා. නිරපරාධෙ මිනීමරුවො වෙන්න ඕනෙ නැහැනේ!" ලයිසැන්ඩර් මහතා පැවසීය.

මෙලෙස ක්‍රමයෙන් රාත්‍රිය එළැඹියේය. අපි ගං ඉවුරේ දල්වන ලද ගිනි මැලයක් වටා රැස්වී සිටියෙමු.

"මොකක්ද ඒ හඬ...? මට හිතෙන්නෙ බෝට්ටුවක් වගේ." රොබින් පැවසුවේ හුන් තැනින් නැගී සිටිමිනි.

"ඔව්, ඒක බෝට්ටුවක් තමයි. මට පේන හැටියට ඒක එන්නෙ මේ පැත්තට." මම පැවසුවෙමි.

ඉන්පසු අපි අපගේ කූඩාරම වෙත දිව ගොස් ආයුධ සන්නද්ධව යළි පැමිණියෙමු. ඒ වන විට එය ගම්මානයට යාර දෙසීයක් පමණ ඈතින් ගම්මානය දෙසට යාත්‍රා කරමින් තිබිණි.

"කන්නියගෙ මිනිස්සුද දන්නෑ." ක්ලෙවර් විමසීය.





"ඔව්, වෙන්න පුළුවන්. ස්වදේශිකයන්ටත් මම මේ ගැන කිව්වා. කොකටත් සූදානමෙන් ඉන්න එක හොඳයි." මැතිව් පැවසීය.

"එහෙනම් අපි උන්ට නොපෙනෙන විදියට හැංගිලා ඉන්න එක හොඳයි." ක්ලෙවර් පැවසීය.

නිසල රැයේ පැවති මිහිරියාව බිඳිමින් කර්කශ හඬක් නගමින් ගම්මානය වෙත පැමිණි යාත්‍රාව තොටුපළට තව තවත් සමීප විය. එහි සුදු මිනිස්සු සයදෙනෙක් සිටියහ. එහෙත් මා විමතියට පත් වූයේ ඒ පිළිබඳව නොවේ. ඔවුන් අතර ලැඩමියර් නම් ඔත්තුකරුවා ද සිටිනු දැකීමෙනි.

ගං ඉවුරට බොහෝ සමීප වූ යාත්‍රාව නතර විණි. ඉන් අනතුරුව අප දුටුවේ ඔවුන් ගං ඉවුර වෙත ගොඩවීමට උත්සාහ ගන්නා අයුරුයි. මැතිව් අතින් සංඥා කළෙන් අපි වහා එහි දිව ගියෙමු. ප්‍රථමයෙන් ක්‍රියාත්මක වූයේ මැතිව්ගේ ගිනි අවියයි.

හිස් අහසට වෙඩි මුරයක් තැබූ මැතිව් ඔවුන් වෙත තව තවත් සමීප වූයේය.

"උඹලා කවුද?" මම ගිනි අවිය ඔවුන් වෙත මානමින් කෑගැසුවෙමි. එක්වරම අඳුරු තුරුගොමු අතරින් මතුවූ අප දැකීමෙන් ඔවුන් තුෂ්ණීම්භූතව යනු මම දුටුවෙමි. අවසානයේ අපි ඔවුන් යටත් කර ගං ඉවුරේ දල්වා තිබූ ගිනි මැලය අසලට කැඳවාගෙන ගියෙමු. ඔවුන් ඇමරිකානුවන් වූ බව පෙනිණි.

"උඹලා කවුද? මොකටද මේ රෑ මෙහෙ ආවෙ? උඹලා ආවෙ උඹලගෙ අනින් උන්ව බේරගන්න නම් ඉතින් ඒකට බොහොම ප්‍රමාද වැඩී." මැතිව් පැවසීය. ඉන්පසු ඔහු ස්වදේශිකයන් කැඳවා ලැඩමියර් ඇතුළු පිරිසගේ දෑත් දෙපා බැඳ දමන ලෙස නියෝග කළේය. එහෙත් ලැඩමියර් සිය හුරත ඔසවා මැතිව්ගේ අවධානය යළි ඔහු වෙත යොමු කරවා ගත්තේය.

"කාගෙද අනින් කට්ටිය කියලා අදහස් කළේ?" ලැඩමියර් විමසීය. මැතිව්ගේ දෑස් කෝපයෙන් දිලිසෙනු මම දුටුවෙමි.

''අනික් කට්ටිය කියන්නෙ කවුද කියලා තව ටිකකින් බලාගන්න පුළුවන් වෙයි.'' මැතිව් පැවසීය. ඉන්පසු රතු ඉන්දියානුවන් විසින් ඔවුන්ගේ දෑත් දෙපා බැඳ දමන ලදී. අපි ඔවුන් රැගෙන සන්තියා ඇතුළු මැරවරයන් ගාල්කර සිටි පැල්පත වෙත ගමන් කළෙමු. අනපේක්ෂිත ලෙස සියල්ල වෙනස් වූයේ එහිදිය. මා පෙර පැවසූ ලෙස ලැඩමියර් ඇතුළු ඇමරිකානුවන් ද සෙසු මැරවරයන් සිරගත කර සිටි පැල්පත වෙත ඇතුළු කිරීමට යෑමේදී ලැඩමියර්ගේ මුවින් විශ්මයාන්විත හඬක් නික්මුණේය.

''මට පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න! මෙතන ලොකු වැරදීමක් සිද්ධවෙලා තියෙනවා මහත්වරුණි. කරුණාකරලා මට මගේ හැඳුනුම්පත පෙන්වන්න ඉඩ දෙන්න. මට විශ්වාසයි, අපිව වරදවා හඳුනා ගැනීමක් සිද්ධවෙලා තියෙන බව. අපි දූව ජාවාරම්කාරයො නොවන බව මුලින්ම කියන්න ඕනෙ.'' ලැඩමියර් පැවසුවේය.

අපි එකිනෙකා මුහුණට මුහුණ බලා ගත්තෙමු. ''දූව ජාවාරම්කාරයො නෙවෙයි? හොඳයි එහෙනම් මොකටද මහ රෑ මේ ගම්මානයට කඩා වැදුණෙ?'' මම විමසුවෙමි.

''මට මගේ හැඳුනුම්පත පෙන්වන්න ඉඩ දෙන්න.'' ඔහු යළි ඉල්ලා සිටියේය.

''හොඳයි...'' ඉන්පසු මැතිව් විසින් ලැඩමියර්ගේ දෑත් බැඳි රැහැන් මුදාහැරියේය. අපි ගිනි අවි සූදානමෙන් තබා ගතිමු.

සිය කබා සාක්කුව තුළින් යමක් ඉවතට ගත් ලැඩමියර් එය මැතිව් වෙත දිගු කළේය. එය හැඳුනුම්පතක් විය. බ්‍රසීලියානු රජයේ නිල මුද්‍රාව ද එහි සටහන්ව තිබෙනු මම දුටුවෙමි.

''සමාවෙන්න ලැඩමියර් මහත්මයා. මේක අපිට සිද්ධවුණු ලොකු වැරදීමක්. මම ආයෙත් සමාව අයදිනවා සිද්ධවුණු දේවල්වලට.'' මැතිව් පැවසුවේ ගිනි අවිය පහත හෙළමිනි. හැඳුනුම්පත අප පැහැදිලිව දුටුවේ එවිටයි. ලැඩමියර් බ්‍රසීලියානු රජය විසින් පත් කරන ලද රහස් පරීක්ෂකයකු බව අපට අවබෝධ විය. අපි වහා ඔවුන් බැඳ දමා තිබූ බැමි ලිහා දැමුවෙමු.

''අපි ඒ ගැන අමතක කරලා දාමු.'' ලැඩමියර් පැවසීය.





''මටත් ඕනෙ කරලා තිබුණෙ මේ කාලකණ්ණි දූව ජාවාරම්කාරයින්ව අල්ල ගන්න තමයි. අපි දැන් මාස ගණනාවක් තිස්සෙ මහන්සි වෙනවා මුන්ව අත්අඩංගුවට ගන්න. ඒත් ඒ හැම වතාවෙම උන් මගේ කනෙන් රිංගුවා. ඒත් අන්තිමට මම කළ යුතුව තිබුණු දේ මේ මහත්වරු කළා.'' ඔහු පැවසීය.

''ඉතින් ඇයි මීට කලින් මේ බවක් නොකිව්වෙ. එහෙනම් මේ හැමදෙයක්ම මීට වඩා හොඳින් සිද්ධවෙනවා.'' ක්ලෙවර් පැවසීය.

''නෑ... මුලින් මට හිතුණෙ මේ මහත්වරුත් උන්ගෙ කණ්ඩායමේ අය වෙන්න ඇති කියලයි. ඒක එහෙම නොවුණෙ අපේ වාසනාවට. මොකද උන් දන්නවා අපි උන්ගෙ පස්සෙන් පන්නන බව. උන්ට පුළුවන්නම් අපිව මරලා දාන්න, ඒකට එක මොහොතක්වත් ප්‍රමාදවෙන එකක් නෑ. මොකද මීට මාස තුනකට කලින් අපේ රහස් පොලිසියෙ මැකිනොත්ව උන් මරලා දැම්මා. මැකිනොත් කියන්නෙ අති දක්ෂ නිලධාරියෙක්. මැකිනොත්ගෙ මරණෙන් පස්සෙ තමයි මට මේ වැඩේ භාර වුණේ. ඉතින් මේ මහත්වරුන්ට පැහැදිලියි නේද ඇයි මම නිශ්ශබ්දව හිටියෙ කියලා?''

''ඔව්... ඒත් මට අපැහැදිලි තැනක් තියෙනවා. මට මතකයි අපි ආපු නැවේ ලැඩමියර් මහත්තයත් ආපු බව. ඇයි අපිව ලුහුබැන්දෙ?''

''මම දැනන් හිටියා මේ ජාවාරම පිටිපස්සෙ මේ නීග්‍රෝ ජාතිකයා වගේම තවත් සුදු මිනිස්සු කිහිපදෙනෙකුත් ඉන්න බව. ඒ නිසා මම බොහොම සෝදිසියෙන් ඉන්නෙ රටේ අභ්‍යන්තර නැව් සේවය ගැන. මට සැක සහිත කෙනෙක් ගැන හරි කණ්ඩායමක් ගැන හරි ආරංචියක් ලැබුණොත් ඒ ගැන හොයලා බලනවා. ඒ නිසයි මම ඒ දේ කළේ.'' ඔහු පැවසීය.

''අපිට ආරංචි වුණු හැටියට සන්තියට අමතරව මේ ජාවාරමට හැන්ස් ස්විත්සන් කියන ඇමරිකානුවත් සම්බන්ධයි.'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

''ඔව්... මමත් ඒ ගැන හොයා ගත්තා. ඒත් මිනිහගෙ ඇත්ත නම ස්විත්සන් නෙවෙයි. මිනිහගෙ නම ජෝන් විල්ස්... ස්විත්සන් කියන්නෙ බොරු නමක්.'' රහස් පරීක්ෂකයා පැවසීය.

# සන්තියාගේ අවසානය

ස්වදේශිකයන් විසින් සිය දුක්ගැනවිලි ලැඩමියර් ඇතුළු සෙසු නිලධාරීන් හට මැතිව සහ අපගේ බ්‍රසීලියානු සේවකයන් හරහා පවසන්නට වූ අතර එයින් අනාවරණය වූ ඇතැම් කරුණු ඉතා වැදගත් ඒවා විය.

''මේ දේවල් අපිට බොහොම වැදගත් වෙයි මුන්ට විරුද්ධව නඩු පවරද්දී.'' ලැඩමියර් පැවසීය.

ඉන්පසු අපි සිරකරුවන් ලැඩමියර් ඇතුළු රහස් පරීක්ෂකයන් හට භාර කළෙමු.

''ලයිසැන්ඩර් මහත්මයා, ඔබතුමා ඇතුළු කණ්ඩායම දක්වූ ඇමරිකාව වෙනුවෙන් මේ කළ සේවයට අපි හැම කෙනෙක්ම ණයගැතියි.'' ලැඩමියර් පැවසුවේ සන්තියා ඇතුළු සිරකරුවන් ඔවුන්ගේ භාරයට ගනිමිනි. ඉන්පසු ඔහු අප සැමට අතට අත දී සුබ පැතීය.

''ඉතින් ඇලෙක් මහත්මයලගේ ගමනත් සාර්ථකව නිම කරන්න වාසනාව ලැබෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා.'' අවසානයේ ඔහු පැවසීය.

ඉන්පසු රතු ඉන්දියානුවන්ගේ උණ පහුරක් ආධාරයෙන් සිරකරුවන් ගඟ පහළට රැගෙන යැමට ඔවුහු තීරණය කළහ.

''ලැඩමියර් මහත්තයා, ජෝන් විල්ස්ව කොටුකර ගන්න බලාපොරොත්තු වෙන්නෙ කොහොමද?'' මැතිව් විමසුවේ ඔවුන් පිටත්ව යැමට සූදානම් වන අතරයි.

''ඔව්. ඒක ලොකු අභියෝගයක් තමයි. ඒත් ඊට කලින් මුන්ව මැනාඕස්වලට ගෙනියන්න ඕනෙ. මට හිතෙනවා විල්ස්ව කොටුකර ගන්න බැරිවෙන එකක් නෑ කියලා.'' ලැඩමියර් පැවසුවේ දැඩි විශ්වාසයකින් යුතුවයි.

වන මෘගයන් මෙන් කිපී සිටි සිරකරුවන් පැල්පත තුළින්





ඉවතට රැගෙන පහුර වෙත නංවා ගැනීම සඳහා බොහෝ වෙහෙසක් දැරීමට සිදුවිය. ඊට රතු ඉන්දියානුවන්ගේ සහය ද ලබා ගැනීමට සිදුවූ අතර ඔවුන් නොසිටින්නට එය ඉතා අපහසු කාර්යයක් වීමට ඉඩ තිබිණි. සිරුරෙන් අධික ලෙස රුධිරය වහනය වීමෙන් දුර්වලව දුර්මුඛව පහුරේ වැතිරී සිටි සන්තියාගේ දෙනෙත් රැඳී තිබුණේ කුරිරු බැල්මකි. මෙතරම් පහසුවෙන් තමා නීතියේ රැහැනට හසුවනු ඇතැයි ඔහු සිහිනෙනුදු නොසිතන්නට ඇත.

• • • • • •

''ඒ ප්‍රශ්නෙත් ඉවරයි එහෙනම්.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ සිරකරුවන් රැගත් පහුර සහ ලැඩමියර්ගේ යාත්‍රාව අපගේ දර්ශන පථයෙන් ඉවත්ව ගිය පසුවයි.

''නෑ, සම්පූර්ණයෙන්ම ඉවර නෑ. මම හිතන් නෑ විල්ස්ව ලේසියෙන් අල්ලගන්න ලැබෙයි කියලා.ඒ නැතත් ඔය ලී ජාවාරම පිටිපස්සෙ දේශපාලන බලල් අතක් තියෙනවා නම් නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වෙයි ද කියන එකත් සැක සහිතයි.'' ක්ලෙවර් පැවසීය.

''මම හිතන්නෑ එහෙම දෙයක් වෙයි කියලා.'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

සන්තියා ඇතුළු මැරවරයන් පිරිස ගම්මානයෙන් රැගෙන ගිය පසු ස්වදේශික රතු ඉන්දියානුවන් විසින් සිය සතුට පළකිරීම සඳහා අපූර්ව උත්සවයක් සංවිධානය කරන ලදී. ගං ඉවුර අසල දැවැන්ත ගිනි මැලයක් නිර්මාණය කළ ඔවුහු සිය ප්‍රධානියා එහි කැඳවාගෙන ආහ. ඉන්පසු ජවසම්පන්න තරුණ රතු ඉන්දියානුවෝ ගිනි මැලය වටා රොක්වී අපූර්ව රංගනයක නිරත වූහ. ඇතැමෙක් උණ බට කැබැලිවලට කෝටු කැබැලිවලින් පහර දෙමින් ද තවත් සමහරෙක් සත්ත්ව සම් පටලයක් ආධාරයෙන් සැදූ ඉතා හොඳින්‍ ඉතා නොදියුණු, ප්‍රාථමික මට්ටමේ බෙරයකට දෑතින් පහර දෙමින් ද සෙසු සගයන්ගේ රැඟුමට තාල සැපයූහ. මෙම ස්වදේශික මිනිසුන්ගේ සාදය මට අපූර්ව අත්දැකීමක් විය. රංගනය සහ වාදනය අවසානයේ මස් මාංසවලින් සහ ප්‍රණීත මත්පැන් වර්ගයකින් සන්තර්පණය වූ

ඔවුහු අපට ද ඒවා පිළිගැන්වූහ. අපගේ කූඩාරම අසල තිබූ ගිනි මැලය වටා රැස්ව අපි එම සංග්‍රහය භුක්ති වින්දෙමු. රතු ඉන්දියානු තරුණියන් සිය ප්‍රධානියා සමග රංගනයක නියැළුණේ ඒ අතරතුරය. මෙලෙස රැය පහන් වන තුරුම ඔවුහු ප්‍රීති වූහ.

"ඇලෙක්, අපි හෙට මෙහෙන් පිටත් වෙමු නේද?" ක්ලෙවර් මාගෙන් විමසුවේ නැගෙනහිර අහසේ අරුණලු නැගෙත්මයි.

"ඔව්, හෙට පාන්දරින්ම අපි පිටත් වෙමු. මං හිතන්නෙ අපේ පහුරු සූදානම් ඇති."

"මම මැතිව්ටත් ඒ ගැන කිව්වා. මැතිව් ගෝත්‍රික ප්‍රධානියා එක්ක ඒ ගැන කතා කරයි." ක්ලෙවර් පැවසීය.

"පහුරු හතරක් සූදානම් කරලා තියෙනවා. හෙට උදේන්ම අපිට පිටත් වෙන්න පුළුවන්." මැතිව් පැවසුවේ ඒ පිළිබඳව මා ඔහුගෙන් විමසූ අවස්ථාවේදීය.

පෙර දින රාත්‍රියේ නිදිවර්ජිතව පහන් කළෙන් එදින දිවා කල අපි කූඩාරම අසල පිහිටි දැවැන්ත වෘක්ෂයක් පාමුල වැතිරී නින්දට වැටුණෙමු. එහෙත් මැතිව් සිටියේ අවදිවයි.

"අපි හැමෝම නින්දට යන එක ඒ තරම් සුදුසු නෑ." ඔහු පැවසීය.

• • • • • •

පසු දින අලුයම හතරට පමණ අවදි වූ අපි ගමනට සූදානම් වීමු. අපගේ ඉදිරි ගමන සඳහා මෙම ගම්මානයෙන් තරුණ රතු ඉන්දියානුවන් සතරදෙනෙකු බඳවා ගැනීමට අපි තීරණය කළෙමු. ඔවුහු ජෝ, අටුනා, බාබු සහ අබූකා නම් වූහ. එහෙයින් මේ වන විට ඔවුන් සතර දෙනා ද ඇතුළුව අපගේ කණ්ඩායමේ සාමාජිකයන් ගණන දහඅටක් විය. ඊට අපගේ බෝට්ටු යුගලේ සේවකයන් දෙදෙනා ද ඇතුළත් විය. උදෑසන හය පමණ වන විට අපි ඇටන් රතු ඉන්දිය ගම්මානයට සමු දී ගඟ ඉහළට යාත්‍රා කිරීම ඇරඹීමු. අපගේ චාරිකාවේ වඩාත් දුෂ්කර පරිච්ඡේදය ඇරඹුණේ එලෙසය.





"ඇලෙක්, අපිට සතුටු වෙන්න පුළුවන්. අපි මේ සුන්දර ගහ කොළ ආරක්ෂා කරගන්න අපේ උපරිම ශක්තියෙන් දායක වුණා. මං හිතනවා ලැඩ්මියර් ඒකෙ ඉතිරි කොටස සම්පූර්ණ කරයි." ක්ලෙවර් පැවසුවේ අප ඉදිරියට ගමන් ගන්නා අතරය.

පහුරු හතර බෝට්ටු යුගලේ පසුපසින් අමුණා පැවති අතර අපගේ බඩුබාහිරාදියෙන් කොටසක් ඒවායේ රැඳවීමු. බෝට්ටුවලින් ගමන් කළ හැකි වන්නේ තවත් දින කිහිපයක් පමණි. ඉන්පසු අපට ඉතිරි වන්නේ මෙම පහුරු සතර පමණි.

• • • • • •

"ලයිසැන්ඩර් මහත්මයා, අපි ඇටන් රතු ඉන්දියානු ගම්මානයෙන් පිටත්වෙලා අදට හරියටම දවස් හතක් වෙනවා." මැතිව් පැවසුවේය.

"තව දවස් කීයක් අපිට මේ බෝට්ටුවලින් යන්න පුළුවන් වෙයිද දන්නෑ නේද?" ටෝර්නි විමසුවේ යාත්‍රාව භාරව ක්‍රියා කළ සේවකයාගෙනි.

"මට හිතෙන්නෙ තව දවස් හතරක් විතර පුළුවන්." ඔහු පිළිතුරු දුන්නේය.

## මැතිව් හයිග්‍රේව් අභියෝගය භාර ගනී

අපි තවත් දෙදිනක් පුරා ඉදිරියට යාත්‍රා කළෙමු. එහෙත් තවම ගං ඉවුරු පිහිටියේ බොහෝ ඈතිනි. මැතිව් සිය දෙනෙතියෙන් අවට නිරීක්ෂණය කරමින් සිටි අතර එක් වරම ඔහුගේ මුවින් විශ්මයාන්විත හඬක් නික්මුණේය. එහෙයින් අප සැමගේ අවධානය ඔහු වෙත යොමු විය.

"ඇයි? මොකක්ද මැතිව් එහෙ සිද්ධ වෙන්නෙ?"

"මම දන්නෑ, ඒත් අතන ඉවුරෙ බෝට්ටුවක් නතර කරලා තියෙනවා. ඒත් ඒක පැහැදිලිව පෙනෙන් නෑ." ඔහු පැවසීය.

ඉන් අනතුරුව අපි අපගේ දෙනෙති දුරේක්ෂවලින් ඔහු පැවසූ පෙදෙස නිරීක්ෂණය කළෙමු. ගං ඉවුරේ ගං දිය දෙසට නැඹුරුව තිබූ තුරු වදුලක් තුළින් සුදු පැහැති යාත්‍රාවක බඳක් දකගත හැකි විය.

"මට හිතෙන්නෙ කවුරුහරි ඒ බෝට්ටුව එතන හංගන්න උත්සාහ කරලා තියෙනවා." මම පැවසීමි.

"ඔව්, සමහර විට මේක අර දුව ජාවාරම්කාරයින්ගෙ වැඩක් වෙන්න පුළුවන්. මොකද කියන්නෙ? එතනට ගිහින් සෝදිසි කරලා බලනවද?" මැතිව් විමසීය.

"කැමැත්තක්..." ටෝර්නි පැවසීය.

"මට හිතෙන්නෙ අපි ඒ ගැන කරදර වෙන්න අවශ්‍ය නෑ කියලයි. මොකද අනිවාර්යයෙන්ම ඒ ගැන ලැඩමියර් බලා ගනී." ලයිසැන්ඩර් මහතා පැවසුවේ අප අධෛර්යයට පත් කරමිනි.

එහි ගොස් එම ආගන්තුක යාත්‍රාව පිළිබඳ පරීක්ෂා කර බැලීමට අපගේ සේවකයන්ගේ ද වැඩි උනන්දුවක් නොතිබිණි. එහෙයින් අපි එය අමතක කර දමා ඉදිරියටම යාත්‍රා කළෙමු.

"මගේ හිතට නම් හරි නෑ ඇලෙක්..." ක්ලෙවර් පැවසුවේ



අප එම යාත්‍රාව දර්ශනය වූ පෙදෙස පසුකර ඉදිරියට යාත්‍රා කරන අතරයි. ඔහුගේ පමණක් නොව මාගේ සිත ද එම ආගන්තුක යාත්‍රාව හේතුවෙන් මඳක් නොසන්සුන් වූයේය. මැතිව් ද කිසිවෙකු නොරුස්සනා අයුරින් යාත්‍රාවේ එක් පසෙකට වී සිය දෙනෙතියෙන් අවට නිරීක්ෂණය කරමින් සිටියේය. යථෝක්ත යාත්‍රාව පිළිබඳ සොයා නොබැලීම පිළිබඳ ඔහුගේ සිතේ ද වැඩි කැමැත්තක් නොතිබිණි.

• • • • • •

පසු දිනට පහන් විය. පෙර වාරයේ අප ඉන්කා රාජධානියේ සිට පෙරළා පැමිණෙන විට මා සකස් කර ගත් සිතියම ආධාරයෙන් මෙවර ගමන් මඟ සොයාගත යුතුව තිබුණෙන් මම නිරතුරුවම දෙනෙතියෙන් ගං ඉවුර පරීක්ෂා කළෙමි. මාගේ සිතියමේ ලකුණු කර තිබූ බොහෝ සලකුණු දක හඳුනා ගැනීමට මට හැකි විණි.

එය මාගේ සිතට විශාල සහනයක් වූයේය. දැන් මා පියවරින් පියවර ඇය වෙත ළඟා වෙමින් නොසිටින්නේද? ඒ පිළිබඳ සිහිවත්ම මාගේ සිත අමුතු මිහිරියාවකින් වෙළී යන්නාක් මෙන් දැනිණි.

"ක්ලෙවර්, අපේ සිතියමේ හැටියට අන්න අර පෙනෙන අතු ගංගාවෙන් තමයි අපි හැරෙන්න ඕනෙ." මම පැවසුවෙමි.

"ඔව්, මටත් එහෙම හිතෙනවා. මට හොඳට මතකයි අර වම් ඉවුරෙ තියෙන දැවැන්ත දේවදාර ගස් ටික." ක්ලෙවර් පැවසුවේ අපගේ මතකය යළි අවදි කරමිනි.

"දැන් ඉතින් අපිට බොහොම කල්පනාකාරී වෙන්න සිද්ධ වෙනවා. මං හිතන්නෙ හෙට අපිට බෝට්ටු දෙක පිටත් කරන්න සිද්ධ වෙයි." ලයිසැන්ඩර් මහතා පැවසීය.

"මට හොඳටම විශ්වාසයි, මම මීට කලින් කිසිම වතාවක මේ අතු ගංගාව දිගේ ගඟ ඉහළට යාත්‍රා කරලා නැති බව. ඒ නිසා මේක මටත් අලුත් අත්දැකීමක්." මැතිව් හයිග්‍රේව් පැවසුවේය. ඔහු මෙතෙක් කල් තැබූ ප්‍රීතිමත් සතුටින් උද්දාමයට පත්ව ඇති බව මුහුණට නැගී තිබූ ප්‍රීතිමත් ස්වභාවයෙන් සනාථ විය.

තවත් අඩ හෝරාවකට පමණ පසු අපගේ යාත්‍රා එම අතු ගංගාව වෙත ඇතුළු කිරීමට අපි සමත් වීමු.

"මහත්තයා, හෙට උදේ අපේ ගමන නවත්වන්නයි මම කල්පනා කරන්නෙ." යාත්‍රාවේ සේවකයෙක් පැවසීය.

"එහෙනම් අද රෑ අපි අපේ පාරුවලට බඩු ටික පටවගමු." මම ක්ලෙවර් වෙත යෝජනා කළෙමි.

"ඔව්, එහෙනම් අපි හෙට උදේන්ම බෝට්ටු දෙක ආපහු පිටත් කරමු." ඔහු පිළිතුරු දුන්නේය.

• • • • • •

එදින මධ්‍යම රාත්‍රිය වන තුරු ද අපි එම අතු ගංගාව ඔස්සේ ඉහළට යාත්‍රා කළෙමු. අලුයම අපගේ යාත්‍රා යුගල නැවත පිටත්කර යැවිය යුතුව තිබුණෙන් ඉන් අනතුරුව අපි යාත්‍රා ගං ඉවුර දෙසට යාත්‍රා කරවූයෙමු. ඒ චාරිකාවේ මීළඟ පරිච්ඡේදය නිම කිරීම සඳහා අපගේ පහුරු සූදානම් කර ගැනීමටය. ඉන් අනතුරුව අපි රැගෙනවිත් තිබූ භාණ්ඩ සියල්ල සමාන කොටස් හතරකට බෙදා ඒවා පහුරු සතරේ තැන්පත් කළෙමු. පසු දින අලුයම එතැනින් පිටත්වීම සුදුසු යැයි යෝජනා වූයෙන් ගං ඉවුරේ රාත්‍රිය ගත කිරීමට කටයුතු සූදානම් කරගත්තෙමු.

වියළි දර කැබලි සෙවීම අපි රතු ඉන්දියානු සේවකයන් හට භාර කළෙමු. ඒ ගිනි මැලයක් දල්වා ගැනීම පිණිසයි. ඉන්පසු අපි අපගේ තාවකාලික කූඩාරම ගිනි මැලයට නුදුරින් අටවා ගත්තෙමු.

"ඇලෙක්, මේ මදුරුවන්ගෙන් තමයි බේරෙන්න අමාරු." ක්ලෙවර් පැවසුවේය.

"ඒකට මෙන්න මේ පැහිරි මිශ්‍ර ආලේපයෙන්වත් පිහිටක් වෙයිද කියලා බලන්න ක්ලෙවර්." ලයිසැන්ඩර් මහතා පැවසුවේ ක්ලෙවර්ගේ දුක්ගැනවිල්ල සවන් වැකුණෙන් විය යුතුය. මේ දක්වා අප එගෙන ආ යාත්‍රා යුගල හරවා සිටි සේවකයන් දෙදෙනා ද පසු දින අලුයම වන තෙක් අප හා එක් කිරීමට තීරණය කළෙන්





ඔවුන්ට ද රාත්‍රී ආහාර පිළිගන්වන මෙන් අපගේ සේවකයන්ට දැනුම් දුන්නෙමු.

"හෙටින් පස්සෙ තමයි අපිට මේ ගමනෙ නියම ආශ්චර්යය විඳගන්න ලැබෙන්නෙ." මැතිව් පැවසුවේ රාත්‍රී ආහාර ලෙස පිළියෙල වූ පරිසිද්ධා රොටි කැබැල්ලක් මුවෙහි රඳවා ගනිමිනි.

"මැතිව්, ඇත්තටම මේ අතු ගංගාවෙ මීට කලින් ගිහින් නැද්ද?" මම විමසුවෙමි.

"නෑ.. මෙක මටත් අලුත් අත්දැකීමක්! ඒ කොහොම වුණත් මේ වගේ තවත් අනන්තවත් අතු ගංගාවල් ඇති අපි නොදන්න. මේ ඝන ඇමේසන් ගංගාව කියන්නෙ වෙනම ලෝකයක් වගේ. මේ ඝන වනාන්තරේ ඇතුළෙ කවුරු ඉන්නවද මොනවා වෙනවද කියලා කවුද දන්නෙ?" මැතිව් පැවසීය.

"ඒත් ඒ සරල දේ තේරුම් ගන්න තරම් බුද්ධියක් මහ ලොකු උගත්තුයි කියලා කියාගන්න සමහරුන්ට නෑ. දැන් නම් මගේ හිතේ ඒ ගැන කිසිම කනගාටුවක් නෑ." ලයිසැන්ඩර් මහතා පැවසුවේ දිගු සුසුමක් පහත හෙළමිනි. ඉන්පසු ඔහු ගැඹුරු කල්පනා සයුරක කිමිදෙමින් බොහෝ වේලාවක් නිහඬව සිටියේය. අපි ඔහුට බාධා නොකළෙමු.

kathapothak.blogspot.com

# පහුරුවලින් ගඟ ඉහළට

පසු දින හැගෙනහිර අහසේ අරුණලු නැගෙත්ම අපි යුහුසුළුව ගමනට සූදානම් වීමු.

''එහෙනම් ලයිසැන්ඩර් මහත්තයා, අපි ගිහින් එන්නම්... සුබ ගමන්'' මේ දක්වා අප රැගෙන ආ යාත්‍රා යුගලේ සේවකයෝ දෙදෙනා අපගෙන් සමුගෙන පෙරළා මැනාඕස් වෙත ගමන් ඇරඹූහ. ඉන්පසු අපට ඉතිරි වූයේ උණ පහුරු සතර පමණි. එමෙන්ම ගමනාරම්භයේ සිටම ශ්වසනාබාධයකින් පෙළුණු අපගේ එක් බ්‍රසීලියානු සේවකයකු ද එම යාත්‍රාවකින් නැවත සිය නිවස වෙත පිටත්කර හැරීමට අපි තීරණය කළෙමු.

නමුත් ඕහු අප හැර නොගියේය. එහෙයින් මේ වන විට අපගේ කණ්ඩායමට ඇතුළත් වූයේ අප තිදෙනාත් මැනිව්, ටෝර්නි දෙදෙනාත් බ්‍රසීලියානු සේවකයන් හත්දෙනාත් රතු ඉන්දියානුවන් සිවු දෙනාත්ය.

අපගේ යාත්‍රා යුගල යටිගං බලා පිටත් වී ගිය පසු අපි කූඩාරම ගකුළා ගිනි මැලය ද වතුර ගසා නිවා දැමුවෙමු. එහෙත් නැංගුරම්වලින් මුදා හළ පහුරු ගඟ ඉහළට යාත්‍රා කිරීම ඇරඹුවේ තවත් මිනිත්තු කිහිපයකට පසුවයි. මමත් ක්ලෙවරුත් ලයිසැන්ඩර් මහතාත් රැඳී සිටියේ ඉදිරියෙන්ම ගමන් කළ පහුරෙහිය. ඊට අමතරව එහි තවත් බ්‍රසීලියානුවෝ දෙදෙනෙක් සහ එක් රතු ඉන්දියානුවෙක් රැඳී සිටියහ.

අප පහුරුවලින් ගමන් අරඹා දින ගණනාවක් ගත වනතුරු ද ගං ඉවුරු පිහිටියේ අපට බොහෝ ඈතිනි. ගංගාවේ ජලය තරමක් බොර පැහැ වුවද එහි සුන්දරත්වයට ඉන් කිසිදු හානියක් සිදු වී නොතිබිණි.





''ඔය වතුර බොර පැහැයක් ගන්නෙ කොළරොඩු රොන්මඩ වගේ දේවල් මේ වතුරෙ දියවෙලා තියෙන නිසා.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ පහතට නැඹුරු වී දිය දෝතක් ගනිමිනි.

• • • • • •

මේ වන විට අප පහුරුවලින් ගමන් අරඹා දෙසතියකට ආසන්න කාලයක් ගත වී තිබිණි. ඒ අතරතුර අපට කිසිවෙකුගෙන් බාධාවක් එල්ල නොවිණි. එමෙන්ම අවම වශයෙන් වන සතකුගෙන් හෝ කිසිදු අන්තරායක් සිදු නොවීම පිළිබඳ අපි සතුටට පත්වීමු.

පෙර වාරයේ අප පැමිණි මඟ ඔස්සේ ආපසු ගමන් කළ යුතුව තිබුණෙත් නිවැරැදි මඟ සොයා ගැනීම සඳහා දිවා රෑ නොබලා අවදියෙන් සිටීමට මා හට සිදුවිය.

''ක්ලෙවර්, මගේ සිතියමේ හැටියට මෙන්න මේ අතු ගංගාවෙන් ඉහළට තමයි අපි යන්න ඕනෙ.'' මම පැවසුවෙමි. සැබැවින්ම මාගේ සිතියමට අනුව අපි එම කුඩා දිය පහර වෙත ඇතුළු විය යුතු වීමු.

''ඔව්, මටත් ඒක හොඳට මතකයි. මේ දිය පාර කෙළවර වෙන්නෙ අපි ගිය වතාවෙ අර බල්සා පහුරුවලින් ගමන් ආරම්භ කරපු තැනින්. හැබැයි ඒත් තව දවස් දහයක් විතර අපිට මේ පුංචි අතු ගංගාව දිගේ යාත්‍රා කරන්න වෙනවා.'' ක්ලෙවර් පැවසීය.

''එහෙනම් අද රෑ අපි ඉවුරේ මේ හරියෙ අපේ කූඩාරම අටවා ගමු නේද?'' ටෝර්නි විමසීය. අප එම කුඩා අතු ගංගාවට ඇතුළු වී නොබෝ වේලාවකින්ම ගං ඉවුරු එකිනෙක සමීප වී දියපාර පටු විය.

''දැන් නම් ඉතින් බොහොම කල්පනාවෙන් ඉන්න වෙනවා. මං බලන්න මේ හරියෙ ගං ඉවුරු බොහොම ළඟින් තියෙන්නෙ. ගිහාන්නෙ යාර සියයක්වත් දුර නෑ මේ ඉවුරෙ ඉඳන් එහා ඉවුරට.''

මැතිව් පැවසුවේ අප මුහුණපා සිටි අවදානම් සහගත තත්ත්වය නැවත සිහිකැඳවමිනි.

"ඔව්, ඒ නිසා ගඟ මැද්දි වුණත් අපිට ඒ හැටි ආරක්ෂාවක් නෑ. කෝකටත් අපෙන් තුන්දෙනෙක්වත් ඇහැරලා ඉන්න වෙනවා හෙට එළිවෙනකල්." ලයිසැන්ඩර් මහතා පැවසීය.

"මම අද මුරට ඉන්නම් එහෙනම්." මැතිව් පැවසීය.

"මමත් ඉන්නම්." ටෝර්නි ද ඉදිරිපත් වූයේය.

"හොඳයි එහෙනම් මුලින්ම මැතිව්ලා ඇහැරලා ඉන්න. ඉන් පස්සෙ අපිට කතා කරන්න. ඒක තමයි හොඳම ක්‍රමේ." ක්ලෙවර් යෝජනා කළේය.

ගං ඉවුර මුළුමනින්ම දෑවැන්ත තුරුලතාවන්ගෙන් වැසී තිබුණෙන් අපගේ කූඩාරම අටවා ගැනීමට සුදුසු ස්ථානයක් සොයා ගැනීම බොහෝ අපහසු විය. එහෙයින් ගං ඉවුර ඔස්සේ තවත් සැතපුම් කාලක පමණ දුරක් ඉදිරියට ඇවිද යැමට අපට සිදුවිය. කූඩාරම අටවා ගැනීමට තරමක් හෝ සුදුසු ස්ථානයක් හමුවූයේ ඉන් අනතුරුවය. හිරු බැස ගොස් අඳුර ගලාවිත් තිබුණෙන් අපි නොපමාව ගිනි මැලයක් දැල්වීමු. අප වටකරගෙන සිටි තෙරක් නොපෙනෙන ඝන වනයෙන් නැඟුණු විවිධ සතුන් විසින් නඟන ලද රුදුරු හඬවල් විටින් විට අපගේ සවන්හි වැකිණි.

ඉන්පසු රතු ඉන්දියානු සේවකයන් විසින් මඤ්ඤොක්කා පිටිවලින් රොටි සාදන ලද්දෙන් අපි නොපමාව රාත්‍රී ආහාර ගත්තෙමු. ඝන වනාන්තරය මධ්‍යයෙන් බෙර හඬක් වැනි යම් අපැහැදිලි නාදයක් නැඟුණේ ඒ අතරතුරය.

"ඇලෙක් ඇහෙනවද ඒ හඬ?" ක්ලෙවර් මාගේ අවධානය ඒ වෙත යොමු කළේය. මැතිව් ද ශිලා ස්තම්භයක් මෙන් නොසෙල්වී සිය අවධානය එම ආගන්තුක හඬ නැඟුණු දිශාව වෙත යොමු





කරගෙන සිටියේය. එමෙන්ම අපගේ ඇටන් රතු ඉන්දියානුවෝ සතර දෙනා ද භීතියෙන් මුසපත්ව එකිනෙකා වෙත තව තවත් ළං වූහ. ඔවුන් එම බෙර හඬින් කොතරම් කැළඹීමට පත් වී දැයි මම ඉන් වටහා ගත්තෙමි.

"මේ ඇමේසන් වනාන්තරේ මොන තරම් වනචාරී ස්වදේශික ගෝත්‍ර ඉන්නවා අත්ද? සමහර විට ඒ හඬ ඇහුණු පැත්තෙ ස්වදේශික රතු ඉන්දියානුවන්ගෙ ගම්මානයක් ඇති..." ලයිසැන්ඩර් මහතා පැවසුවේය.

රාත්‍රියේ දිගින් දිගටම එම ආගන්තුක බෙර හඬ ඇසුණෙන් නින්ද මා කරා පැමිණියේ නැත. එහෙයින් මම මැතිව් සහ ටෝර්නි සමඟ අවදිව සිටියෙමි. අප සමඟ තවත් බ්‍රසීලියානු සේවකයෙක් ද අවදිව සිටියේය. ක්ලෙවර් සහ ලයිසැන්ඩර් මහතා අපගේ කූඩාරම තුළ නින්දට වැටී සිටියෝය.

"මට හිතෙන්නෙ අද උන්ට විශේෂ දවසක් වෙන්න ඇති. ඒකයි ඔය බෙර හඬ දිගටම ඇහෙන්නෙ. උන්ට අපි ගැන දැනගන්න නොලැබෙනකල් අපි පරිස්සම්... ඒත් බැරි වෙලාවත් උන්ට අපි ගැන දැනගන්න ලැබුණොත් අන්න එතකොට තමයි නියම සෙල්ලම් බලාගන්න පුළුවන් වෙන්නෙ. අවුරුදු හතරකට කලින් එක වතාවක් මට වළස්සු අල්ලන්න මිට හැතැප්ම තුන්සියක් විතර ගඟ පහළදි කැලෑවට ඇතුළු වෙන්න සිද්ධ වුණා මගේ ගෝලයො දෙන්නෙකුත් එක්ක. මං හිතන්නෙ මැනාඕස්වලට කිට්ටුවදි තමයි මේ දේ සිද්ධ වුණේ. එදා රෑ අපිට ඝන කැලෑවෙ නවතින්න සිද්ධ වුණා. තුවක්කු තිබුණත් මම සාමාන්‍යයෙන් රාත්‍රිය ගත කරන්න තෝර ගන්නෙ උස ගහක්. මොකද ගිනි මැලයක් පත්තු කරන එකට මම එච්චර කැමති නෑ. වන සතුන්ගෙන් ආරක්ෂා වෙන්න පුළුවන් වුණත් ඇමේසන් වනාන්තරයෙදි අපිට මිනී කන වනචාරී ස්වදේශිකයන්ගෙන් ගැලවෙන්න ලැබෙන්නෑ. ඒත් එදා මගේ කීමට අර මම කියපු ගෝලයො දෙන්නා එකඟ වුණේ නෑ. උන් මහ උද්ධච්ච මිනිස්සු.

උන්ව මම එක්කරන් ගියේ දවස් පඩියට. මොකද, මට ඒ කාලෙ ස්ථිර ගෝලයෙක් හිටියෙ නෑ... ඉතින් එදා උන්ට ඕනෙ වුණා ගිනි මැලයක් පත්තු කරන් එතන රාත්‍රිය ගතකරන්න. ඒත් මම දැනන් හිටියා ඒකෙ තියෙන අවධානම. විශේෂයෙන් නොදන්න පැත්තක! ඒත් උන් මටත් බැණලා බලෙන්ම වගේ ගිනි මැලයක් පත්තු කළා. මට හිතුණ උන්ව එක්කරන් ආපු මෝඩකම කියලා. ඒ විතරක් නෙවෙයි උන් මට විහිළු කළා, මම මහ බයගුල්ලෙක්, කිසිම ආත්ම විශ්වාසයක් නැති නිවටයෙක් කියලා. තව ටිකකින් ඒ බහින්බස් වීම කෙළවර වෙන්නෙ මිනීමැරුමකින්. ඒත් අන්තිමට කියන දේ නාහන එකා උඩින් ගියත් එකයි යටින් ගියත් එකයි කියලා හිතලා මම උස ගහකට නැග ගත්තා. මං හිටපු තැනට අර මුරණ්ඩු බ්‍රසීලියානුවො දෙන්නව පෙනුණෙ නෑ. ඒත් මට නින්ද යන තුරුම උන් දෙන්නා කතාබහ කරන, උසුළු විසුළු කරන හඬ ඇහුණා.

පහුවදා උදේ මට ඇහැරෙන කොට හොඳටම එළිය වැටිලා තිබුණා. මම මගේ ඔරලෝසුව දිහා බැලුවා. මම දැක්කා උදේ අටටත් ළංවෙලා තිබුණු බව. මං හිතුවා උන් දෙන්නා මටත් නොකියම මාව දාලා පිටත්වෙන්න ඇති කියලා. මම ගහෙන් බැහැලා ගිහින් උන් හිටපු තැන සෝදිසි කරලා බැලුවා. ඇලෙක් විශ්වාස කරන එකක් නෑ, එතන තිබුණෙ හිතක් පපුවක් තියන මිනිහෙක්ට බලන්න පුළුවන් විදිහෙ දර්ශනයක් නෙවෙයි...'' ඔහු මඳකට නිහඬ වූයේ ඈතින් ඇසුණු බෙර හඬ හිටි හැටියේ නතර වූ බැවිනි.

''ඉතින්...'' තවත් තත්පර කිහිපයකට පසු මම විමසුවෙමි.

''ඉතින්, ඒ ගිනි මැලය ළඟ එකම ලේ විලක්! ඒ විතරක් නෙවෙයි ඒ ගිනි මැලය වටේ විසිරිලා තිබුණා පිළිස්සුණු ඇට කටු. ඒ වගේම හිස් කබල් දෙකක්. මට නින්ද ගිය අතරෙ එතන මොකක්ද සිද්ධ වුණේ කියන එක හිතා ගන්න අමාරු වුණේ නෑ. අනිවාර්යයෙන්ම මගේ ගෝලයො දෙන්නා මිනී මස් කන





වනචාරීන්ගෙ ගොදුරක් බවට පත්වෙලා... ඒ සිද්ධිය නම් මට පණ තියෙනතුරු අමතක වෙන එකක් නෑ...'' මැතිව් පැවසීය. පෙර ඇසුණු බෙර හඬ යළි ඇරඹුණේ ඒත් සමඟයි.

ඉන්පසු මම පෙර වාරයේ අප බිහිසුණු වනචාරීන්ගෙන් දිවි ගලවා ගත් අයුරු ඔහුටත් ටෝර්නිටත් විස්තර කළෙමි. දැඩි උද්යෝගයෙන් යුතුව ඔවුහු ඊට සවන් දුන්නහ. අපි මෙලෙස අපගේ විවිධ අත්දැකීම විස්තර කරමින් රැය පහන් කරන්නට වීමු. ඒ අතරතුර අවදිව සිටි අපගේ බ්‍රසීලියානු සේවකයා එක්වරක් කෝපි පිළියෙල කර අපට පිළිගැන්වූවේය. ඉන් අපි තවත් ප්‍රබෝධමත් වීමු.

අප සිටි ස්ථානයට සැතපුම් කාලක් පමණ දුරින් ව්‍යාඝ්‍රයකුගේ බිහිසුණු ගර්ජනා හඬක් නැඟුණේ අලුයම හතරට පමණය. ඒ වන විට ඈතින් ඇසුණු බෙර හඬ නැවතී තිබිණි.

''සමහර විට ඌ ගින්දර දකින්න ඇති...'' ටෝර්නි පැවසුවේය.

''ඔව්... ඒත් ඇහුණු හඬේ හැටියට ඌ බොහොම විශාල සතෙක්. ඒ බව මට ඉර හඳ වාගේ විශ්වාසයි.'' මැතිව් පැවසීය.

kathapothak.blogspot.com

# තවත් තීරණාත්මක දිනයක්

නැගෙනහිරින් අරුණලු නැගෙත්ම අපි මිතුරන් අවදි කළෙමු. රිය නිරුපද්‍රිතව පහන් කිරීමට හැකි වීම පිළිබඳ මාගේ සිතේ විශාල සතුටක් ඇති විය. එහෙයින් ඉන් අනතුරුව අපි උදෑසන ආහාරය පිණිස රොටි කිහිපයක් ද පුළුස්සා ගෙන නැවත ගමන් ඇරඹුවෙමු. ඉවුරු අතර පරතරය ශීඝ්‍ර ලෙස අඩුවත් ම සතුරන් පිළිබඳව සුපරික්ෂාකාරී වීමේ අවශ්‍යතාව ද වැඩි විය. එහෙයින් අපි අපගේ බ්‍රසීලියානු සේවකයන් දෙදෙනෙකුට ද රයිෆල් ලබා දී ආරක්ෂාව තවත් තර කළෙමු.

''ක්ලෙවර්, අර ඊයෙ රෑ අපිට ඇහුණ බෙර හඬ ගැන මොකද හිතන්නෙ?'' මම ඔහුගේ අවධානය නැවත පෙර දින රාත්‍රියේ ඇසුණු ආගන්තුක හඬ වෙත යොමු කළෙමි.

''මට නම් හිතෙන්නෙ ඊයේ උන්ට වැදගත් දවසක්. නැත්නම් ඒ විදියට මුළු රෑම ඒ හඬ ඇහෙන්න විදියක් නෑ.'' ඔහු පැවසීය.

මෙවර ඉදිරියෙන්ම ගමන් කළ පහුරේ සිටියේ මමත් ක්ලෙවරුත් තවත් බ්‍රසීලියානු සේවකයන් තිදෙනෙකුත් පමණි. ලයිසැන්ඩර් මහතා සිටියේ අපගේ පහුරට පසුපසින් පැමිණි පහුරෙහිය. එහි ටෝර්නි ද සිටියේය. මැතිව් සිටියේ පසුපසින්ම පැමිණි පහුරේය. ඔහු සිය රයිෆලය අතැතිව සුපරික්ෂාකාරිව සිටියේය.

මෙලෙස අපි තවත් පැය කිහිපයක් ඉදිරියට යාත්‍රා කළෙමු. ඉන්පසු අප පැමිණියේ ස්වභාවික දිය ඇල්ලක් පිහිටි ස්ථානයක් වෙතයි. එම අවදානම් සහගත ප්‍රදේශය ගොඩබිමෙන් පසුකර යෑමට සිදුවිය. එය බොහෝ වෙහෙසකර කටයුත්තක් වූයේය. පහුරුවලට භාණ්ඩ පටවා අප නැවත ගමන් අරඹන විට තවත් හෝරා කිහිපයක් ගතවී තිබිණි. රිය එළැඹියේ අප එලෙස ඉදිරියට ගමන් කරමින් සිටින අතරතුරය. ඒ වන විට අප පසු කරමින් සිටි සීමාවේ ගං ඉවුරු අතර පරතරය අඩි හතළිහකට වඩා වැඩි නොවීය. එහෙයින් ගඟ මැද පහුරු නවතාගෙන රිය පහන් කළ ද පහුරු ඉවුරු වෙත පදවා ගං ඉවුරෙහි රාත්‍රිය ගත කළ ද අපගේ ආරක්ෂාව සම්බන්ධව පවතිනුයේ විශාල අවදානමකි.



''මොකද කියන්නෙ ඇලෙක්, අපි ගඟ මැද නතර වෙනවද? නැත්නම් ඉවුරෙ කූඩාරම් අටවා ගන්නවද?'' මැතිව් විමසීය.

''ගඟ මැද පහුරු නැංගුරම් දාමු. හැබැයි කවුරුවත් වැරදිලාවත් ගඟට නම් බහින්න හිතන්න එපා. මිරිදිය පිරානා ගැන කවුරු කවුරුත් අහලා ඇතිනෙ. මතකයිනෙ ගිය වතාවෙ අපේ බ්‍රසීලියානු සේවකයෙක්ට සිද්ධ වුණු දේ?'' ලයිසැන්ඩර් මහතා එම බිහිසුණු සිදුවීම නැවත අපට මතක් කර දුන්නේය.

පෙර කථිකා කර ගත් අයුරින් අපි රාත්‍රී එකොළහ පමණ වන තුරු ඉදිරියට යාත්‍රා කර ඉන් අනතුරුව ගමන නතර කළෙමු. සඳ පායා තිබූ බැවින් අප වටා විහිදී තිබූ දුවැන්ත තුරුලතා පවුර මඳක් ආලෝකවත් විණි. මෙම සෞම්‍ය සඳ කිරණ විඳිමින් අපි බොහෝ වේලාවක් සතුටු සාමීචියේ යෙදුණෙමු. එදින මුර සේවය භාර වූයේ ක්ලෙවර්ටත් මටත්ය. අප දෙදෙනාට අමතරව බ්‍රසීලියානුවෝ දෙදෙනෙක් ද අවදිව සිටියෝය.

මා දැන් විස්තර කිරීමට සූදානම් වන සිදුවීම සිදු වූයේ එවන් මොහොතකය. අප දෙදෙනා සිටියේ ඉදිරියෙන් තිබූ පහුරෙහිය. අප මෙන්ම ආයුධ සන්නද්ධව සිටි අපගේ බ්‍රසීලියානු සේවකයන් දෙදෙනා සිටියේ පසුපසින්ම පිහිටි පහුරෙහිය. පහුර මත තිබූ අපගේ භාණ්ඩ පෙට්ටියකට පිට දී වාඩිවී හුන් ක්ලෙවර් හිටිහැටියේ ඔහුගේ රයිෆල් මිටෙන් මගේ උරහිසට ඇන්නෙන් මම ඔහු වෙත මාගේ පූර්ණ අවධානය යොමු කළෙමි. ඔහුගේ ඇස් යොමුවී තිබුණේ වම් ඉවුරේ පිහිටි එළිමහන් භූමියක් වෙතය.

''ඇලෙක්, සද්ද කරන්න එපා, දැක්කද?'' ඔහු පැවසුවේ සිය දෙනෙත එම එළිමහන් භූමියෙන් ඉවතට නොගනිමිනි. එම එළිමහන් භූමිය පිහිටියේ අපට යාර තිහක් පමණ දුරිනි. එහෙත් එහි කිසිදු විශේෂත්වයක් මේ වන තුරු ද මාගේ අවධානයට ලක් නොවිණි.

''මට නම් මොනවත්ම පෙනෙන් නෑ ක්ලෙවර්...'' මම ඔහුගේ කනට කෙඳිරුවෙමි. එහෙත් ඔහු සිය දෙතොල හරහා සුරතේ දබරැඟිල්ල තැබුවේ නිශ්ශබ්ද වන්නැයි පවසන්නාක් මෙනි.

# කාලවර්ණ දැවැන්තයා

මම වඩාත් හොඳින් ඔහු පෙන්වූ එළිමහන් භූමිය පරීක්ෂා කළෙමි. අඳුරේ යම් සියුම් චලනයක් මාගේ නෙත ගැටුණේ එවිටයි. එය ක්‍රමයෙන් ගං ඉවුර වෙත සමීප වන කාලවර්ණ ඡායාවක් විය. එම ඡායාව හඳුනා ගැනීමට මාගේ මනස සමත් වූයේය.

''ක්ලෙවර්, ඒ කළු ව්‍යාඝ්‍රයෙක් නේද?'' මම ඔහුගේ කනට ළංවී කොඳුළෙමි.

''ඔව්, වැඩිය කලබල කරන්න එපා. ඌ අපිව දක්කෙ නෑ. ඒත් අර බ්‍රසිලියානුවො දෙන්නට මේ ගැන අහවන්න විදියක් නෑනේ.'' ක්ලෙවර් පැවසුවේ පසුපසින්ම තිබූ පහුරේ නිදි කිරා වැටෙමින් සිටි ෆර්නැන්ඩෝ සහ ටෝරෝ නම් අපගේ සේවකයන් දෙදෙනා දෙස හැරී බලමිනි.

තවත් තත්පර කිහිපයක් ගතවිණි. ඉවුරේ සිට දිය පහර වෙත සිය කාලවර්ණ හිස පහත් කළ දැවැන්ත ව්‍යාඝ්‍රයා දිය පානය කිරීමට වූයේය. වන මෘගයා සහ අප අතර පැවති දුර ප්‍රමාණය හේතුවෙන් ඌ සිය දිගු දිවෙන් දිය කලතන හඬ අපට ඇසුණේ යාන්තමිනි. එම හඬ පසුපස පහුරේ සිටි ෆර්නැන්ඩෝ හට ඇසුණා විය යුතුය. ඔහුගේ වික්ෂිප්ත දෙනෙත හඬ ඇසුණු දිශාව වෙත යොමුවනු මම දුටුවෙමි. එහෙත් ඔහු විසින් අඳුරේ සිටි වන මෘගයා නොදුටු බව පැහැදිලි වූයේ රයිෆලය රැගෙන ඔහු පහුර මත සිටගැනීමත් සමඟය.

ඔහුගේ අවධානය අප වෙත යොමුකර ගැනීම පිණිස මම මාගේ දෑත් ඒ මේ අත සැලුවෙමි. එහෙත් ඉන් ඵලක් නොවිය. ඔහු ඍජුව බලා සිටියේ අඳුරු ගං ඉවුර දෙසය.

• • • • • •

එක්වරම ගං ඉවුර දෙසින් නැඟුණේ බිහිසුණු ගෙරවුම් හඬකි. ඒ කාලවර්ණ ව්‍යාඝ්‍රයාගෙනි. රුදුරු වන මෘගයා අපගේ සේවක ෆර්නැන්ඩෝ දුටුවා විය යුතුය.





''ඇලෙක්, ඌ ගඟට බැස්සොත් විතරක් තුවක්කුව පාවිච්චි කරන්න.'' ක්ලෙවර් එලෙස පැවසුවේ හුන් තැනින් නැගී සිටිමිනි. එහෙයින් මමත් පහුර මත සිට ගත්තෙමි. නැවතත් ගං ඉවුර දෙසින් නැඟුණේ බිහිසුණු ගෙරවුම් හඬකි. ඉන්පසු මා දුටුවේ දැවැන්ත ව්‍යාඝ්‍රයා එම එළිමහන් භූමිය හරහා පලායන ආකාරයයි.

''යන්නම ඇති...'' මම සැනසුම් සුසුමක් පහත හෙළමින් පැවසීමි. එහෙත් ඉන්පසු ඇසුණේ මා කිසිසේත් අපේක්ෂා නොකළ හඬකි. ඒ ෆර්නැන්ඩෝගේ රයිෆලය ක්‍රියාත්මක වන හඬයි. රාත්‍රියේ නිසල බව බිඳිමින් ක්‍රියාත්මක වූ ගිනි අවියේ හඬ සැතපුම් ගණනාවක් දුරට ඇසෙන්නට ඇතැයි මට සිතේ.

''ඔක නවත්තනවා, ඌ පැනලා ගියා...'' ක්ලෙවර් උස් හඬින් පැවසීය.

''මට හිතුණෙ ඌ පිහිනගෙන මේ පැත්තට එයි කියලයි. ඒකයි මම වෙඩිල්ලක් පත්තු කළේ.'' ෆර්නැන්ඩෝ පැවසුවේ හිතියට පත්වය.

''මේ මහ රෑ තුවක්කුව පාවිච්චි කරපු එක ගැන නම් සන්තෝස වෙන්න බෑ. මීට පස්සෙවත් මතක තියාගන්න තුවක්කුව පාවිච්චි කරන එක අන්තිම තුරුම්පුව හැටියට තියාගන්න.'' ක්ලෙවර් පැවසීය. නිදා සිටියවුන් ද වෙඩි හඬින් අවදි වී සිටියෙන් සියල්ල ඔවුන්ට පහදා දීමට බොහෝ කාලයක් ගත වූයේය.

''ෂාඃ අපරාදෙ මට ඌව බලාගන්න බැරි වුණානෙ. කළු ව්‍යාඝ්‍රයන්ට යුරෝපයේ සත්ත්ව උද්‍යානවලින් තියෙන්නෙ පුදුම ඉල්ලුමක්. කමක් නෑ. මේක ඌගේ වාරෙ වෙන්න ඇති.'' මැකිව් පැවසුවේ කළු ව්‍යාඝ්‍රයා දැක බලා ගැනීමේ අවස්ථාව අහිමිවීම නිසා සිතේ හටගෙන තිබූ ශෝකයෙන් යුතුවය.

''අපි එහෙනම දැන් පිටත් වෙමු නේද?'' ක්ලෙවර් පැවසුවේ පෙරදිග අහසේ අරුණලු නැඟෙත්මය.

''මට ආයෙත් අර එදා ඇහුණු විදියෙ බෙර හඬක් ඇහෙනවා.'' ටෝපිනි පැවසුවේ අප ගමන් අරඹා මිනිත්තු කිහිපයක් ගතවත්මය.

"හ්ම්... හැබැයි හුගක් ඇතින්." මම පැවසීමි. තවත් මිනිත්තු කිහිපයක් ගතවිණි. එම බෙර හඬ අප වෙත ක්‍රමයෙන් සමීප වන බවක් මට දැනිණි.

"ක්ලෙවර්, මට හිතෙන්නෙ ඒ හඬ ටිකෙන් ටික මේ පැත්තට ළංවෙනවා වගේ..." මම පැවසීමි.

එහෙත් ඔහු සිය හඬ අවදි කළේ තවත් බොහෝ වේලාවක් ඊට සවන් යොමුකරගෙන සිටීමෙන් අනතුරුවය.

"ඔව්, මටත් එහෙම හිතෙනවා. ඒත් සමහර විට මේක අහම්බෙන් සිද්ධවෙන දෙයක් වෙන්න ඇති. මම හිතන්නෑ උන්ට තවම අපි ගැන දැනගන්න ලැබිලා ඇති කියලා."

කෙසේ හෝ වාසනාවකට මෙන් අපි එම අන්තරාදායක අඩවිය පසුකර තවත් සැතපුම් කිහිපයක් ඉදිරියට යාත්‍රා කළෙමු. මේ අතර මා පූර්ණ අවධානය යොමු කළේ මාගේ සිතියම ආධාරයෙන් පෙර අප ගමන් ඇරඹූ ස්ථානය සොයා ගැනීමටය. වාකා ඇතුළු ඉන්කා සෙබළුන් සමග අප කඳවුරු බැඳගත් එම භූමිය මට සොයාගත හැකිවේ යැයි මම තරයේ විශ්වාස කළෙමි. ඒ සඳහා තවත් සැතපුම් ගණනාවක් ඉහළට යාත්‍රා කළ යුතුව තිබිණි.

මේ අතර අපි නැවත වරක් ස්වභාවික දිය ඇල්ලක් පිහිටි ස්ථානයක් වෙත සමීප වීමු. එම අන්තරාදායක පෙදෙස අපගේ පහුරු ඇතුළු සියලු බඩුබාහිරාදිය ද රැගෙන ගොඩබිමෙන් පසුකර යෑමට සිදු විය. ඒ සඳහා හෝරා කිහිපයක් ගතවිණි.

"මගේ සිතියමේ හැටියට මේක තමයි අපි පහු කළ යුතුව තිබුණු අන්තිම දියඇල්ල. මැනාඕස්වල ඉඳලා අපි දැනට දිය ඇලි හතක් පහු කළා. මගේ සිතියම හරි නම් මේ දිය ඇල්ලේ ඉඳලා දවස් තුනක විතර ගමනක් තමයි තියෙන්නෙ අපි ගිය වතාවෙ පිටත්වුණු තැනට." මම පැවසුවෙමි.

සියල්ලෝම ඉන් උද්යෝගිමත් වූහ. දැන් අපි අපගේ චාරිකාවේ එක් අභියෝගාත්මක අදියරක අවසානය කරා සමීප වෙමින්





සිටින්නෙමු. එහෙත් ඉන් අනතුරුව මීටත් වඩා අතිශය බිහිසුණු චාරිකාවක යෙදීමට අපට සිදුවනු ඇත. ඝන වනාන්තරය තුළ සැඟවී ඇති ඉන්කා රාජධානිය සොයා ගැනීම ලෙහෙසි පහසු කර්තව්‍යයක් නොවනු ඇත.

මිනී මස් අනුභව කරන්නා වූ මිලේච්ඡ ස්වදේශිකයන්ගෙන් කිසියම් මොහොතක අපට ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ තිබුණෙන් නිරතුරු අවධානයෙන් සිටීමට අපට සිදුවනු ඇත. එපමණක් ද නොවේ, ගඟ මැද දී නොතිබුණ ද ඝන වනාන්තරය තුළ දී බිහිසුණු වන මෘගයන්ගෙන් යම් අනතුරක් සිදු වීමට ඉඩ ඇති බැවින් සෑමවිටම ගිනි අවි සූදානම් කර තබාගත යුතුව තිබිණි. එහෙයින් අපගේ චාරිකාවේ මීළඟ පරිච්ඡේදය ඉතා බිහිසුණු එකක් වනු නොඅනුමානය.

# නදී තෙරේ අවසන් රාත්‍රිය

මෙලෙස අපි තවත් දිනක් ඉදිරියට යාත්‍රා කළෙමු. දිය පාරේ ගැඹුර ශීඝ්‍රයෙන් අඩු වූයෙන් පහුරු ගඟ පතුලෙහි වූ ගල්පර සහ වැලි කඳු ආදියෙහි ගැටීමේ අවදානමට අපි මුහුණ පෑවෙමු. එක් වරක ඉදිරියෙන් ම ගමන් ගත් අප සිටි පහුර ගං පතුලෙහි වූ ගල්පරයක ගැටුණ අතර පහුර පෙරළී නොගියේ වාසනාවකට මෙනි. එහෙත් පහුර මත තිබූ අපගේ සියලු බඩුබාහිරාදිය දිය පාරට ඇද වැටිණි. එමෙන්ම අපගේ ජෝසෝ නම් බ්‍රසීලියානු සේවකයා ද දිය පාර වෙත ඇද වැටුණේ ය. ඉන් ඔහු කොතරම් භීතියට පත් වී ද යත් පැය කිහිපයක් ගත වන තුරු ද ඔහු අප හා කිසිත් නොපැවසීය. මිරිදියෙහි වෙසෙන පිරානා මසුන් පිළිබඳ මෙම බ්‍රසීලියානුවන් තුළ පැවැතියේ අප්‍රමාණ භීතියකි. එහි පුදුමයක් නැත. පසුගිය චාරිකාවේ දී අපගේ එක් සේවකයකු පිරානා මසුන්ගේ ගොදුරක් බවට පත්වූවා නොවේ ද? එහෙත් වාසනාවකට මෙන් මෙවර අපිට එම බිහිසුණු ජලචර සතුන්ගෙන් කිසිදු හිරිහැරයක් හෝ බාධාවක් හෝ සිදු නොවිණි.

''ඇලෙක්, කළුවරත් වැටීගෙන එනවා, අද අපි ගොඩබිමේ කූඩාරම අටවගමු. මේ දියපාර මැද හිටියා කියලා වැඩි ආරක්ෂාවක් ලැබෙන් නෑ.'' ක්ලෙවර් යෝජනා කළේ ය.

''ඔව්, මේ හරියෙ කූඩාරමක් අටවගන්න පුළුවන්.'' මැතිව් පැවසුවේ දකුණු ඉවුරේ පිහිටි මදක් එළිමහන් වූ භූමියක් පෙන්වමිනි. එහි දැවැන්ත වෘක්ෂ වැඩී නොතිබිණි.

''එහෙනම් අපි මේ හරියෙ නවතිමු. මට හිතෙන්නෙ මදුරුවන්ගෙන් නම් අපිට ගැලවුමක් නැති වෙයි.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ සිය මුහුණේ වසා සිටි මදුරුවකු පලවා හරිමිනි.

ඉන් අනතුරුව අපි පහුරු නැංගුරම් ලා ගං ඉවුරට ගොඩ වී යථෝක්ත එළිමහන් බිමෙහි අපගේ කූඩාරම් අටවා ගත්තෙමු.

''මොකද කියන්නෙ මැතිව්? ගිනි මැලයක් පත්තු කරනවද නැත්නම...?'' ක්ලෙවර් විමසුවේ ය.





''අද නම් ගිනි මැලයක් නැතුව අපිට රෑ ගත කරන්න අමාරු වෙයි. මේ මදුරුවන්ගෙන් බේරෙන්න නම් අපිට ගිනි මැලයක් පත්තු කරන්නම වෙනවා.'' මැතිව්ට පෙර ටෝරිනි මැසිවිලි නැඟීය.

''ගිනි මැලයක් පත්තු කරනවා නම් අපිට මිනී කන මලේච්ඡයන්ගේ අවදානමත් භාරගන්න වෙනවා.'' මැතිව් පැවසීය.

''හොඳයි කමක් නෑ, එහෙනම් අපිට මාරුවෙන් මාරුවට ඇහැරලා ඉන්න වෙනවා.'' ක්ලෙවර් පැවසීය.

''ගිනි මැලයක් පත්තු නොකළත් අනිවාර්යයෙන්ම ඒක කරන්න වෙනවා.'' මම පැවසුවෙමි.

ගිනි මැලයක් දල්වීමේ කාර්යය අපි අපගේ බ්‍රසීලියානු සේවකයන් හට පැවරුවෙමු. එමෙන්ම රාත්‍රී ආහාරය වශයෙන් පරිඤ්ඤා රොටි සෑදීම රතු ඉන්දියානුවන් වෙත භාර කළෙමු.

මෙලෙස අපි එම සීතල අන්ධකාර දිගු රාත්‍රිය ගෙවා දමන්නට වීමු. රාත්‍රී ආහාරයෙන් අනතුරුව මුර සේවය භාර වූයේ ක්ලෙවර්ටත් මටත් තවත් බ්‍රසීලියානු සේවකයන් දෙදෙනෙකුටත් ය. ඔවුහු පීටර් සහ ජෝසෝ නම් වූහ.

අපගේ සේවා මුරය අවසන් වීමට නියමිතව තිබුණේ අලුයම එකටය. මා දැන් පැවසීමට සූදානම් වන සිදුවීම සිදුවූයේ මධ්‍යම රාත්‍රිය පසුවී තවත් මිනිත්තු විස්සක පමණ කාලයක් ගත වූ පසුවය. එළිමහන් භූමියේ තාවකාලිකව ඉදිකරන ලද කූඩාරම් යුගල තුළ සහ ඉන් පිටත අපගේ මිතුරන් සහ සෙසු සේවකයන් නිදා සිටි අතර මම ක්ලෙවර් සමඟ අපගේ කූඩාරම් පසුපසට වී නිදිවර්ජිතව සිටියෙමි. පීටර් සහ ජෝසෝට භාරව තිබුණේ ගං ඉවුරු පිළිබඳ පරික්ෂාවෙන් සිටීමටය. අප කූඩාරම්වලට පිටුපා සිටියෙන් අප සිටි ස්ථානයට ඔවුන්ව නොපෙනිණි.

මම වරක් හුන් තැනින් නැගිට අපගේ සේවකයන් දෙදෙනා අවදිව සිටී දැයි දැනගැනීම පිණිස ගං ඉවුර දෙසට ගමන් කළෙමි. එහෙත් ඒ මොහොතේ දුටු දසුනෙන් මම බෙහෙවින් කැළඹුණෙමි.

# පීටර් අතුරුදන් වෙයි

ජෝසෝ ගිනි මැලය අසල උඩුකුරුව වැටී සිටියේය. ඔහුගේ ගෙල රුධිරයෙන් නැහැවී තිබිණි. එහෙත් පීටර් පෙනෙන තෙක් මානයක නොසිටියේය.

''ක්ලෙවර්...!'' මම කෑගැසුවෙමි.

මාගේ අභිජාත මිතුරා වහා එහි දිව ආවේය. එසැණින් ඔහු සියල්ල වටහා ගත්තේය.

''ජෝසෝ මැරිලා...! කවුද මේ අපරාදෙ කළේ? කෝ පීටර්?'' ඔහු පැවසීය.

''මට නම් මොනවත්ම හිතාගන්න බෑ...'' මම පැවසුවෙමි.

ඉන් අනතුරුව අපි අපගේ මිතුරන් අවදි කළෙමු. මෙම අවාසනාවන්ත රාත්‍රියේ එහි කුමක් සිදුවිණි දැයි කිසිවකුට වටහා ගත නොහැකි විය.

''ඇලෙක් මහත්තයා... මේක පීටර්ගෙ වැඩක්. කිසි සැකයක් නෑ. මට මුල ඉඳලම පීටර්ගෙ හැසිරීම හිතට ඇල්ලුවෙ නෑ. මතකද ඌ එඩ්මන්ඩ්වත් මැරුවා...! මෙතන මොකක් හරි භයානක ක්‍රීඩාවක් කෙරෙනවා...'' ෆර්නැන්ඩෝ නම් අපගේ විශ්වාසවන්ත බ්‍රසීලියානුවා පැවසුවේ අප සැමගේ සිත් භීතියෙන් මුසපත් කරමිනි.

''ඔව්... මේක එසේ මෙසේ දෙයක් නෙවෙයි. ඇලෙක්... ආ.. කෝ, අපේ පහුරුවලින් එකක් අඩුයි නේද?'' මැතිව් පැවසුවේ අප සැමගේ අවධානය පහුරු වෙත යොමු කරවමිනි.

ඇත්තෙන්ම නැංගුරම් ලා තිබූ පහුර අතුරුදන් වී තිබිණි. ''සැකයක් නෑ. පීටර් ජෝසෝවත් මරලා පහුරත් අරන් ගඟ පහළට යන්න ඇති...'' ක්ලෙවර් පැවසීය.

කළ යුත්තේ කුමක් දැයි වටහා ගත නොහැකිව අපි බොහෝ





වේලාවක් එකිනෙකාගේ නිරුත්තර මුහුණු දෙස බලා සිටියෙමු. අවසානයේ නිහැඬියාව බින්දේ ක්ලෙවර්ය.

''මොකද කියන්නෙ? අපි මේ දැන්ම ගඟ පහළට ගිහින් බලමුද?'' ඔහු විමසුවේ සිය රයිෆලය ද රැගෙන පහුරක් වෙත ගොඩවීමට සූදානම් වෙමිනි.

''එපා!'' ලයිසැන්ඩර් මහතා කෑගැසුවේය.

''ඇයි එපා කියන්නෙ? අපි කොහොමද දන්නෙ ඌ මොන අරමුණකින් මේ දේ කළා ද කියලා?'' ක්ලෙවර් පෙරළා විමසුවේය.

''ඒක හින්දම තමයි මම කියන්නෙ අපි පහළට යාත්‍රා කරන එක සුදුසු නෑ කියලා. සමහර විට ඌ මේ දේ වෙන කාගෙහරි වුවමනාවකට කළා වෙන්න පුළුවන්. උන්ට වුවමනා කරන්නෙ අපේ ගමන වළක්වන එක නම් ගඟ පහළට යන එකෙන් අපි උන්ගෙ අරමුණ ඉටුකළා වෙනවා. ඒ නැතත් ඌ මේක කාගෙහරි වුවමනාවකට කළා නම් අනිවාර්යයෙන්ම අපිට ගඟ පහළදී උන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා...'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

''හොඳයි, එහෙනම් ලයිසැන්ඩර් මහත්තයාම කියන්න, දැන් අපි මොකක්ද කළ යුත්තෙ?'' මැතිව් විමසුවේ එය නොපිළිගත්තාක් මෙනි.

''වෙන කරන්න දෙයක් නෑ. අපි අපේ ගමන යමු.'' ඔහු පැවසීය.

ඉන් පසු නැවත අප අතර පැතිර ගියේ දිගු නිහැඬියාවකි. ජෝසෝගේ මරණයෙන් මම බෙහෙවින් කම්පා වීමි. එම බිහිසුණු පරිසරයෙහි තවදුරටත් රැඳී නොසිටිය යුතු යැයි මට සිතිණි.

''ක්ලෙවර් අපි යමු...'' දිගු නිහැඬියාව බිඳිමින් මම පැවසුවෙමි.

''කොහේද? ගඟ පහළටද?'' ඔහු විමසීය.

''නෑ... අපි අපේ ගමන යමු. මට හිතෙන්නෙ ලයිසැන්ඩර් මහත්තයා කියපු දේ හරි. අපි මේ මහ රෑ ගඟ පහළට යාත්‍රා

කරනවා කියන්නෙ, බොහොම අන්තරාදායක වැඩක්. සමහර විට අවාසනාවකට වගේ පීටර් කියන්නෙ කාගෙ හරි ඔත්තුකාරයෙක් නම් ගඟ පහළට යන එකෙන් අපි ලොකු කරදරේක වැටෙනවා. කවුරුහරි අපි හිතන් ඉන්නවට වඩා සැලසුම් සහගතව අපිව ලුහුබඳිනවා වෙන්නත් පුළුවන්. මතකද මැතිව් කිව්වා, මැතිව්ගෙ ව්‍යාපාරයට කවුරුහරි අභියෝග කරන්න ඉඩ තියෙනවා කියලා... ක්ලෙවර් මොකද කියන්නෙ?'' මම ඔහුගෙන් සෘජු පිළිතුරක් බලාපොරොත්තු වීමි.

මඳ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටි ඔහු ඉන් අනතුරුව සිය හිස ඉහළ පහළ සැලුවේ මා පැවසූ දේ අනුමත කරන්නාක් මෙනි.

kathapothak.blogspot.com



# නැවත ගඟ ඉහළට

ජෝසෝගේ අවසන් කටයුතු සිදු කර, අපගේ කූඩාරම ද හකුළාගෙන නැවත ගමන් අරඹන විට නැගෙනහිර අහසේ අරුණලු නැගී තිබිණි. ජෝසෝගේ ඝාතනය සිදු කිරීමට යොදා ගෙන තිබුණේ තියුණු පිහියකි. පීටර් නිතර සිය හිණේ රඳවාගෙන සිටි මුවහත් පිහිය මට සිහිවිණි. නියත වශයෙන්ම මෙම අසරණ මිනිසාගේ ගෙල මිනීමරු පීටර් විසින් එම තියුණු පිහියෙන් සිඳ දමන්නට ඇත.

''මට හිතෙන්නෙ මෙතන අපි නොදන්න කුමන්ත්‍රණයක් සිද්ධ වුණා. ඒ කොහොම වුණත් ඌ අපෙන් ඈත් වුණ එක හොඳයි. අඩු තරමින් දැන් අපි දන්නවනෙ ඌ අපේ හතුරෙක් කියලා.'' ක්ලෙවර් පැවසුවේ අප ඉදිරියට ගමන් ගන්නා අතරයි.

අඳුර මුළුමනින්ම පලා ගොස් නොතිබුණෙත් අප ඉදිරියට ගමන් කළේ ඉබි ගමනිනි. දිය පාරේ ගැඹුර බෙහෙවින් අඩු වී තිබුණෙත් ගං පතුලේ තිබූ ගල්පරයක හෝ වැලි කන්දක පහුරු ගැටීමේ විශාල අවදානමක් තිබිණි. එහෙයින් මම ක්ලෙවර් සමග ඉදිරියෙන්ම ගමන් ගත් පහුරට වී දිය පාර පිළිබඳ පරීක්ෂාවෙන් සිටියෙමි.

''කිසි සැකයක් නෑ, අර මීට කලින් වතාවෙ මැරුණු එඩ්මන් ගැන පීටර් කියපු කතාව මතකද ඇලෙක්?'' ක්ලෙවර් විමසීය.

''ඔව්. පීටර් කිව්වෙ එඩ්මන් අපේ කූඩාරම පිටිපස්සෙ හැංගිලා අපේ කතාබහට ඇහුම්කන් දෙනවා දැක්කා කියලනෙ...?''

''ඇත්තටම එදා සිද්ධ වෙන්න ඇත්තෙ ඒකෙ අනිත් පැත්ත. පීටර් අපේ කතාබහට ඇහුම්කන් දෙන හැටි එඩ්මන් දකින්න ඇති. මෙක අපිට ආරංචි වෙලා වැඩේ දුර දිග යනවට පීටර් කැමති වුණේ නෑ. අන්න ඒ නිසයි ඌ එදා එඩ්මන්ව මැරුවෙ... මට හිතෙන්නෙ එහෙමයි.'' ක්ලෙවර් පැවසීය.

''ඒක එහෙම තමයි සිද්ධ වෙන්න ඇත්තෙ. ඒත් මට හිතාගන්න බැරි පීටර් කාගෙ ඉල්ලීමකට මේ දේවල් සිද්ධ කළා ද

කියන එකයි.'' මම පැවසුවෙමි. සැබැවින්ම මෙය මට ප්‍රහේලිකාවක් විය.

''ඒක තමයි මම කිව්වෙ මෙතන අපි නොදන්න මහ භයානක කුමන්ත්‍රණයක් සිද්ධ වෙනවා කියලා. සමහර විට පීටර් සත්තියගෙ ගෝලයෙක් වෙන්න ඇති. එහෙමත් නැත්නම් අපි ගැන ඔත්තු බලන්න වෙන කවුරුහරි යොදවපු කුලී සේවකයෙක් වෙන්න පුළුවන්. මතකද අපි පරාවල දී අපේ කණ්ඩායමට සේවකයො හොයද්දී පීටර් අහම්බෙන් වගේ අපිව මුණගැහෙන්න ඇවිත් 'තමන් මේ ගමනට එකතු වෙන්න කැමතියි' කියලා කියපු විදිය?''

''ඔව් මට හොඳට මතකයි. ඒත් දැන් ඒ ගැන පසුතැවිලා වැඩක් නෑ. පීටර්ව යොදවපු මිනිහට ඕනෙ වුණේ අපි යන තැන බලාගන්න නම් ඒ දේ දැන් සිද්ධ වෙලා ඉවරයි. මොකද පීටර් අපි ආපු විදිය, අතු ගංගාවලට හැරුණු තැන් මේ හැම එකක්ම හොඳින් මතක තියාගන්න ඇති. සමහර විට ඌ අපේ ගමන් මාර්ගය කාටත් හොරෙන් කොහේ හරි සටහන් කර ගන්න ඇති.'' ක්ලෙවර් පැවසීය.

''ඒත් කාටවත් මොකටද අපි යන තැන?'' මම විමසුවෙමි.

''මේක එහෙම අවතක්සේරු කරන්න එපා ඇලෙක්... අපි යන තැන වැදගත් වෙන්නැත්තෙ කාටද කියලා කල්පනා කරලා බලන්න. අන්න එතකොට නිකන්ම ඇලෙක්ගෙ ප්‍රශ්නෙට උත්තරේ ලැබෙයි. විශේෂයෙන් අපි අමතක කරන්න නරකයි මැතිව්ගෙ පෞද්ගලික හතුරන්ව. මැතිව්ගෙ සත්ත්ව වෙළෙඳ ව්‍යාපාරය ගැන ඊර්ෂ්‍යාවෙන් කවුරුහරි මැතිව්ගෙ ගමන් බිමන් ගැන සොඳිසි කරනවා වෙන්න පුළුවන්. අර බෙංගාල ව්‍යාඝ්‍රයින්ට සමාන පෙනුමක් තියෙන දකුණු ඇමරිකානු ව්‍යාඝ්‍රයින් ගැවසෙන්නෙ කොහේද කියන එක කාටහරි දැනගන්න අවශ්‍ය වුණා වෙන්නත් පුළුවන්. අපිට මේ හැම දෙයක් ගැනම කල්පනා කරලා බලන්න සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසුවේය.

උද්ගතව ඇති ගැටලුවට පිළිතුරු සෙවීම මනස තව තවත් ව්‍යාකූල කරන කාර්යයක් වූයෙන් මම තවත් ඒ පිළිබඳ කල්පනා නොකළෙමි.



# මං සලකුණු හමුවේ

ක්‍රමයෙන් හිරු පායා දෙරණ ආලෝකවත් විය. එහෙත් දිය පාර ආවරණය කරමින් පැවැති ඝන උඩුවියන් හේතුවෙන් අප අවට පැවතියේ මඳ අඳුරු බවකි. අපි මෙලෙස තවත් හෝරා කිහිපයක් ඉදිරියට යාත්‍රා කළෙමු. ඒ වන විට මධ්‍යාහ්නය ද එළඹ තිබිණි. එහෙයින් අපි පලතුරු ටින් කිහිපයක් විවෘත කර කුසගිනි නිවා ගත්තෙමු.

තවත් හෝරා කිහිපයකින් පහුරුවලට සමුදීමට සිදුවනු ඇත. මාගේ සිහියමට අනුව දැන් අප ළඟා වෙමින් සිටින්නේ පෙර වාරයේ යළි මවු රට බලා පිටත්ව යෑමට බල්සා පහුරුවලට නැඟි ස්ථානය වෙතයි. එහෙයින් මම නිරතුරු පරික්ෂාවෙන් සිටියෙමි. එහෙත් මා සෙවූ සලකුණු හමු වූයේ තවත් හෝරා කිහිපයක් ඉදිරියට ගමන් කළ පසුවය.

''ක්ලෙවර්, මතකද අර දැවැන්ත සෙඩර් ගහ?'' එම දැවැන්ත වෘක්ෂය නෙත ගැටෙත්ම මම කෑගැසුවෙමි.

''ඔව්... එදා රෑ අපි හිටියෙ ඒ සෙඩර් ගහ යටනෙ!'' ඔහු පැවසුවේ මාගේ සුරත තදින් ග්‍රහණය කර ගනිමිනි. එම දැවැන්ත වෘක්ෂය දැකීම පවා සිතට සැනසුමක් විණි. එත්කි! ඔබත් මාත් හමුවේ ඇත්තේ තවත් එක් අභියෝගයක් පමණි. එනම් මෙම බිහිසුණු වනය ජය ගෙන ඉන්කා රාජධානිය සොයා ගැනීමය.

තවත් මිනිත්තු කිහිපයක් ගතවත්ම අපි එම දැවැන්ත වෘක්ෂය පිහිටි සීමාව වෙත සමීප වීමු.

''අපි මේ පහුරු කාටවත් හොයාගන්න බැරි වෙන විදියට කොහේ හරි හංගමු.'' මැතිව් පැවසීය.

''ඔව්... ඒක කෝකටත් හොඳයි. සමහර විට පීටර්ව ඔත්තු බලන්න යොදවපු මිනිහා අපිව ලුහුබඳිනවා වෙන්න පුළුවන්.'' ක්ලෙවර් පැවසීය.

පහුරු සැඟවීම සඳහා දිය පාරට යාර සියයක් පමණ දුරින් පිහිටි අඳුරු තුරු ගොමුවක් අපි සොයා ගතිමු. වැඩි ආරක්ෂාව පතා තවත් කටු පඳුරු කිහිපයක් කපා ගෙනවිත් පහුරු ආවරණය වන ලෙස තැබීමට ද අපි අමතක නොකළෙමු. දැන් අප අපගේ චාරිකාවේ වඩාත් දුෂ්කර වූ පරිච්ඡේදයට පැමිණ ඇත.

මම එම දැවැන්ත වෘක්ෂය පාමුල හිඳ මාගේ සිතියම දිගහැර බැලුවෙමි. ඒ වන විට අපගේ සේවකයන් සිටියේ, දැවමය පෙට්ටිවල අසුරා තිබූ අපගේ බඩුබාහිරාදිය කර මතින් ඔසවාගෙන යෑමට හැකි වන අයුරින් සකසමිනි. එය බොහෝ වෙහෙසකර මෙන්ම දුෂ්කර වූ කාර්යයක් වන බව මම දැන සිටියෙමි. මේ වන විට ද අපට අපගේ බ්‍රසීලියානු සේවකයන් තිදෙනෙකු අහිමි වී ඇත. එඩ්මන් සහ ජෝසෝ ඝාතනයට ලක් වූ අතර පීටර් පලා ගියේය. ඉතිරිව සිටි බ්‍රසීලියානුවන් පස්දෙනාත් ස්වදේශික රතු ඉන්දියානුවන් සතර දෙනාත් යුහුසුළුව සිය කාර්යයන්හි නිරතව සිටින අයුරු මම බලා සිටියෙමි.

''ඇලෙක්, මොනවද කල්පනා කරන්නෙ?'' ක්ලෙවර් මා අසලට පැමිණෙන තුරුම මම ඔහු නොදුටුවෙමි.

''නෑ, මම මේ කල්පනා කළේ අපිට කරදරයක් නැතිව ඉන්කා රාජධානියට යන්න ලැබෙයිද කියලා.''

''මට නම් ඒ ගැන කිසි සැකයක් නෑ ඇලෙක්. මට හිතෙන්නෙ අපි දැන් අපේ චාරිකාවෙ අමාරුම කොටස පහු කරලයි ඉන්නෙ. මට විශ්වාසයි, අපිට කරදරයක් නැතිව ඉන්කා රාජධානියට යන්න ලැබෙන බව.'' ක්ලෙවර් පැවසුවේ අඳුරු සිතිවිලිවලින් වැසී යමින් තිබූ මාගේ සිත ධෛර්යමත් කරමිනි.

''අද රෑ අපි මෙතන නවතිමුද?'' දැනටමත් කළුවර වැටීගෙන එනවා.'' මම විමසුවේ මැතිව් ද ටෝර්නි ද ලයිසැන්ඩර් මහතා ද අප වෙත සමීප වූ පසුවය.

''නෑ, අපි තව ටිකක් එහාට යමු. මොකද අද රෑ අපිට ගිනිමැලයක් පත්තු කරන්න වෙනවා. මෙතන ගිනි මැලයක් පත්තු





කළොත් දිය පාර දිගේ එන කෙනෙක්ට අපි මෙතන ඉන්න බව පෙනෙනවා. මට හිතෙන්නෙ ඒ නිසා අපි තව ටික දුරක් වනාන්තරේ ඇතුළට යන එක නුවණට හුරුයි.'' මැතිව් යෝජනා කළේය.

''ඒ කියන්නෙ මැතිව්ට හිතෙනවද කවුරුහරි අපේ පස්සෙන් එනවා කියලා.'' ලයිසැන්ඩර් විමසීය.

''මට ඒක හරියටම කියන්න බෑ ලයිසැන්ඩර් මහත්තයා. ඒත් අපි හැම පැත්තක් ගැනම කල්පනා කරන්න ඕනෙ.'' මැතිව් පැවසීය.

# රාත්‍රී කඳවුර

මාගේ සිතියමට අනුව අප ගමන් කළ යුතුව තිබුණේ දිය පාරේ සිට නැගෙනහිර දෙසටය. දිශාව නිර්ණය කර ගැනීම සඳහා මම මාලිමා යන්ත්‍රය උපයෝගී කර ගත්තෙමි.

"අපි මෙන්න මේ පැත්තට තමයි යන්න ඕනෙ." මම පැවසුවෙමි.

ඉන් අනතුරුව අපි අපේ සියලු ගමන් මලු ඔසවාගෙන නැගෙනහිර බලා ගමන් ඇරඹුවෙමු. කාලාන්තරයක් මුළුල්লේ පොළොව මතුපිට ඒකරාශී වූ කොළ රොඩු ස්තරය සහ ලං ලංව වැඩී තිබූ දුවැන්ත තුරුලතාවන් හේතුවෙන් ඉදිරියට ගමන් ගැනීම බොහෝ දුෂ්කර කාර්යයක් විණි. එහෙත් අපි සැතපුම් භාගයක පමණ දුරක් ගෙවා දමා මඳ වශයෙන් එළිමහන් වූ භූමියක් කරා සමීප වීමු. දැවැන්ත වෘක්ෂ කිහිපයක් යම් ස්වභාවික ව්‍යසනයක් හේතුවෙන් කඩා වැටී තිබුණෙන් එම භූමිය තරමක් එළිපෙහෙළි වී තිබිණි.

"මෙතන හොඳයි අපේ කූඩාරම් අටව ගන්න." ක්ලෙවර් යෝජනා කළේය.

"ඔව්.. මේ දරත් තියෙන්නෙ ඕන තරම්." අපගේ විශ්වාසවන්ත බ්‍රසීලියානු සේවකයකු වූ චාලි පැවසීය.

පරිසරය බෙහෙවින් අඳුරු වී පැවතියෙන් කඩිනමින් ගිනි මැලයක් දල්වන ලෙස අපගේ රතු ඉන්දියානු සේවකයන් වෙත පැවසුවෙමු.

කූඩාරම් යුගළ සාදා නිම වන විට රැය උදා වී තිබිණි. ඉන්පසු අපි පරිස්සඩා රොටී සාදා කුසගිනි නිවා ගත්තෙමු.

"ඇලෙක්, ක්ලෙවර්, මට වැදගත් කාරණයක් තියෙනවා කතා කරන්න." මැතිව් පැවසුවේ අප රාත්‍රී ආහාර ගෙන අවසන් වූ පසුවය.

"මොකක්ද?" මම විමසුවෙමි.

"මම මේ කල්පනා කළේ මගේ වැඩේ කොහොමද කර ගන්නෙ කියලා." ඔහු පැවසීය.





"ඒ කිව්වෙ අර ව්‍යාඝ්‍රයෙක්ව කොටු කර ගන්න වැඩේ ද?"

"අන්න හරි, ව්‍යාඝ්‍රයෙක් විතරක් නෙවෙයි, තව සත්තු ඉන්නවා. මම හිතන් ඉන්නෙ සත්ත්ව උද්‍යානවලින් වැඩියෙන් ඉල්ලන සත්තු අල්ල ගන්න." මැතිව් පැවසීය.

"ඉතින් මැතිව් කියන්නෙ ඒක මොන විදියට කරමු කියලද?"

"ඒක තමයි මාත් මේ කල්පනා කරන්නෙ"

"මම හිතන්නෙ අපි මුලින්ම ඉන්කා රාජධානිය හොයාගෙන ඊට පස්සෙ මේ ගැන කල්පනා කරලා බලමු කියලයි." ලයිසැන්ඩර් මහතා යෝජනා කළේය. එහෙත් මැතිව්ගේ මුහුණ අඳුරු වනු මම දුටුවෙමි.

"ලයිසැන්ඩර් මහත්තයා, මම මෙහෙම කිව්වට මාත් එක්ක අමනාප වෙන්න එපා. ඇත්තම කියනවා නම් ඉන්කා රාජධානියට යන්න මගේ කිසිම බලාපොරොත්තුවක් නෑ. ඒකයි මට කියන්න පුවමනා වෙලා තිබුණේ." ඔහු පැවසීය.

එහෙත් ඔහුගේ මෙම ඉල්ලීම කිසිසේත් සාධාරණ එකක් නොවේ යැයි මට සිතිණි.

"මැතිව්, මට හිතෙන්නෙ මේ ඒකට වෙලාව නෙවෙයි." ක්ලෙවර් පැවසුවේය.

"නෑ, ක්ලෙවර්ලගෙ ගමන කඩාකප්පල් කරන්න මම බලාපොරොත්තු වෙන්නෑ. ටෝර්නිටයි මටයි අපේ බ්‍රසීලියානු සේවකයො දෙන්නටයි අපේ වැඩ කර ගන්න පුළුවන් වෙයි. ඒත් මම හිතන්නෙ කොහොමටත් මේ රතු ඉන්දියානුවො හතරදෙනත් ඇඟිලි ගැන ගැන ඉන්නෙ කවදද ආපහු පිටත් වෙන්නෙ කියලා බලාගෙන." මැතිව් පැවසුවේය.

"ඒ කියන්නෙ අපේ රතු ඉන්දියානුවො හතර දෙනත් මැතිව්ට ඕනෙ කියල ද?" මම විමසුවෙමි.

"නෑ... නෑ... මට ඕනෙ නෑ. ඒත් ඒ අයගෙන් අහල බලන්න වෙනවා ඉන්කා රාජධානිය හොයා ගන්නකල් ඇලෙක්ල එක්ක ඉන්නවද කියලා." මැතිව් පැවසීය.

# මැතිව් අප හැර යයි

මැතිව්ගේ සමුගැනීම පිළිබඳ මෙලෙස සටහන් කර තැබීමට සිදුවේ යැයි මම කිසිසේත් නොසිතුවෙමි. එහෙත් එය එසේ සිදුවිණි. යථෝක්ත සංවාදයෙන් අනතුරුව මාගේ සිතේ මැතිව් සහ ටෝර්නි පිළිබඳව පැවති විශ්වාසය සහ හෘදයාංගම බව මඳක් පළුදු වූ බව නොරහසකි. ක්ලෙවර්ට සහ ලයිසැන්ඩර් මහතාට ද එය එසේම වන්නට ඇත. සැබැවින්ම මා සිතා සිටියේ අප ඉන්කා රාජධානිය සොයා ගන්නා තුරු මැතිව් සහ ටෝර්නි අප සමඟ රැඳී සිටිනු ඇතැයි කියාය. එහෙත් සියල්ල අප බලාපොරොත්තු වන අයුරින්ම සිදු නොවනු ඇත.

පසු දින හිරු නැගී පසු මැතිව් සහ ටෝර්නි සිය අරමුණු ඉටුකර ගනු පිණිස, එනම් සතුන් අල්ලා ගැනීම පිණිස පිටත්ව යන බව පැවසුවෙන් අපි මහත් අපහසුතාවයට පත්වීමු.

''ඇලෙක්, අපිටත් දෙකෙන් එකක් තීරණය කරන්න වෙනවා. එක්කො තවත් ප්‍රමාද නොවී අපි අපේ ගමන යන්න ඕනෙ. එහෙම නැතිනම් මැතිව්ලගෙ වැඩේ ඉවර වෙනකල් අපිටත් බලන් ඉන්න සිද්ධ වෙනවා.'' ක්ලෙවර් පැවසුවේ මා හා හුදකලා වූ මොහොතකය.

''ඒක තමයි, මට නම් මොනවත්ම හිතාගන්න බෑ. ඒත් තවත් ප්‍රමාද වෙන එකත් නුවණට හුරු නෑ.'' මම පැවසීමි.

ලයිසැන්ඩර් මහතා අප අසලට පැමිණියේ මේ අතරතුරය. ඔහුගේ මුහුණ ද අඳුරු වී තිබිණි.

''මැතිව්ලට යන්න ඕනෙ නම් යන්න දෙමු. අපිට කාවවත් බලෙන් තියාගන්න ඕනෙ නැහැනෙ.'' ඔහු පැවසීය.

''මටත් එහෙම හිතෙනවා. ඒත් එහෙම වුණොත් අපි තුන්දෙනයි චාලි, ටෝරෝ, ෆර්නැන්ඩෝ කියන බ්‍රසීලියානුවො තුන්දෙනයි විතරයි ඉතිරි වෙන්නෙ.''

''කරන්න දෙයක් නෑ ක්ලෙවර්, අපිට කොහොමහරි ඒ අභියෝගයට මුහුණ දෙන්න වෙනවා.'' ලයිසැන්ඩර් පැවසීය.





''අපි අපේ රතු ඉන්දියානු සේවකයො හතරදෙනාව කොහොමහරි තියාගන්න බලමු.''

''ඔව්, ඒත් උන් එක්ක ඍජුව අපේ අදහස් හුවමාරු කර ගන්න බැරි නිසා අපිට අපේ බ්‍රසීලියානු සේවකයන්ගෙ උදව් ඕනෙ වෙනවා ඒකට.'' ක්ලෙවර් පැවසීය.

ඉන්පසු අපි අපගේ විශ්වාසවන්ත සේවකයකු වන ෆර්නැන්ඩෝ කැඳවීමු.

''ෆර්නැන්ඩෝ, හෙට උදේන්ම මැතිව් මහත්තයයි ටෝර්නියි ඒගොල්ලන්ගෙ බ්‍රසීලියානු සේවකයො දෙන්නයි සත්තු අල්ලන්න යන්නයි තීරණය කරලා තියෙන්නෙ. මැතිව් අපේ රතු ඉන්දියානුවො හතර දෙනාත් ඒ කණ්ඩායමට එකතු කරගන්නයි හිතන් ඉන්නෙ. ඉතින් ෆර්නැන්ඩො ඒ රතු ඉන්දියානුවො එක්ක කතා කරලා ඒ අයව නතර කරගන්න බලන්න. අඩුම ගානෙ ඉන්කා රාජධානිය හොයා ගන්න තුරුවත් ඒ අයට අපිත් එක්ක ඉන්න පුළුවන්නම් ඒක ලොකු දෙයක්.'' මම පැවසුවෙමි.

''වැඩක් වෙන් නෑ ඇලෙක් මහත්තයා. මටත් ආරංචි වුණා මේ හැම දෙයක්ම. උන් දැනටමත් තීරණය කරලා ඉවරයි මැතිව් එක්ක යන්න.'' ෆර්නැන්ඩෝ පැවසීය.

''මොනවා! ඒ ඇයි?'' ලයිසැන්ඩර් මහතා විමසීය.

''අනේ මන්ද මහත්තයා. උන් හිතන් ඉන්නෙ අපිත් එක්ක ඉන්කා රාජධානියට ගියොත් ආයෙත් කිසි දවසක ආපහු යන්න ලැබෙන එකක් නෑ කියලයි. මම කොච්චර කිව්වත් උන්ගෙ හිත් වෙනස් කරන්න බැරි වුණා.'' ෆර්නැන්ඩෝ පැවසීය.

''ඒ කියන්නෙ උන් අපිත් එක්ක එන්න කැමති නෑ කියන එකනෙ?'' ක්ලෙවර් පැවසීය.

''අපේ අවාසනාවට අර පීටර් වගේ එකෙක්ව දුර දිග නොබලා මේකට සම්බන්ධ කර ගත්තෙ.'' මම පැවසුවෙමි.

''කමක් නෑ ඇලෙක්, අර කතාවක් තියෙන්නෙ හැම දෙයක්ම සිද්ධ වෙන්නෙ හොඳටයි කියලා. අපිට ගෙනියන්න මහ ලොකු

බඩු තොගයක් නැතෙ. අපි හයදෙනාට පුළුවන් වෙයි ඒවා උස්සගෙන යන්න.'' ක්ලෙවර් අවසානයේ පැවසුවේ අප ඉදිරියේ ඇති අභියෝගය දෙස සුබවාදීව බලමින් විය යුතුය.

• • • • • •

පසු දිනට පහන් වූයේ මෙවන් වූ ව්‍යාකූල වාතාවරණයක් පවතින අතරතුරය. අප අපගේ ගමන් මලු සූදානම් කරමින් සිටින අතරතුර මැතිව් මා ඇමතුවේය.

''ඇලෙක්, මේ අන්තිම මොහොතෙ අපි හිත් අමනාපකම් ඇතිකර ගන්න ඕනෙ නෑ. ඒත් ඇලෙක්ලා ඉන්කා රාජධානියට අපිවත් අරන් යන එකෙන් වෙන්නෙ තවත් අමතර අභියෝගයක් කරට ගන්න එක විතරයි. ඒ නිසා ඇලෙක්ලා ගිහින් එන්න. අපි මෙතන තාවකාලික කඳවුරක් හදා ගන්නවා. කොහොමත් අපේ වැඩ රාජකාරි ඉවර කරගන්න තවත් මාසයක්වත් ගත වෙයි. ඊට වැඩි මිස අඩු නෑ. ඉතින් ඒ අතරතුර ඇලෙක්ලට පුළුවන් ඇලෙක්ලගෙ ගමන ගිහින් ආපහු මෙතනට එන්න. ඉන් පස්සෙ අපි කට්ටියටම ආපහු ගඟ පහළට යන්න පුළුවන්.'' මැතිව් පැවසුවේ මාගේ සුරත තදින් ග්‍රහණය කර ගනිමිනි.

ඊට පිළිතුරු ලෙස මම කිසිත් නොපැවසීමි. එහෙත් ඔහු පවසන්නා වූ පරිදි ඔවුන් අප සමඟ ඉන්කා රාජධානිය වෙත ගමන් ගැනීමෙන් අපට සිදුවන්නා වූ බාධාව කුමක් දැයි මට සිතාගත නොහැකි විය. එහෙයින් මම නිහඬව මාගේ ගමන් මල්ල සූදානම් කර ගත්තෙමි.

තවත් අඩ හෝරාවක පමණ කාලයක් ගත වී අප ඔවුන්ගෙන් සමුගන්නා එම තීරණාත්මක මොහොත උදාවිය. කිසිවකුගේ මුහුණෙහි මඳ සිනහවක් හෝ රැඳී නොතිබිණි.

kathapothak.blogspot.com



# ඉන්කා රාජධානිය සොයා

''මට මතකයි අපිට දවස් දෙකහමාරක් විතර ගියා ඉන්කා රාජධානියෙ ඉඳලා අර දිය පාර ළඟට එන්න.'' ක්ලෙවර් පැවසුවේ සුපරීක්ෂාකාරීව ඉදිරියට ගමන් ගන්නා අතරයි.

''ඔව්, අපිට වරු පහක් ගතවුණා මේ දිය පාර ළඟට එන්න.'' මම පැවසුවෙමි.

අපගේ ගිනි අවි සහ පතරොම් සම සමව බෙදා සේවකයන් තිදෙනා සහ අප තිදෙනා අතර බෙදා තිබූ අතර ඇඳුම් පැළඳුම් සහ ආහාර ආදී සෙසු බඩු බාහිරාදිය සේවකයන්ගේ ගමන් මලු තුළ බහා අපි තිදෙනා ගිනි අවි සූදානමින් තබා ගෙන ඉදිරියෙන් ගමන් කළෙමු. මධ්‍යහ්නය එළැඹි පසු අපි දැවැන්ත වෘක්ෂයක් පාමුල හිඳ ගිමන් හළෙමු. වාසනාවකට මෙන් මේ වන තුරුත් අපිට බිහිසුණු වන සතුන්ගෙන් හෝ ම්ලේච්ඡ ස්වදේශිකයන්ගෙන් හෝ බාධාවක් එල්ල නොවිණි. අප දිවා ආහාරය ගත්තේ එම වෘක්ෂය පාමුල හිඳමය. ටින් කරන ලද ආහාර තවත් සතියකට පමණ ප්‍රමාණවත් වන තරම් ඉතිරි වී ඇති බව මම දුටුවෙමි. එය සිතට විශාල සහනයක් විය.

''මැතිව්ලා මේ විදියට හිටි හැටියෙ ගත්ත මේ තීරණය ගැන නම් මගේ හිතේ කිසිම පැහැදීමක් නෑ ඇලෙක්.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ අප නැවත ගමන් අරඹන විටය. ඔහු මැතිව් අවස්ථාවාදියෙක් යැයි පැවසුවේ වරක් දෙවරක් නොවේ. සැබැවින්ම මැතිව් සහ ටෝර්ති මෙවන් තීරණාත්මක මොහොතක මෙවන් තීරණයක් ගනු ඇතැයි අපි කිසිසේත් නොසිතුවෙමු.

අපි තවත් හෝරාවකට අධික කාලයක් නිහඬව ඉදිරියට ගමන් කළෙමු. මේ අතර ඉදිරියෙන්ම ගමන් කළ ක්ලෙවර් හිටි හැටියේ ගල් පිළිමයක් මෙන් වහා නතර වූයේය. ඉන්පසු ඔහු අතින් යම් සංඥාවක් කළෙන් අපි වහා නතර වීමු. කුරුල්ලන්ගේ සුමිහිරි කූජනයත් තුරු වැල් සුළඟෙන් සෙලවෙන විට නැගෙන්නා වූ සිහින් සර සර නාදයත් හැරුණු විට මගේ සවන්හි වැකුණු යම් හඬක් විණි නම් ඒ අපගේ සුසුම් හඬ පමණි. එහෙත් ක්ලෙවර් සිය දෙතොල හරහා සුරතේ දබරැඟිල්ල තබනු මම දුටුවෙමි.

තවත් තත්පර කිහිපයක් ගත විණි. යම් අපැහැදිලි හඬක් ඇතින් ඇසෙන්නට වූයේ ඒ අතරය. එය බෙර හඬක් විය යුතු යැයි මම අනුමාන කළෙමි.

"ක්ලෙවර්, ඒක බෙර හඬක් නේද?" ලයිසැන්ඩර් මහතා නිහැඬියාව බිඳිමින් සිය හඬ අවදි කළේය.

"ඔව්... මට හිතෙන්නෙ මේ ළඟම වනචාරී ස්වදේශිකයන්ගෙ ගම්මානයක් ඇති. සමහර විට ඒ අර ගිය වතාවෙ අපි එද්දි මඟ හැරපු ම්ලේච්ඡ කුකුමා ගෝත්‍රිකයන්ගෙ ගම්මානය වෙන්න පුළුවන්. මතකයි නේද චාකා අපිට කියපු කතාව?" ක්ලෙවර් විමසීය.

"ඔව්, උන් මිනී මස් කන මහ භයානක ගෝත්‍රයක්!" ලයිසැන්ඩර් පැවසීය.

"ඒ කියන්නෙ අපි කොහොමහරි උන්ව මඟහරින්න ඕනෙ."

ඉන්පසු අප ගමන් ඇරඹුවේ වඩාත් සුපරීක්ෂාකාරී වීමේ අරමුණෙන් යුතුවය. ඇතින් නැගුණු බෙර හඬ පිළිබඳව අපි නිරතුරු අවධානයෙන් පසුවීමු. ඉදිරියට ගමන් ගන්නා වූ සෑම පියවරක් පාසාම බෙර හඬ අපට තව තවත් සමීප වනු දැනිණි. එහෙයින් අපි සෘජුව ඉදිරියට ගමන් නොකර වෙනත් විකල්ප මාර්ගයක් යොදා ගැනීමට කතිකා කර ගතිමු.

"ඇලෙක්, ඔය මාලිමාව හොඳට බලන්න. මේ අනතුරෙන් මිදෙන්න නම් අපිට හැතැප්මක් දෙකක් විතර උතුරට යන්න සිද්ධ වෙනවා. අවදානමක් නෑ කියලා තේරුණහම අපට ආයෙත් අපේ ගමන යන්න පුළුවන්. මොකද ඇලෙක් හිතන්නෙ ඒ ගැන?" ක්ලෙවර් විමසීය.

"ඔව්, මම හිතන්නෙත් අපි මේක මඟහරින එක හොඳයි."

ඉන් අනතුරුව අපි අපේ ගමන් මඟ සම්පූර්ණයෙන්ම වෙනස් කර සෘජුව උතුරු දෙසට ගමන් ගන්නට වීමු. දිගින් දිගටම අපට හමු වූ දැවැන්ත වනස්පතීන් මඟහරිමින් අපි පුරා හෝරාවකට ආසන්න කාලයක් උතුරු දෙසට ගමන් කළෙමු.

"දැන් නම් ඒ හඬ ඇහෙන් නෑ වගේ..." ක්ලෙවර් පැවසුවේ දැවැන්ත වෘක්ෂයක් පාමුල හිඳ ගිමන් හරිමිනි.



# බිහිසුණු ස්වදේශිකයෝ

එම දැවැන්ත වෘක්ෂය පාමුල හිඳ මදක් ගිමන් හැර අපි නැවත ගමන් ඇරඹුවෙමු. ඝන උඩු වියන් ස්ථරය හේතුවෙන් සූර්ය රශ්මිය සෘජුව මිහිමත පතිත නොවූ තරම්ය. එහෙයින් ගතට දැඩි අපහසුවක් නොදැනිණි. විටින් විට වනය තුළින් නැඟී බිහිසුණු නාදයන්ගෙන් අපි තැති ගත්තෙමු. එහෙත් තුරු මුදුන්හි රැඳී සිටි විවිධ විශේෂයන්ට අයත් වානරයන්ට සහ පක්ෂීන්ට අමතරව අපට හමු වූයේ ගෝනුන්, මුවන්, මූසිකයන්, ආමඩිලෝවන් වැනි අහිංසක සතුන් පමණි.

"සමහර විට මේ ස්වදේශික වනචාරී මිනිසුන්ගෙ ඉව වැටෙන නිසා හුඟක් සත්තු මේ පැත්තට නොඑනවා වෙන්නත් පුළුවන්. මොකද සත්තු ඉවෙන් ඒ හැම දෙයක්ම තීරණය කරනවා. මොනම සතෙක්වත් කැමති නෑ වෙනත් සතෙක් එක්ක බලෙන් ගැටුමක් ඇති කර ගන්න. මට හිතෙන්නෙ ඒකයි මේ පැත්තෙ සත්තු අඩුවෙන්න හේතුව." ලයිසැන්ඩර් මහතා පැවසුවේය.

අපි මෙලෙස තවත් හෝරා කිහිපයක් ඉදිරියට ගමන් කළෙමු. අධික බරක් කර මත තබාගෙන මෙවන් රළු බිමක් ඔස්සේ ඉදිරියට ගමන් කිරීම බොහෝ වෙහෙසකර කාර්යයක් විය. එහෙයින් අපගේ ගමන සිදුවූයේ ඉතා මන්දගාමීවය.

"මේ බරත් උස්සගෙන යනවා කියන එක හිතන තරම් ලේසි පහසු වැඩක් නෙමෙයි, ඇලෙක්. තව පැයකින් විතර කළුවර වැටෙයි. අපි ඊට කලින් රෑට ඉන්න තැනක් හොයාගන්න ඕනෙ." ක්ලෙවර් පැවසීය.

"ඔව්, අපි ගිනි මැලයක් පත්තු කරමු." බ්‍රසීලියානු සේවක ෆර්නැන්ඩෝ යෝජනා කළේය.

"ලයිසැන්ඩර් මහත්තයා මොකද හිතන්නෙ? අද රෑ අපි ගිනිමැලයක් පත්තු කරන එක එච්චර සුදුසු නෑ කියලයි මට හිතෙන්නෙ. ඒ නිසා අපි අද රෑ ගහක් උඩ ඉන්න බලමු. මොකද

ජ්කෙන් අර මිනී මස් කන ස්වදේශික වනචාරීන්ව මගහරින්නත් පුළුවන් වෙනවා.'' ක්ලෙවර් පැවසීය.

ඔහුගේ යෝජනාව වඩාත් ප්‍රඥාගෝචර යැයි මට සිතිණි. එහෙයින් මම ද එය අනුමත කළෙමි. ඉන් අනතුරුව රාත්‍රිය ගත කිරීම සඳහා සුදුසු අතුපතර විහිදුණු වෘක්ෂයක් සොයමින් අපි තව තවත් ඉදිරියට ගමන් කළෙමු.

''මේ ගහ හොඳයි වගේ ඇලෙක්... හැබැයි අපේ ගමන් මලු කොහේහරි සුදුසු තැනක හංගන්න වෙනවා.'' ක්ලෙවර් පැවසීය. එය දැවැන්ත ඇප්‍රිකොට් ගසක් වූයේය. පොළොව මට්ටමට අඩි තිහක් හතළිහක් පමණ ඉහළින් සුව පහසුව හිඳගෙන සිටිය හැකි අතු විහිදී තිබුණෙන් අපි එය අපගේ රාත්‍රී නවාතැන වශයෙන් තෝරා ගත්තෙමු.

හිරු අවරගිරේ සැඟව යත්ම සිවු දෙසින් නැගෙන්නට වූයේ ගත ලොමු දැහැගැන්වෙනසුලු බිහිසුණු නාදයන්ය. මෙම ඝන වනාන්තරය මධ්‍යයේ වෙසෙන්නා වූ බිහිසුණු වන මෘගයන්ගේ භයංකාර නාදයන්ගෙන් තැතිගත් අපගේ සේවකයන් භීතියෙන් මුසපත්ව යනු මම දුටුවෙමි. ලයිසැන්ඩර් මහතා ද සිය රයිෆලය දෙඅතින් ග්‍රහණය කර ගෙන සිටියේ, ඕනෑම මොහොතක කොකා ගැස්සීමට සූදානමෙනි. කොයි මොහොතක හෝ අප ඉදිරියට බිහිසුණු වන මෘගයකු කඩා පනිනු ඇතැයි මට සිතිණි. එහෙත් වාසනාවකට මෙන් තවම අපි එවැන්නකට මුහුණපෑමට තරම් අවාසනාවන්ත නොවීමු.

අපගේ ගමන් මලු ඇතුළු බඩු බාහිරාදිය එක් තැනක ගොඩ ගසා කටු පඳුරු සහ අතු ඉති කපා ගෙනවිත් එය කිසිවෙකුට නොපෙනෙන අයුරින් ආවරණය කළෙමු. එම දැවැන්ත ඇප්‍රිකොට් ගසට නැග ගැනීමට අපි සූදානම් වූයේ ඉන් අනතුරුවයි. එය අප සිතූ තරම් පහසු කාර්යයක් නොවීය.

''ක්ලෙවර් මහත්තයා, මම මේ කඹයක් මේ අත්තෙ ගැටගහන්නම්. එතකොට මහත්තයලට ලේසියෙන් ගහට නැග ගන්න පුළුවන් වෙයි.'' ප්‍රථමයෙන් ගසට නැගගත් චාලි පැවසීය.





ඉන්පසු අපි එම කඹය ආධාරයෙන් ගසට නැග ගත්තෙමු. එමෙන්ම අපි අපගේ ගිනි අවි ද පතරොම් යම් ප්‍රමාණයක් ද ගස ඉහළට රැගෙන යැමට අමතක නොකළෙමු. තවත් මිනිත්තු කිහිපයක් ගත වත්ම රැය එළැඹියේය. එමෙන්ම ගතට අධික ශීතලක් දැනෙන්නට වූයේය. රැය එළැඹී මිනිත්තු කිහිපයක් ගතවත්ම වනාන්තරය තුළින් නැගෙන්නට වූයේ බෙර හඬකි. එය නැගුණේ සැතපුම් භාගයක් පමණ දුරින් විය යුතුය. ක්ලෙවර් සිටියේ මා වාඩි වී සිටි අත්තට යාබද අත්තෙහිය. එහෙයින් මට ඔහු සමඟ අදහස් හුවමාරු කර ගැනීමේ හැකියාව තිබිණි.

''ක්ලෙවර්, ඒ හඬ ඇහෙන්නෙ නම් වැඩි ඈතකින් නෙවෙයි. ස්වදේශිකයන්ගෙ ගම්මානයක් මේ ළඟම තියෙනවා. ඒ නිසා අපිට තවත් ඉස්සරහට යන්න වෙනවා උන්ව මගහරින්න.'' මම පැවසුවෙමි.

ක්ලෙවර් මා ඇමතුවේ මිනිත්තු කිහිපයක් එම බෙර හඬ වෙත සිය අවධානය යොමු කිරීමෙන් අනතුරුවයි.

''ඔව්, උන් ඉන්නෙ අපිට බොහොම ළඟින්. සමහර විට මේ හරියෙත් උන් නිතර ගැවසෙනවා ඇති. අපි ගිනිමැලයක් පත්තු නොකළෙ හොඳ වෙලාවට.'' ඔහු පැවසීය.

ගත ලොමුදැහැගන්වනසුලු එම රළු බෙර හඬින් අපගේ බ්‍රසීලියානු සේවකයන් ද බෙහෙවින් තැතිගත් බව ඔවුන්ගේ රැළිගැන්වුණු මුහුණුවලින් ප්‍රත්‍යක්ෂ විය. මධ්‍යම රාත්‍රිය ද පසුවන තුරු එම බෙර හඬ පැවතිණි.

''ඇලෙක්, අපි ගිය වතාවෙ ඉන්කා රාජධානියෙන් පිට වුණාට පස්සෙ ස්ටොන්* මොනවා කරගත්තද දන්නැ නේද? අපි ස්ටොන්ලව හොයාගෙන එන බව දන්වන්න පුළුවන් විධියෙ ස්ටොන්ලව හොයාගෙන එන බව දන්වන්න පුළුවන් විධියෙ සන්නිවේදන ක්‍රමයක් තිබුණ නම් මොනතරම් දෙයක් ද කියලා

* ස්ටොන් යනු ක්ලෙවර්ගේ සහ ඇලෙක්ගේ මිතුරෙකි. ඔහු පෞරාණික ඉන්කා පෙළපතෙන් පැවත ආ තරුණයෙකි. පෙර වාරයේ චාරිකාවේ දී ඔහු ඉන්කා පුරවරයේ රජුගේ දියණියක වූ ලගාෂා කුමරිය විවාහ කර ගත් අතර ඇයගේ පියා වූ ඉන්කා රජුගේ අභාවයෙන් අනතුරුව ස්ටොන් ඉන්කා රාජධානියේ නව රජු බවට පත් වූයේය.

දූත් තමයි තේරෙන්නෙ..'' ක්ලෙවර් පැවසුවේ දිගු සුසුමක් හෙළමිනි.

පසු දිනට පහන් විය. මා අවදි කරන ලද්දේ ක්ලෙවර් විසිනි.

''දන්නෙම නැතිව මට නින්ද ගිහින්. අර බෙර හඬ එළිවෙනතුරු දිගටම ඇහුණද?'' මම විමසුවෙමි.

''නෑ, මට මතක විදියට පාන්දර එකට විතර ඒ හඬ නතර වුණා. ඉන් පස්සෙ මටත් නින්ද යන්නැති.'' ක්ලෙවර් පැවසුවේ ගසෙන් බැස ගැනීමට සූදානම් වෙමිනි.

මිනිත්තු කිහිපයකට පසු අපි සැම එම දැවැන්ත වෘක්ෂයෙන් බිමට බැස ගත්තෙමු. එහි තවදුරටත් රැඳී සිටීම ප්‍රඥාගෝචර ක්‍රියාවක් නොවූයෙන් ඉන් අනතුරුව අපගේ බඩු බාහිරාදිය ද රැගෙන අපි නැවත ගමන් ඇරඹුවෙමු. අප උදෑසන ආහාර ගත්තේ ඉදිරියට ගමන් ගන්නා අතරය. අපගේ උදෑසන ආහාරය බවට පත් වූයේ ටින් කරන ලද පලතුරුය. මෙලෙස අප තවත් සැතපුමක පමණ දුරක් ඉදිරියට ගමන් කරන්නට ඇත. එහෙත් අවාසනාවකට මෙන් මෙවර ද අපි ක්‍රම ක්‍රමයෙන් ළඟාවෙමින් සිටියේ මිනිස් වාසය සහිත පෙදෙසකටය. කපා දමන ලද ගාකවල ඉතිරි කොටන් ආදිය දසත විසිරී තිබිණි.

''මෙක නම් එච්චර හොඳ ලකුණක් නෙවෙයි ඇලෙක්. ඉක්මනට මේ පැත්ත මඟහරින්න බලමු.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේය.

''මේ බලන්න ඇලෙක් මහත්තයා, මේක නම් මිනිස්සු හදාගත්තු අඩි පාරක් ද කොහෙද?'' චාලි පැවසීය. එය නිතර මිනිසුන් ගමන් කිරීම නිසා නිර්මාණය වූ අඩි පාරක් බව බැලූ බැල්මටම පෙනිණි.

''ක්ලෙවර් දූත් අපි මොන පැත්තට ද හැරෙන්නෙ? ආපහු හැරෙන එකත් නුවණට හුරු නෑ. ඒත් තවදුරටත් ඉදිරියට යන්නත් බෑ!'' මම විමසුවෙමි.





''ඉන්කා රාජධානිය තියෙන්නෙ මොන පැත්තෙද?'' ඔහු විමසීය.

''මගේ සිතියමට අනුව නැගෙනහිරින්..''

''එහෙනම් ඉතින් අපි ඒ පැත්තට හැරෙමු.'' ක්ලෙවර් පැවසීය.

''ඔව්, මම හිතන්නෙත් ඒක තමයි හොඳම දේ.'' මම පැවසුවෙමි. මෙතෙක් වේලා මම එය පැවසිය නොහැකිව පසුතැවෙමින් පසුවූවෙමි. මා යළි පැමිණෙන තුරු එන්කි කුමරිය නොඉවසිල්ලෙන් බලා සිටින බැව් මම දනිමි. එහෙයින් තවත් එක් තත්පරයක් හෝ ප්‍රමාද නොවිය යුතු යැයි මට සිතුණේ වරක් දෙවරක් නොවේ. එහෙත් ඇයගේ කාන්තිමත් වත මාගේ මනසේ ඇඳුණු සෑම අවස්ථාවකම මම මහත් ආයාසයකින් මාගේ හැඟීම් පාලනය කර ගත්තෙමි. මා අඳබාලයකු මෙන් හැඟීම්වලට මුල් තැන දී කටයුතු කළේ නම් මෙතෙක් අප ජය ගත් අභියෝග කිසිවක් ජය ගත නොහැකි වනු ඇත.

# ගමන් මඟ වෙනස් වෙයි

ඉන් අනතුරුව අපි නැගෙනහිර දෙස බලා ගමන් ඇරඹුවෙමු. එහෙත් අවාසනාවකට මෙන් මිනිස් වාසය පවත්නා බව තහවුරු වන සාධක දිගින් දිගට ම හමු වූයේය. බිහිසුණු ස්වදේශිකයන් ගැවසුණු එම පෙදෙස මඟහැරීමට අප කොතෙක් උත්සාහ කළ ද එය නිරර්ථක වූයේය.

එය සිදුවූයේ මෙලෙසය. වනාන්තරය මධ්‍යයේ දක්නට ලැබුණු අඩි පාරවල් ආදී සියලු ස්ථාන මඟහරිමින් අපි වේගවත්ව නැගෙනහිර දෙසට ඇවිද යන්නට වීමු. එහෙත් ඉදිරියෙන්ම ගමන් කරමින් සිටි ක්ලෙවර් එක් වරම තිගැස්සී නතරවනු මම දුටුවෙමි. මා ගමන් කළේ ඔහු පසුපසිනි. එහෙයින් මම වහා නතර වීමි. අප ගමන් ගන්නා මඟ හරස් කරමින් මතු වූ තද දුඹුරු පැහැ ස්වදේශික වනචාරීන් දෙදෙනාගේ ඡායාවන් මා නෙත ගැටුණේ ඉන් පසුවයි. උරහිස් දක්වා වැඩුණු කේශ කලාපයන්ගෙන් යුත් ඔවුන් සිටියේ අපට යාර දහයක් පමණ ඉදිරියෙනි. යටි කය පමණක් සම් කඩකින් ආවරණය කර ගෙන සිටි ඔවුහු විවිධ වර්ණයන්ගෙන් සිය සිරුරු වර්ණ ගන්වාගෙන සිටියහ. එමෙන්ම ඉතා නොදියුණු ආයුධ වූ හෙලි සහ මුගුරු ඔවුන් අත රැඳී තිබෙනු මම දුටුවෙමි.

''ඇලෙක්, උන් අපිට පහර දෙන්න ආවොත් කිසිම සමාවක් දෙන්න එපා!'' ක්ලෙවර් පවසනු ඇසිණි. එම වනචාරීන්ගේ කුරිරු දෑස් හි රැඳී තිබුණු බිහිසුණු බව හඳුනා ගැනීම අපහසු නොවිය. කිසියම් මොහොතක මෙම බිහිසුණු මිනිසුන් අපට පහර දෙනු ඇත. එහෙයින් මම මාගේ ගිනි අවියෙන් දෑත් ඉවතට නොගත්තෙමි. මිනිත්තුවක් පමණ අප දෙස බලා සිටි ඔවුහු අපට කිසිසේත් වටහා ගත නොහැකි යම් නොදියුණු භාෂාවකින් යමක් කථිකා කර ගත්හ. ඉන්පසු ඔවුන් අකුණු දෙසට දිවයන්නට වූයේ විදුලි වේගයෙනි. තත්පර කිහිපයක් ගත වන විට ඔවුන් අපගේ දර්ශන පථයෙන් ඉවත්ව ගොස් තිබිණි.





''ක්ලෙවර්, අපි ඉක්මනින් මෙතනින් පිටවෙමු. උන් ආයෙත් එන්නෙ උන්ගෙ වනචාරි සේනාවත් අරන්.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේය. ඔහුගේ කටහඬේ පැවතියේ වෙව්ලනසුලු ස්වභාවයකි. ක්ලෙවර්ගෙ මුහුණ ද අඳුරු වී තිබුණේය.

ඉන්පසු අපි වේගවත්ව ඉදිරියට ගමන් කළෙමු. ''ඉක්මන් කරමු මහත්තයා. දැක්කෙ නැද්ද උන්ගෙ ඇස්වල තිබුණු මිනීමරු මලේච්ඡ පෙනුම. කොයි වෙලාවෙ හරි උන්ගෙ යක්ෂ සේනාව අපේ ඇඟට කඩා පනී!'' ෆර්නැන්ඩෝ පැවසීය.

අපගේ බ්‍රසීලියානු සේවකයන් තිදෙනාට ද ගිනි අවි ලබා දී ඔවුන්ව ද ආයුධ සන්නද්ධ කර තිබුණෙන් එය සිතට යම් සහනයක් විය. අප අඩ හෝරාවකට ආසන්න කාලයක් ඉදිරියට ගමන් කරන්නට ඇත. ඈතින් යම් අපැහැදිලි හඬක් නැඟිණි. එය බෙර හඬක් වූයේය.

''අපිට තව ටිකක් වෙලා තියෙනවා ඇලෙක්.'' ක්ලෙවර් පැවසුවේය.

''උන් ලේසියෙන් අපිව අමතක කරන එකක් නෑ. සමහර විට දැනටමත් අපිව ලුහුබඳිනවා ඇති.'' චාලි පැවසුවේ අප වේගයෙන් ඉදිරියට ගමන් ගන්නා අතරය.

මේ වන විට අප පිවිසෙමින් සිටියේ මනුෂ්‍ය වාසයකින් තොර ඝන උඩු වියනකින් හෙබි අඳුරු පෙදෙසකටය. ලං ලංව වැඩී තිබූ දැවැන්ත වෘක්ෂයන්ගේ මූල පද්ධතිය හේතුවෙන් වේගයෙන් ඉදිරියට ගමන් කිරීම අපහසු විය. එහෙත් බිහිසුණු වනචාරීන්ගෙන් මිදීමට මෙම අඳුරු භූමිය පසුකර යා යුතු විය.

''අර බෙර හඬ ටික ටික මේ පැත්තට ළංවෙනවා වගේ...'' ක්ලෙවර් පැවසීය.

''උන් එක්ක සටනට යන එක අපේ අන්තිම තුරුම්පුව

හැටියට තියාගමු. මොකද අපි හිතනවට වඩා උන්ගෙ පිරිස විශාල එකක් වුණොත් මේ රයිෆල්වලින් උන්ව මෙල්ල කර ගන්න ලැබෙන එකක් නෑ.'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

ඉන් අනතුරුව අපි පොළොවෙන් ඉහළට නෙරාවිත් තිබූ ගල් මුල්වල ගැටෙමින් සැතපුම් භාගයකට ආසන්න දුරක් ඉදිරියට ගමන් කළෙමු. මේ වන විට එම කටුක බෙර හඬ ඉතා පැහැදිලිව ශ්‍රවණය වන අයුරින් අපට ළංවී තිබිණි.

kathapothak.blogspot.com



# ස්වදේශිකයන්ගෙන් මිදී පලායෑම

''උන් ටිකෙන් ටික අපිට ළං වෙනවා වගේ ඇලෙක්'' ලයිසැන්ඩර් මහතා පැවසුවේ දෑවැන්ත වෘක්ෂයක් පාමුල වැතිර ගිමන් හරිමිනි. නොනවත්වා හෝරාවකට අධික කාලයක් අපි වේගවත්ව ඉදිරියට ගමන් කර තිබුණෙමු. එහෙයින් අපි ඔසවාගෙන සිටි අධික බරැති ගමන් මලු බිමින් තබා මිනිත්තු කිහිපයක් විඩා හළෙමු. එහෙත් ක්‍රමයෙන් අප වෙත සමීප වෙමින් තිබූ බෙර හඬ පිළිබඳ සිහිවත්ම අප වැතිර හුන් තැන්වලින් ඉහළට එසවුණේ නිරායාසයෙනි.

අපි නැවත ගමන් ඇරඹුවෙමු. අප ගමන් අරඹා මිනිත්තු විස්සක් පමණ ගතවිණි. අධික බර ප්‍රමාණයක් ඔසවාගෙන බොහෝ වේලාවක් මුළුල්ලේ ඒකාකාරීව වේගවත්ව ඉදිරියට ගමන් කිරීම හේතුවෙන් මාගේ දෑත් දෙපා හිරිවැටී අප්‍රාණිකව යෑමට ආසන්නව පැවතිණි. මාගේ මිතුරන්ගේ මුහුණුවල ද රැඳී තිබුණේ බොහෝ විඩාපත් ස්වභාවයකි. එහෙත් අපගේ චිත්ත ශක්තිය හීන වන සෑම මොහොතකම ක්ලෙවර් අප දිරිමත් කළේය.

''දැන්නම් ඒ හඬ පැහැදිලිව ඇහෙනවා ක්ලෙවර්.'' ලයිසැන්ඩර් මහතා වරෙක පැවසීය.

''ඒ ගැන අමතක කරලා දාන්න ලයිසැන්ඩර් මහත්තයා. දැන් උනුත් අපි වගේම හෙම්බත් වෙලා ඇති. සමහර විට උන් අපිව හොයන එක අත්හැරල දාන්නත් ඉඩ තියෙනවා.'' ක්ලෙවර් පැවසීය.

එහෙත් එම ස්වදේශිකයන්ගේ නොදිසුණු බෙර හඬ එළඹෙන්නා වූ සෑම තත්පරයක් පාසාම අපට තව තවත් සමීප වන්නාක් මෙන් දැනිණි. එහෙයින් කොතරම් විඩාපත්ව සිටිය ද අපි මඳකට හෝ නොනැවතුණෙමු. මේ අතර අප ළඟාවෙමින් සිටියේ තැනින් තැන ශේෂ වූ ගල් පර්වත පිහිටි භූමියක් වෙතය. මෙතෙක් අප පසු කරමින් පැමිණි ඝන උඩු වියනකින් ගෙතී දෑවැන්ත තුරුලතා පවුර ඉන් අවසන් වන බවක් පෙනිණි. දෑවැන්ත

වනස්පතීන් තැනින් තැන පිහිටා තිබුණ ද එහි බහුලව පැවතියේ අඩි දහයක් පමණ උසට වැඩී තිබූ තුරු වදුළුය.

පෙරමුණ ගෙන සිටි ක්ලෙවර් වරෙක නැවතී ඇතින් ඇසෙන බෙර හඬට ඇහුම්කන් දුන්නේය.

''ඇයි?'' ලයිසැන්ඩර් මහතා විමසුවේය.

''නෑ, මට හිතෙන්නෙ උන් තවම ඉන්නෙ අඩුම තරමින් අපිට හැතැප්ම භාගයකට වැඩි දුරින්.'' ක්ලෙවර් පැවසීය.

එහෙත් ගිමන් හැරීම සඳහා මදකට හෝ නතර වීමට අපි උත්සුක නොවුණෙමු. තවත් අඩ හෝරාවකට ආසන්න කාලයක් ගත වන්නට ඇත. දිගින් දිගටම විහිදී තිබූ කළු ගල් පර්වත භූමි සහ තුරු වදුළු පසු කරමින් අපි නැවත වරක් ඝන වනාන්තරයට පිවිසියෙමු. එහෙත් එහිදී මෙවැන්නකට මුහුණ පෑමට සිදුවේ යැයි මම සිහිනෙනුදු නොසිතුවෙමි.

අපි ක්‍රමයෙන් ඝන උඩු වියනකින් හෙබි දැවැන්ත වනස්පතීන් අතරින් ඉදිරියට ගමන් ගනිමින් සිටියෙමු. එක්වරම මුවින් විශ්මයාන්විත හඬක් නැගූ ක්ලෙවර් පසුපසට පියවරක් තැබුවේය. ඉන් මම ද තිගැස්සී ගියෙමි.

''ඇලෙක්, දැක්කද අර අඩි පාර?'' ක්ලෙවර් පැවසුවේ සිය සුරත එක් පසකට දිගු කරමිනි. සතුන් හෝ මිනිසුන් හෝ ගමන් කිරීම නිසා නිර්මාණය වූ අඩි පාරක් අපට දැකගත හැකි විය.

''මේක නම් මිනිස්සු හදාගතිපු අඩි පාරක්. ඒ ගැන කිසි සැකයක් නෑ.'' ලයිසැන්ඩර් පැවසීය.

එසේ නම් අප නැවත පැමිණ තිබෙන්නේ මිනිසුන් වාසය කරන්නා වූ පෙදෙසකටද? බෙර හඬ ඇතින් තවම ඇසේ. අපගේ බ්‍රසීලියානු සේවකයන් තිදෙනා භීතියෙන් මුසපත්ව නිරුත්තරව පසෙකට වී බලා සිටියේ අප මීළඟට ගන්නා තීරණය කුමක් දැයි කියාය.

''ක්ලෙවර්, දැන් අපි මොකද කරන්නෙ? අපි දැන් හැම





පැත්තකින්ම වගේ කොටුවෙලා.'' මම ක්ලෙවර් දෙසට හැරුණෙමි. ඔහු සිටියේ ගැඹුරු කල්පනාවකය.

''අපි මේ අඩි පාර මගහැරලා මෙන්න මේ පැත්තට යමු, ඇලෙක්, බලන්න මාලිමාව, එතකොට අපි කොයි පැත්තට ද යන්නෙ කියලා.'' ක්ලෙවර් පැවසීය.

මම මාලිමාව ඉවතට ගෙන පරීක්ෂා කර බැලුවෙමි.

''දැන් අපිට යන්න වෙලා තියෙන්නෙ නිරිතට.'' මම පැවසුවෙමි.

''එහෙනම් ඒක හොඳට මතක තියාගන්න ඇලෙක්.'' ක්ලෙවර් පැවසුවේ නිරිත දෙසට ගමන් අරඹමිනි.

''ඔව්. දැන් අපි යන්නෙ නිරිත දිගට.'' මම පැවසුවෙමි.

kathapothak.blogspot.com

# රාත්‍රී නවාතැන අබියස දී

අපි එලෙස නිරිත දිගට තවත් අඩ හෝරාවක පමණ කාලයක් මුළුල්ලේ ගමන් කළෙමු. දැවැන්ත තුරු ලතාවන්ගේ මුල පද්ධති සහ පොළොව මත අගල් ගණනාවක් උසට ඒකරාශී වී තිබූ දිරා ගිය ශාක පත්‍ර ස්තරය හේතුවෙන් අපගේ ඉදිරි ගමන සිදු වූයේ බොහෝ මන්දගාමී ලෙසය.

"දැන් වෙලාව පහත් පහුවෙලා ඇලෙක්. මේ වගේ ගොම්මන් වෙලාවට තමයි ඔය දරුණු වන සත්තු එළිපහළියෙ වැඩිපුර ගැවසෙන්නෙ. ඒ නිසා ඉක්මනින් රැය ගත කරන්න සුදුසු තැනක් හොයා ගන්නත් වෙයි. මම හිතන්නෙ අදත් අපිට ගහක් උඩ තමයි ඉන්න වෙන්නෙ." ලයිසැන්ඩර් පැවසීය.

"ඔව්, මට නම් අර බෙර හඬ තවම ඇහෙනවා." චාලි පැවසීය. ස්වදේශික වනචාරීන්ගේ බෙර හඬින් ඔහු බෙහෙවින් තැතිගෙන සිටියේය.

"දැන්නම් උන්ට අපිව හොයා ගන්න ලැබෙන එකක් නෑ චාලි." ලයිසැන්ඩර් ඔහු අස්වසාලීය.

තවත් කෙටි කාලයකින් අඳුර ගලා විත් මෙම ඝන වනාන්තරය සිය කාල වර්ණ සළුවේ වෙලා ගනු ඇත. ඊට පෙරාතුව අපගේ රාත්‍රී නවාතැන සොයා ගැනීමට අපි උත්සාහ කළෙමු.

"මෙන්න මේ ගහ නම් හොඳයි ක්ලෙවර් මහත්තයා." ෆර්නැන්ඩෝ පැවසුවේ දැවැන්ත සෙඩර් ගසක් පෙන්වමිනි.

එම දැවැන්ත වෘක්ෂය වටා එති ඉහළට නැගී තිබූ යෝධ වැල් ආධාරයෙන් එහි ඉහළට නැග ගැනීමේ හැකියාව ද තිබිණි. එහෙයින් අපි අපගේ රාත්‍රී නවාතැන් පොළ ලෙස එම දැවැන්ත සෙඩර් වෘක්ෂය තෝරා ගතිමු.

"අපේ ගමන් මලු ඔක්කොම මෙන්න මෙතන ගොඩ ගහන්න." ක්ලෙවර් පැවසීය. ඉන් අනතුරුව අපි අපේ සියලුම බඩු බාහිරාදිය එක් තුරු වදුලක් අසල ගොඩ ගසා එය ආවරණය වන ලෙස තවත් අතු ඉති කිහිපයකින් එය වසා දැමුවෙමු. එහෙත් ඊට පෙරාතුව පතරොම්වලින් අපගේ සාක්කු පුරවා ගැනීමට අපි අමතක නොකළෙමු.





එම දැවැන්ත වෘක්ෂය වෙත නැග ගැනීම අප සිතූ තරම් පහසු කටයුත්තක් නොවන බව පෙනිණි. ප්‍රථමයෙන් ඊට නැග ගැනීමට උත්සාහ ගත්තේ බ්‍රසීලියානු සේවක ෆර්නැන්ඩෝය. ඔහු ගස් නැගීමට හපනෙකි. ගස වටා එති තිබූ යෝධ වැලෙහි ආධාරයෙන් ඔහු ඉහළට නැග ගැනීමට උත්සාහ ගන්නා අයුරු අපි පහළ සිට බලා සිටියෙමු. ඒ වන විටත් අඳුර ගලා විත් තිබුණෙන් ඉන් අනතුරුව අපි නොපමාව ගසට නැග ගැනීමට උත්සාහ කළෙමු.

එහෙත් කිසිසේත් අපේක්ෂා නොකළ මොහොතක අප මුහුණ පෑවේ බිහිසුණු සිදුවීමකටය. ඒ වන විට අපගේ බ්‍රසීලියානු සේවකයන් තිදෙනා සහ ලයිසැන්ඩර් මහතා ගසට නැග සිටි අතර ගස පාමුල ඉතිරිව සිටියේ ක්ලෙවර් සහ මා පමණි.

ක්ලෙවර් සූදානම් වූයේ ගසට නැග ගැනීමටයි. එහෙත් ඊට ඉඩ නොලැබිණි. මා අසලින් වේගයෙන් පියාඹා ගිය ඊයක් අසල තිබූ පඳුරක ගැටිණි.

"ක්ලෙවර්!" ඒත් සමගම මම ඔහුගේ සුරතින් ඇද්දෙමි.

එහෙත් අප ඇසිපිය හෙළීමටත් පෙර අප අසලින් පියාඹා ගිය තවත් ඊයක් දැවැන්ත සෙඩර් කඳේ ඇමිනුණේය.

"ක්ලෙවර් අන්න උන් සිය ගණනක් මේ පැත්තට එනවා." ලයිසැන්ඩර් ගස මත හිඳ කෑගසනු ඇසිණි. ඉන්පසු ඇසුණේ ගිනි අවියක් මහ හඬින් ක්‍රියාත්මක වන හඬය. ඒ ලයිසැන්ඩර් මහතාගේ ගිනි අවියයි. අන්තරාය අප වෙත ළඟා වන්නේ කවර දිශාවකින් දැයි වටහා ගත නොහැකිව මම රයිෆලය මානමින් දසත බැලුවෙමි. සතර දෙසින්ම හෙලි සහ දුනු හී රැගෙන අප වෙත දිව එන්නවුන්ගේ ඡායාවන් මා නෙත ගැටුණේ එවිටය.

"ඇලෙක්! ඔක පහළ දාපං. මේ ස්වදේශික වනචාරියො නෙවෙයි! මේ අපේ ඉන්කා සෙබළු!" ක්ලෙවර් විශ්මයාන්විතව කෑ ගැසුවේය.

# ඉන්කාවරු නැවත හමුවෙයි!

''ලයිසැන්ඩර් මහත්තයා දෙවියන්ගෙ නාමෙන් ඔක නවත්තන්න.'' මම ලයිසැන්ඩර් මහතාට ඇසෙන අයුරින් කෑගැසුවෙමි. තත්පර කිහිපයක් ගත වන විට තිස්දෙනෙකුගෙන් පමණ සමන්විත ඉන්කා සෙබළ කණ්ඩායමක් අප වටකර ගත්හ.

''උඹලට අපිව මතක නැද්ද? අපි උඹලගෙ හතුරො නෙවෙයි මිතුරො!'' මම ඉන්කාවරුන්ගේ මව් භාෂාවෙන් ඔවුන් ඇමතුවෙමි. ඉන් ඔවුන් විශ්මයට පත් වූ බව මම දුටුවෙමි. එතෙක් වේලා අප වෙත අමෝරාගෙන සිටි හෙලි සහ දුනු හී පහත දැමූ ඔවුහු එකිනෙකාගේ මුහුණු බලාගත්හ. ඉන්පසු අප ඉදිරියට පැමිණියේ මැදි වියේ පසු වූ තේජාන්විත පෙනුමකින් හෙබි ඉන්කා සෙබළෙකි.

''මට ඔබව මතකයි... ඇලෙක්... ඒත් ඒ සූර්යය දිව්‍ය රාජෝත්තමයාගේ ශුද්ධ වූ ඉන්කා දෙවොල දැන් අපිට උරුම නෑ! ඒ හැම දෙයක්ම විනාශ වුණා. ඒ හැම දෙයක්ම නස්කාගෙ පාලනයට නතුවෙලා. නස්කා තමයි දැන් එහෙ ප්‍රධාන පූජකයා. සාපා ඉන්කා* නස්කාගෙන් බේරිල පණ රැක ගත්තෙ බොහොම අමාරුවෙන්.'' ඔහු පැවසුවේ ඉන්කාවරුන්ගෙ මව් භාෂාවෙනි. එය වටහා ගත හැකි වූයේ මට පමණි. ඒ පෙර මා ඉන්කා පුරවරයේ සිටි සමයේ එන්කි කුමරියගෙන් එය උගත් බැවිනි.

ක්ලෙවර් මාගේ මුහුණ දෙස බැලුවේ ඔහු පැවසූ දේ වටහා ගත නොහැකිවයි. එහෙත් එය ක්ලෙවර් හට පහදා දීමට තරම් චිත්ත ශක්තියක් මා තුළ නොවිය.

''ඇයි ස්ටෝන්ට මොකද වුණේ? කෝ ලගාෂා කුමාරිකාව?'' මම නොඉවසිලිමත්ව ඉන්කා සෙබළාගෙන් විමසුවෙමි.

''සාපා ඉන්කයි ලගාෂා කුමරියයි දැන් ඉන්නෙ අපිත් එක්ක. නස්කාගෙ පාලනයට යටත් වෙන්න බැරි නිසා අපි කණ්ඩායමක් ඉන්කා රාජධානියෙන් පිට වුණා. දැන් අපේ අලුත් රාජධානිය තියෙන්නෙ මිට ටිකක් එහායින් වනාන්තරය මැද්දෙ තියෙන පර්වත භූමියක.'' ඔහු පැවසීය.

* ඉන්කාවරු සිය රජු අමතන්නේ 'සාපා ඉන්කා' ලෙසයි.





''එතකොට කෝ එන්කි?'' මගේ හද තුළ ගිනි ඇවිලෙන්නාක් මෙන් දැනිණි. එන්කි යන නම සවන් වැකෙත්ම ඔහුගේ දෙබැම ඉහළ ගොස් නළල රැලි වැටිණි. එමෙන්ම දෙනෙතින් කෝපයේ ගිනි දැල් නික්මිණි.

''එන්කි!... නස්කාගෙ මායා බන්ධනවලට එන්කි අහුවෙලා. දැන් එන්කි තමයි ඉන්කා රාජධානියෙ රැජින. නස්කා එන්කිව යොදාගෙන තමයි මේ හැම විනාශයක්ම කරන්නෙ. නස්කවයි එන්කිවයි මරණ තුරු අපි අපේ සටන අත්හරින් නෑ!'' ඔහු පැවසීය. එය ඇසෙත්ම මාගේ දෙපා අප්‍රාණික වී යන්නාක් මෙන් දැනිණි. කළ යුත්තේ කුමක් දැයි වටහා ගත නොහැකිව මම බොහෝ වේලාවක් ක්ලෙවර් දෙස බලා සිටියෙමි. එහෙත් ඔහුට මේ කිසිවක් වටහා ගත නොහැකි වන්නට ඇත. මේ වන විට ලයිසැන්ඩර් මහතා මෙන්ම අපගේ බ්‍රසීලියානු සේවකයෝ තිදෙනා ද සෙඩර් ගෙසන් පහළට බැස සිටියහ. මෙම රන්වන් පැහැ ඉන්කාවරුන් දැකීමෙන් අපගේ සේවකයන් තිදෙනා බෙහෙවින් තැතිගෙන ඇති බව මම දුටුවෙමි.

''ඇලෙක්, මොනවද මෙතන සිද්ධ වෙලා තියෙන්නෙ. මේ ඉන්කා සෙබළා මොනවද කිව්වෙ?'' ක්ලෙවර් නොඉවසිලිමත්ව විමසීය.

මම ඔහුට සියල්ල පැහැදිලි කළෙමි. එය අසා ඔහු ද බෙහෙවින් කැළඹීමට පත් වූයේය.

''එහෙනම් අපි යමු මේ ඉන්කා සෙබළු එක්ක ස්ටෝන්ව මුණගැහෙන්න.'' ඔහු පැවසීය.

ලයිසැන්ඩර් මහතා ද එය අනුමත කළේය. ''ඇලෙක්, නස්කාට ඔය තියනවයි කියන මායා බන්ධන බලය ගැන නම් මගේ කිසිම විශ්වාසයක් නෑ. මතකයිනෙ ගිය වතාවේ ඔල්මෙක්ට* සිද්ධ වුණ දේ.''

* ඔල්මෙක් යනු නස්කාට පෙර ඉන්කා රාජධානියේ සිටි ප්‍රධාන පූජකයාය. ඔහු සතුව ඉන්ද්‍රජාලික බලයක් පැවතියේ යැයි ඉන්කාවරු විශ්වාස කළහ. (බිහිසුණු වන මැද)

## ඉන්කාවරු සමඟ

ක්ලෙවර් මෙන්ම ලයිසැන්ඩර් මහතා ද මෙම ඉන්කා සෙබළුන් සමඟ ඔවුන්ගේ ගම්මානය වෙත ගමන් කිරීම වඩාත් සුදුසු යැයි පැවසූයෙන් මම ඒ බැව් ඉන්කා සෙන්පතියාට පැහැදිලි කළෙමි. ඔහු ඊට කැමැත්ත පළ කළේය. මෙම ඉන්කා සෙබළුන් සමඟ ගමන් කිරීමෙන් අපගේ මිතුරා 'ස්ටොන්' නැවත හමු විය හැකි බව සත්‍යයකි. එහෙත් එන්කි කුමරිය පිළිබඳ සිහිවත්ම මාගේ සිරුරේ රුධිරය කැටි ගැසී යන්නාක් මෙන් දැනිණි. නස්කාගේ මායා බන්ධන බලයට බියෙන් ඉන්කා රාජධානියෙන් පැන ආ මෙම ඉන්කා සෙබළුන් පසුවන්නේ නස්කා සහ එන්කි කුමරිය පිළිබඳ උඩුදුවන ලද බද්ධ වෛරයෙනි. අවස්ථාවක් ලැබුණහොත් නස්කා නම් පූජකයා මරා දැමීමට ඔවුන් කිසිසේත් පසුබට නොවනු ඇත. එපමණක්ද? නැත. මාගේ ආදරණීය එන්කි කුමරිය ද මොවුන් විසින් මරා දමනු ඇත. ඇය සිය ඉන්කා වැසියන්ට ශාප නොකරන තැනැත්තියක වන බව මම තරයේ විශ්වාස කරමි. ඇය නස්කාගේ ප්‍රාණ ඇපකාරියක බවට පත්වී ඇතිවා විය යුතුය. නොඑසේ නම් ඇය වන් ලාබාල සියුමැලි තරුණියක් මෙවන් වූ තත්ත්වයකට පත් වූයේ කෙසේද? අප විශ්වාස නොකළ ද නස්කා සතුව කිසියම් අදෘශ්‍යමාන බලයක් පවතිනවා විය හැක. එය එසේ වුවද මම නොපමාව ඇය සොයා යා යුතු යැයි අදිටන් කර ගතිමි.

එහෙත් මාගේ සිතෙහි පහළ වූ සිතිවිලි මම කිසිවෙකුට අනාවරණය නොකළෙමි. වෙසෙසින් එය ඉන්කාවරුන්ගේ කෝපයට හේතුවනු ඇතැයි සිතුණෙන් දැඩි ආයාසයකින් මම මාගේ අදහස මදකට යටපත් කර ගත්තෙමි.

ස්ටොන් හමු වූ පසු ඔහු කුමක් පවසනු ඇත්දැයි මට සිතාගත නොහැකි විය. නස්කා නමැති මායා බන්ධනකරුවාට බියෙන් පසුවන ඔහු පෙරළා සිය ඉන්කා රාජධානිය වෙත ගමන් කිරීමක් පිළිබඳ සිතීමටවත් කැමති නොවනු ඇත. එසේ වුවහොත්



මා එන්කි කුමරිය හමුවන්නේ කෙසේද? මෙවන් වූ ගැටලු රාශියක් මාගේ සිතට නැඟිණි.

මෙ වන විට අඳුර ගලාවිත් අප වෙලාගෙන තිබුණේය. එහෙයින් කුමක් කළ යුතු දැයි මට සිතාගත නොහැකි විය.

''ඇලෙක්, දැන් ඒ ගැන කල්පනා කරලා වැඩක් නෑ. අපි මුලින්ම ස්ටෝන්ව මුණගැහිලා ඉමු. ඉන් පස්සෙ තීරණය කරමු මේ ප්‍රශ්නෙ විසඳගන්නෙ කොහොමද කියලා.'' ක්ලෙවර් මා දිරිමත් කළේය. එහෙත් මම නිරුත්තරව ඔහු දෙස බොහෝ වේලාවක් බලා සිටියෙමි. ඔහු නැවත මා ඇමතීය.

''ඇලෙක්, අධෛර්යවත් වෙන්න එපා. අපිට පුළුවන් වෙයි මේ ඉන්කාවරුන්ගෙ සහය ඇතිව ආයෙත් ඉන්කා රාජධානියට ඇතුළු වෙන්න. ඒ හැම දේකටම කලින් අපි ස්ටොන්ව මුණගැහිලා මෙතන ඇත්තටම මොකක්ද සිද්ධ වුණේ කියලා දැනගෙන ඉමු.''

''ඇලෙක්, අහල බලන්න කළුවර වැටිලා තියෙන නිසා අද රෑ මේ සෙඩර් ගහ යට ඉඳලා හෙට උදේන්ම පිටත් වෙමුද කියලා.'' ලයිසැන්ඩර් මහතා පැවසුවේය.

එහෙයින් මම රස්ටා නම් වූ ඉන්කා සෙන්පතියාගෙන් එය විමසුවෙමි.

''නෑ, අපි මේ දැන්ම පිටත් වෙමු. අර ඇතින් ඇහෙන්නෙ මලේච්ඡ කුකුමා ගෝත්‍රිකයන්ගෙ බෙර හඬ. උන් මිනී මස් කන යක්ෂයො වගේ මහ දරුණු කොටසක්. මට හිතෙන්නෙ ඒ හඬ ටිකෙන් ටික මේ පැත්තට ළං වෙනවා. සමහර විට උන්ට ඇලෙක්ලා ගැන දැනගන්න ලැබිලා වෙන්න පුළුවන්. ඒ නිසා මෙතන රැය ගත කරන එක නුවණට හුරු නෑ. අපි අපේ ගම්මානයට යමු. උන් කවදාවත් අපේ ගම්මානයට ඇතුළුවෙන් නෑ, අපිට පහර දෙන්න. ඒ නිසා එහේ අපිට ආරක්ෂාව වැඩි.'' රස්ටා පැවසීය.

''ඔව්. උන් දෙන්නෙක් අපිව දැක්කා. අපිට හිතුණා උන් අපේ පස්සෙන් එයි කියලා. ඒකයි අපි උන්ව මඟහරින්න කියලා හිතාගෙන මේ පැත්තට ආවෙ.'' මම පැවසුවෙමි.

"ඒක හොඳයි. උන්ට අහුවුණා නම් ඉතින් මොන විදියකින්වත් ගැළවුමක් ලැබෙන් නෑ..." රස්ටා පැවසීය.

ඉන් අනතුරුව අපි එම ඉන්කාවරුන් සමඟ ඔවුන්ගේ ගම්මානය බලා ගමන් ඇරඹුවෙමු. වනාන්තරය තුළ ලැගුම් ගෙන තිබූ ගනඳුර හේතුවෙන් ඉදිරියට ගමන් කිරීම බොහෝ අපහසු වූයේය. ඉන්කාවරුන්ගේ මඟ පෙන්වීම අනුව අපි ඔවුන් සමඟ අඩ හෝරාවකට ආසන්න කාලයක් මුළුල්ලේ ඉදිරියට ගමන් කළෙමු.

ඉන් අනතුරුව අපි ගිනිමැල දල්වා ආලෝකවත් කරන ලද, තැනින් තැන කුඩා පර්වත භූමි විසිරී තිබූ කුඩා ගම්මානයක් වෙත ළඟා වූවෙමු. ශක්තිමත් දඬු වැටකින් වට කරන ලද එය ඉන්කාවරුන් ඔවුන්ගේ වාසය සඳහා තාවකාලිකව නිර්මාණය කර ගන්නා ලද රාජධානිය වන බව මම වටහා ගත්තෙමි. අප එහි ළඟාවනු දුටු ඉන්කා වැසියෝ කුතුහලයෙන් යුතුව ගම්මානය මධ්‍යයේ වූ ප්‍රමාණයෙන් තරමක් විශාල පැල්පතක් වටා ඒකරාශී වූහ.

ඉදිරියට ගමන් ගන්නා ඉන්කා සෙබළුන්ට මැදිවී මාගේ මිතුරන් සමඟ මා ඉදිරියට ගමන් කළ ද මාගේ මනස රැඳී තිබුණේ එන්කි කුමරිය අසලයි. මේ මොහොතේ ඇය කුමක් කරනු ඇත්දැයි මම කල්පනා කළෙමි. ඇය බිහිසුණු නස්කාගේ ග්‍රහණයට නතු වී ඇති බවට සැක නැත. කෙසේ හෝ නොපමාව ඇය සොයා යා යුතු යැයි මට සිතිණි.

"ඇලෙක්, උඹ මොනවද කල්පනා කරන්නේ? මම හිතන්නෙ මේක වෙන්නැති ස්ටෝන්ගෙ වාසභවන." ක්ලෙවර් පැවසුවේ මගේ දෙවුරෙන් අල්ලා සොලවමිනි.

එහෙත් මම නිරුත්තරව දෙවුර හැකිළුවෙමි. මාගේ ප්‍රතිචාරය ඔහුගේ සිත් නොගත් බව මම වටහා ගත්තෙමි. මා දෙස නිහඬව බලා සිටි ඔහු යමක් පැවසීමට සූදානම් වූවා පමණි. යථෝක්ත පැල්පත තුළින් ඉවතට පිවිසියේ රන්පත්වලින් සැදි සන්නාහයක් පැළඳ සිටි ඉන්කා තරුණයෙකි.



# පලා ආ රජ කුමරා

"ඇලෙක්! ක්ලෙවර්!" රජ කුමරා විශ්මයාන්විතව පැවසීය.

ඔහු අපගේ මිතුරා, ස්ටෝන් වූ බව මම දුටුවෙමි. "ස්ටෝන්, අපි ආයෙත් මුණගැහුණා." මම ඔහු වැළඳ ගත්තෙමි.

ඉන් අනතුරුව ඔහු ක්ලෙවර්ගේ සුරත ද තදින් ග්‍රහණය කර ගත්තේය.

"ලයිසැන්ඩර් මහත්තයා, මම හීනෙකින්වත් හිතුවෙ නෑ මහාචාර්යතුමා ආයෙත් වතාවක් ඇමේසන් වනාන්තරයට එයි කියලා." ස්ටෝන් පැවසුවේ හිස පහත් කොට මහාචාර්යවරයාට ආචාර කරමිනි.

"ඔව් ස්ටෝන්, අපි හිතන විදියට මේ ලෝකෙ කිසිම දෙයක් සිද්ධ වෙන්නෙ නෑ. අපි දිවි පරදුවට තියලා මෙහේ මහාචාර්ය වෝල්ටර්ව* හොයද්දී ඒ මිනිහා මීට හැතැප්ම දහස් ගණනක් එහා ඊජිප්තුවෙ පිරමිඩ නරඹලා සතුටු වෙනවා. ඉතින් එංගලන්තෙට ගියාට පස්සෙ මට ඒ හැම දෙයක්ම එපා වුණා. ඒකයි මම ඇලෙක්ලා එක්ක ආපහු එන්න තීරණය කළේ. කුහක මිනිස්සුන්ගෙන් පිරුණු ඒ කෘත්‍රිම සුරපුරයට වඩා මේ සතා සිවුපාවා ගහ කොළ කොච්චර සුන්දරද?" ලයිසැන්ඩර් පැවසුවේ දිගු සුසුමක් පහත හෙළමිනි.

"රස්ටා, බොහොම ස්තුතියි මගේ මිත්‍රයින්ව මා ළඟට එක්ක ආවට. මම පස්සෙ රස්ටව මුණගැහෙන්නම්." ස්ටෝන් පැවසීය.

ඉන් අනතුරුව ස්ටෝන් අප තිදෙනාත් අපගේ බ්‍රසිලියානු සේවකයන් තිදෙනාත් සිය පැල්පත තුළට කැඳවා ගෙන ගියේය. එම පැල්පත රන් පත්වලින් සරසා විලක්කු දල්වා හොඳින් ආලෝකවත් කර පැවතියේය.

* මොවුන්ගේ ප්‍රථම චාරිකාවේ පරමාර්ථය වූයේ ඇමේසන් වනාන්තරයේ දී මංමුළා වූ වෝල්ටර් කැවෙන්ඩිෂ් නම් විද්‍යාඥයා සොයා ගැනීමය. (බිහිසුණු වන මැද)

එහි අභ්‍යන්තර කුටියක් අසල සිටි ලගාෂා කුමරිය මා නෙත ගැටිණි. මම මාගේ මිතුරන් දෙදෙනාට ඇය පෙන්වූවෙමි. ඇය ද අප දැක අප අසලට පැමිණියාය. ඇයගේ සෝභාසම්පන්න බව මඳකුදු වියැකී ගොස් නොතිබිණි. ඇය අප අසලට පැමිණි පසු අපි ඇයට ආචාර කළෙමු. සුහදශීලී සිනාවකින් අප පිළිගත් ඇය මා දෙස බැලුවේ අසරණ ලෙසය.

අන් සැමට වඩා ඇයගේ නැගණිය වූ එන්කි කුමරියට කුමක් සිදුවිණි දැයි දන්නා එකම තැනැත්තිය ඇයයි.

''කෝ එන්කි? එයාට මොකද වුණේ?'' මම විමසුවෙමි.

ඇය සිය සැමියා වූ ස්ටොන් දෙස බැලුවේ තීරණයක් ගත නොහැකිව විය යුතුය. ස්ටොන් මාගේ සුරතින් ඇද මා පසෙකට කැඳවාගෙන ගියේය.

''ස්ටොන්, ඇත්තටම ඉන්කා රාජධානියෙ මොකක්ද සිද්ධ වුණේ? මගේ එන්කිට මොකද වුණේ? රස්ටා මට කිව්වා නස්කා කියලා මායා බන්ධනකාරයෙක් ගැන. ඒ කතාව ඇත්තද?''

''ඔව්, මම ඒ හැම දෙයක්ම ඇලෙක්ට තේරුම් කරලා දෙන්නම්. ඊට කලින් මට කියන්න කොහොමද ඇලෙක්ලට රස්ටලාව මුණගැහුණෙ කියලා.'' ස්ටොන් ඉල්ලා සිටියේය.



# නස්කාගේ මායා බලය

ඇමෙසන් වනාන්තරයට පිවිසි මොහොතේ පටන් රස්ටාගේ කණ්ඩායමට අප හමුවන තුරු සිදු වූ සියල්ල ස්ටොන් හට පැහැදිලි කර දීමට බොහෝ වේලාවක් ගත වූයේය. එහෙත් ඒ සියල්ල පැහැදිලි කළේ මා විසින් නොවේ, ක්ලෙවර් විසිනි. එය සවිස්තරාත්මකව පැහැදිලි කළ හැකි මානසික වාතාවරණයක මම පසු නොවූවෙමි.

''ඇලෙක්ලා පහුගිය වතාවෙ ඉන්කා රාජධානියෙන් පිටත් වුණාට පස්සෙ සූර්ය දෙවොලෙ ප්‍රධාන පූජකයා හැටියට අනුප්‍රාප්ත වුණු නස්කාගේ හැසිරීම සම්පූර්ණයෙන්ම වෙනස් වුණා.'' ස්ටෝන් සිය කතාව ඇරඹීය.

''ඒත් අපි එහෙ ඉන්නකල් මට නම් නස්කාගෙ කිසිම වෙනසක් තේරුන් නෑ.'' ක්ලෙවර් පැවසීය.

''ඔව්, ඒක ඇත්ත. නස්කා කියන්නෙ කලින් හිටපු පූජකයා, ඔල්මෙක්ගෙ ඥාති පුත්‍රයෙක්. ගහේ කටු අමුතුවෙන් උල් කරන්න ඕනෙ වෙන්නෑනෙ. ඒ විතරක් නෙවෙයි ඔල්මෙක්ට නොතිබුණු මහ පුදුමාකාර මායා බලයක් නස්කාට තියෙනවා. ඇලෙක්ලා ඉන්කා රාජ්‍යයෙන් පිටවෙලා මාසයයි ගත වුණේ නස්කා මට විවිධ බලපෑම් කරන්න ගත්තා. තමන්ට ඕනෙ ඕනෙ විදියට මාව පාලනය කරන්න උත්සාහ කළා. නස්කා කළ ඉල්ලීම් මම ඉටු කළා නම් රටේ ඉන්කාවරු පීඩාවට පත්වෙන එක වළක්වන්න බෑ. ඉතින් මම නස්කාගෙ ඉල්ලීම් ප්‍රතික්ෂේප කළා. මේ නිසා නස්කා තව තවත් දරුණු වුණා. මට තවමත් හිතාගන්න බෑ මේ දේවල් මේ විදිහට සිද්ධ වුණේ කොහොමද කියලා. එක දවසක් නස්කා මට තර්ජනය කළා තමන්ගෙ ඉල්ලීම් ඉෂ්ට නොකළොත් මාවයි ලගාෂවයි මරලා දානවා කියලා. ඒක අහලා මටත් තදින් කේන්ති ගියා. මම නස්කට අභියෝග කළා. 'පුළුවන් දෙයක් තියෙනව නම් කරලා පෙන්නපං' කියලා. ඌ කිව්වා 'හොඳයි

එහෙනම් මැරෙන්න ලෑස්ති වෙයන් සාපා ඉන්කා. උඹට හෙට උදේ ඇඳෙන් නැගිටින්න ලැබෙන එකක් නෑ. එහෙම නොවුණොත් මම නස්කා නෙවෙයි' කියලා. ඌ මගේ කුටියෙන් පිටවෙලා ගියේ මහ අසෝබන විදියට හිනාවෙවී.

නස්කා ගැන මගේ හිතේ බයක් ඇති නොවුණා නෙවෙයි. ඒත් මම හීනෙකින්වත් හිතුවෙ නෑ මෙහෙම දෙයක් වෙයි කියලා. එදා රෑ මම ලගාෂටත් කිව්වා නස්කා මට කළ අභියෝගය ගැන. අපි එදා රෑ නින්දට ගියේ බොහොම ප්‍රමාද වෙලා. හිතේ තිබුණු තැති ගැනීම නිසා මට නින්ද ගියේම නෑ. යාන්තමින් හරි ඇස් දෙක පියවුණේ පාන්දර එළිවෙන යාමෙ.

ඒත් මට වැඩි වෙලා ඒ විදියට ඉන්න ලැබුණෙ නෑ. මට තේරුණා මාව පිච්චෙනවා වගේ. මම නැගිටලා ලගාෂට කතා කළා. මගේ හිස පුපුරන්න එනවා වගේ දැනුණා. ලගාෂා මගේ නළලට අත තියලා බලලා කිව්වා මට හොඳටම උණ කියලා. ඒ උණ දවස් දෙකක් තිස්සේ තිබුණා. ඒක මොන විදියකින්වත් සුව වුණේ නෑ. ඉන් පස්සෙ මට කෑම බීම පවා අප්‍රිය වුණා. මම හිතුවා මේක තමයි මගේ අවසානය කියලා. මගේ හැම අවශ්‍යතාවයක්ම සොයා බැලුවෙ ටාකායි රස්ටායි තමයි.

මේ අතර තමයි ලගාෂාත් මේ දරුණු උණට ගොදුරු වුණේ.

ඊට පහුවෙනිදා නස්කා ආවා මං ළඟට. ඒ වෙලාවෙ ටාකායි, රස්ටයි, එන්කියි මං ළඟ හිටියා. නස්කා මං ළඟට ඇවිත් නිශ්ශබ්දව මං දිහා හුඟක් වෙලා බලං හිටියා. ඒ වෙලාවෙ මං හිටියෙ බොහොම අසාධ්‍යව මරණය පෙනි පෙනී. ඌ මං දිහා බලං ඉඳලා ඉන් පස්සෙ දිග ලෝගුවෙ තිබුණු සාක්කුවෙන් අලංකාර මැණිකක් එළියට අරන්, ඒකට මොනවදෝ මැතිරුවා.

"සාපා ඉන්කා, උඹ මට අභියෝග කළා. දැන් උඹට තේරෙනවනෙ අපි දෙන්නගෙන් කවුද බලවතා කියලා. මට දැන් ඕනෙ නම් උඹවයි ලගාෂාවයි සූර්යය දිව්‍ය රාජෝත්තමයාට බිලි දෙන්න වුණත් පුළුවන්. මොකක්ද උඹේ අවසාන තීරණය සාපා ඉන්කා? මරණය ද? නැත්තම් මං කියන විදියට..." නස්කා අර





මැණික මගේ මූණට ළං කළා. මට තේරුණා මාව කොහේ හරි ඈත ලෝකයකට පාවෙලා යනවා වගේ. මම කතා කරන්න උත්සාහ කළත් එක වචනයක්වත් කටින් පිටවුණේ නෑ. මේ අතර මම දැක්කා මගේ ඇඳ ළඟ හිටපු ටාකා නස්කාව පැත්තකට තල්ලු කරනවා වගේ. ඒත් එක්කම ආයෙත් මං පියවි සිහිය ලැබුවා.

ඒත් ප්‍රශ්නය එතනින් විසඳුනේ නෑ. "ටාකා, උඹගෙ කිලිටි දෑතින් ශුද්ධ වූ මේ දිව්‍ය පුත්‍රයාට තර්ජනය කළා. උඹට ඒකට දඬුවම් විඳින්න සිද්ධ වෙනවා." එහෙම කියලා නස්කා එතනින් පිටත්වෙලා සූර්ය දෙවොල පැත්තට ගියා.

"සාපා ඉන්කා, නස්කාගෙන් අපිට ගැලවීමක් නෑ වගේ. ඉක්මනට මෙකෙ කෙළවරක් දකින්න ඕනෙ." ටාකා එහෙම කිව්වා. ඒත් එදා රෑ ටාකා අතුරුදන් වුණා! අන්තිමට ටාකාව දැක්කෙ මෙන්න මේ රස්ටා. ඒ සූර්ය දෙවොල පැත්තට යනවලු. ඒත් ඉන් පස්සෙ ටාකා සම්පූර්ණයෙන්ම අතුරුදන් වුණා. ටාකා තවම ජීවතුන් අතර ද නැත්නම් නස්කා ටාකට මොනවාහරි කළා ද කියලා අපි තවම දන්නෙ නෑ.

ටාකා අතුරුදන් වුණු දවසට පහුවෙනි දා ආයෙත් නස්කා ආවා මාව මුණගැහෙන්න. මට මතකයි මගේ ඇඳ ළඟට වෙලා නස්කා හුඟක් වෙලා බලන් හිටපු බව.

"සාපා ඉන්කා, උඹ දැන්වත් පිළිගන්නවද මේ ඉන්කා රාජධානියෙ ප්‍රධානියා උඹ නෙවෙයි, මම කියන එක?" නස්කා ඇහුවෙ මගේ මූණට ළංවෙලා. ඒත් මගේ හිතේ නස්කා ගැන මොනතරම් ක්‍රෝධයක් ඇති වෙලා තිබුණ ද කියනවා නම් මගේ ඇඟට පණ තිබුණ නම් ඒ වෙලාවෙ මොනවගේ දෙයක් සිද්ධ වෙයිද කියන්න මටම තේරෙන් නෑ. ඒත් අඩුම තරමේ ඒ වෙලාවෙ මට කතා කර ගන්නවත් පුළුවන්කමක් තිබුණෙ නෑ. මේ වෙලාවෙ මගේ ඇඳ ළඟ හිටියෙ එන්කි විතරයි. නස්කාගෙ මේ පිළිකුල් සහගත හැසිරීම නිසා එන්කි හිටියෙ හොඳටම බයවෙලා.

"නස්කා, සූර්ය දිව්‍ය රාජෝත්තමයාගෙ නාමෙන් මෙක නවත්තන්න. මොකක්ද මෙකෙ තේරුම?" එන්කි කිව්වා.

ඒත් නස්කා එන්කිගෙ ඉල්ලීම පයට පෑගෙන දූවිල්ලක් තරමවත් ගණන් ගත්තෙ නෑ.

"එන්කි, උඹ උඹේ වැඩක් බලාගනින්. මේ ඉන්කා රාජධානියෙ වැඩ කෙරෙන්න ඕනෙ මට ඕන විදියට. අන්න ඒක මතක තියා ගනින්!" කියලා නස්කා වියරුවෙන් වගේ කෑගැසුවා.

"සාපා ඉන්කා! හෙටින් පස්සෙ මේ ශුද්ධ වූ ඉන්කා පුරවරයෙ අවුරුදු සිය දහස් ගණනක් මුළුල්ලේ පැවත ගෙන ආපු සම්ප්‍රදාය අවසන් වෙනවා. ඔව්, හෙට සූර්ය දිව්‍ය රාජෝත්තමයා සූර්ය දෙවොලට ඇතුළුවෙන්න කලින් සාපා ඉන්කා මේ රාජධානිය අත්හැරලා යා යුතුයි. එහෙම නොවෙනවා නම් මේක තමයි උඹේ අන්තිම රැය! හෙට සූර්ය දිව්‍ය රාජෝත්තමයා දකින ගන්න උඹ ජීවත් වෙන එකක් නෑ!" නස්කා එතැනින් පිටවෙලා ගියේ මට මරණ තර්ජනය කරලා. ඒත් මට මතක එච්චරයි. ඉන් පස්සෙ මට සිහිය එද්දි මම හිටියෙ මේ ඝන වනාන්තරේ මැද තාවකාලිකව අටවපු පුංචි පැල්පතක, බිම එළපු පන් පැදුරක." එසේ පැවසූ ඔහු මඳකට නිහඬ වූයේය.

"ඔව්, මම තමයි මගේ කණ්ඩායමත් එක්ක සාපා ඉන්කාවයි ලගාෂා කුමාරිකාවයි අරන් ඉන්කා රාජ්‍යයෙන් පිටත් වුණේ. අපිත් එක්ක තවත් පවුල් පනස් එකක් ආවා." රස්ටා මා හට කරුණු පැහැදිලි කිරීමට වූයේය. "තමන්ට විරුද්ධව කතා කරපු කිසි කෙනෙක්ට යහතින් ඉන්න නස්කා ඉඩ දුන්නෙ නෑ. සමහර අය ඔත්පල වුණා. තවත් සමහර අය අතුරුදන් වුණා. ඒ වගේම නස්කාගේ මායා බන්ධන බලය බිඳින්න සමත් කවුරුවත් මේ ඉන්කා රාජ්‍යයේ හිටියෙ නෑ. ඒ නිසයි අපි තීරණය කළේ සාපා ඉන්කවත් අරන් ඉන්කා රාජධානියෙන් පිටවෙන්න. අපේ වාසනාවට ඉන්කා රාජ්‍යයෙන් පිට වෙලා සතියක් විතර ගත වෙද්දි සාපා ඉන්කගෙ තත්ත්වය සුව අතට හැරුණා. සූර්ය දෙවොලෙ මුරට හිටපු, නස්කාට පක්ෂපාති මුර සෙබළ කණ්ඩායම හැර අනිත් හැම ඉන්කා වැසියෙක්ම හිටියෙ සාපා ඉන්කට පක්ෂපාතිව. ඒත් අපිත් එක්ක ඉන්කා රාජධානියෙන් පිටවුණේ පවුල් පනස් එකක් විතරයි. මේ වෙනකොට වාකත් අතුරුදන් වෙලා තිබුණු නිසා මට තමයි





මේ හැම දේකම වගකීම භාරගෙන කටයුතු කරන්න සිද්ධ වුණේ. මම දැනන් හිටියා කලකට ඉස්සර අත්හැරලා දාපු ස්වදේශික ගම්මානයක් මෙතන තිබුණු බව. ස්වදේශිකයන්ගෙ පැල්පත් තවමත් ඉතිරිවෙලා තිබුණු නිසා මට හිතුණා මෙතන අපේ රාජධානිය පිහිටුවා ගන්න එක පහසු වෙයි කියලා.

මෙතන ඉඳලා වරු තුනක් විතර දුරයි අපේ ඉන්කා රාජධානියට. ඒ වුණාට ඉන්කා රාජධානියෙ වැසියෝ අපිට නිතර මුණගැහෙනවා. එහේ හැම විස්තරයක්ම ඒ නිසා අපිට ආරංචි වෙනවා..." රස්ටා සිය කතාව මඳකට නතර කළේ මාගේ බාධා කිරීම හේතුවෙනි.

"ඇයි එන්කි රස්ටලත් එක්ක ඉන්කා රාජධානියෙන් පිට නොවුණේ?" මම විමසුවෙමි.

"එදා අපි ඉන්කා රාජධානියෙන් පිටත් වුණු දවසෙ එන්කි කුමාරිකාව අතුරුදන් වුණා.! සාපා ඉන්කා කිව්වෙ එදා එන්කි කුමාරිකාව නස්කා එක්ක බහින් බස් වුණා කියලා. එදා අපි එහෙන් පිටවෙද්දි එන්කි කුමාරිකාව සාපා ඉන්කගෙ රාජකීය කුටියෙ හිටියෙ නෑ. මම හැම තැනකම හෙව්වා. ඒත් ඒ කොහේවත් එන්කි හිටියෙ නෑ. එකම එක තැනයි තිබුණෙ මම නොගිය. ඒ තමයි සූර්ය දෙවොල. නස්කාගෙ රාජධානිය! ඒ වෙලාවෙ එන්කි හිටියා නම් ඒ සූර්ය දෙවොල ඇතුළෙ තමයි. සමහර විට නස්කාගෙ සෙබළු එන්කිව හිරකරගෙන හිටියා වෙන්න පුළුවන්.

අපි ඉන්කා රාජධානියෙන් පිටවෙලා දවස් තුනක් ගත වෙන්න ඇති. මම මගේ මිත්‍රයින් කීපදෙනෙක්ට දැනුම් දීලයි ආවෙ අපි කොහේද අපේ කඳවුර පිහිටුවා ගන්නෙ කියලා. ඒ නිසා ඒ අයට අපි අලුතින් හදා ගනිපු රාජධානිය හොයා ගන්න එක අමාරු වෙන්න නැතිව ඇති. ඉතින් දවස් තුනක් යද්දි අර මම කියපු මගේ මිත්‍ර ඉන්කා වැසියෙක් ආවා අපිව හොයාගෙන. එතකොට තමයි අපිට දැනගන්න ලැබුණෙ නස්කා ඉන්කා රාජධානියෙ අලුත් පාලිකාව විදියට එන්කි කුමාරිකාව නම් කරපු බව. අපේ ඉන්කා පරපුරේ ඉතිහාසයෙ කිසිම දවසක රජෙක් මිස

රජිනක් ඉඳලා නෑ. ඒ විතරක් නෙවෙයි, මෙතන තියෙන භයානකම දේ තමයි එන්කි කරන හැම දෙයක්ම තීරණය කරන්නෙ නස්කා. කොටින්ම කියනවා නම් දූන් ඉන්නෙ ඉස්සර හිටපු එන්කි කුමාරිකාව නෙවෙයි, නස්කගෙ මායා බන්ධනවලට හසුවුණු දුෂ්ට රජිනක්!'' රස්ටා පැවසීය.

''රස්ටා, ඒ කියන්නෙ නස්කගෙ මායා බන්ධන රස්ටත් විශ්වාස කරනවා කියලද?'' මම විමසුවෙමි.

''විශ්වාස කරන්න තමයි සිද්ධ වෙලා තියෙන්නෙ. නස්කාට මායා බන්ධන බලයක් නැත්නම් කොහොමද සාපා ඉන්කා හිටිහැටියෙ ලෙඩ වුණේ, ලගාෂා කුමාරිකාවත් ඒ දරුණු රෝගයට ගොදුරු වුණේ? ඒ විතරක් නෙවෙයි, වාකාට මොකක්ද සිද්ධ වුණේ? එන්කි කුමාරිකාවට මොකද වුණේ? හැම දෙයකින්ම ඔප්පු වෙනවා නස්කාගෙ තියෙන මායා බන්ධන බලය. මම කලිනුත් කිව්වෙ, අපිට නිතරම අපේ මිත්‍රයින්ව මුණගැහෙනවා කියලා. ඒ නිසා එහෙ සිද්ධ වෙන හැම දෙයක්ම අපිට ආරංචි වෙනවා. දූන් ඉන්කා රාජධානියෙ හැම දෙයක්ම සිද්ධ වෙන්නෙ නස්කාට ඕනෙ විදියට ලු. නස්කාට විරුද්ධ වෙන කාට වුණත් අත්වෙන්නෙ මහ භයානක ඉරණමක්. ඒ තමයි මරණය. සූර්ය දිව්‍ය රාජ්‍යයේ පාරිශුද්ධත්වය වෙනුවෙන් නස්කා තමන්ට විරුද්ධව යන කාව වුණත් පණ පිටින් පුළුස්සලා දානවා. මෙ ළඟදිත් ඉන්කා රාජ්‍යයෙන් තවත් පවුල් විසිහතරක් විතර පිටත්වෙලා ඇවිත් අපිට එකතු වුණා. ඉතින් අපි කවුරුත් සූර්ය දිව්‍ය රාජෝත්තමයාගෙ නාමෙන් දිවුරලා පොරොන්දු වෙලා ඉන්නෙ අපේ දිවි පරදුවට තියලා හරි, නස්කාවයි එන්කිවයි මරන්න!'' රස්ටා පැවසීය.

''නෑ!! එන්කිට කරදරයක් වෙන්න දෙන්න බෑ!'' මම ඔහුට බාධා කළෙමි. මම කිසිසේත් ඊට ඉඩ නොදෙමි.

මාගේ බාධා කිරීමෙන් රස්ටාගේ මුහුණ අඳුරු වූයේය.

''නස්කා කියන්නෙ අපේ පාරිශුද්ධ ඉන්කා රාජ්‍ය කෙළසපු දුෂ්ටයෙක්. ඉතින් ඇලෙක් කියන්නෙ නස්කාට තවදුරටත් අපේ





රාජධානිය විනාශ කරන්න ඉඩ දෙන්න කියලද?'' ඔහු විමසුවේ කෝපයෙනි.

''නෑ.. මම කිව්වෙ එන්කි ගැන.''

''ඇලෙක්, දූන් ඉස්සර හිටපු එන්කි කුමාරිකාව නෙවෙයි ඉන්නෙ. ඒ නස්කාගෙ බිහිසුණු ආත්මය අරක් ගත්තු දුෂ්ට රැජිනක්. මට හිතාගන්න බෑ නස්කා එන්කිව මේ තත්ත්වෙට පත් කළේ කොහොමද කියලා. ඒත් අපේ පාරිශුද්ධ ඉන්කා රාජ්‍යය ආරක්ෂා කරගන්න නම් නස්කවයි, එන්කිවයි උන්ට පක්ෂපාති වූ සෙබළුයි ඉවරයක් කරන්න වෙනවා!'' රස්ටා පැවසීය.

''ඇලෙක්, අපි මෙ ගැන පස්සෙ කතා කරමු.'' ස්ටොන් මා අස්වසාලීමට වැර දැරුවේය. එහෙත් රස්ටාගේ වදන්වලින් මාගේ සිත කොතරම් කැළැඹී දැයි දන්නේ මා පමණි. මා සැතපුම් දහස් ගණනක් දුර ගෙවා ජීවිතය පරදුවට තබමින් පැමිණියේ ඈ හමුවීමට නොවේද? ඇය රස්ටා පවසන්නා වූ ආකාරයේ කුරිරු තැනැත්තියක යැයි මම කිසිසේත් විශ්වාස නොකරමි. නස්කාගේ බලපෑම් හා තර්ජනයන් හමුවේ ඇය යම් මානසික පසුබෑමකට ලක්වී නම් මිස මෙය කිසිසේත් සිදුවිය නොහැකි බව මම තරයේ විශ්වාස කරමි. එහෙත් නස්කා සතුව කිසියම් අද්භූත මායා බන්ධන බලයක් ඇතැයි මම මේ වන තුරු ද විශ්වාස නොකරමි.

# ඉන්කා රාජධානියට ඇතුළුවීමට සැලැස්මක්

රස්ටා සමඟ ඇති වූ සංවාදයෙන් අනතුරුව අපි බිම එලන ලද පන් පැදුරු මත වැතිර මදක් ගිමන් හැරීමට වීමු. එළඹ පැවතියා වූ ගනඳුරු රාත්‍රිය කෙසේ පහන් කරම් දැයි සිතමින් මම නිහඬව එහි වැතිර සිටියෙමි.

"ඇලෙක්, ඒ ගැන වැඩිය කල්පනා කරන්න එපා. අපි කොහොමහරි මේකට විසඳුමක් හොයා ගමු. ඒත් මේ සැරේ නම් මායා බන්ධන බලයක් ගැන මේ ඉන්කාවරු කියන කතාව නිකන්ම අමතක කරලා දාන්න බෑ. බැරිවෙලාවත් රස්ටලා කියන දේ ඇත්ත නම් අපි හිතන තරම් ලේසියෙන් නස්කාව යටත් කර ගන්න ලැබෙන එකක් නෑ. ඒ කොහොම වුණත් ස්ටෝන් හිටි හැටියෙ එක රැයෙන් ඔත්පල වුණු එක, ටාකා අතුරුදහන් වුණු එක අපිට ලේසියෙන් අමතක කරන්න බෑ. ඔය හැම මායා බලයක්ම ක්‍රියාත්මක වෙන්නෙ දුර්වල මනසක් තියෙන තැනක විතරයි. මතකයිනෙ ඇලෙක්, මේ ඉන්කාවරු කොහොමත් යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලට දක්වන්නෙ අප්‍රමාණ බයක් නෙ." ක්ලෙවර් පැවසීය.

"ක්ලෙවර්, අපි කොහොමහරි ඉන්කා රාජධානියට ඇතුළු වෙන්න ඕනෙ. මට හොඳටම විශ්වාසයි, නස්කා බලහත්කාරයෙන් එන්කිව රඳවගෙන ඇත්තෙ." මම පැවසුවෙමි.

"ඔව්. ඒ ගැන කිසි සැකයක් නෑ. ඒ වුණත් අපි ඉන්කා රාජධානියට ඇතුළු වෙනවා නම් ඕනෙම දේකට සූදානමෙන් යන්න වෙනවා. අපි මේ ගැන ස්ටෝන් එක්ක කතා කරමු. අපිට රස්ටවත් මේකට හවුල් කර ගන්න පුළුවන්." ක්ලෙවර් පැවසීය.

ඉන් අනතුරුව ක්ලෙවර් නිහඬව බොහෝ වේලාවක් කල්පනාවේ නිමග්නව සිටිනු මම දුටුවෙමි. ඉන්කාවරුන්ගේ රාජධානියට ඇතුළු වන ආකාරය ඔහු සිතින් සැලසුම් කරන්නට ඇත. එහෙයින් මම ඔහුට බාධා නොකළෙමි. නස්කාට පක්ෂපාති මුර සෙබළුන්ගේ අවධානයට ලක් නොවී එහි ඇතුළු වීම සඳහා





රස්ටාගේත් ඔහුට පක්ෂපාති ඉන්කා වැසියන්ගේත් සහය අපට අත්‍යවශ්‍ය වනු ඇත.

"අපි හෙට රස්ටා එක්ක කතා කරලා තීරණයක් ගමු." අවසානයේ ක්ලෙවර් පැවසීය.

මේ වන විට වේලාව රාත්‍රී එකොළහට ආසන්නව පැවතියෙන් අවට පරිසරය බොහෝ නිහඬ විය. වනාන්තරය තුළින් වරින්වර නැඟුණු බිහිසුණු ගෙරවුම් හඬවල් හැරුණු කොට වෙනත් හඬක් සවන්හි වැකුණේ නම් ඒ ඈතින් නැඟුණු අපැහැදිලි බෙර හඬක් පමණි. ස්වදේශික වනචාරීන් අවට ගැවසුණ ද ඔවුන් ඉන්කාවරුන්ගේ ගම්මානයට වැද පහර දීමට තරම් උත්සුක නොවේ යැයි රස්ටා මා සමඟ පවසා තිබුණෙන් ස්වදේශිකයන්ගේ එම බෙර හඬින් මම කලබලයට පත් නොවුණෙමි.

● ● ● ● ● ●

පසු දිනට පහන් වූයේය. මාගේ සිත තුළ පැවැති නොසන්සුන් බව හේතුවෙන් ගත වූ රාත්‍රියේ නිදි දෙව්දුව මා කරා ළඟා නොවූවාය. නස්කා නමැති බිහිසුණු පූජකයා හමුවේ ප්‍රාණ ඇපකාරියක බවට පත්ව සිටිනා ඇය ඉන් මුදා ගන්නේ කෙසේ දැයි කල්පනා කරමින් හිඳිම පමණක් මා හට ශේෂව තිබිණි. ඉන්කාවරුන් උදෑසන ආහාර පිළිගැන්වූයේ ඉන් අනතුරුවයි. ඉන්කා රාජධානියට ඇතුළු වන ආකාරය ස්ටෝන් සහ රස්ටා සමඟ සාකච්ඡා කළ යුතු යැයි සිතුණෙන් මම ඔවුන් මදකට එහි රඳවා ගතිමි. ප්‍රථමයෙන් මම මෙම ගම්මානයේ සිට ඉන්කා රාජධානිය වෙත ගමන් ගන්නා මාර්ගය රස්ටාගෙන් අසා සටහන් කර ගත්තෙමි. සම්පූර්ණ ගමනට වරු තුනක පමණ කාලයක් ගත වන බව ඔහු පැවසීය.

"ඇලෙක්, නස්කට විරුද්ධව කරන සටන ලේසි පහසු එකක් නෙවෙයි. ඒක බොහොම කල්පනාවෙන් කරන්න ඕනෙ වැඩක්." ස්ටෝන් පැවසුවේය. නස්කා නමැති ගුප්ත පූජකයා හට ඔහු කොතරම් භීතියෙන් පසුවන්නේ ද යන්න ඔහුගේ වෙව්ලනසුලු කටහඬින් සහ නළලට නැගි ඩහබිඳුවලින් මම වටහා ගත්තෙමි.

''රස්ටාට පුළුවන් ද අපිට සහයෝගය දෙන්න?'' මම විමසුවෙමි.

''සාපා ඉන්කාගෙ අවසරේ ලැබෙනවා නම් මම සූදානම්. ඒත්... මගෙන් මොන වගේ සහයෝගයක් ද ඇලෙක් බලාපොරොත්තු වෙන්නෙ?'' රස්ටා විමසීය.

''රස්ටට පුළුවන් නම් සූර්ය දෙවොලෙ මුරට ඉන්න සෙබළු ගැන බලාගන්න, අපි නස්කා ගැන බලාගන්නම්.'' මම ක්ලෙවර් දෙස බලමින් පැවසුවෙමි. ඔහු සිය හිස ඉහළ පහළ සැලුවේ මා සමග එකඟ වන බව පවසන්නාක් මෙනි. මේ වන විට අපි දෙදෙනා එක්වී ඉතා බිහිසුණු මෙන්ම තීරණාත්මක අවස්ථාවන් ගණනාවකට මුහුණ දී තිබුණෙමු. මෙ වන තුරුත් කිසිදු විටෙක ඔහු මා හැර දා නොගියේය. එහෙයින් මෙවන් අත්‍යවශ්‍ය මොහොතක ඔහු මා අසල සිටීම කොතරම් වාසනාවක් දැයි මට සිතිණි.



# සැලැස්ම ව්‍යර්ථ වෙයි

සාකච්ඡාවෙන් අනතුරුව රස්ටා අපගෙන් සමුගෙන ගියේ සිය සෙබළුන් දැනුවත් කිරීම සඳහාය. නස්කාගේ මායා බලය හමුවේ භීතියට පත්වී සිටි ස්ටොන් මටත් ක්ලෙවර්ටත් සියලු කටයුතු භාර දී වගකීමෙන් නිදහස් වූයේය. එහෙයින් නස්කාගේ මායා බලයට එරෙහිව සටන මෙහෙයවිය යුත්තේ කෙසේදැයි තීරණය කිරීමට අපට සිදු විය.

''ඇලෙක්, ක්ලෙවර්, කරන ඕනම දෙයක් කල්පනාවෙන්! මමත් පෞද්ගලිකව ඔය මායා බන්ධන කියන දේවල් විශ්වාස කරන් නෑ. ඒත් මට හිතෙනවා මෙතන මොකක්හරි අපිට නොපෙනෙන දෙයක් සිද්ධ වෙනවා කියලා.'' ලයිසැන්ඩර් මහතා පැවසීය.

''ලයිසැන්ඩර් මහත්තයා, නස්කා අපිව පිළිගන්න හදන්නෙ ඒ විදියට නම් ඒ හැම ප්‍රශ්නෙකටම උත්තර මෙතන තියෙනවා.'' ක්ලෙවර් එසේ පැවසුවේ සිය රයිෆලයේ ආරක්ෂක අගුල ලිහිල් කරමිනි.

තවත් හෝරා කිහිපයක් ගත විණි. ඒ අතරතුර මම ක්ලෙවර් සමග අපගේ ගිනි අවි සහ පතරොම් පරීක්ෂා කර බැලුවෙමි. ලයිසැන්ඩර් මහතා අපගේ බ්‍රසීලියානු සේවකයන් තිදෙනා සමග ගම්මානයේ ඔබමොබ සැරිසරනු මම දුටුවෙමි. රස්ටා අප වෙත පැමිණියේ මේ අතරයි. ඔහුගේ දෙනෙතේ රැඳී තිබූ පරාජිත බව හඳුනා ගැනීම අපහසු නොවිය.

''ඇලෙක්, මම අපේ කණ්ඩායමේ හැම කෙනෙක්ටම මේ ගැන කිව්වා. ඒත් හතර පස්දෙනෙක් හැර අනෙක් කවුරුවත් ආයෙත් ඉන්කා රාජධානියට යෑමක් ගැන හිතන්නවත් කැමති නෑ. සමහරුන්ට සිහි නැතිවෙන්න නස්කාගෙ නම මතක් කළත් ඇති. ඉතින් මම කොහොමද සූර්ය දෙවොලෙ සෙබළුන්ට පහර දීමක් ගැන හිතන්නෙ?'' රස්ටා මැසිවිලි නැඟීය.

ක්ලෙවර් මා දෙස සෘජුව බැලුවේ තීරණයක් ගත නොහැකිවය. ඉන්පසු අපි ස්ටොන් හමුවීමු.

''ඇලෙක්, ගිය වතාවෙ ඔල්මෙක්ව නිහඬ කළා වගේ නස්කාව නිහඬ කරන්න නම් ලැබෙන් නෑ. ඒත් මම අණ කළොත් මේ මිනිස්සු මේ ගමනට සහභාගි නොවී ඉන්නෙ නෑ. ඒ කොහොම වුණත් පහුගිය දවස්වල සිද්ධ වුණු දේවල්වල හැටියට මම කොහොමද මේ මිනිස්සුන්ට බල කරන්නෙ? අපි බලමු මේ ඉන්කා සෙබළුන් ඒ අයගෙ කැමැත්තෙන්ම මේකට සම්බන්ධ වෙයිද කියලා.'' ස්ටොන් පැවසීය.

''ඔව්, කොටින්ම කියනවා නම් මේක හරියට රටක බලය අල්ල ගන්න කරන යුද්ධයක් වගේ. ඉතින් ඒකට තමන්ගෙ හදවතින්ම එන වුවමනාවක් තියෙන්න ඕනෙ. එහෙම නැතිව බලෙන් කාටවත් විරුද්ධව සටන් කරවන්න අපිට බෑ.'' ලයිසැන්ඩර් පැවසුවේය.

''ඇලෙක්, අපි කෙළින්ම මේ ගැන මේ මිනිස්සු එක්ක කතා කරමු. රස්ටට කියමු හෙට උදෙන්ම සෙබළු රැස් කරන්න කියලා.'' ක්ලෙවර් යෝජනා කළේය.

එහෙත් කළ යුත්තේ කුමක් දැයි තීරණය කර ගත නොහැකිව මම බොහෝ වේලාවක් නිහඬව සිටියෙමි.

''අපිට බැරිවෙන එකක් නෑ මේ මිනිස්සුන්ව මේකට කැමති කරවා ගන්න.'' අවසානයේ ක්ලෙවර් පැවසුවේ මාගේ ව්‍යාකූල වූ මනස මඳක් හෝ සනසවාලීමට විය යුතුය. එහෙත් මෙවර මාගේ සිත සනසවාලීමට එවදන් සමත් නොවීය.

එදින රාත්‍රියේ අපි ගිනිමැලයක් වටා රැස්වී මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කළෙමු. ක්ලෙවර් පැවසූ පරිදි පසු දින උදෑසන ඉන්කා සෙබළුන් රැස් කරන ලෙස රස්ටාට දැනුම් දීමට ද මම අමතක නොකළෙමි.

''මම අපේ සෙබළුන්ට දැනුම් දුන්නා හෙට උදෙන්ම සාපා ඉන්කගෙ පැල්පත ළඟට රැස්වෙන්න කියලා.'' රස්ටා පැවසීය.





''අපිට හෙට උදේ තීරණයක් ගන්න පුළුවන්.'' අවසානයේ ස්ටොන් පැවසීය. ඉන්පසු අපි පැල්පත් තුළ අතුළ පන් පැදුරු මත වැතිර නින්දට වැටුණෙමු. ඉන්කා රාජධානිය වෙත ඇතුළු වී, නස්කාගේ පාලනයෙන් එය මුදා ගැනීමට සහ එන්කි කුමරිය ඔහුගේ ග්‍රහණයෙන් මුදා ගැනීමට මෙම සෙබළුන්ගෙන් පිටිවහලක් නොලැබුණහොත් මා කුමක් කළ යුතු දැයි මම කල්පනා කළෙමි. මෙම බිහිසුණු ඉන්ද්‍රජාලිකයාගේ මායා බන්ධන බලය හමුවේ ගීනියට පත්ව හිඳිනා මෙම ඉන්කාවරුන්ගෙන් පිළිසරණක් පැතීම අනුවණකමකැයි මට සිතිණි. තත්ත්වය එසේ වී නම් මා එන්කි කුමරිය කරා යන්නේ කෙසේද? ඉන්කාවරුන්ගේ සහයෝගය නොමැතිව අපට එය කළ නොහැකිද? මෙවන් වූ අනේකවිධ ගැටලු සංඛ්‍යාවක් එම අඳුරු රාත්‍රියේ දී මගේ සිතේ ජනිත විය.

# අවසන් තීන්දුව

අඳුරු සිහිවිලිවලින් මාගේ මනස වැසී ගියෙන් නිදි දෙව්දුව තව තවත් මාගෙන් ඈකට ඇදී ගියාය. ඉන්කාවරුන් නැවත සිය රාජධානිය වෙත යැමට අකමැත්ත පළ කළ ද මට මාගේ මිතුරන් සමඟ එහි ළඟා විය හැක. එහෙත් අපගේ සැලැස්ම ව්‍යර්ථ වී අපට එම කුරිරු පූජකයාගේ සෙබළුන් හට යටත් වීමට සිදුවුවහොත් සියල්ල ඉන් අවසන් වනු ඇත. එහෙයින් මාගේ මිතුරන් දෙදෙනා සහ අසරණ බ්‍රසීලියානුවන් තිදෙනා එවන් වූ අන්තරාදායක පරිසරයකට රැගෙන නොයා යුතු යැයි මම තීරණය කළෙමි. එහෙත් මට එන්කි කුමරිය කිසිසේත් අමතක කළ නොහැක. ඉන්කාවරුන්ගේ ගම්මානය වටා වූ ඝන වනාන්තරයෙන් නැගුණු නිශාචර විලෝපිකයන්ගේ බිහිසුණු හඬ පරයමින් මාගේ හදවත ගැහෙන රාවය ඇසෙන්නාක් මෙන් මට දැනිණි. අපගේ ඉරණම එය නම් මා තවත් පමා වන්නේ කුමට ද? මා යළි පැමිණෙන තුරු ඇය ඇඟිලි ගනිමින් බලා සිටින බව මම දනිමි. ඇයගෙන් සමුගත් මොහොතේ "ඉක්මනින් මාව බලන්න එන්න" යැයි පවසමින් ඇය වැළපුණු අයුරු නැවත නැවතත් මාගේ නෙත් ඉදිරියේ මැවී පෙනෙන්නාක් මෙන් දැනිණි.

මා අසලම වැතිරී නිදා සිටින ක්ලෙවර් දෙස මම හිස ඔසවා බැලුවෙමි. මේ මොහොතේ ඔබ අවදිව සිටියේ නම් කිසිලෙසකින්වත් මා හට තනිව මෙම ඉන්කා ගම්මානයෙන් නික්ම යෑමට ඔබ ඉඩ නොදෙනු ඇත. එහෙත් මම තවදුරටත් ඔබගේ ජීවිතය අනතුරේ නොදමමි. මාගේ ඉරණම මා තනිව විසඳාගත යුතුය. මාගේ ගමනේ අවසානයේ ඇත්තේ වේදනාකාරී මරණයක් දැයි මම නොදනිමි. එහෙත් මිය යන්නේ එක් වරක් පමණි.

• • • • • •

මම කිසිදු හඬක් නොනැඟෙන අයුරින් වැතිරී හුන් තැනින් නැගිට්ටෙමි. ඉන්පසු මාගේ රයිෆලය ගෙන ඊට සරිලන





පතරොම්වලින් මාගේ සාක්කු පුරවා ගත්තෙමි. ඉන්කා රාජධානිය වෙත ගමන් ගන්නා අයුරු රස්ටා පැවසූ ආකාරය මම නැවත සිහියට නගා ගත්තෙමි. එය සොයා ගත හැකි වනු ඇතැයි මට සිතිණි. අවම වශයෙන් ඉන්කා රාජධානිය ඇත්තේ මෙහි සිට සැතපුම් විස්සකට වැඩි දුරකිනි. එහෙයින් මෙය බිහිසුණු චාරිකාවක් වනු නොඅනුමානය.

එහෙත් ඒ පිළිබඳ සිතමින් මෙහි තවත් ප්‍රමාද නොවිය යුතු යැයි මම තීරණය කළෙමි. පැල්පතෙන් නික්මීමට මොහොතකට පෙර මම බිම වැතිර නිදා සිටින ක්ලෙවර්, ලයිසැන්ඩර් මහතා සහ අපගේ සේවකයන් තිදෙනා දෙස අවසන් වරටත් හැරී බැලුවෙමි. ඇතැම් විට නැවත කිසිදිනක අප හමු නොවනු ඇත. එහෙත් හස්කාගේ ග්‍රහණයට හසුවී සිරවී සිටිනා එන්කි කුමරිය පිළිබඳ සිහිවත්ම මාගේ ගත දැවී යන්නාක් මෙන් දැනේ. එහෙයින් මා එහි යා යුතුවම ඇත.

මම පැල්පතෙන් නික්මී නිවී යමින් තිබූ ගිනි මැලය ද පසුකරමින් ඉදිරියට ගමන් කළෙමි. ගම්මානය පුරා විහිදී තිබූ පැල්පත් සියල්ල නිශ්චලව පැවතියේ මුළු ගම්මානයේම වැසියන් නිදිගෙන ඇති බැව් පවසන්නාක් මෙනි.

ගම්මානයේ සීමාවෙන් පිට වූ මම ඝන වනාන්තරයට ඇතුළුවීමි. සඳ මෝදු වී තිබුණ ද දැවැන්ත වෘක්ෂයන්ගේ ඝන උඩු වියන් හේතුවෙන් සඳ එළිය මිහි මත පතිත නොවූ තරම්ය. සනදූරේ ඉදිරියට ගමන් කිරීම මා සිතූ තරම් පහසු කාර්යයක් නොවිණි. ගල්මුල්වල දෙපා ගැටී මා ඇද වැටීමට ගියේ වරක් දෙවරක් නොවේ. මෙතෙක් කල් සෙවණැල්ල මෙන් මා අසල සිටි මාගේ අභිජාත මිතුරා, ක්ලෙවර් ද දැන් මා සමඟ නැත. එහෙත් අසරණව සිටි එන්කි ඉන් මුදා ගැනීමට මාගේ යටි සිත තුළ කැකෑරෙමින් පැවැති වුවමනාව විසින් මා ඉදිරියටම මෙහෙයවන්නට වූයේය. රස්ටා මට පවසා තිබූ දිශාව ඔස්සේ මම මෙලෙස ඉදිරියට ගමන් කළෙමි. හෝරාවකට ආසන්න කාලයක් ගතවත්ම මම කුඩා ජලාශයක් වැනි ස්ථානයක් වෙත සමීප වූයෙමි. රස්ටා පැවසූවේ ජලාශය අසල පිහිටි පර්වත කපොල්ල අතරින්, ඒ ඔස්සේ ඉදිරියට

ගමන් කළ යුතු බවය. එහෙයින් ප්‍රථමයෙන් ඔහු පැවසූ පර්වත කපොල්ල සොයාගත යුතුව තිබිණි.

මෙම ඝන වනාන්තරයේ වෙසෙන්නා වූ බිහිසුණු සත්ත්වයන්ට මෙන්ම අහිංසක සත්ත්වයන්ට ද නොවෙනස්ව එකසේ පිරිසිදු ජලයෙන් සංග්‍රහ කළ එම අපූර්ව ජලාශය නෙත් වශීකරවනසුලු දසුනක් වූයේය. එහෙත් එහි මිහිරියාව විඳ ගැනීමට සුදුසු මානසික වාතාවරණයක් මා සතු නොවීය. ගමන් ගත් මග ඔස්සේම ජලාශයේ ඉවුර අසලට පැමිණි මම රස්ටා විස්තර කළ පර්වත කපොල්ල කුමන දිශාවකින් ඇත්දැයි පරීක්ෂා කළෙමි. වර්ග සැතපුම් තුනකට ආසන්න භූමි ප්‍රදේශයක් පුරා පැතිර තිබූ එම අපූර්ව ජලාශය වටා මාගේ නෙත් දිව යන්නට වූයේය.



# පර්වත කපොල්ල අතරින්

දිය බීමට පැමිණි සතුන් ජලාශයේ ඉවුර අසල රැඳී සිටීමට ඉඩ තිබූ බැවින් මා ඉවුරට සමීප වූයේ සුපරීක්ෂාකාරීවයි. මාගේ උපකල්පනය නිවැරැදි විය. ඉවුර වටා දුවැන්ත තුරුලතා පිහිටා තිබුණ ද සඳ එළියෙන් එහි ඇතැම් ස්ථාන ආලෝකවත් වී තිබිණි. මා සිටි ස්ථානයට යාර පනහක් පමණ දුරින් ජලාශ ඉවුරේ රැඳී සිටියේ වේපර රංචුවකි. එහි වැඩිහිටි සතුන් දෙදෙනෙකුසහ පැටවුන් තිදෙනෙකු සිටි බව මම දුටුවෙමි. එමෙන්ම ඊට මදක් ඔබ්බෙන් සිය දැවැන්ත අං යුවළ සහිත හිස ඉහළට ඔසවාගෙන සුපරීක්ෂාකාරීව ජලාශය දෙස බලා සිටි ගෝනෙකුගේ ඡායාවක් ද මට දැකගත හැකි විය. එහෙත් මා සෙවූ පර්වත කපොල්ල මිස තව තවත් වන සතුන් දැක ගැනීමට මම අපේක්ෂා නොකළෙමි.

තත්පර කිහිපයක් ගතවන්නට ඇත. මා සිටි ස්ථානයට හරි කෙළින් ඉවුරේ අනෙක් පස පිහිටි කළුගල් පර්වත කිහිපයක් මා නෙත ගැටිණි. එසේ නම් රස්ටා පැවසූ කපොල්ල පිහිටියේ එම පර්වත අතරින් විය යුතුය. එහි ළඟාවීමට නම් මා ජලාශය වටා ගමන් කළ යුතුව තිබිණි. කොතරම් දුෂ්කර කාර්යයක් වුව ද එය කළ යුතුවම තිබුණේය. මම මොහොතකට ඉවුර අසල පිහිටි දැවැන්ත සෙඩාර් ගසක් පාමුල හිඳ මාගේ කබායේ ඇතුළත සාක්කුවේ පිහිටි ආරක්ෂිත කුටියේ සඟවාගෙන සිටි පළා පැහැ එමරල්ඩ් මාණික්‍යය සුරතට ගෙන බැලුවෙමි. එන්කි කුමරිය එදින සූර්ය දෙවොල අසල දී එය මා අත තැබුවේ නැවත ඇය හමුවන තුරු එය සුරැකිව මා ළඟ තබා ගන්නා ලෙස පවසමිනි. මේ දක්වා ද මම එම පොරොන්දුව කඩ නොකළෙමි. එමෙන්ම මා හට ඇය කරා යෑමට දෙවියන් වහන්සේ ඉඩ හළහොත් ඒ දක්වා ද මෙම මාණික්‍යය මා සමඟ රැඳී තිබෙනු ඇත. නොඑසේ නම් එය මාගේ මළ සිරුර සමඟම මෙම බිහිසුණු වනාන්තරය මධ්‍යයේ වැළලී යනු ඇත. එම සුසිනිඳු එමරල්ඩ් මාණික්‍යය මම මාගේ කොපුල් මත ස්පර්ශ කළෙමි. සැබැවින් මා ලද සංවේදනය ඇයගේ සුසිනිඳු සුරතින් ලද පහසට සම

අතකින්ම සමාන විය. එමෙන්ම එම මිහිරි සංවේදනය මාගේ මනස වැළලී ගිය සුන්දර අතීතය වෙත රැගෙන යාමට සමත් විය.

මාගේ සිහිවිලි දාමය බිඳී ගියේ ඉවුර දෙසින් නැඟුණු බිහිසුණු ගෙරවුම් හඬක් සමඟයි. මම වහා හුන් තැනින් නැගිට එමරල්ඩ් මාණික්‍ය සුරැකිව මාගේ කබා සාක්කුවේ රඳවා ගත්තෙමි. ඉන්පසු රයිෆලය රැගෙන හඬ නැඟුණු දෙසට යොමු කළෙමි. පෙර ඉවුර අසල රැඳී සිටි වේපර රංචුව සහ දැවැන්ත අං යුවළක් සහිත ගෝනා තවදුරටත් එහි නොවීය. නැවත වරක් වනාන්තරය තුළින් අතු බිඳෙන හඬක් සහ ව්‍යාඝ්‍රයකුගේ ගර්ජනා හඬක් ශ්‍රවණය වූයේ මේ අතරයි. එහි කුමක් සිදුවන්නේ දැයි මට වැටහිණි.

තවත් මිනිත්තු කිහිපයක් එහි රැඳී සිටි මම ඉවුර ඔස්සේ දකුණු දෙසට ගමන් ඇරඹුවෙමි. නැගෙනහිර දෙසින් අරුණලු නැඟීම ඇරඹී තිබුණෙන් හිරු නැඟීමට තවත් හෝරාවකට ආසන්න කාලයක් ගතවනු ඇතැයි මම අනුමාන කළෙමි.

උදෑසන පළමු හිරු කිරණ ගත දැවටෙන විට මා සිටියේ යථෝක්ත පර්වත භූමියට සැතැපුම් කාලක් පමණ දුරිනි. දිය බීම සඳහා ජලාශය වෙත පැමිණෙන සතුන් මඟහැරීමට සිදු වූයෙන් මාගේ ඉදිරි ගමන තව තවත් ප්‍රමාද වූයේය. මේ වන විට ක්ලෙවර් සහ ලයිසැන්ඩර් මා අතුරුදන් වී ඇති බව දැන මා සොයනවා විය හැක. එහෙත් ඉදිරියට තැබූ පය නැවත පසුපසට නොගැනීමට මම සිතා ගත්තෙමි.

දැවැන්ත ග්‍රැනයිට් පාෂාණ දසත විසිරීමෙන් සැදි එම අපූර්ව පර්වත භූමිය වෙත මා ළඟාවන විට තවත් හෝරාවක පමණ කාලයක් ගත වී තිබෙන්නට ඇත. එම පර්වත අතරින් වැටී තිබූ උමං මාර්ගයක් වැනි කපොල්ලක් පැහැදිලිවම හඳුනා ගත හැකි විය. රස්ටා පැවසුවේ මෙම ගිරි දුර්ගය පිළිබඳ විය යුතුය. කුඩා පර්වතයක් මත හිඳ මඳක් ගිමන් හළ මම ඉන් අනතුරුව එම කපොල්ල ඔස්සේ ඉදිරියට ගමන් කළෙමි. රස්ටා පැවසූ මීළඟ මං සලකුණ හමුවන්නේ මෙම කපොල්ල පසුකර නැවත ඝන වනාන්තරයට ඇතුළු වූ පසුය.



# බිහිසුණු වන මෘගයෝ

හෝරාවකට ආසන්න කාලයක් මුළුල්ලේ වෙහෙසී මම එම පර්වත කපොල්ල පසුකර නැවත ඝන වනාන්තරය වෙත පිවිසියෙමි. රස්ටා පැවසූ ආකාරයට අනුව ඉන් අනතුරුව ගමන් කළ යුතුව තිබුණේ හිරු නගිනා දිශාව වූ නැගෙනහිර දෙසටය. එම දිශාව ඔස්සේ වරුවකට ආසන්න කාලයක් ගමන් කළ යුතු යැයි ඔහු පැවසුවේය. මා තනිව, තැතිගත් සිතින් යුතුව ගමන් කළ බැවින් මාගේ ඉදිරි ගමන ඉතා වේගවත්ව සිදු විය. හැකි ඉක්මනින් එන්කී කරා යෑම මාගේ එකම අභිලාෂය වූයේය. එහෙයින් මා ඉදිරියට ගමන් කළේ දුවන තරම් වේගයෙනි.

තවත් හෝරාවකට පමණ පසු මා සිටියේ දැවැන්ත රෙඩ්වුඩ් කලාපයක් පසු කරමිනි. එම වෘක්ෂයන් කොතරම් උසට වැඩී තිබුණේ දැයත් එම තුරු මුදුන් පහළ සිට දැකගත නොහැකි තරම් උස් වූයේය. එමෙන්ම ඒවායේ පෘථුල කඳන්වල වට ප්‍රමාණය කොපමණ දැයි මා හට සිතාගත නොහැකි විය. අඩියක් පමණ උසට පොළොව මත ඒකරාශී වී තිබූ කොළ රොඩු තට්ටුව මතින් ඉදිරියට ඇවිද යෑම අපහසු වූයේය. මෙලෙස ඉදිරියට ගමන් කරමින් සිටි අතරේ තුරු මුදුන් මත ලැග සිටි වානරයන් අසාමාන්‍ය ලෙස කලබලයට පත්ව අත්තෙන් අත්තට පැන ඇතට යනු මම දුටුවෙමි.

බොහෝ විට ඔවුන් මෙලෙස හැසිරෙන්නේ යම් බිහිසුණු සතෙකු දුටු විටයි. නොඑසේ නම් යම් ආගන්තුක යමක් දුටු විටයි. ඇතැම් විට ඔවුන් මා දුටුවා විය හැක. කෙසේ වෙතත් ඉන් අනතුරුව මා ඉදිරියට පිය නැඟුවේ වඩාත් සුපරීක්ෂාකාරීවය. අනවරත ලෙස ඉදිරියට විහිදී තිබූ දැවැන්ත වෘක්ෂයන්හි කඳන්වලින් ආවරණය ලබමින් ඉතා මන්දගාමී ගමනක යෙදීමට මා හට සිදු විය. එහෙත් වැඩි කාලයක් නොගොස් මාගේ පෙර සූදානම කොතරම් ප්‍රඥාගෝචර ක්‍රියාවක් වී දැයි මටම වැටහිණි. මෙලෙස ඉදිරියට ගමන් ගනිමින් සිටි මාගේ නෙතට හසු වූයේ දුඹුරු පැහැ ආගන්තුක දර්ශනයකි. එය මට යාර සියයක් පමණ ඈතින් එහා

මෙහා වලනය වෙමින් පැවතියේය. මම වහා නැවතී අසල තිබූ දැවැන්ත වෘක්ෂයේ කඳට මුවා වී ඒ දෙස සුපරික්ෂාකාරීව බැලුවෙමි. මා නෙත ගැටුණේ දුඹුරු පැහැ පියුමාවෙකුගේ රුවයි. ගාම්භීර ලෙස පා තබමින් ගමන් කරමින් සිටි මෙම බිහිසුණු සත්ත්වයා මා නොදුටු බව විශ්වාසය. එය මාගේ සිතට විශාල සහනයක් වූයේය. බිහිසුණු වන මෘගයා මාගේ දර්ශන පථයෙන් ඉවතට ගොස් බොහෝ වේලාවක් ගතවන තුරු ද මම එහි රැඳී සිටියෙමි.

ක්ලෙවර් මේ මොහොතේ කුමක් කරනු ඇත්දැයි ඉදිරියට දෙපා තබන අතරතුර මම කල්පනා කළෙමි. මාගේ අතුරුදන්වීම සැලවූ පසු ඔහු බෙහෙවින් කම්පා වන්නට ඇතිවාට සැක නැත. අවම වශයෙන් ඔහුට ලිපියක්වත් ලියා නොතැබීම පිළිබඳ මාගේ සිතේ විශාල කනගාටුවක් ඇති විය.

තවත් හෝරා කිහිපයකට පසු මම පඳුරු ශාක බහුලව පැතිරී තිබූ භූමියක් වෙත ළඟා වෙමින් සිටියෙමි. මේ රස්ටාගේ අවසන් මඟ සලකුණය. දැවැන්ත වෘක්ෂයන් එතරම් ව්‍යාප්තව නොපැවති එම භූමි ප්‍රදේශය පසු කළ පසු නැවත දැවැන්ත පර්වත භූමියක් හමුවේ. එය ඉන්කා රාජධානියේ ආරම්භයයි. රස්ටා මා සමග පැවසුවේ එලෙසය. එහෙයින් ගසක් පාමුල වැතිර මඳක් හිමන් හළ මා නැවත ගමන් ඇරඹුවේ දැඩි උද්‍යෝගයකින් යුතුවය.



# ඉන්කා රාජධානිය

එදින හිරු අවරට හැරී දෙපැයක් ගතවීමට මත්තෙන් මම පඳුරු ශාක බහුලව විසිරී පැවති භූමි භාගයේ බොහෝ දුරක් ගෙවා දමා, පර්වත භූමිය පෙනෙන සීමාවට ළඟා වූවෙමි. ඉදිරියට තබන්නා වූ සෑම පියවරක් පාසාම මෙම පෙදෙසේ මිනිසුන් ගැවසෙන්නා වූ බව පවසන්නා වූ සාධක දකගත හැකි වූයේය. එහෙයින් මා වඩාත් සුපරික්ෂාකාරී විය යුතුව තිබිණි.

එන්කි කුමරිය සහ මා අතර ඇත්තේ තවත් කෙටි පරතරයක් පමණි. ඒ පිළිබඳ සිහිවත්ම මාගේ චිත්ත ශක්තිය තව තවත් දැඩි වන්නාක් මෙන් දැනිණි. මා යළි ඇ සොයා පැමිණෙන තුරු ඇ නොඉවසිල්ලෙන් බලා සිටිනා බව මම දනිමි.

කුසගින්න තදින් දැනුණ ද එය අමතක කර දමා මම එම දුෂ්කර කලාපය පසු කළෙමි. ඉන්කා රාජ්‍ය සෙසු වනාන්තරයෙන් ඡේදනය කරන්නා වූ තියුණු උල් සහිත දඬු වැට මට හමු වූයේ හිරු බැස ගොස් හෝරාවකට පමණ පසුය. එවන් මොහොතක දඬු වැටෙන් පැනීමට තැත් කිරීම බොහෝ අවදානම් සහගත කටයුත්තක් වනු නොඅනුමානය. එහෙයින් ඊට සුදුසුම කාලය එළැඹෙන තුරු එය අසල සැඟවී සිටිය යුතු යැයි මම තීරණය කළෙමි. ඉන්කා වැසියන් සිය රාත්‍රී භෝජනයෙන් අනතුරුව නින්දට යන බැව් මම පෙර ලද අත්දැකීමෙන්ම දැන සිටියෙමි. කිසිවෙකුගේ අවධානයට ලක් නොවී සූර්ය දෙවොල අසලට ගමන් කිරීමට නම් මා අවම වශයෙන් මධ්‍යම රාත්‍රියට ආසන්න වන තුරු මෙහි රැඳී සිටිය යුතු විය. දැවැන්ත වෘක්ෂයක් පාමුල රැඳී සිටි එම හෝරා කිහිපය මට ශතවර්ෂ ගණනාවක් මෙන් දැනිණි.

මා එම දඬු වැටෙන් පැන ගැනීමට උත්සාහ කළේ රාත්‍රී දහය පසු වූ පසුවය. එය අඩි පහළොවක් පමණ උස් විය. මා මෙලෙස සමීප වී සිටියේ ඉන්කා පුරවරයේ කුමන දිශාවකට දැයි යන්න පිළිබඳ කිසිදු අදහසක් මා තුළ නොවීය. ඇතැම් විට මෙය රාජධානියේ ප්‍රධාන දොරටු ආදිය පිහිටි ඉදිරිපස සීමාව විය හැක.

නොඑසේ නම් ඉන්කා වැසියන් නිතර නොගැවසෙන්නා වූ පසුපස සීමාව විය හැක.

එළඹෙන්නා වූ ඕනෑම ආකාරයක අන්තරායකට මුහුණ දීමෙ සූදානමින් මම එම දඹුවැට මතට නැඟ ගැනීමට වැර දරුවෙමි. එය කිසිසේත් කළ නොහැකි කාර්යකැයි විටෙක මට සිතුණ ද වැල්පොටක ආධාරයෙන් මෙම අභියෝගය ජය ගත හැකි බව පසුව මට වැටහිණි.

අවට පරිසරයේ අඳුර ලැඟුම් ගෙන තිබුණෙන් වැල් පොටක් සොයා ගැනීම බොහෝ දුෂ්කර කාර්යයක් වූයේය. එහි එක් අන්තයකට ලී දණ්ඩක් ගැටගසා එය ඉහළට විසිකර දඹු වැට මුදුනේ ඇති උල් වූ දඹු දෙකක් අතර සිර කර ගැනීමට මට හැකි විය. ඉන්පසු එහි එල්ලී ලී දඹු මත දෙපා තබමින් ඉහළට නැග ගැනීමට මම සමත් වූවෙමි. වාසනාවකට හෝ අවාසනාවකට හෝ මා ළඟා වී තිබුණේ රාජධානියේ පසුපස අන්තයටයි. එකදු පැල්පතක් හෝ මා නෙත ගැටෙන සීමාවේ පිහිටා නොතිබිණි. දුවැන්ත තුරුලතාවන් දිගින් දිගටම විහිදී තිබුණේ ඇමෙසන් වනාන්තරයේ රුදුරු බව පසක් කිරීමට මෙනි.



# සූර්ය දෙවොල සොයා

උල් දඹු වැටෙන් ඉන්කා රාජධානිය වෙත පැන ගත් පසු මාගේ සිතට ආගන්තුක බියක් ඇතුළු වූයේය. මීට මාස කිහිපයකට පෙර සම්භාවනීය වීරෝදාර මිනිසුන් ලෙස මෙම රාජධානියෙන් පිට වී ගිය අප නැවත එලෙසින් පිළිගැනීමට මෙම රාජධානිය සූදානම් නැත. මාගේ සිත වඩාත් සලිත වූයේ එබැවිනි. මෙවර එංගලන්තයෙන් පිටත් වන විට මා පැතුවේ අති දුෂ්කර චාරිකාවක් අවසානයේ මෙම ඉන්කා පුරවරයට පිය නැඟූ පසු, මෙහි වැසියන් අප මහත් හරසරින් පිළිගනු ඇතැයි කියාය. මෙහි සෙසු වැසියන් මා ප්‍රතික්ෂේප කළ ද ඇය කිසි දිනක මට එරෙහිව නොයනු ඇතැයි යන බලාපොරොත්තුව පමණක් මාගේ හදවතේ කොනක ශේෂව තිබිණි. මා ඉදිරියට පියනැඟුවේ එවන් වූ මානසික වාතාවරණයකින් යුතුවයි.

මිනිත්තු දහයක් පමණ ගත වන විට දැවැන්ත තුරු ලතාවන්ගෙන් මුක්ත තරමක් එළිමහන් භූමියක් වෙත මම ළඟා වූවෙමි. අඩ සඳ මෝදු වී පැවතියෙන් අවට විසිර පැවතියේ මොනවා දැයි මම හඳුනා ගත්තෙමි. ඉන්කාවරුන්ගේ පැල්පත් ඈතින් දිස්විය. ඒවා අසල නිවී යමින් පැවැති ගිනි මැලයන්හි රත් පැහැය මට පැහැදිලිවම දර්ශනය විය. මා වඩාත් සුපරීක්ෂාකාරී විය යුතුව ඇත්තේ මෙතැන් සිටය.

අඳුරු සෙවණැලිවල ආවරණය ලබමින් මම ක්‍රමයෙන් එම පැල්පත් පිහිටි පෙදෙස පසු කළෙමි. පැල්පත් අඳුරේ වෙළී පැවති අතර කිසිදු හඬක් ඒවා තුළින් නොනික්මිණි. ඔවුන්ට තදින් නින්ද ගොස් ඇතිවාට සැක නැත. එහෙත් හැකි සෑම විටම එම පැල්පත් පිහිටි පෙදෙස් මඟ හැර යෑමට මම තැත් කළෙමි.

දැවැන්ත පර්වත භූමිය මාගේ නෙත ගැටුණේ තවත් මිනිත්තු දහයකට පමණ පසුවය. සූර්ය දෙවොල පිහිටි එම පර්වත භූමිය වටා පැල්පත් විශාල සංඛ්‍යාවක් පිහිටා තිබුණෙන් මා කිසිවකුගේ

අවධානයට ලක්වීමේ දූඩි අවදානමක් පැවතිණි. වාසනාවකට මෙන් මෙතෙක් එකදු ඉන්කා වැසියකු හෝ මා නෙත නොගැටිණි. එහෙත් නියත වශයෙන්ම සූර්ය දෙවොලට ඇතුළු වන දොරටුව අබියස මුර සෙබළුන් රැඳී සිටිනු ඇත. ඔවුන්ගෙන් මිදී පර්වත භූමියට ඇතුළු විය හැක්කේ කෙසේදැයි මට සිතාගත නොහැකි විය. මේ අතර මා නෙත ගැටුණේ එක් පැල්පතක් තුළ තවමත් විලක්කුවක් හෝ පහනක් හෝ දැල්වෙමින් පැවැති ආකාරයයි. එහි විසූවන් තවම නින්දට ගොස් නැතිවා විය හැක. එය එසේම වූයේය. පැල්පත තුළ එලා තිබූ පැදුරක වාඩි වී කතා බහක නිරත වෙමින් සිටි ඉන්කාවරුන් දෙදෙනෙකුගේ ඡායාවන් මා නෙත ගැටිණි.

ඔවුන්ගේ අවධානයට ලක් නොවී එම පැල්පත පසුකර යෑම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට මා හට සිදුවිණි. එහෙත් කෙසේ හෝ එම අභියෝගයත් ජය ගැනීමට මට හැකි විය. මේ අතර යටගියාවූ මතකයන් යළි සිහියට නගා ගැනීමට මම වෑර දැරුවෙමි. පෙර මාස කීපයක් අප මෙම ඉන්කා පුරවරයේ ජීවත් වූයෙන් එහි ඇතැම් මං සලකුණු මාගේ මතකයේ රැඳී තිබිණි.

එහෙත් අවසානයේ කෙසේ හෝ මම පැල්පත් අතරින් වැටී තිබූ රළු වීථි ඔස්සේ ගමන් කර, සූර්ය දෙවොල පිහිටි එම පර්වතයේ දොරටුව පෙනෙන සීමාවට ළඟා වූයෙමි. දොරටුව දෙපස විලක්කු දල්වා ආලෝකවත් කර තිබූ අතර මුර සෙබළු දෙදෙනෙක් ඒ අසල රැඳී සිටියහ. එක් අයෙක් ශිලාමය අසුනකට බර වී නිදි කිරා වැටෙමින් සිටි අතර අනෙක් තැනැත්තා ඒ අසල සක්මන් කරමින් සිටියේ තියුණු හෙල්ලයක් අතැතිවය. එහෙයින් සුදුසු අවස්ථාවක් එළැඹෙන තුරු පර්වත නෙරුමක් පසුපස සැඟවී බලා සිටීමට මා හට සිදු විය. තවත් මිනිත්තු කිහිපයක් ගත විණි. මා ඇඟිලි ගනිමින් බලා සිටි මොහොත එළැඹියේය. ද්වාරය අබියස ඔබමොබ සක්මන් කරමින් සිටි සෙබළා මෙවර මඳක් ඈතට ඇවිද යනු මා නෙත ගැටිණි. මම තවත් පමා නොවූණෙමි. සැඟවී සිටි තැනින් ඉවතට පැමිණ, නිදි කිරා වැටෙමින් ශිලාමය අසුනට බරවී සිටි සෙබළා පසුකර, දොරටුවෙන් ඇතුළු වීමට මට හැකි විය. මා එම තීරණාත්මක





අවස්ථාවට මුහුණ දුන්නේ එලෙසය. වාසනාවකට මෙන් නිදා සිටි සෙබළාට මාගේ බූට් සපත්තුවලින් නැඟුණු හඬ නෑසිණි. දැන් මා සිටින්නේ සූර්ය දෙවොල පිහිටි එම අපූර්ව පර්වතය අභ්‍යන්තරයේය. ඇය මෙම පර්වත කුහරයේ යම් කුටියක සිටින බව ස්ථිරය. මා මෙහි ඇතුළු වූ බව දන්නේ නම් ඇ මා වෙත දිව එනු නොඅනුමානය. මෙවන් වූ සුන්දර වූත් ප්‍රතාපවත් වූත් සිතුවිලි මාගේ සිත තුළ ජනිත වූයේ මා එම ශිලාමය උමග ඔස්සේ ඉදිරියට ගමන් ගන්නා අතරය. විලක්කු දල්වා දෙපස ශිලාමය බිත්තිවල රඳවා තිබුණෙන් ඉදිරියට ගමන් කිරීම ඉතා පහසු විය. මඳ නැග්මක් සහිත වූ ශිලාමය පැසේජය ඔස්සේ ඉදිරියට ගමන් ගත් මම එහි පළමු මහලට පිවිසියෙමි. පෙර පැවැති අයුරින්ම එම ශිලාමය ශාලාව තවම නොවෙනස්ව පැවැති බව මට දැකගත හැකි විය. බිත්තිවල රඳවා තිබූ විලක්කුවලින් නැඟි ආලෝකයෙන් මම එහි සෑම අන්තයක්ම පරීක්ෂා කර බැලුවෙමි. දෙපස පිහිටි කුටි අඳුරේ වෙළී පැවතියේය. මම නොපමාව දිගු ශාලාව හරහා ඇවිද ගොස් ඉහළ මහලට පිවිසෙන දොරටුව පිහිටි කුටිය වෙත ඇතුළු වූවෙමි. රන්පත්වලින් සරසා තිබූ එම අලංකාර කුටියට පිවිසි පසු මාගේ සවන් වැකුණේ යම් පිරිසක් කතාබහක නිරත වන හඬයි. එය ඉහළ මහලෙන් නැඟි හඬක් විය යුතු යැයි මම වටහා ගත්තෙමි.

# උමතු වූ රාජකීයයෝ

රන්පත්වලින් සරසා තිබූ එම ස්වර්ණමය කුටියේ පිහිටා තිබූ අනෙක් ද්වාරයෙන් පිටවී මම ඉහළ මහල දක්වා විහිදී තිබූ පැසේජය ඔස්සේ ඉදිරියට ගමන් කළෙමි. මා ඉදිරියට තබන්නා වූ සෑම පියවරක් පාසාම යථෝක්ත හඬ තව තවත් තීව්‍රව ඇසෙන්නට වූයේය. ඉන්කාවරුන්ගේ භාෂාව දන සිටියෙන් ඔවුන්ගේ ඇතැම් වචන හඳුනා ගැනීමට මා හට හැකි විය. එහෙත් ශිලාමය බිත්ති මත ගැටී එම හඬ දෝංකාර දීමට වූයෙන් ඇතැම් වචන පැහැදිලිව හඳුනා ගැනීමට මම අපොහොසත් වූවෙමි.

මිනිත්තු කිහිපයක් ගත වන විට මා සිටියේ රාජකීයයන්ගේ කුටි පිහිටි එම දෙවැනි මහලට පිවිසෙන දොරටුව අබියසය. නියත වශයෙන්ම මොවුන් නස්කාගේ ඥාති මිත්‍රාදීන් විය යුතුය. මෙම ඉන්කා රාජ්‍යයේ වෙසෙන්නා වූ අහිංසක වැසියන් පීඩාවට පත් කරමින් සියලු සුඛ විහරණයන් භුක්ති විඳිනා තුච්ඡ මිනිසුන් මොවුන් විය යුතුය.

මම එම දොරටුව අසලට වී අඩ හෝරාවකට ආසන්න කාලයක් බලා සිටිය ද ඇතුළතින් ඇසුණු කතාබහ අවසන් වන බවක් නොපෙනිණි. දොරටුවෙන් එබිකම් කර ඇතුළත ශාලාවේ කවුරුන් සිටින්නේ දැයි දැක බලා ගැනීමට මා හට සිතුණු වාර ගණන අනන්තය. එහෙත් දැඩි ආයාසයකින් මම මාගේ කුතුහලය සංසිඳුවා ගත්තෙමි. තවත් මිනිත්තු කිහිපයක් ගත වූයේය. ඇතුළතින් දෝංකාර දෙමින් පැවැති හඬවල් හිටි හැටියේ නතර විය. ඉන්පසු නැගුණේ යම් පිරිසක් ඉවතට ඇවිද යන හඬය. ඇති වූ නිහඬ බව හමුවේ හීනව යමින් පැවැති මගේ කුතුහලය නැවත හිස ඔසවා නැගී සිටියේය. මම සෙමින් එම දොරටුවෙන් ඇතුළට එබිකම් කර බැලුවෙමි. රන්පත්වලින් සරසා, විලක්කු දල්වා ආලෝකවත් කර තිබූ එම ශාලාවේ අනෙක් අන්තයේ සිවුදෙනෙක් ඇවිද යමින් සිටියහ. ඔවුන් සිටියේ මට පිටුපාමිනි. එහෙයින් මම නොපමාව ශාලාවට ඇතුළු වී අසලම තිබූ කුටියට පිවිසියෙමි. එහි





මන්දාලෝකයක් විහිදූ පහන් දල්වා තිබිණි. යහන මත සැතැපී සිටි කුමාරිකාවන් දෙදෙනකුගේ ඡායාවන් මා නෙත ගැටුණේ මොහොතකට පසුවය. ඔවුහු තද නින්දේ පසුවූහ. එහෙයින් මාගේ සම්ප්‍රාප්තියෙන් කුටියේ පැවැති නිසල බවට හානියක් සිදු වූයේ නැත. එහි දොරටුව අසලට වී මොහොතක් බලා සිටි මම ඉන් අනතුරුව නැවත ශාලාවට ඇතුළු වී තවත් ඉදිරියට දිව ගියෙමි. ඉන්කා රාජධානියේ රජු විසූ රාජකීය කුටි පිහිටි පාර්ශ්වය මම හොඳින් දන සිටියෙමි. ඊට ඇතුළු වීමට මෙම ශාලාවේ අනෙක් අන්තයේ පිහිටි පැසේජයක් ඔස්සේ තවදුරටත් පර්වතය අභ්‍යන්තරයට ගමන් කළ යුතුය. නියත වශයෙන්ම එන්කි කුමරිය රැඳී සිටින්නේ එහි විය යුතුය. නස්කාගේ වාසභවන වූ සූර්ය දෙවොල පිහිටියේ පර්වතයේ ඉහළම ස්තරයේය. එහෙයින් මේ මොහොතේ රාජකීය කුටි පිහිටි අංගනයේ ඔහු සිටීමට වැඩි ඉඩක් නැත.

මෙවන් වූ විවිධාකාර සිතිවිලිවලින් මාගේ මනස පිරී යන්නට වූයේය. එහෙත් අවසානයේ මම එම රාජකීය කුටි පිහිටි අංගනය දක්වා විහිද තිබූ පැසේජයට ඇතුළු වූවෙමි. ඉහළ මහලට ගමන් ගන්නා පියගැට පෙළ සහිත පැසේජයට විවර වන දොරටුව සහ මා දන් ඇතුළු වූ රාජකීය කුටි පිහිටි අනෙක් අංගනය වෙත විවර වන දොරටුව පිහිටියේ එකිනෙකට යාබදවය. පෙර මෙදෙසට පැමිණි රාජකීයන් පිරිස මෙම දොරටු දෙකෙන් කුමකට ඇතුළු වී දැයි මම නොදුටුවෙමි. එහෙත් ඒ පිළිබඳ සිතමින් කාලය කා දැමීමට මම උත්සුක නොවුණෙමි.

# නස්කාගේ බලය

විලක්කු දල්වා ආලෝකවත් කර තිබූ එම ශිලාමය උමං මාවත ඔස්සේ මම හඬක් නොනැඟෙන අයුරින් ඉදිරියට ගමන් කළෙමි. මිනිත්තු කිහිපයකට පසුව මා සිටියේ රාජකීය කුටි පිහිටි එම අභ්‍යන්තර ශාලාවට ඇතුළු වන ද්වාරය අසලය. එම ශාලාවේ කවුරුන් රැඳී සිටී දැයි මට සිතාගත නොහැකි විය. එහෙයින් මම දොරටුවෙන් ඇතුළුවීමට ප්‍රථම මොහොතක් ඒ අසල රැඳී සිටියෙමි. ශාලාව තුළින් යම් අපැහැදිලි හඬක් නැඟුණ ද එය කුමක් දැයි නිශ්චිතව හඳුනා ගැනීමට මට නොහැකි විය. මම ඉන් අධෛර්යමත් නොවුණෙමි. හඬක් නොනැඟෙන අයුරින් පියවර තබමින් මම දොරටුවෙන් එබී බැලුවෙමි. ශාලාව මුළුමනින්ම හිස්ව පැවතිණි. එහෙයින් මම නොපමාව එහි ඇතුළු වීමි. ශාලාව විලක්කු දල්වා ආලෝකවත් කර තිබූ අතර රාජකීය කුටි වෙත ඇතුළු වන දොරටු මා නෙත ගැටිණි. දැන් මා සිටින්නේ ස්වර්ණමය කුටිය අබියසය. පෙර අප මෙහි විසූ සමයේ රජු සඳහා වෙන්කර තිබූ කුටිය මෙය විය. එහෙයින් එන්කි මෙහි වත්මන් රැජින වේ නම් මෙම කුටියෙහි ඇය රැඳී සිටිය යුතුමය.

මම සැලෙන හදින් යුතුව එම ස්වර්ණමය කුටියට ඇතුළුවීමි. කුටිය තුළ දල්වා තිබූ විලක්කුවල ආලෝකය වැටී බිත්ති සරසා තිබූ රන්පත් දිදුලමින් පැවතියේය. ඒවායින් නික්මුණු කාන්තියෙන් මාගේ දෙනෙත තිලංකාරව යන්නාක් මෙන් දැනිණි. කුටිය අභ්‍යන්තරයේ වූ ස්වර්ණමය යහනේ සැතැපී සිටි එන්කි කුමරියගේ රුව මා නෙත ගැටුණේ ඒ මොහොතේදීය. එමෙන්ම එම පුළුල් යහනේ තවත් කුමාරිකාවෝ සිවුදෙනෙක් සැතැපී සිටියහ. අවසානයේ කෙසේ හෝ මම මාගේ අරමුණ ඉෂ්ට කර ගත්තා නොවේද? ඒ පිළිබඳව සිහිවත් ම මාගේ සිත සොම්නසින් පිරී යන්නට වූයේය. සිටින්නේ කොතැනකද? කරන්නේ කුමක්ද? යන්න පවා මට අමතක විය. ප්‍රීතියෙන් උද්දාමයට පත් වූ මාගේ මනස මටම පාලනය කරගත නොහැකි වූයේය.

''එන්කි!'' මාගේ මුවින් එවදන නික්මුණේ උස් හඬිනි. සියල්ල වෙනස් වූයේ ඒත් සමඟය. සිදුවන්නේ කුමක්දැයි වටහා ගැනීමට කාලයක් ඉතිරිව නොතිබිණි. මාගේ හඬින් ඇය අවදි වූවාය. මඳක්





වික්ෂිප්තව මෙන් ඇය හිස ඔසවා දසත බැලුවාය. ඇය අසල සැතැපී සිටි පරිවාර කුමාරිකාවන් ද අවදි වූයේ ඒත් සමඟය. මොහොතක් ගතවිණි. ඇයගේ නීල දෑස මාගේ දෙනෙත ඉදිරියේ නතර විණි. එහෙත් එහි කිසිදු ළෙන්ගතු බවක් හෝ ලයාන්විත බවක් රැඳී නොතිබිණි. මාගේ දෙනෙත ගිනි පුළිඟු යුග්මයකින් දැවී පිළිස්සී යන්නාක් මෙන් දැනිණි. එමෙන්ම මාගේ දෙනෙත මාගේ ග්‍රහණයෙන් මිදී වෙනත් මායා බන්ධනයකට නතු වූවාක් මෙන් දැනිණි. එහෙත් ඒ තත්පර කිහිපයකට පමණි.

''ඇලෙක්!'' කර්කශ හඬකින් කිසිවෙකු මා අමතන්නාක් මෙන් ඇසිණි.

මා පියවි සිහියට එළැඹියේ ඒත් සමඟය. තවදුරටත් මාගේ නෙත් ඉදිරියේ නිසලව සිටින්නේ ඇය නොවේ. ඇයත් ඇයගේ පරිවාර තරුණ කුමාරිකාවන් සිවුදෙනාත් අතුරුදන්ව ඇත. එසේ නම් මා දුටුවේ මායාවක් ද? මෙය මා කෙසේ විශ්වාස කරන්නද? රාජකීය සිරි යහන හිස්ය. කුටිය තුළ ශේෂව සිටියේ මා පමණි.

එන්කි කුමරියට සහ ඇගේ පරිවාර තරුණියන්ට කුමක් සිදුවිණි දැයි මට සිතා ගත නොහැක. තවත් තත්පර කිහිපයක් ගතවිණි. මෙම රාජකීය කුටි පිහිටි ශාලාවට ඇතුළුවන පැසේජය දෙසින් යම් අපැහැදිලි හඬක් නැඟිණි. තවත් තත්පර කිහිපයක් ගත වන විට එම සියුම් හඬ ක්‍රමයෙන් තීව්‍ර වී ඝෝෂාවක් බවට පත් වූයේය. යම් පිරිසක් මෙහි දිව එන බව මට ප්‍රත්‍යක්ෂ විය. කොතැනක හෝ සැඟවිය යුතු යැයි මා හට සිතුණ ද ඊට අවස්ථාවක් නොලැබිණි. කෝපයෙන් වියරුව සිටි ඉන්කා මුර සෙබළු දස දෙනෙක් පමණ එහි ඇතුළු වූහ. ඔවුන්ගේ පැමිණීම කොතරම් වේගවත්ව සිදුවිණි ද යත් මට මාගේ රයිෆලය පවා අමතක වූයේය. අසුරු සැණින් මා වටකර ගත් සෙබළු සිය හෙලි සහ දුනු හී මා වෙත මානමින් වියරුවෙන් මෙන් ඝෝෂා නඟන්නට වූහ. ඒ මොහොතේ ගිනි අවිය සුරතට ගැනීමට උත්සාහ කළේ නම් නියත වශයෙන්ම එම වියරු ඉන්කා සෙබළෙකුගේ හෙලි පහරකට මා ගොදුරු වනු නියතය.

අවසානයේ මම ඔවුන්ට යටත් වූ බව පැවසීමට මෙන් දෑත් ඉහළට එසවීමි. එහෙත් ඔවුන්ගේ උමතු හැසිරීම ඉන් නොනැවතිණි.

# නස්කා අභිමුව

මා ඉතා අවාසනාවන්ත ලෙස නස්කාගේ චෞර සෙබළුන්ගේ ග්‍රහණයට නතු වූයේ එලෙසය. කොතරම් අවාසනාවක් ද? මා ඇය අසලට පැමිණි මුත් ඇය හමුවීමට අවස්ථාවක් නොලැබිණි. රාජකීය කුටියේ දී මාගේ නෙත් ඉදිරියේ දෘශ්‍යමාන වූ එන්කි කුමරිය ඇතුළු එම රූමතියන්ගේ ඡායා නස්කා විසින් සිය අධිමානසික ගුප්ත බලයකින් මවාපාන ලද්දක් බව මම වටහා ගත්තෙමි. එසේ නම් ඉන්කාවරුන් නස්කා සතු මායා බන්ධන බලයක් පිළිබඳ පවසන්නා වූ කතාව සත්‍යයක් ද? එය සිහිවත්ම මාගේ ගත හිරිවැටී යන්නාක් මෙන් දැනිණි.

මා දැන් සිටින්නේ රාජකීය කුටි පිහිටි එම ශාලාවේ අන්තයේ පිහිටි එක් අඳුරු ශිලා කුටියක් තුළය. නස්කාගේ වියරු සෙබළුන් විසින් මා මෙම කුටියේ සිරගත කරන ලද්දේ මීට අඩ හෝරාවකට පමණ පෙරාතුවය. නැවත වරක් මෙම ඉන්කා පුරවරයේ සිරකරුවකු වීම කොතරම් අභාග්‍යසම්පන්න සිදුවීමක් ද? මෙවර මෙම කුරිරු පූජකයාගෙන් මා හට කිසිදු අනුකම්පාවක් හිමි නොවන බව මම දැන සිටියෙමි. එහෙයින් මාගේ අවසානය එළැඹෙන තුරු එම කුටියට වී බලා සිටීම පමණක් මා හට ඉතිරිව තිබිණි. මේ මොහොතේ මාගේ අභිජාත මිතුරා ක්ලෙවර් මා අසල සිටියේ නම් කොතරම් අගනේ දැයි මට වැටහිණි. ඔහු මා සමඟ සිටියේ නම් මා දිරිමත් කිරීමට යමක් පවසනු නියතය. එහෙත් දැන් ඔහු මා සමඟ නැත. මෙම බිහිසුණු ඉරණමට මා තනිව මුහුණ දිය යුතුව ඇත. මාගේ රයිෆලය තවම මා සතුව ඇත. ගිනිඅවිය වෙත මොවුන් තුළ පැවැති භීතිය කොතෙක් වී ද යත් මාගේ උරෙහි රැඳී තිබූ රයිෆලය වෙත අත තැබීමට හෝ ඔවුහු උත්සුක නොවූහ.

තවත් මිනිත්තු කිහිපයක් ගත විණි. මා සිරගත කර තිබූ කුටියේ ශිලාමය ද්වාරය විවර විණි. ඉන්පසු සෙබළු මා කුටියෙන් ඉවතට ඇද දමනු ලැබූහ. අවාසනාවකට මෙන් මාගේ රයිෆලය මා අතින් ගිලිහී බිම වැටිණි. සිර කුටිය අසල විශාල පිරිසක් රැස්ව





සිටි අතර කාලවර්ණ දිගු ලෝගුවක් ගත දවටාගෙන සිටි බිහිසුණු පෙනුමකින් හෙබි පූජකයෙක් ද ඒ අතර සිටියේය. ඔහු වටා සෙබළු දස දෙනෙක් රැඳී සිටියහ. මෙම බිහිසුණු පෙනුමැති පූජකයා නස්කා බව මම වටහා ගත්තෙමි. අවිගත් සෙබළුන් පිරිසක් මා වටකරගෙන සිටියෙන් ඔහු වෙත සමීප වීමට ඉඩක් නොලැබිණි. එමෙන්ම මාගේ රයිෆලය නැවත අහුලා ගැනීමට මා හට ඉඩක් නොලැබිණි.

කළ යුත්තේ කුමක් දැයි තීරණය කරගත නොහැකිව මම මොහොතකට දෙලොවක් අතර අතරමං වීමි. මා හට විකල්ප දෙකක් ඉතිරිව තිබිණි. එනම් මා බිම වැටී ඇති මාගේ ගිනි අවිය රැගෙන මෙම බිහිසුණු සෙබළුන් සමඟ සටන් වැදිය යුතුය. නොඑසේනම් මෙහි කුමක් සිදු වන්නේ දැයි තවදුරටත් ඉවසා බලා සිටිය යුතුය.

මොවුන් සමඟ සටන් වැදුණ හොත් නියත වශයෙන්ම එය මාගේ මරණයෙන් කෙළවර වනු ඇත. මා සතුව ඇත්තේ සීමිත පතරොම් ප්‍රමාණයක් පමණි. එමෙන්ම ඉන්කා සෙබළුන් ගණන ද තිහකට අධිකය. එහෙයින් මොවුන් සමඟ තනිව කිසිසේත් සටන් කළ නොහැකි වනු ඇත. එපමණක් ද නොවේ ඔවුන් සමඟ සටන් වැදුන ද මට කිසිසේත් ඇය සොයා ගත නොහැකි වනු ඇත. එහෙයින් තවදුරටත් ඉවසා සිටිය යුතු යැයි මම තීරණය කළෙමි.

එහෙත් ඉන් පසු දුටු දසුනෙන් මාගේ ගත සලිත වී ගියේය. එම රාජකීය කුටි පිහිටි ශාලාවට ඇතුළු වන ද්වාරය දෙසින් තවත් පිරිසක් එහි ඇතුළු වූහ. ක්ෂණයෙන් මාගේ දෙනෙත ඔවුන් වෙත ඇදී ගියේය. සිය පරිවාර කුමාරිකාවන් සමඟ අප දෙසට පැමිණෙන එන්කි කුමරියගේ රුව මම දුටුවෙමි. එම කුමාරිකාවන් වටකරගෙන සෙබළුන් කිප දෙනෙකු ද සිටින අයුරු මට දැක ගත හැකි විය.

"එන්කි!" මම උස් හඬින් ඇය ඇමතුවෙමි. එහෙත් ඇයගේ දෙනෙතේ රැඳී තිබුණේ මළානික ගුප්ත බැල්මකි.

# ගුප්ත මණි මේඛලාව

ඇය මා හඳුනා නොගත් බව මම වටහා ගත්තෙමි. මෙය කිසිසේත් සිදුවිය නොහැක. ඇයගේ ජීවිතයට මෙතරම් සමීප වී සිටි මා ඇයට අමතක වූයේ කෙසේද? ඒ නස්කාගේ යම් ගුප්ත බලපෑමක් හේතුවෙන් ම විය යුතුය. ඇයගේ කිරිගරුඬ පැහැ බඳ වටා බැඳි අත්‍යලංකාර මණි මේඛලාව මා නෙත ගැටුණේ ඒ මොහොතේදීය. ස්වර්ණමය සළු පිළිවලින් ඇයගේ ශෝභාසම්පන්න සිරුර ආවරණය වී තිබුණ ද මාගේ නෙත දිව ගියේ එම ගුප්ත පෙනුමකින් හෙබි මණිමේඛලාව වෙතය. ඇයගේ මෙන්ම ඇය සමඟ සිටි සෙසු කුමාරිකාවන්ගේ ද එවන් මණිමේඛලාවන් බැඳ තිබූ බව මම දුටුවෙමි. මින් පෙර මෙවන් ආභරණ මම මෙම ඉන්කා පුරවරයේ දී දැක නොතිබුණෙමි. එහෙත් තවදුරටත් ඒ වෙත මාගේ අවධානය යොමු කිරීමට ඉඩ නොලැබිණි.

''ඇලෙක්!'' නස්කා කර්කශ හඬින් මා ඇමතීය. ඉන් පසු මා වෙත තවත් පියවර කිහිපයක් සමීප වූ ඔහු සිය ගෙලෙහි රඳවාගෙන සිටි ස්වර්ණමය පෙන්ඩනය පිරිමදිමින් යමක් මතුරන්නට වූයේය. මම මොහොතක් නිහඬව ඔහු දෙස බලා සිටියෙමි. ඔහුගේ තියුණු දෙනෙතේ රැඳී තිබූ ගුප්ත පෙනුම කොතරම් මායාකාරී වී ද යත් මාගේ හිස බමන්නාක් මෙන් දැනිණි. මම වහා මාගේ දෙනෙත එම කුරිරු දැසෙන් ඉවතට ගත්තෙමි. ඉන්පසු ඔහුගේ දෙනෙත යොමු වූයේ එන්කි කුමරිය වෙතයි. ඇය දෙස බලා යමක් තොල් මැතිරූ ඔහු වියරු ලෙස සිනාසුණේය.

''සෙබළුනි, අපගේ පාරිශුද්ධ භූමිය කෙලෙසුවා වූ මෙම අශුද්ධ මිනිසාව සූර්ය දිව්‍ය රාජෝත්තමයාට බිලිදීම සඳහා සිරගත කරනු!'' මාගේ සවන්හි වැකුණේ එන්කි කුමරිය සිය සෙබළුන් හට නියෝග කරන හඬයි. එමෙන්ම ඒ මොහොතේ පවා ඇගේ හඬ පරයමින් නස්කාගේ වියරු සිනා හඬ මාගේ සවන්පත් තුළ රැව් පිළිරැව් දිණි.

සිය රැජිනගේ අණ ලද සැණින් මා වටා සිටි ඉන්කා මුර





සෙබළු අනුකම්පා විරහිත ලෙස මාගේ දැත් දෙපා බැඳ දැමූහ. එන්කි කුමරියගේ සිතුම් පැතුම් පවා නස්කා විසින් පාලනය කරන්නේ යැයි රස්ටා මා සමඟ පවසා තිබුණ ද මෙතෙක් මම එය විශ්වාස නොකළෙමි. එහෙත් එය සත්‍යයක් බව මෙම අවාසනාවන්ත සිදුවීමෙන් පසු මම ප්‍රත්‍යක්ෂ කර ගත්තෙමි. නස්කා විසින් සිය මායා බන්ධනයන් මඟින් ඇයගේත් ඇය වටා සිටින සෙසු කුමාරිකාවන්ගේත් සිතුම් පැතුම් පාලනය කරන්නා වූ බව ස්ථිරය. එහෙත් එය අවබෝධ වන විට මා ප්‍රමාද වැඩිය.

සෙබළු මා පසෙකට ඇදගෙන යන්නට වූහ. මම අවසන් වරටත් ඇයගේ දෙනෙත දෙස සෘජුව බැලුවෙමි. එහි රැඳී තිබුණේ අජීවී මලානික බැල්මකි. එමෙන්ම භීතියෙන් මුසපත් වූ අසරණ බවක් ද ඇගේ දෙනෙතේ ගැබ්ව තිබුණේ යැයි මට සිතිණි. අනුකම්පා විරහිත ලෙස එම ශාලාවේ අන්තයක පිහිටි කුටියක් වෙත මා තල්ලු කර දැමූ සෙබළු එහි ශිලාමය දොරටුව වසා දැමූහ. මාගේ හදවත ප්‍රථම වරට බියෙන් සලිත විය. මාගේ රයිෆලය ද දැන් මා සතුව නැත. එය මාගේ අතින් ගිලිහී බිම වැටිණි.

එහෙයින් මාගේ සාක්කුවල රඳවාගෙන සිටි පතරොම්වලින් කිසිදු ප්‍රයෝජනයක් අත් නොවනු ඇත. මට අවශ්‍ය විණි නම් පෙර ගිනි අවිය මා සතුව තිබූ මොහොතේ නස්කා ඇතුළු සෙබළුන් විශාල සංඛ්‍යාවක් මරා දැමීමට අවස්ථාව තිබිණි. මා එසේ නොකළේ එසේ විණි නම් එන්කි කුමරියට යම් විපතක් සිදුවනු ඇතැයි යන බියෙනි. එහෙත් දැන් මා හට සිදුවන්නේ අන්ත අසරණයකු ලෙස මෙම බිහිසුණු මිනිසුන් අතින් මරණයට පත්වීමටය. ලද අවස්ථාවෙන් නිසි ප්‍රයෝජන ලබා නොගැනීම පිළිබඳ මම මටම සිතින් ශාප කර ගත්තෙමි. එහෙත් ඇය කෙරෙහි මාගේ සිතේ වෛරයක් ඇති නොවිණි. මා මෙන්ම ඇය ද සැබැවින් ම අසරණය.

ක්ලෙවර්, මෙවර මා හට පිහිට වීමට ඔබ ද මා අසල නැත! මා තනිව මාගේ අවාසනාවන්ත ඉරණමට මුහුණ දිය යුතුය.

# නස්කාගේ සිරකරුවෝ

කොපමණ කාලයක් එම අඳුරු කුටියේ මා වැතිරී සිටියේ දැයි මම නොදනිමි. ඒ අතරතුර මාගේ දෑත් දෙපා බැඳ තිබූ රැහැනේ ගැට ලිහා ගැනීමට මට හැකි විය. කෙසේ හෝ මාගේ රයිෆලය නැවත මා අතට පත් කර ගත හැකි නම් මෙම බිහිසුණු පූජකයාට එරෙහිව යමක් කළ හැකි වනු ඇත. එහෙත් නැවත එය කිසිසේත් මා අතට පත් නොවනු ඇතැයි මාගේ යටි සිත පවසන්නට විය.

තවත් හෝරා කිහිපයක් ගතවිණි. මාගේ සිර කුටියේ ශිලාමය දොරටුව විවර වන්නාක් මෙන් ඇසිණි. මම හුන් තැනින් නැගිට සිදුවන්නේ කුමක් දැයි බලා සිටියෙමි. ද්වාරය මුළුමනින්ම විවර වූ අතර මුර සෙබළ සිවුදෙනෙක් කුටියට ඇතුළු වූහ.

ඉන්පසු ඔවුන් මා කැඳවාගෙන ගියේ සූර්ය දෙවොල පිහිටි උඩු මහලට පිවිසෙන පියගැට පෙළ සහිත පැසේජය වෙතයි. මම ඊට විරුද්ධත්වයක් නොපෙන් වූවෙමි. මිනිත්තු කීපයකට පසු අපි සූර්ය දෙවොල පිහිටි ඉහළම මහලට පිවිසියෙමු. එහි සූර්ය දෙවොලේ පූජාසනය අබියස රාජකීය පෙනුමැති කීපදෙනෙක් රැස්වී සිටියහ. එමෙන්ම තවත් මුර සෙබළුන් තැන තැන සිටිනු මා නෙත ගැටිණි. මුර සෙබළුන් මා කැඳවාගෙන ගියේ පූජකයාගේ පෞද්ගලික කුටිය අසල තිබූ තවත් විශාල කුටියක් වෙතයි.

මා එහි ඇතුළු කළ සැණින් ශිලාමය ද්වාරය වැසී ගියේය. එම කුටිය තුළ මා සිටින්නේ තනිව නොවන බව වැඩි වේලාවක් ගතවීමට පෙර මම වටහා ගත්තෙමි. දෙනෙත අඳුරට හුරුවත්ම මට ඔවුන් හඳුනාගත හැකි විය. එහි සිටියේ තවත් තරුණ ඉන්කාවරු දෙදෙනෙකි. භීතියෙන් මුසපත්ව කුටියේ එක් මුල්ලකට වී සිටි ඔවුහු දෑත් ඉහළට ඔසවමින් යමක් මුමුණන්නට වූහ. මම තත්පර කිහිපයක් නිහඬව ඔවුන් දෙස බලා සිටියෙමි.

''මම ඇලෙක්, මොනවද උඹලා ඔතන කරන්නෙ?'' අවසානයේ මම විමසුවෙමි.

''සූර්ය දිව්‍ය රාජෝත්තමයාණනි, මේ බිහිසුණු ඉරණමෙන්





අපව මුදාගනු මැනවි!'' ඔවුන් ආදිකල්පික පෙරුවියානු භාෂාවෙන් මුමුණනු ඇසිණි. මම ඔවුන්ගේ භාෂාව උගෙන තිබුණෙන් එය වටහා ගත හැකි විය.

''උඹලා කවුද?''

මාගේ ප්‍රශ්නයට ඔවුහු කිසිදු ප්‍රතිචාරයක් නොදක්වූයෙන් මම යළි එසේ විමසුවෙමි.

''අපි සූර්ය දිව්‍ය රාජෝත්තමයාගේ සිරකරුවො. අපිව මරණයට කැපවෙලයි තියෙන්නෙ. නස්කා අපිව අද හෙටම හිරු දෙවියන්ට බිලි දෙයි. උඹ කවුද? කොහෙන්ද අපේ රාජධානියට ඇතුළු වුණේ?'' ඉන් එක් අයෙක් පැවසීය.

මම කවුරුන් දැයි යන්නත්, මෙහි පැමිණි ආකාරයත් ඔවුන්ට පැහැදිලි කළෙමි.

''මට මතකයි ඔබව. ඇලෙක්, කෝ අනිත් අය? ගිය වතාවෙ ඇලෙක්ලා මෙහෙන් පිටත් වුණාට පස්සෙ මෙහේ සිද්ධ වුණේ මහ පුදුම සහගත දේවල්.'' ඔහු පැවසීය.

''මට ඒ හැම දෙයක්ම රස්ටා කීව්වා. ඒ විතරක් නෙවෙයි උඹලගෙ රජතුමා වනාන්තරේ මැද්දෙ තියෙන ගම්මානයක තවමත් ඉතා හොඳින් ජීවත් වෙනවා!'' මම පැවසුවෙමි.

එය සවන් වැකෙත්ම ඔවුන්ගේ මළානික මුහුණු එක් නිමේෂයකට එළිය වනු මම දුටුවෙමි.

''කවදහරි නස්කාගෙ පාලනයෙන් මේ රාජධානිය මුදාගන්න අපේ සූර්ය දිව්‍ය පුත්‍රයට බලය ලැබෙයි.'' එක් අයෙක් පැවසීය.

ඉන් අනතුරුව තවත් හෝරා කීපයක් ගත විණි. නස්කා විසින් මෙම ඉන්කා  තරුණයන් දෙදෙනා මෙලෙස මරණයට කැප කොට ඇත්තේ සිය පෞද්ගලික කෝන්තරයක් පිරිමසා ගන්නා අටියෙනි. ඒ බැව් මම ඔවුන්ගෙන් අසා දැන ගත්තෙමි. එමෙන්ම දියේ ගිලීමට යන තැනැත්තා දිය මත පාවෙන පරඬැලක පිහිට පතන්නාක් මෙන් මෙම බිහිසුණු ඉරණමෙන් ගැළවුමක් ලබන්නේ කෙසේ දැයි මම කල්පනා කළෙමි. එහෙත් මෙම උමතු පූජකයාගේ ග්‍රහණයෙන් මිදී පලා යා හැකි ආකාරයක් මට සිතාගත නොහැකි විය.

# මරණ මංචකය

තවත් හෝරා ගණනාවක් ගත වූයේ කිසිදු විශේෂත්වයකින් තොරවය. අප සිරගත කර තිබූ අඳුරු කුටියට රැයක දවාලක වෙනසක් නොදැනිණි. එමෙන්ම පිපාසයෙන් සහ කුසගින්නෙන් හෙම්බත්ව මම බෙහෙවින් දුර්මුඛ වී සිටියෙමි. මා සමඟ සිර කුටියේ සිටි ඉන්කා තරුණයන් දෙදෙනාට ද දින දෙකක් මුළුල්ලේ එක් දිය බිඳක් හෝ ලබා දී නොතිබිණි.

''අපි දැන් මරණයට කැප වෙලා ඉන්නෙ. කාටවත් අපේ ඉරණම වෙනස් කරන්න පුළුවන් කමක් නෑ.'' කගාක් නම් ඉන්කා තරුණයා පැවසීය.

අපි මෙලෙස නිරාහාරව තවත් දිනක් එම අඳුරු කුටියේ සිරවී සිටියෙමු. එහි සිරවී සිටි හෝරා කීපයේ මට දහස් වතාවක් ඇයගේත් මගේ මිතුරන්ගේත් ශෝකාකුල මුහුණු මැවී පෙනෙන්නට ඇත.

කුටියේ ශිලාමය ද්වාරය විවර වූයේ මා සිහින ලොවක අතරමංව සිටි එවන් අනපේක්ෂිත මොහොතකය. මුර සෙබළුන් කිහිපදෙනෙක් කුටියට පිවිසී අප තිදෙනා කුටියෙන් ඉවතට තල්ලු කර දමන ලද්දෙන් අපි ශිලාමය පොළොවෙහි ඇද වැටුණෙමු. ඉන් පසු ඔවුන් අප කැඳවාගෙන යන්නට වූයේ සූර්ය දෙවොලේ පූජාසනය අබියසටය. ඉන්කා තරුණයන් දෙදෙනා මරණ බියෙන් විලාප නඟන්නට වුව ද මම දැඩි ආයාසයකින් නිහඬව සිටියෙමි.

සූර්ය දෙවොල අබියස විශාල පිරිසක් රැස්ව සිටි බව මම ඈත සිටම දුටුවෙමි. එහෙයින් අප මෙලෙස කැඳවාගෙන යන්නේ අපගේ මරණ මංචකය වෙත බව වටහා ගැනීම අපහසු නොවීය. මම රැස්ව සිටියවුන් අතර ඇය සිටී දැයි දැක ගැනීමට දෙනෙත සෑම දිශාවකටම යොමු කළෙමි. ඇය නස්කා අසලින් ම සිටිනු





දැක මාගේ ගත හිරිවැටී ගියේය. මාගේ මරණ මංචකය හමුවේ ඇය මෙලෙස විරාජමානව අනුකම්පා විරහිතව බලා සිටීම කොතරම් විශ්මයජනකද? මාගේ හදවතේ සෑම සංවේදනයක් ම හඳුනාගෙන සිටි ඇය මාගේ මරණය අභිමුව මෙලෙස නොසැලී සිටින්නේ කෙසේද? එය මට වටහා ගත නොහැක. පූජාසනයට මඳක් එපිටින් ශිලාමය පොළොවේ ඇති විශාල සිදුරු තුනක සිටුවන ලද දැව කඳන් තුනක් මාගේ නෙත ගැටුණේ මේ අතරය. ඒ අසලට අප කැඳවගෙන ගිය සෙබළු සිය තියුණු හෙලි අප වෙත දිගු කළහ. නස්කාත් එන්කි ඇතුළු පරිවාර කුමාරිකාවනුත් සිටියේ පූජාසනය අබියසය. ඔවුන් සහ අප අතර පැවතියේ අඩි කිහිපයක පරතරයක් පමණි.

''කගාක්, මොන්කෝ උඹලට අවසන් වශයෙන් මොනවා හරි කියන්න තියෙනවද?'' නස්කා කර්කශ හඬින් විමසීය. රැස්ව සිටියවුන්ගේ ඝෝෂාව ඒත් සමඟම නතර විණි.

භීතියෙන් මුසපත්ව වෙව්ලමින් සිටි ඉන්කා තරුණයන් සිය දෑත් ඉහළට ඔසවමින් සූර්ය දෙවියන්ට යාච්ඤා කරනු මම දුටුවෙමි. ඉන්පසු සෙබළු පැමිණ ඔවුන් දෙදෙනා යථෝක්ත දැව කඳන් දෙකක් ඉදිරියේ සිටුවා ලනු පොටවල්වලින් ඊට තදින් බැඳ දමන්නට වූහ. තවත් සෙබළු පිරිසක් ඔවුන් දෙදෙනාගේ දණහිස් තෙක් වැසී යන අයුරින් දර කැබලි ඔවුන් වටා අසුරන්නට වූහ. මම නොසැලී එන්කිගේ ගුප්ත දෙනෙත දෙසම සෘජුව බලා සිටියෙමි.

''ඇලෙක්! උඹ හිතන්න ඇති ඔල්මෙක්ව වගේ මාවත් බලයෙන් නෙරපන්න පුළුවන් වෙයි කියලා. ඔල්මෙක් කියන්නෙ මගේ ඥාතියෙක්. මම අද උඹෙන් මගේ ලේවල පළිය ගන්නවා... ඉතින් උඹට මොනවද කියන්න තියෙන්නෙ?'' ඔහු පැවසුවේ සිය ගෙලෙහි පැළඳගෙන සිටි මාණික්‍ය මාලය සුරතින් ස්පර්ශ කරමිනි. විලක්කුවලින් විහිදුණු ආලෝකය ඒ මත පතිත වීමෙන් එහි වෛවර්ණ වූ මාණික්‍යයෝ දිදුලන්නට වූයේ ඒ දෙස සෘජුව බැලීමටත් නොහැකි වන ආකාරයේ දීප්තියක් විහිදුවමිනි. ඔහු

වෙතින් ඉවත් වූ මාගේ දෙනෙත නැවත සිර වූයේ ඇයගේ දෙනෙත් අතරය. ඉන් පසු මාගේ නෙත් දිව ගියේ ඇයට පිටුපසින් පිහිටි පූජාසනය අබියස වූ ශිලාමය පුවරුව මත තබා තිබූ මාගේ රයිෆලය වෙතයි!

"දෙවියනේ!" මාගේ යටි සිත පවසනු ඇසිණි. මුළු ලොවම මා වෙත කඩා පැන මාගේ සිරුර කැබලි කර දමන්නාක් මෙන් මට හැඟී ගියේය. එහෙත් මිළඟ නිමේෂයේ මම තීරණයකට එළැඹියෙමි. දෙවියන් වහන්සේ මට තවත් එක් අවස්ථාවක් ලබා දී ඇත. රයිෆලය සහ මා අතර ඇත්තේ පියවර කිහිපයක පරතරයක් පමණි. එහෙත් රයිෆලය සහ මා අතර ඇය සිටී!

මම තවත් එක් මොහොතක් හෝ පමා නොවුණෙමි. මක්නිසාද යත් ඒ වන විටත් නස්කාගේ සෙබළුන් මා අසලට පැමිණ සිටි බැවිනි. ඔවුන්ට මා ග්‍රහණය කර ගැනීමට ඉඩ නොලැබිණි. මම ඔවුන්ට සිතා ගැනීමටවත් නොහැකි අයුරින්, අසුරු සැණින් ඉදිරියට පැන, එන්කි කුමරිය නස්කා වෙත තල්ලු කර දැමුවෙමි. සිය සිරුරේ සමබරතාව ගිළිහී ගිය ඔහු එන්කි කුමරිය සමඟ බිම පෙරළී යන්නට ඇත. එහෙත් ඒ මොහොතේ මාගේ අවධානය යොමු වූයේ ඒ වෙත නොවේ. මම මොහොතක් හෝ පමා නොවී ශිලාමය පුවරුව මත තිබූ මාගේ රයිෆලය රැගෙන ආපසු හැරුණෙමි. ඒත් සමඟම මා පසු පස සිටි ඉන්කා සෙබළා මාගේ හිස වෙත එල්ල කළේ මාරාන්තික හෙලි පහරකි. වාසනාවකට මෙන් හිස ඉවතට ගෙන එම පහරින් මිදීමට මට හැකි විය. ඉන් පසු ක්‍රියාත්මක වූයේ මාගේ ගිනි අවියයි. විශාල හඬක් නංවමින් රයිෆලය ක්‍රියාත්මක වූ අතර මා වෙත මාරාන්තික පහර එල්ල කළ ඉන්කා සෙබළා කපා හෙළූ ගසක් මෙන් බිම ඇද වැටුණේය. ගිනි අවියේ හඬ දසත දෝංකාර දෙත්ම රැස්ව සිටියවුන් හිස් ලූ ලූ අත දිවයන්නට වූහ. හෙලි සහ මුගුරු අත දරා සිටි නස්කාගේ සෙබළු පවා පලා යන්නට වූහ. ඒ අතරතුර මට පහර දීමට සූදානම් වූ තවත් වියරු සෙබළෙකුට මම රයිෆලයෙන් පිළිතුරු දුන්නෙමි. ඔහු ද මාගේ





දෙපා මුල ඇද වැටුණේ විලාප නගමිනි. ලද අවසරයෙන් මම රයිෆලය ඉහළට හරවා තවත් වෙඩිල්ලක් තැබුවෙමි.

අවසානයේ මා අබියස ශේෂ වූයේ නස්කාත් එන්කි කුමරියත්, මාගේ ගිනි අවියට බිලි වූ සෙබළුන් දෙදෙනාත් දර සෑයත් මධ්‍යයේ ගැට ගසා සිටි අසරණ ඉන්කා තරුණයන් දෙදෙනාත් පමණි.

# මායා බන්ධනය

නැගිටීමට වැර දරමින් සිටි එන්කි කුමරිය පසෙකට තල්ලු කර දමූ නස්කා සිය ගෙලෙහි පැළඳ සිටි මාණික්‍ය මාලය සුරතින් පිරිමදිමින් යමක් මුමුණන්නට වූයේය. මම ඔහු අබියසට ගොස් මාගේ රයිෆලයේ මිටෙන් ඔහුගේ හිසට පහරක් එල්ල කළෙමි. නස්කා සිහිසුන්ව බිම ඇද වැටී නිශ්චල වූයේය. ඉන් අනතුරුව මම වහා එන්කි වෙත නැඹුරු වීමි. ඇයගේ දෙනෙත් තවමත් ඇත්තේ මලානික ගුප්ත බැල්මකි. මම ඇයගේ දෑතින් අල්ලා නැගිටීමට සහය වීමි.

අඳුරු අහසේ විදුලි කෙටුවාක් මෙන් මෙතෙක් අමතකව තිබූ යමක් මට සිහි විය. එමරල්ඩ් මාණික්‍ය! එය තවම මා ළඟ සුර. කිව ඇත. මම මාගේ කබා සාක්කුවෙන් එම පලා පැහැ මාණික්‍ය ඉවතට ගෙන ඇය වෙත දිගු කළෙමි. එහි කාන්තිය නෙත ගැටෙත්ම ඇයගේ මලානික මුහුණ පිබිදෙනු මම දුටුවෙමි. ඒත් සමගම විශ්මයට පත් හඬක් ඇගේ මුවින් නික්මිණි.

''එන්කි! කතා කරන්න ඔයාට මොනවද වුණේ?'' මම ඇ වෙත තව තවත් නැඹුරු වෙමින් පැවසුවෙමි. එහෙත් ඇය මා දෙස බලා සිටියේ වික්ෂිප්තවය. ඇයගේ බඳ වටා බැඳ තිබූ මැණික් පළඳනාව නැවත මාගේ අවධානයට ලක් වූයේ මේ අතරය. එම මණිමේඛලාවේ තිබූ ගුප්ත පෙනුම මාගේ මනස කොතරම් කැළැඹී ද යත් මම බොහෝ වේලාවක් නිහඬව ඒ දෙස බලා සිටියෙමි. එය තවදුරටත් ඇය පැළඳ සිටිය යුතු නැත! මීළඟ නිමේෂයේ මම තීරණයකට එළැඹියෙමි. ඇගේ බඳ වටා සුරත යැවූ මම එම මැණික් පළඳනාව ගලවා පසෙකට විසි කළෙමි. ඒත් සමඟම ඇය සිහි විසඥව ඇද වැටුණාය. එහෙත් වාසනාවකට මෙන් තවත් තත්පර කිහිපයකට පසු ඇය නැවත පියවි සිහිය ලැබුවාය.

''එන්කි! දෙවියන්ගෙ නාමෙන් කතා කරන්න.'' මම ඇ වෙත නැඹුරු වෙමින් පැවසුවෙමි.





''ඇලෙක්, දෙවියනේ ඔයා මාව මුණගැහෙන්න ඇවිත්!'' ඇය විශ්මයෙන් යුතුව පැවසුවාය.

''දැන් ඔයාට කොහොමද? ඇඟට අමුත්තක් දැනෙනවද?'' මම විමසුවෙමි.

''පණ නැති ගතියක් දැනෙනවා. ඒ හැර මට වෙන අසනීපයක් නෑ. කෝ ලගාෂා,, එතකොට ස්ටෝන්?'' ඇය වික්ෂිප්තව දසත බලමින් විමසුවාය.

ඇය හැසිරුණේ යම් ගැඹුරු නිද්‍රාවකට පත්ව හිඳ හිටි හැටියේ අවදි වූවාක් මෙනි. එහෙයින් ඇය නස්කාගේ ග්‍රහණයට නතු වූ පසු යම් මායා බන්ධනයකට ලක්ව හිඳි බව මට ප්‍රත්‍යක්ෂ විය.

''ඇලෙක්, අන්න නස්කා!'' ඇය භීතියෙන් විලාප නැගුවාය. මම වහා පසුපස හැරී බැලුවෙමි. නස්කා වැටී සිටි ස්ථානයෙන් නැඟී සිටීමට වැර දරමින් සිටියේය. මම වහා ඔහු වෙත සමීප වී ඔහු ගෙලෙහි පැළඳ සිටි මාණික්‍ය මාලය කඩා පසෙකට විසි කළෙමි. ඉන් අනතුරුව දර සැයත් මධ්‍යයේ ගැට ගසා සිටි ඉන්කා තරුණයන් දෙදෙනා ඉන් මුදාහැර, ඔවුන්ගේ සහය ද ඇතිව නස්කා ඉන් එක් දැව කඳක් ඉදිරියේ සිටුවා එහි බැඳ දමා දර කැබලි ඔහු වටා ඇතිරුවෙමි. ඔහු විටෙක මා හට ශාප කරමින් ද තවත් විටෙක විලාප නගමින් ද සිය දෑත් දෙපා බැඳි රැහැන් කඩා දැමීමට වැර දැරීය. කෝපයෙන් වියරු වැටී සිටි මා මිත්‍ර ඉන්කාවරු දෙදෙනා මුගුරුවලින් පහර දී නස්කා නිහඬ කළහ. මම ඔවුන්ට බාධා නොකළෙමි. මක්නිසාද යත් මෙම ප්‍රෞඪ රාජධානියේ සාමකාමී ජන ජීවිත අවුල් වියවුල් කළ එම දුෂ්ට මිනිසාට නිසි දඬුවම හිමි විය යුතු බැවිනි. එහෙත් ඉන් පසු සිදුවූයේ මා කිසිසේත් අපේක්ෂා කළ දෙයක් නොවේ.

ඈතින් යම් පිපිරුම් හඬක් නැගිණි. එය මෙම ශිලා පර්වතයට පිටතින් නැගුණු හඬක් විය යුතු යැයි මට සිතිණි. තවත් එවැනිම පිපිරුම් හඬවල් කිහිපයක් මීළඟ තත්පර කිහිපය තුළ මගේ සවන් හි වැකිණි. මෙම පර්වතයෙන් පිටත කුමක් සිදුවන්නේ දැයි වටහා ගත නොහැකිව මම බොහෝ වේලාවක් නිහඬව බලා සිටියෙමි.

මෙය නස්කාගේ යම් ඉන්ද්‍රජාලික ක්‍රියාවක් දැයි විටෙක මට සැක සිතිණි. එහෙයින් මම ඔහු දෙස හැරී බැලුවෙමි. ඔහු සිටියේ සිහි විසඥවය. ඉන්කා තරුණයන්ගේ මුගුරු ප්‍රහාරවලින් ඔහුට බරපතළ ලෙස තුවාල සිදු වී තිබිණි.

එහෙයින් ඉන් පසු මම එක් අතකින් රයිෆලය ද අනෙක් අතින් එන්කිගේ සුරත ද ග්‍රහණය කර ගෙන එම සූර්ය දෙවොලෙන් පිටවීමට සිතා පැසේජය ඔස්සේ ඉදිරියට දිව යන්නට වීමි. ඇය මා පසුපස දිව ආවේ ඉතා අපහසුවෙනි. එමෙන්ම ඉන්කාවරු දෙදෙනා ද අප දෙදෙනා පසුපස පැමිණි බව මම දුටුවේ සූර්ය දෙවොල පිහිටි තෙවැනි මහලෙන් දෙවැනි මහලට ද පිවිසි පසුවය.

"ඇලෙක් මෙහෙ මොනවද සිද්ධ වෙලා තියෙන්නෙ. මගේ ඇඟට කිසිම පණක් නෑ. ඇයි අපි මේ පහළට යන්නෙ?" එසේ ඉදිරියට දිව යන අතර ඇය මාගෙන් විවිධ ප්‍රශ්න ඇසීමට වූවාය. එහෙත් ඒවා ඇයට පැහැදිලි කර දීමට කාලයක් ඉතිරිව නොතිබිණි.

දෙවැනි මහල ද මුළුමනින්ම හිස්ව පැවතියෙන් මාගේ සිත නොසන්සුන් විය. මාගේ රයිෆලයට බියෙන් මෙම පර්වත භූමියේ සිටියවුන් ඉවතට පලා යන්නට ඇතිවාට සැක නැත. එහෙත් පෙර ඇසුණු පිපිරුම් හඬවල් ඇති වූයේ කෙසේ දැයි මට වටහාගත නොහැකි විය.



# පර්වත භූමියෙන් පිටවීම

රන්පත්වලින් අත්‍යාලංකාර ලෙස සරසා තිබූ රාජකීය කුටි පිහිටි දෙවැනි මහල සහ පළමු මහල පසුකරමින් අපි බිම් මහලේ පර්වත ද්වාරය තෙක් විහිදුනා වූ පැසේජය වෙත පිවිසියෙමු. එහි පිවිසි පසු විවිධ අපැහැදිලි හඬවල් ඇසෙන්නට වූයෙන් මම රයිෆලයේ ආරක්ෂක අගුළ ලිහිල් කර ගත්තෙමි. මිනිත්තු කිහිපයක් ගත වන විට අපි එම පර්වත කුහරයෙන් පිට වන ද්වාරය වෙත පැමිණියෙමු. පිටත විවිධ කෑකෝ ගැසීම් සහ අවි ආයුධ එකිනෙක හා ගැටෙන හඬවල් ඇසිණි.

"යුද්ධයක්" මාගේ යටි සිත පවසන්නට විය. එහෙත් ඒ කා අතර ද? සූර්ය දෙවොල භාරව සිටි නස්කාගේ දුෂ්ට සේනාව සහ මෙම ඉන්කා පුරවරයේ සෙසු වැසියන් අතර ද?

"ඇලෙක්, එළියෙ මේ මොනවද සිද්ධ වෙන්නෙ?" එන්කි විමසුවේ මාගේ සුරත තව තවත් තදින් ග්‍රහණය කර ගනිමිනි. දොරටුව අසල කිසිවකුත් පෙනෙන්නට නොසිටියෙන් මම නොපමාව ඇය සමඟ ඉන් ඉවතට පැමිණියෙමි. අප පසුපසින් පැමිණි ඉන්කාවරු දෙදෙනා ද අපත් සමඟම ඉන් ඉවතට පිවිසියහ.

මාගේ උපකල්පනය නිවැරැදි විය. සූර්ය දෙවොල පිහිටි මෙම පර්වතය වටා පිහිටි භූමිය එකම යුධ පිටියක් බවට පත් වී ඇත. තුවාලකරුවන් තැන තැන වැටී විලාප නඟමින් සිටි අතර ඇතැමෙක් තවමත් තැන තැන කා කොටා ගනිමින් සිටිනු පෙනිණි. මම එන්කි කුමරිය ද කැටුව එම අන්තරාදායක පෙදෙස මඟහරිමින් මෙම ඉන්කා පුරවරයෙන් පිටවන ප්‍රධාන දොරටුව දෙසට ගමන් කිරීමට උත්සාහ කළෙමි. එහෙත් එක්වරම අප පසුපස පැමිණි ඉන්කා තරුණයෝ දෙදෙනා එන්කිගේ දෑතින් ඇද ඇය පසෙකට තල්ලු කර දැමීමට උත්සාහ කළහ. ඉන් මම කොතරම් විශ්මයට පත් වී ද යත් හුන් තැනම නතර වීමි.

"කාෆාක්, එන්කිට යන්න දෙන්න එපා! අල්ල ගනින්. නස්කා

වගේම එන්කිවත් සූර්ය දිව්‍ය රාජෝත්තමයන්ට බිලි දිය යුතුයි!'' මොන්කෝ පැවසීය.

''ඇලෙක්, එන්කිව අපට භාර දීලා යන තැනක යන්න.''

''නෑ. දැන් ඒ හැම දෙයක්ම ඉවරයි. නස්කාගේ මායා බන්ධන තවදුරටත් වලංගු නෑ. එන්කි සම්පූර්ණයෙන්ම අහිංසකයි.'' මම පැවසුවෙමි. එනමුත් ඔවුන් එය පිළිගැනීමට සූදානම් නොමැති බව පෙනිණි. මා පසෙකට තල්ලු කර දැමූ කෆාක් එන්කිගෙ ගෙල තදින් ග්‍රහණය කර ගත්තේය. එහෙයින් මාගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියේය. කෆාක්ට එරෙහිව රයිෆලය ක්‍රියාත්මක කිරීමට මගේ සිත ඉඩ නොදිණි.

''කෆාක් ඕක නවත්තපං.'' මම කෑගැසුවෙමි. එහෙත් ඊට ප්‍රතිචාර දැක්වූයේ ඔහු නොවේ. ඉන් පසු මම මාගේ රයිෆලයේ මිටෙන් ඔහුගේ හිසට පහරක් එල්ල කළෙමි. ඒත් සමගම මොන්කෝ මා වෙත කඩා පැන්නේ වියරු වූ වන මෘගයකු මෙනි. අවසානයේ වාසනාවකට මෙන් මම ඔහුගේ බල බිඳ පසෙකට තල්ලු කර දැමූවෙමි. අපගේ සටන ඉන් අවසන් නොවීය. එහෙත් මොන්කෝ නැවත නැගිටීමට පෙර මම එන්කි සමඟ ඉදිරියට දිවයන්නට වීමි.

මිනිත්තුවක පමණ කාලයක් ගත වන විට අපි ඉන්කා රාජධානියේ ප්‍රධාන දැවමුවා දොරටුව අබියසට පැමිණියෙමු. මුර සෙබළුන් තිදෙනෙකුගේ මළ සිරුරු ඒ අසල වැටී තිබෙනු දුර සිටම දැක ගත හැකි විය. එහෙත් එහි නොනැවතී අපි නොපමාව දොරටුවෙන් පිට වුණෙමු.

මොන්කෝ තවත් ඉන්කාවරුන් පිරිසක් සමඟ අප පසුපස ලුහුබැඳ ඇති බව මා දුටුවේ එම ප්‍රධාන දොරටුවෙන් පිටවනවාත් සමඟයි. ඔවුන් සිටියේ අපට යාර දෙසීයක් පමණ දුරිනි. එහෙයින් අපි නොපමාව වනාන්තරයට පිවිසී ඉදිරියට දිවයන්නට වීමු. එන්කිගේ ජීවිතය රැක ගැනීමට නම් මෙම ප්‍රකෝපකාරී ඉන්කා වැසියන්ගෙන් හැකිතාක් ඈත් විය යුතුව තිබිණි. කෙසේ වෙතත් රයිෆලය මා අත රැඳී තිබීම මාගේ සිතට විශාල සහනයක් විය.





මිනිත්තු කිහිපයක් ගතවන විට අපි ඝන වනාන්තරයට පිවිසී සිටියෙමු. දැවැන්ත තුරුලතාවන් දසත පැතිරී තිබුණෙන් ඒවායේ ආවරණය ලබමින් අපි ඉන්කා රාජධානියෙන් තව තවත් ඈත් වීමු. ඒ වන විට මධ්‍යාහ්නය පසු වී තවත් හෝරා කිහිපයක් ගත වී තිබෙන්නට ඇතිවාට සැක නැත. කුසගින්නෙන් හා පිපාසයෙන් මා කොතරම් පීඩාවට පත් වී සිටිය ද ඇය කෙරෙහි මාගේ සිතේ පැවති ආදරය හේතුවෙන් මම කිසි විටෙකත් ඇයට ඒ බවක් නොහැඟවීමි. අප පසුපස කිසිවෙකු ලුහුබඳින්නේ නැති බව මට ප්‍රත්‍යක්ෂ වූයේ හිරු බැස යෑමට බොහෝ ආසන්න වූ පසුය.

**සමාප්තයි**

**ස්වර්ණමය නගරයෙන්**
**නැවත හමුවෙමු.**

kathapothak.blogspot.com